# ප්‍රජා විද්‍යාත්මක සහ සෞඛ්‍ය සමීක්ෂණය

# ශ්‍රී ලංකාව

# 2006

## උපලේඛණය සම්පූර්ණ කිරීම සඳහා උපදෙස්

ලෝක බැංකු ආධාර මත සෞඛ්‍ය ආරක්ෂණ සහ පෝෂණ අමාත්‍යාංශය සඳහා
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලැබේ.

# 1. හැඳින්වීම

2006 වසරේ සිදු කරන ප්‍රජා විද්‍යාත්මක හා සෞඛ්‍ය සමීක්ෂණය ශ්‍රී ලංකාවේ ජනගහනය, උපත් පාලනය, මාතෘ හා ළමා සෞඛ්‍යය, AIDS හා වෙනත් ලිංගිකාශ්‍රිත බෝවන රෝග ප්‍රජනන සෞඛ්‍ය සහ පෝෂණය වැනි ඉතා වැදගත් තොරතුරු රාශියක් එක් රැස් කරනු පිණිස සිදු කරන ජාතික මට්ටමේ නියැදි සමීක්ෂණයකි. සසම්භාවී ලෙස ගත් වයස අවු. 15 - 49 අතර කවදා හෝ විවාහක කාන්තාවන්ගෙන් සමන්විත නියැදියක් මෙම සමීක්ෂණයේදී සම්මුඛ පරීක්ෂණයට භාජනය කරනු ලැබේ. මෙම කාන්තාවන්ගෙන් ඔවුන්ගේ සමාජ ආර්ථික පසුබිම, ඔවුන් බිහි කළ දරුවන්, උපත් පාලන ක්‍රම පිළිබඳව ඔවුන්ගේ දැනුම දරුවන්ගේ සෞඛ්‍ය පිළිබඳ තොරතුරු, AIDS සහ වෙනත් ලිංගිකාශ්‍රිත රෝග පිළිබඳ දැනුම සහ සෞඛ්‍ය වැඩසටහන් හා පවුල් සැලසුම් සම්පාදකයින්ට ප්‍රයෝජනවත් වෙනත් තොරතුරු පිළිබඳ විමසනු ලැබේ.

## 1.1 සමීක්ෂණයේ අරමුණු

ලෝක බැංකුවේ මූල්‍ය ආධාර සහිතව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් මෙම සමීක්ෂණය සිදු කරනු ලැබේ.

1975, 1979, 1982, 1985, 1987, 1993 හා 2000 වර්ෂවලද මීට සමාන සමීක්ෂණ මෙම දෙපාර්තමේන්තුව මගින් පවත්වා ඇත. සමීක්ෂණයේ අරමුණු සංක්ෂිප්ත වශයෙන් පහත අයුරින් දැක්විය හැක.

- ලෝක බැංකුව මගින් සෞඛ්‍ය ක්ෂේත්‍ර සංවර්ධන ව්‍යාපාතිය හරහා දෙන ලද ආධාර යටතේ සිදුකරන ලද සංවර්ධන වැඩසටහන්වල සාර්ථකත්වය මැන බැලීම.
- මෑත කාලීනව ජාත්‍යන්තර වශයෙන් පිළිගත් සහස්‍ර සංවර්ධන දර්ශක (Millennium Development Indicators) සකස් කිරීමට අවශ්‍ය දත්ත ලබා ගැනීම.
- සෞඛ්‍ය හා පවුල් සැලසුම් පිළිබඳ සැලසුම් සකස් කිරීමට අවශ්‍යවන පවුල් සැලසුම් ක්‍රම භාවිතය, දරු උපත්, මව් කිරි දීම, එන්නත් කිරීම, ගර්භනී සායනය, මවගේ හා දරුවන්ගේ සෞඛ්‍ය හා පෝෂණය පිළිබඳ තොරතුරු එක් රැස් කිරීම.
- උපත් අනුපාතිකය, උපත් පාලන ක්‍රම වැනි කරුණුවල කාලීනව සිදුවන වෙනස්කම් සොයා බැලීමට හා ඉහතදී සිදුකළ මෙවැනි සමීක්ෂණ තොරතුරු සමඟ සංසන්දනය කිරීමට.
- AIDS හා වෙනත් ලිංගික රෝග පිළිබඳව කාන්තාවන්ගේ දැනුම මැනීම.
- සෞඛ්‍ය අමාත්‍යාංශයට අවශ්‍යවන අතිරේක තොරතුරු (මැලේරියා වැළැක්වීම සඳහා භාවිතා කරන උපක්‍රම, දුම් පානය කරන්නන් පිළිබඳ තොරතුරු) රැස් කිරීම.

## 1.2 නියැදිය

නියැදියකින් එක් රැස් කරනු ලබන තොරතුරුවල නිවැරදිභාවය හා නියැදියේ සම්පූර්ණත්වය කරුණු කිහිපයක් මත රඳා පවතී. මින් එක් කරුණක් නම් තෝරා ගනු ලබූ නියැදියේ ප්‍රමාණයයි. නියැදියේ ප්‍රමාණය බලාපොරොත්තු වන නිරවද්‍යතාවයක් ලැබිය හැකි වන සේ සංඛ්‍යාන විද්‍යා ක්‍රම අනුව දැනටමත් තීරණය කර ඇත. එබැවින් ඔබ වෙත පවරනු ලබන සෑම නිවාසයකටම ගොස් ඒවායේ සිටින සෑම අදාළ ප්‍රතිචාරකයෙකුගෙන්ම තොරතුරු රැස්කර ගැනීම අත්‍යවශ්‍යවේ. එසේ නොමැතිව නිවාස ඒකක මගහැරුනහොත් හෝ අදාළ ප්‍රතිචාරකගෙන් අවශ්‍ය විස්තර ලබා ගැනීමට නොහැකි වුවහොත් එයින් නියැදියේ ප්‍රමාණය බලාපොරොත්තු වන ප්‍රමාණයට වඩා අඩුවීමෙන් සමීක්ෂණයේ නිරවද්‍යතාවය අඩුවේ.

නියැදි සමීක්ෂණයක නිරවද්‍යතාවය රඳා පවතින තවත් සාධකයක් වන්නේ තෝරාගත් නියැදිය අනිවාර්‍යයෙන්ම අහඹු පදනමක් මත තෝරා ගැනීමයි. මෙයින් අදහස් කරන්නේ මුළු ජනගහනයේ ඇති සියළුම පුද්ගලයන් නියැදියට ඇතුළුවීමට ඇති හැකියාව එක හා සමාන බවයි. මේ නිසා වරක් ගෙදර නොමැති ප්‍රතිචාරකයන් වෙත නැවත පැමිණ තොරතුරු සටහන් කර ගැනීම ඉතාමත් වැදගත් වේ. ඒ අයගේ ගති ලක්ෂණ නිතරම ගෙදර සිටින අයගේ ලක්ෂණ වලට වඩා වෙනස් විය හැකි වේ. උදාහරණයක් ලෙස දරුවන් නොමැති කාන්තාවන් ගෙදරින් පිටත ස්ථානවල වැඩ කිරීමට බොහෝ ඉඩකඩ ඇති අතර එම ප්‍රතිචාරක කාන්තාවන් දහවල් කාලයේ නිවසේ නොමැතිවීම හේතුවෙන් සමීක්ෂණයෙන් අත්හැර ගියහොත් සාරතා ඇස්තමේන්තු සාවද්‍ය විය හැකිය.

නියැදි නිවාස ඒකක තේරීමට ප්‍රථමයෙන් තෝරාගත් සංගණන කාණ්ඩයන්හි අඩංගුවන නිවාස ඒකක සියල්ල ලැයිස්තුගත කර දැනට පවතින තත්වය නිරූපනය වන පරිදි ක්ෂේත්‍රයේදී යාවත්කාලීනකර ඇත. මේ සංගණන කාණ්ඩයන්ගෙන් නියමිත පරිදි තෝරාගත් නිවාස ඒකක ලැයිස්තු (DHS/L1/SAMP/06) ඔබ වෙත සපයා ඇති අතර ඔබ වෙත පවරන සෑම ඒකකයකටම ඔබ විසින් යා යුතුය.

මෙවර සමීක්ෂණයේ නියැදියේ ගෘහ ඒකක සංඛ්‍යාව කලින් සමීක්ෂණයන්ට වඩා විශාලය. එනම් දිස්ත්‍රික් මට්ටමින් ඇස්තමේන්තු සකස් කිරීමට ප්‍රමාණවත් පරිදි ගෘහ ඒකක 25,000 පමණ නියැදියක් සමීක්ෂණයට තෝරා ඇත.

## 1.3 ප්‍රශ්නාවලිය

සමීක්ෂණ ප්‍රශ්නාවලිය කොටස් 2 කින් සමන්විතය.

1. ගෘහ කාණ්ඩ උපලේඛණය (පිටු අංක 1 - 19)
2. පුද්ගල උපලේඛණය (පිටු අංක 20 - 80)

මීට අමතරව පිටු අංක 81 හි ඇති දින දර්ශණය, ප්‍රශ්නාවලියේ දක්වා ඇති උපදෙස් අනුව සම්පූර්ණ කළ යුතු අතර, පිටු අංක 83 ප්‍රශ්නාවලිය සම්පූර්ණ කරන නිලධාරිණියගේ සහ අධීක්ෂක නිලධාරිගේ නිරීක්ෂණ සටහන් කිරීමට වෙන්කර ඇත.

### 1.3.1 ගෘහ කාණ්ඩ උපලේඛණය

මෙම උපලේඛණය A, B, BI හා BII යනුවෙන් කොටස්වලින් යුක්තය. A කොටසෙන් කරනු ලබන්නේ ගෘහ කාණ්ඩයක් තුළ සිටින සියළුම සාමාන්‍ය පදිංචිකරුවන් සහ අමුත්තන් ලැයිස්තුගත කිරීමයි. එයට අමතරව ඔවුන්ගේ නම, ස්ත්‍රී පුරුෂ භාවය, වයස ආදී තොරතුරු කිහිපයක්ද, සමහර වයස් කාණ්ඩවල පුද්ගලයන්ගේ විශේෂ තොරතුරුද එකතු කරනු ලැබේ. මෙම උපලේඛණයෙන් ලබා ගන්නා තොරතුරු කිහිප ආකාරයකට වැදගත් වේ.

1. උපත් අනුපාතිකය, මරණ අනුපාතිකය වැනි අනුපාතික ගණනය කිරීමට
2. පුද්ගල ප්‍රශ්නාවලිය පිරවීමට සුදුසුකම් ලබන කාන්තාවන් තෝරා ගැනීමට
3. නියැදිය පිළිබඳ ඇගයීමට

B කොටසින් ගෘහ ඒකකය සහ පවුල සම්බන්ධව තොරතුරු කීපයක් රැස් කරයි. එනම්, ගෘහ සාමාජිකයින්ගේ සනීපාරක්ෂක තොරතුරු අයිතියේ ස්වභාවය, පිහිටීම මෙන්ම ගෘහ ඒකකයට අයත් උපකරණ පිළිබඳව සාමාන්‍ය තොරතුරුද ලබා ගනී. ගෘහ ඒකකයේ ජීවන තත්වය තක්සේරු කිරීමටද මෙම තොරතුරු උපයෝගී කරගනු ලැබේ. BI හා BII කොටස් වලින් අදාල වයස් කාණ්ඩවල දරුවන් හා කාන්තාවන්ගේ උස, බර මැනීම හා හිමොග්ලොබින් පරීක්ෂාව සිදු කෙරේ.

### 1.3.2 පුද්ගල උපලේඛණය

සම්මුඛ පරීක්ෂණය සඳහා සුදුසුකම් ලබන කාන්තාවන් සහ ඔවුන්ට ඉපදී ඇති දරුවන් පිළිබඳ ඉතා වැදගත් තොරතුරු මෙම උපලේඛණයෙන් එකතු කරනු ලැබේ. ඒවා පහත සඳහන් පරිදි වේ.

- වයස, විවාහක තත්ත්වය, අධ්‍යාපනය, රැකියාව, වැනි මූලික තොරතුරු
- ප්‍රජනන ක්‍රියාවලිය (දරු උපත්)
- උපත් පාලන ක්‍රම පිළිබඳ දැනුම හා භාවිතය
- පෙර හා පසු ප්‍රසව පරීක්ෂාව, ළමා සෞඛ්‍ය, මව්කිරිදීම සහ මවගේ සෞඛ්‍ය
- ප්‍රතිශක්තිකරණය, මවගේ හා දරුවාගේ පෝෂණය
- ලිංගික හැසිරීම් රටාව
- දරුඑල ගැන කැමැත්ත
- සැමියාගේ පසුබිම හා රැකියාව සහ ප්‍රතිචාරකගේ රැකියාව
- ඒඩ්ස් සහ අනෙකුත් ලිංගික ආසාදන හා පිළිකා රෝග පිළිබඳ දැනුම
- ළමයින්ගේ සහ මවගේ උස මැනීම සහ බර කිරීම හා හිමොග්ලොබින් මට්ටම මැනීම.

## 1.4 සම්මුඛ පරීක්ෂක නිලධාරියෙකු ලෙස ඔබේ කාර්යභාරය

මෙම සමීක්ෂණයේදී ප්‍රතිචාරකයාගෙන් තොරතුරු එකතු කරනු ලබන්නේ ඔබ විසිනි. එබැවින් ඔබ වෙත විශාල වගකීමක් පැවරී ඇත. සමීක්ෂණයේ සාර්ථකත්වය රඳා පවතිනුයේ ඔබ විසින් කොතරම් දුරට නිවැරදිව එම තොරතුරු ලබා ගන්නේද යන සාධකය මතය. එබැවින් ඔබගේ වැඩ කොටස ඉතාමත් නිවැරදිව හා වගකීමෙන් යුතුව ඉටු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

සාමාන්‍ය වශයෙන් ඔබගේ කාර්යභාරය පහත සඳහන් පරිදි වේ.

- අධීක්ෂක නිලධාරී විසින් ඔබ වෙත භාර දෙනු ලබන නිවාස ඒකක හඳුනා ගැනීම.
- හඳුනා ගත් නිවාස ඒකකයේ ඇති ගෘහ කාණ්ඩ ගණන නිවැරදිව තීරණය කර ගැනීම.
- මේ එක් එක් ගෘහ කාණ්ඩය සඳහා ගෘහ කාණ්ඩ උපලේඛණයක් සම්පූර්ණ කිරීම.
- සුදුසුකම් ලබන ප්‍රතිචාරකයන් නිවසේ එවෙලේ නොසිටියහොත් නැවත අවස්ථාවක ගොස් ඔවුන් සඳහා උපලේඛන පිරවීම.
- සම්පූර්ණ කරන ලද ප්‍රශ්නවලින් නිසිලෙස සම්පූර්ණ කර ඇති බවට නැවත පරීක්ෂා කර බලා අධීක්ෂක නිලධාරී වෙත භාරදීම.

## 2. සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වීම.

සම්මුඛ පරීක්ෂණයක් සාර්ථක අන්දමින් පැවැත්වීම ඔබ විසින් ප්‍රගුණ කළ යුතු ක්‍රියාවකි. සෑම සම්මුඛ පරීක්ෂණයක් ම එකිනෙකට වෙනස් වන හෙයින් නැවුම් බවකින් හා උනන්දුවෙන් පවත්වා ගෙන යා යුතු වේ. සම්මුඛ පරීක්ෂණ සිදු කිරීම වෙනත් කාර්යයන් මෙන් අත්දැකීමෙන් ම පුරුදු පුහුණු කර ගත යුතු නමුත් එහි ලා වැදගත් වන මූල ධර්මයන් කිහිපයක් සිහි තබා ගැනීම ප්‍රයෝජනවත් වේ.

මෙම පරිච්ඡේදයේ දී ඔබ විසින් ප්‍රතිචාරක සමඟ හොඳ සම්බන්ධතාවයක් ගොඩනඟා ගෙන සම්මුඛ පරීක්ෂණය පවත්වන ආකාරය පිළිබඳව පොදු උපදෙස් කිහිපයක් වෙත ඔබගේ අවධානය යොමු කරවනු ලැබේ.

1. යම් නිවාසයකට ගිය සම්මුඛ පරීක්ෂණ නිලධාරියා සහ ප්‍රතිචාරක එකිනෙකා නොහඳුනන පුද්ගලයන් දෙදෙනෙකි. එබැවින් ප්‍රථමයෙන් ඔබ කළ යුතු කාර්යයක් වන්නේ ප්‍රතිචාරක සමඟ සුහද සම්බන්ධතාවයක් ගොඩ නඟා ගැනීම වේ. ඔබ දැකීමෙන් ප්‍රතිචාරකට ඇතිවන හැඟීම ඇයගෙන් ලබා ගන්නා තොරතුරු කෙරෙහි බලපෑමක් ඇති කරයි. එම නිසා නිවසට ගිය විගස සුහදශීලීව කතා කොට ඔබව පහත සඳහන් ලෙස හඳුන්වා දෙන්න.

   මගේ නම ..................................................................................... . මම පැමිණියේ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවෙන් දීප ව්‍යාප්තව පවත්වනු ලබන ප්‍රජා විද්‍යාත්මක හා සෞඛ්‍ය සමීක්ෂණයට අවශ්‍ය තොරතුරු ටිකක් ලබා ගැනීමට. එයින් පවුල් ජීවිතය හා ළමා සෞඛ්‍ය සම්බන්ධව විස්තර එකතු කරනවා. ඒ තොරතුරු සැලසුම් කටයුතු සඳහා රජයට අවශ්‍ය වෙනවා. කරුණාකර මට ඒ තොරතුරු ලබා ගැනීමට උදව් වන්න.

   අවශ්‍ය වුවහොත් හැඳුනුම්පත හා දෙපාර්තමේන්තුවෙන් ඔබ වෙත සපයා ඇති ලිපිය පෙන්වන්න.

2. සම්මුඛ පරීක්ෂණය පැවැත්වීමේදී ප්‍රතිචාරක අකමැති වන ආකාරයට ප්‍රශ්න නොඅසන්න. ඔබට දැන් වැඩ වැඩිද ? මම අසන ප්‍රශ්න වලට උත්තර දෙන්න පුළුවන්ද ? ආදී වශයෙන් ප්‍රශ්න ඇසුවහොත් ප්‍රතිචාරක සම්මුඛ පරීක්ෂණය ප්‍රතික්ෂේප කිරීමට පුළුවන. එසේ "නැතිව මම ඔබගෙන් ප්‍රශ්න කිහිපයක් අසන්න කැමතියි " යනුවෙන් පැවසීම වඩාත් උචිත වේ.

3. මෙම තොරතුරු එකතු කරන්නේ කුමකටද ? එයින් තමාට හැනියක් වෙයිද ? යන සැකයක් ප්‍රතිචාරකට ඇති වූ බව හැඟී ගියහොත්, එකතු කරගන්නා තොරතුරු ඉතා රහසිගතව තබා ගන්නා බවත්, පුද්ගලයින්ගේ නම් වලින් ඒවා ප්‍රකාශයට පත් නොකරන බවත් අවබෝධ කර දෙන්න.

4. සම්මුඛ පරීක්ෂණය පටන් ගැනීමට පෙර ප්‍රතිචාරක විසින් සමීක්ෂණය කුමක් සඳහාද ? ඒ සඳහා තමන්ව තේරුනේ කෙසේද වැනි ප්‍රශ්න ඇසීමට ඉඩ තිබේ. මෙවැනි කරුණු ඇයට ආචාරශීලීව පහදා දෙන්න.

5. නිතරම ප්‍රතිචාරක අනික් අයගෙන් ඈත් කරගෙන පෞද්ගලිකත්වය ආරක්ෂා වන සේ ඇයගෙන් ප්‍රශ්න අසන්න. ඇය පිළිතුරු දෙන අවස්ථාවේ ඇයගේ ළමයි, ස්වාමිපුරුෂයා හෝ වෙනත් අය ඇය අසළ සිටියහොත් ඇගෙන් සමහර ප්‍රශ්නවලට අවංක, නිවැරදි පිළිතුරු ලබා ගත නොහැකි වනු ඇත. ඔවුන් ඈත් කර ගැනීමේදී උපායශීලී වන්න.

6. බොහෝ ප්‍රතිචාරකයන් ඔබ නිවැරදි යයි සිතන පිළිතුරු දීමට පෙළඹිය හැකි බැවින් ප්‍රශ්න ඇසීමේදී ඒවා සටහන් කර ගැනීමේදී අපක්ෂපාතී විය යුතුය. ප්‍රතිචාරදෙනු ලබන පිළිතුරු හරි හෝ වැරදි බැව් ඇයට ඔබගේ මුහුණේ ඉරියව් වලින් හෝ කට හඬේ උස් පහත් ගතියෙන් හෝ ඇයට ඇඟවිය නොයුතුය. ප්‍රශ්න මාලාවේ ප්‍රශ්නවල වචන ඉතා ප්‍රවේශමෙන් සකසා ඇති අතර එයින් එක් පිළිතුරක් කෙරෙහි විශේෂ මනාපයක් පල නොකෙරේ. ඔබට සම්පූර්න ප්‍රශ්නයම ඇසීමට නොහැකි වුවහොත් එම අපක්ෂපාතී ගතිය බිඳ යැමට පුළුවන. උදාහරණයක් ලෙස (තව) දරුවෙක් ලබා ගැනීමට කැමතිද ? නැත්නම් (තව) දරුවන් උවමනා නැත්ද ? යන්න ගනිමු. ඔබ එහි මුල් කොටස පමණක් එනම් ඔබ (තව) දරුවෙක් ලබා ගැනීමට කැමතිද ? ඇසුවහොත් ප්‍රතිචාරක බොහෝ දුරට ඔව් යන පිළිතුර දීමට පෙළඹිය හැකිය. එම ප්‍රශ්න මාලාවේ සඳහන් පරිදි සම්පූර්ණ ප්‍රශ්නයම ඇසීම වැදගත් වේ. ඇය දෙන පිළිතුරු පැහැදිලි නැත්නම් ඒ ගැන තව ටිකක් පැහැදිලි කළ හැකිද ? වැනි අපක්ෂපාතී ප්‍රශ්න අසා එය නිරවුල් කර ගත යුතු වේ.

7. කිසි විටෙක ප්‍රතිචාරකට පිළිතුරු යෝජනා නොකරන්න. යම් ප්‍රශ්නයකට ප්‍රතිචාරකගෙන් පැහැදිලි පිළිතුරක් නොලැබුණු විටෙක ඔබ යම් අදහසක් යෝජනා කළහොත් ඇය අදහස් කලේ එය නොවුවද බොහෝ විට ඇය එයට එකඟ වීමට ඉඩ තිබේ. එවැනි විටක ප්‍රතිචාරක තුලින්ම නියමිත පිළිතුර ලැබෙන පිරිදි තව දුරටත් විමසා බැලිය යුතු වේ. ප්‍රතිචාරක පවසන ආකාරයට තොරතුරු සටහන් කර ගන්න. ඔබේ අදහසේ හැටියට ඒවා වෙනස් නොකරන්න.

8. කිසිවිටෙක ප්‍රශ්න අසන පිළිවෙල වෙනස් නොකරන්න. ප්‍රශ්නය අවස්ථාවට උචිත ලෙස අදහස වෙනස් නොවන ලෙස ගලපා අසන්න. උදා - : ඔබේ නම කුමක්ද ? යන්න ඔයාගේ නම මොකද්ද ලෙසින් විමසිය හැක. ප්‍රතිචාරකට එම ප්‍රශ්නය වැටහෙන්නේ නැති බව තේරුම් ගියහොත් ප්‍රශ්නය නැවත හෙමින් හා පැහැදිලිව කියවන්න. ඊට පසුත් ඇයට එය තේරුම් නොගියහොත් ප්‍රශ්නයේ අදහස වෙනස් නොවන පරිදි නැවත පැහැදිලි කරන්න.

9. සමහර ප්‍රතිචාරකයන් සම්මුඛ පරීක්ෂණය සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කිරීමට හෝ අසනු ලබන ප්‍රශ්නවලට මම දන්නෙ නැහැ ආදී වශයෙන් පිළිතුරු දීමට පුළුවන. එවැනි අවස්ථාවක ඉතා උපායශීලී වන්න. කරුණු අවබෝධ කර දී ඔවුන්ගෙන් තොරතුරු ලබා ගැනීමට හැකි සෑම උත්සාහයක්ම දරන්න.

10. කාන්තාවක් සමඟ සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වීමේදී ඇයට ගෙදර වැඩ අධික බැවින් යම් යම් බාධා පැමිණිය හැක. එවැනි අවස්ථාවක වේලාව ගැන සිතා කලබල නොවන්න. ඇයට එම අවස්ථාවේදී කිසිම විදියකින් සම්මුඛ පරීක්ෂණයට සහභාගී වීමට නොහැකි බව හැඟී ගියහොත් වෙනත් වේලාවක් යොදා ගන්න.

## 3. ක්ෂේත්‍ර කටයුතු

සමීක්ෂණයේ ක්ෂේත්‍ර කටයුතු කලින් පිළියෙල කර ගත් කාල සටහනක් අනුව සිදු කිරීමට බලාපොරොත්තු වන අතර ඒ අනුව කටයුතු කිරීම වඩාත් වැදගත් වේ. එක් එක් ප්‍රදේශයක් සඳහා සමීක්ෂණ කණ්ඩායමක් පත් කරනු ලැබේ. එක් කණ්ඩායමක් සාමාන්‍යයෙන් සම්මුඛ පරීක්ෂණයක නිලධාරීන් පස් දෙනෙක් හා කිරුම් මිණුම් කටයුතු කරන නිලධාරියකුගෙන්, සහායකයකුගෙන් හා කණ්ඩායම් නායිකාවකගෙන් සමන්විත වේ.

### 3.1 ක්ෂේත්‍ර කටයුතු සඳහා සූදානම් වීම.

#### 3.1.1 ක්ෂේත්‍රයට යෑමේදී අවශ්‍ය දෑ ගෙන යාම.

පහත සඳහන් දෑ ක්ෂේත්‍රයට යන සෑම අවස්ථාවකට ඔබ ළඟ තිබිය යුතුය.

- නියැදි ඒකක ඇතුලත් ලැයිස්තුගත කළ පෝරමය (DHS/L1/06 ආකෘති පත්‍රය)
- තෝරා ගත් නියැදි ඒකක ලැයිස්තුව (DHS/L1/SAMP/06 ආකෘති පත්‍රය)
- අවශ්‍ය තරම් ප්‍රශ්න මාලා
- ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා උපදෙස් පොත
- ඔබගේ හැඳුනුම්පත සහ දෙපාර්තමේන්තු ලිපිය
- පෑන්
- බර හා උස මිණුම් කට්ටලය
- ලුණුවල අයඩීන් පරීක්ෂා කරන ද්‍රව කුප්පිය
- ප්‍රතිචාරකයින්ට පෙන්වීම පිණිස යකඩ හා විටමින් A සාම්පල

### 3.2. නිවාස හඳුනා ගැනීම

ඔබ ක්ෂේත්‍රයට යෑමට පෙර සමීක්ෂණයට භාජනය වන ප්‍රදේශවල සංගණන කාණ්ඩ ලැයිස්තු සංශෝධනය කර ඇත. ඔබට ලැබෙන්නේ එම සංශෝධිත ලැයිස්තුවලින් තෝරාගත් නිවාස ඒකකයන්ය. ඒවා හඳුනා ගැනීමට අවශ්‍ය අංක හා නම් ඔබට කණ්ඩායම් නායිකාව විසින් දෙනු ලැබේ. මීට අමතරව යාවත්කාලීන කරන ලද පෝරමය (DHS.SAMP 5) මගින් නිවසේ පිහිටීම පැහැදිලිව හඳුනාගත හැක. සංගණන කාණ්ඩයේ දළ සිතියමක් ද එහි සටහන් කර ඇත.

#### 3.2.1 නිවාස හඳුනා ගැනීමේදී ඇතිවිය හැකි ප්‍රශ්න

ඉහත සඳහන් පරිදි ඔබ කිසියම් ප්‍රදේශයකට ගිය පසු නොයෙකුත් හේතූන් නිසා අදාල නිවාස සොයා ගැනීමේ දුෂ්කරතා මතුවිය හැකිය. එවැනි අවස්ථා කිහිපයක් හා ඒ අවස්ථාවන්හි ක්‍රියා කළ යුතු ආකාරය පිළිබඳව පහත දැක්වේ.

**(ඒ). අත්හැර දැමූ හෝ හිස් වූ නිවසක්.**

තෝරා ගනු ලැබූ නිවසේ සියි අය දැන් එහි පදිංචි නැති අතරම, වෙනත් කිසිවෙකුත් එහි ඒ අවස්ථාවේ පදිංචිව නොසිටී නම්, එය හිස් නිවසක් ලෙස සැලකිය යුතුය. ඒ බව ප්‍රශ්නාවලියේ ගෘහ කාණ්ඩ උපලේඛණයේ මෙන්ම තෝරා ගත් නියැදි ඒකක ලැයිස්තුවේ (DHS.SAMP 6) හිද සඳහන් කරන්න.

**(බී) තෝරාගත් නිවසක අළුත් පදිංචිකරුවන් සිටින විට.**

තෝරාගත් නිවසක සිටින අය ලෙස සඳහන් නම් ඇති අය එම නිවාස අත්හැර ගොස් සිටින්නට පුළුවන. එහෙත් ඒ වෙනුවට වෙනත් අය පදිංචි වී සිටින්නට පුළුවන. මෙවැනි අවස්ථාවක හොඳින් විමසා බලා එය තෝරන ලද නිවස බවටත්, එහි සිටි අය දැනට එහි පදිංචි නැති බවටත් ඒත්තු යන්නේ නම් නව පදිංචිකරුවන් (දැනට පදිංචිව සිටින්නන්) සඳහා ප්‍රශ්නාවලිය පිරවිය යුතුය. එවැනි අවස්ථාවක දී තෝරා ගත් නියැදි ඒකක ලැයිස්තුවේ (DHS.SAMP 6) ද අදාළ ගෙය වෙනස් කළ යුතු බව මතක තබා ගන්න.

**(සී) ඔබට දී ඇති පරිදි තෝරා ගත් නිවසක අංකය හා ගෘහමූලික නම නොගැලපෙන අවස්ථාවක.**

දී ඇති නිවාස අංකය ක්ෂේත්‍රයේදී හඳුනාගත හැකි නම් ගෘහ මූලික නාමය වෙනස් වුවත් අදාළ අංකය ඇති නිවස සමීක්ෂණය සඳහා තෝරා ගත යුතුයි.

එහෙත් බොහෝ විට නාගරික ප්‍රදේශවල නොව ග්‍රාමීය ප්‍රදේශවල අංක වලින් නිවසක් හඳුනා ගැනීම අපහසු වනු ඇත. එවැනි අවස්ථාවල ගෘහ මූලික නම, එසේම අසළ නිවෙස්වල සිටින අයගේ නාම පිළිවෙල අනුව නිවැරදි නිවස හඳුනා ගන්න.

**(ඩී) කිසියම් නිවසක ගෘහ කාණ්ඩ හෝ පවුල් කිහිපයක් සිටින අවස්ථා.**

කිසියම් පවුල් කාණ්ඩ කිහිපයක් සිටින විට එම ගෘහ කාණ්ඩ සඳහා අංක දී වෙනම ගෘහ කාණ්ඩ උපලේඛණ පිරවිය යුතුය. මෙහිදී ගෘහ කාණ්ඩයක් ලෙස සලකනු ලබන්නේ වෙන් වශයෙන් ආහාර පිස ගන්නා වෙනම පවුල් ඒකකයක් ලෙස ජීවත්වන කිහිප දෙනෙකුටයි.

**(ඊ) ගෘහ මූලික වෙනස් වී ඇත්නම්.**

කිසියම් ගෘහ මූලික කෙනෙක් මිය ගොස් හෝ එම ස්ථානයේ දැනට පදිංචි නැත්නම් දැනට එම නිවසේ පදිංදිව සිටින පුද්ගලයින් ගෘහ කාණ්ඩ උපලේඛණයට ඇතුලත් කළ යුතු අතර දැනට ගෘහ මූලික ලෙස හඳුන්වන තැනැත්තා ගෘහ මූලික ලෙස ගෘහ කාණ්ඩය ලැයිස්තුවේ සටහන් කළ යුතු අතර DHS.SAMP 6 පෝරමයේ ද සඳහන් කරන්න.

**(එෆ්) වසා ඇති නිවසක්.**

කිසියම් නිවසක් සම්පූර්නයෙන්ම වසා ඇත්නම් හා ඔවුන් දින කිහිපයකට (ඔබ එම ප්‍රදේශයේ නැවතී සිටින කාලය තුළ) නොපැමිණෙන බව අසල්වැසියන්ගෙන් ස්ථිර වශයෙන් ම දැන ගත හොත් කිසිවෙක් ගෙදර නැති බව සඳහන් කරන්න.

### 3.3 සම්මුඛ සාකච්ඡාවකින් පසු සම්පූර්ණ කළ ප්‍රශ්නාවලිය නැවත පරීක්ෂා කිරීම.

සම්මුඛ සාකච්ඡාවක් අවසන් කර එම ස්ථානයෙන් පිටවීමට පෙර ප්‍රශ්නාවලිය නිවැරදිව පුරවා ඇත්දැයි පරීක්ෂා කිරීම ඔබගේ වගකීමක් වේ. විශේෂයෙන් පහත සඳහන් කරුණු පරීක්ෂා කර බලන්න.

- සෑම අදාළ ප්‍රශ්නයක්ම අසා ඇති බව
- පිළිතුරු සියල්ල පැහැදිලිව හා නිවැරදිව සටහන් කර ඇති බව
- මඟ හැර යෑමේදී උපදෙස් නිවැරදිව අනුගමනය කර ඇති බව

අඩු පාඩු හා සැක ඇති තැන් ප්‍රතිචාරකගෙන් අවාරශීලීව අසා පැහැදිලි කර ගන්න.

කිසිම විටෙක පිළිතුරු කොළයක ලියාගෙන ප්‍රශ්නාවලියේ පිටපත් නොකරන්න. එසේ පිටපත් කිරීමේදී අමතර වැරදි ඇති විය හැකිය. ප්‍රශ්න මාලාවක පිළිතුරු සටහන් කිරීමේදී යම් වැරැද්දක් සිදුවුවහොත් ඉරි දෙකක් හරහට ඇඳ පැහැදිලි ලෙස අවලංගු කරන්න.

## 4. ප්‍රශ්නාවලිය සම්පූර්ණ කිරීම සඳහා සාමාන්‍ය උපදෙස්

ප්‍රශ්නාවලිය සාර්ථකව පිරවීම සඳහා ප්‍රශ්න අසන ආකාරය. එම ප්‍රශ්නය ඇසීමෙන් බලාපොරොත්තු වන්නේ කුමක්ද ? ප්‍රශ්න අසන විට ඇතිවන ගැටළු නිරාකරණය කර ගත යුතු අයුරු පිළිතුරු නිවැරදිව සටහන් කිරීම. ප්‍රශ්නාවලියේ දී ඇති උපදෙස් අනුගමනය කරන ආකාරය ආදිය පිළිබඳ මනා දැනුමක් ලබා තිබිය යුතුය.

### 4.1 ප්‍රශ්න ඇසීම

ප්‍රශ්න ලියා ඇති ආකාරයටම ඇසීම සමහර විට අපහසුය. උදා : ඔබ යනුවෙන් පටන් ගන්නා ප්‍රශ්න ඔයා යනුවෙන් වෙනස් කර ඇසීම වඩා උචිතය. ප්‍රශ්න ඇසීමේදී එම ප්‍රශ්නය ප්‍රතිචාරකට අවබෝධ කරගත හැකිවන ආකාරයට සෙමින් හා පැහැදිලිව ඇසීමට මතක තබා ගන්න. ප්‍රශ්නය ඇයට පැහැදිලි නොවුවහොත් නැවත වතාවක් එම ආකාරයටම අසන්න. ඒ අවස්ථාවේදීත් එය අවබෝධ නොවූ බව හැඟේ නම් ඇයට පැහැදිලි කරගත හැකි ආකාරයට වචන ගලපා අසන්න. ඒ අවස්ථාවේදී ප්‍රශ්නයේ අර්ථය වෙනස් නොවන ආකාරයට ඇසිය යුතු අතර, ප්‍රශ්න අසන අවස්ථාවේදී ප්‍රශ්නයට අදාළ පිළිතුරු ඇඟවීමට උත්සාහ නොගන්න. සමහර අවස්ථාවලදී සම්පූර්ණ පිළිතුරු ලබා ගැනීම සඳහා තව දුරටත් විමසා බැලීමට (එනම් අමතර ප්‍රශ්න අසා) සිදුවිය හැක. එවැනි අවස්ථාවකදී එම විමසීම් "අපක්ෂපාතී" විය යුතුය. එනම් එවැනි විමසීමකින් පිළිතුර ඉඟි කළ යුතු නොවේ.

### 4.2 පිළිතුරු සටහන් කිරීම.

පිළිතුරු සටහන් කිරීමේදී සැමවිටම නිල් තීන්ත පෑන් පමණක් පාවිච්චි කරන්න. කළු, රතු හෝ කොළ තීන්ත පෑන් පාවිච්චි නොකරන්න. මෙම ප්‍රශ්නාවලියෙහි දෙආකාරයක ප්‍රශ්න තිබේ.

1. කලින් කේත කරන ලද ප්‍රශ්න (Pre Coded)

මෙවැනි ප්‍රශ්න විවිධාකාර වේ.

අ. සමහර ප්‍රශ්න වලදී ප්‍රතිචාරකගෙන් ලැබිය හැකි පිළිතුරු සඳහා අංක හෝ අකුරු දී ඇත. ඔබ විසින් කළ යුත්තේ ප්‍රතිචාරක විසින් දෙන පිළිතුරු අනුව අදාළ කේතය/කේත කව කිරීමයි.

උදා : ප්‍රශ්න අංක 227A, ප්‍රශ්න අංක 311

සමහර විට අදාල කේත තෝරා දී ඇති කොටුවේ සටහන් කළ යුතුය.

උදා : ප්‍රශ්න අංක 407, ප්‍රශ්න අංක 1001

ආ. ප්‍රතිචාරක විසින් සැපයිය හැකි පිළිතුරුවලට කේත දී ඇති අතර එම පිළිතුරු යටතේ වෙනත් යනුවෙන් කොටසක් ද ඇත. ප්‍රතිචාරක විසින් දෙන ලද පිළිතුරු දී ඇති කේත වලට අනුව කව කළ නොහැකි නම් වෙනත් යටතේ ඇති කේත කව කර සපයා ඇති තිත් පේළිය දිගේ ඇය දෙන පිළිතුර සඳහන් කළ යුතුය.

උදා : ප්‍රශ්න අංක 332, ප්‍රශ්න අංක 330, ප්‍රශ්න අංක 1004

## 2. විවෘත ප්‍රශ්න (Open Ended)

මෙහිදී කළ යුත්තේ ප්‍රතිචාරක විසින් දෙන ලද පිළිතුර සපයා ඇති ඉඩ ප්‍රමාණයේ අකුරෙන් ලිවීමයි. සමහර මෙවැනි ප්‍රශ්න සඳහා කොටු තුළ අදාල පිළිතුරු ඉලක්කමෙන් ලිවිය යුතු අතර සමහර ප්‍රශ්න සඳහා අදාල කොටුව තුල " ✔ " ලකුණ යෙදිය යුතුය.

උදා :- ප්‍රශ්න අංක 805, ප්‍රශ්න අංක 802 ඉලක්කමෙන් ලිවිය යුතුය.
ප්‍රශ්න අංක 806, ප්‍රශ්න අංක 811 පිළිතුර අකුරින් ලිවිය යුතුය.

මෙයට අමතරව ප්‍රශ්න අසන ආකාරය වෙනස්වන විශේෂ අවස්ථාවක්ද ඇත. එනම්

### ෆිල්ටර් ලකුණු කිරීම

සම්මුඛ පරීක්ෂන නිලධාරියාට දෙනු ලබන උපදෙස් මෙවැනි ප්‍රශ්නවල දැක්වේ. ඔබ විසින් කළ යුත්තේ අදාල කොටුව තුළ " ✔ " ලකුණ යෙදීමයි.

උදා :- ප්‍රශ්න අංක 801, 701, 704, 503

## 4.3 වැරදි නිවැරදි කිරීම

සෑම විටම පිළිතුර නිවරදිව ලිවීමට හෝ අදාල කේත නිවැරදිව කව කළ යුතුය. යම් අවස්ථාවක ඔබ විසින් ලියන ලද පිළිතුරු හෝ කව කරන ලද කේතය නිවැරදි නොවේ නම් හරහට ඉරි දෙකක් ඇඳීමෙන් එම පිළිතුරු කපා හරින්න. කිසිම විටක මැකීමකට උත්සාහ නොකරන්න.

## 4.4 ප්‍රශ්න මාලාවේ ඇති උපදෙස් පිළිපැදීම.

### 1. මගහැරයාමේ උපදෙස් :

මඟහැරයාමේ උපදෙස් දී ඇත්තේ ප්‍රතිචාරකගෙන් ඇසිය නොයුතු ප්‍රශ්න සඳහය. උදාහරණයක් ලෙස දැනට දරුවකු පිළිසිඳ ගෙන නොමැති කාන්තාවකගෙන් දරුගැබට මාස කීයද ? කියා ඇසිය නොහැක. මඟහැර යාමේ උපදෙස් ගැන නොසිතා ප්‍රතිචාරකගෙන් ඇසිය නොයුතු/නොහැකි ප්‍රශ්න ඇසුවහොත් එය ඔබ කෙරෙහි ඇති විශ්වාසය බිඳී යාමට හේතුවක් විය හැකි අතර නිවැරදි තොරතුරු ලබා ගැනීමට නොහැකි වනවා ඇත. එනිසා දී ඇති මඟහැර යාමේ උපදෙස් ඉතා හොඳින් පිළිපදින්න.

### 2. ෆිල්ටර්ස් :

ප්‍රශ්න අසන ආකාරය ක්‍රමානුකූල කිරීම සඳහාත්, ප්‍රතිචාරකගෙන් ඇසිය නොයුතු ප්‍රශ්න නොඇසීම සඳහාත් මෙවැනි ෆිල්ටර් ඇතුලත් කර ඇත. එවැනි අවස්ථාවකදී බොහෝ දුරට කරන්නේ පසුගිය ප්‍රශ්නයක් දෙස බලා ගොස් ඒ අනුව අදාළ කොටුව තුළ " ✔ " ලකුණ යෙදීමයි. සෑම විටම එහි සඳහන් කර ඇති ප්‍රශ්නය තිබෙන පිටුවට ගොස් එම ප්‍රශ්නය දෙස බලා " ✔ " ලකුණ යොදන්න.

උදා :- ප්‍රශ්න අංක 503, 404, 801

**4.5 සම්පූර්ණ කරන ලද ප්‍රශ්නාවලිය නැවත පරීක්ෂා කිරීම.**

ප්‍රශ්නාවලිය පිරවීම සම්පූර්ණ කළ විගස එය නිවැරදිව පුරවා තිබේදැයි නැවත පරීක්ෂා කර බලන්න. ප්‍රතිචාරක ළඟ සිටියදීම එය කළ යුතුයි. ප්‍රතිචාරකගෙන් ඇසිය යුතු සියළු ප්‍රශ්න අසා තිබෙනවාද ? මගහැර යාමේ උපදෙස් නිසි ලෙස පිළිපැද තිබෙනවාද ? යන්න නැවත බලන්න. වැරදි නම් ඒ සියල්ල එම ස්ථානයෙන් පිටවීමට පෙර නිවැරදි කර ගන්න.

## 5. ගෘහ කාණ්ඩ උපලේඛණය සම්පූර්ණ කිරීම.

### 5.1 හඳුනාගැනීමේ තොරතුරු සම්පූර්ණ කිරීම.

ගෘහ කාණ්ඩ උපලේඛණයේ එක් පරමාර්ථයක් වන්නේ සමීක්ෂණය සඳහා සුදුසුකම් ලබන ප්‍රතිචාරකයන් හඳුනාගැනීමය. ගෘහ කාණ්ඩ උපලේඛණය A සහ B නමින් කොටස් දෙකකින් ද B(I) සහ B(II) නමින් අනු කොටස් දෙකකින්ද සමන්විත ප්‍රශ්නමාලාවකි. එහි මුල් පිටුව හඳුනා ගැනීමේ විස්තර හා විමර්ශක හමුවීම් සඳහාත්, A කොටසින් ගෘහ කාණ්ඩයේ සාමාන්‍ය පදිංචි හා දැනට සිටින අමුත්තන් පිළිබඳ තොරතුරු ලබා ගැනීමටත් වෙන්කර ඇත. B කොටසින් විමසන්නේ එම ගෘහ ඒකකය සාදා ඇති ද්‍රව්‍ය පිළිබඳවත් එහි පදිංචිකරුවන් පානීය ජලය ලබා ගන්නා මාර්ගය සහ වැසිකිළි භාවිතය පිළිබඳවත් ප්‍රශ්න කිහිපයකි. B(I) සහ B(II) කොටස් වලදී සුදුසු පුද්ගලයින්ගේ උස, බර, හිමොග්ලොබින් මිණුම් ලබා ගනී.

අධීක්ෂණ නිලධාරින්හට ලබාදී ඇති, එක් එක් සංගණන කාණ්ඩයට අදාල නියැදියට තේරුණු නිවාස ඒකක 10 ඇතුලත් කර ඇති පෝරමය (DHS/L1/SAMP/06) ට අනුව හඳුනාගැනීමේ තොරතුරු ඇතුලත් කළ යුතුය.

- තවද විශේෂිත කාණ්ඩය තුළ ගෘහ ඒකක අංකය සඳහා තබා ඇති කොටු 2 හිස්ව තබන්න. එය කාර්යාලීය ප්‍රයෝජනය සඳහා වෙන්කර ඇත.
- එමෙන්ම සංශෝධනය කරනු ලැබුවේ F1 ලේඛණයෙන්ද, නැත්නම් RF1 ලේඛණයෙන්ද හෝ අන්තර්කාලීන නිවාස ලැයිස්තුවෙන්ද යන්න (කේතයන් 1 හෝ 2 හෝ 3) DHS/L1/SAMP/06 පෝරමයෙහි සඳහන් කර ඇත. ඒ අනුව අදාල කේත අංකය කොටුව තුළ සඳහන් කරන්න.
- නිවාස ඒකකය සුනාමියට අසුවී ඇති හෝ නැති බව හඳුනා ගත යුතුය. ඉහත RF1 = 2 හෝ අන්තර් කාලීන = 3 කට විය යුතුය. සුනාමි ප්‍රදේශයේ නිවාසයක් වුවත් සුනමි ආපදා නොමැති නිවාස තිබිය හැකි බැවින් සමීක්ෂණයට යන නිවාසයට ගොස් විමසා බලා අදාල කේතය 1 හෝ 2 ඉදිරියෙන් දී ඇති කොටුව තුළ සටහන් කරන්න. නිවස කැඩී ගොස් නැතත් මුලු නිවසම හෝ නිවෙසින් කොටසක් මුහුදු ජලයට යටවුනා නම් එයද සුනාමි ආපදාවට අයත් වූ එකක් ලෙස සලකන්න.
- ගෘහ කාණ්ඩයක් යනු වෙන වෙනම උයා පිහාගෙන කන පවුලක් වේ. නියැදියට තේරී ඇති නිවාස තුළ වෙන වෙනම උයා පිහාගෙන කන පවුල් 2 ක් තිබේ නම් ගෘහ කාණ්ඩ සංඛ්‍යාව 2 ක් වේ. නිවාස ඒකකය තුල ඇත්තේ එක් ගෘහ කාණ්ඩයක් නම් 1 ද, 2 ක් නම් මුල් උපලේඛණයේ 1 ද , දෙවැනි උපලේඛණයේ 2 ද සඳහන් විය යුතුය. එක් එක් ගෘහ කාණ්ඩයට අදාල ගෘහ මූලිකයා කවුරුන්දැයි විමසා ගෘහමූලිකයාගේ නම ලියන්න.

මෙම පිටුවේ ඉතිරි කොටස ගෘහ කාණ්ඩ උපලේඛණය සම්පූර්ණ කළ පසු නැවත වරක් සම්පූර්ණ කළ යුතුයි.

## 5.2 A - කොටස

### 5.2.1 ගෘහ කාණ්ඩයේ සාමාන්‍ය පදිංචිකරුවන් හා අමුත්තන් ඇතුලත් කිරීම.

| |
|---|
| **නිවාස ඒකකයට අදාල ගෘහ ඒකක ගණන හඳුනාගෙන එක් එක් ගෘහ කාණ්ඩයන් සඳහා වෙන වෙනම උපලේඛණ පුරවන්න.** |

**1. ගෘහ ඒකකයේ සාමාන්‍ය පදිංචිකරුවන්**

සාමාන්‍ය පදිංචිය යනුවෙන් අදහස් කරන්නේ එම පුද්ගලයා සතියේ වැඩි කාලයක් පදිංචිව සිටින ස්ථානයයි. පදිංචි ස්ථාන එකකට වඩා ඇති පුද්ගලයකු වෙනුවෙන් ඔහුගේ සාමාන්‍ය පදිංචි ස්ථානය ලෙස සලකන්නේ රැකියාවට හෝ පාසලට යාම සඳහා සතියේ වැඩි කාලයක් පදිංචිව සිටින ස්ථානයයි. එය ස්ථිර පදිංචි ස්ථානයම විය යුතු නැත.

දිගු කලක් පිටරට ගොස් සිටින හෝ හමුදා සේවය වැනි රැකියාවල යෙදී සිටින අයද සාමාන්‍ය පදිංචියට ඇතුලත් නොකරන්න.

**2. තාවකාලිකව ගෘහයෙන් බැහැරව ගිය පුද්ගලයන්**

තවද ගෘහ ඒකකයේ සාමාන්‍ය පදිංචිකරුවෙක් රාත්‍රී සේවය නිසා නිවසින් බැහැරව සිටින අය අසල නිවසක මළ ගෙයක් හෝ විශේෂ සිද්ධියක් නිසා තමාගේ ගෘහයේ නිදා නොගෙන අසළ ගෙදරක ගතකළ අය සහ හදිසි අවශ්‍යතාවයක් නිසා (උදා: රෝගී වූ අයෙක් රෝහල් ගත කිරීම සඳහා රෝහලට යාමට සිදුවී පෙර දින රාත්‍රියේ තමාගේ ගෙදර ගත නොකළත් එම පුද්ගලයන්ද තාවකාලිකව නිවසින් බැහැරව ගිය පුද්ගලයින් ලෙස සලකා ගෘහ කාණ්ඩ උපලේඛණයේ ඇතුලත් කළ යුතුය.)

**3. පවුලේ සාමාජිකයින් නොවන නමුත් සාමාන්‍යයෙන් ගෘහ ඒකකයේ පදිංචි ගෘහ සේවකයන් නවාතැන්කරුවන් හෝ යහළුවන්**

මෙම ගෘහ ඒකකයේ සාමාජික නොවන නමුත් එහි සාමාන්‍යයෙන් පදිංචි වී සිටින ගෘහ සේවකයන් ටික කාලයක් මෙම නිවසේ ගත කිරීමට පැමිණ සිටින ඥාතීන්, හිතවතුන්, නිවසේ ආහාර පාන ගන්නා බෝඩින්කරුවන් ද ගෘහ කාණ්ඩ උපලේඛණයට ඇතුලත් කළ යුතුය.

**4. සාමාන්‍යයෙන් පදිංචි නොවන පවුලේ සාමාජිකයන් හා රාත්‍රිය ගෘහයේ ගත කළ අමුත්තන්**

සාමාන්‍යයෙන් මෙම ස්ථානයේ පදිංචි පවුලේ සාමාජිකයෙක් සමීක්ෂණයට යන අවස්ථාවේ හා පෙරදින රාත්‍රියේ මෙහි සිටියා නම් එම පුද්ගලයාගේ නම ද ඇතුලත් කරන්න. යම් කිසි පුද්ගලයෙක් පවුලේ සාමාජිකයෙක් නොවුනත් යම් කිසි කටයුත්තකට මෙම ගෘහයට පැමිණ පෙර දින රාත්‍රිය ඇතුළු දින කිපයක් එහි ගත කළා නම් සහ එම පුද්ගලයා ඔබ ක්ෂේත්‍රයේ රැඳී සිටින කාලය තුළ එම ගෘහයේම රැඳී සිටී නම් එම පුද්ගලයන්ට පෙර දින රාත්‍රිය ගෘහයේ සිටිය අමුත්තෙක් ලෙස සලකා එම පුද්ගලයාව ගෘහ කාණ්ඩ උපලේඛණයට ඇතුලත් කළ යුතුය.

**02 තීරය සාමාජිකයින් ලැයිස්තු ගත කිරීම**

මුලින්ම ගෘහ මූලිකයාගේ නම අසා ලියාගන්න. ගෘහ මූලික සැලකිය යුත්තේ ගෘහ ඒකකය විසින් ගෘහ මූලික ලෙස පිලිගන්නා තැනැත්තායි. ඔහු/ඇය වයස අනුව වැඩිමහල් හෝ ගෘහ ඒකකයට ආදායම උපයන තැනැත්තා විය හැක. ගෘහ මූලික ඇතුලත් කර ගත් පසු 3, 4, 5, 6 තීරු පුරවා ඉන් පසුව පහත සඳහන් පිළිවෙලට අනිකුත් සාමාජිකයින් ඇතුලත් කරන්න.

- ගෘහ මූලිකයාගේ බිරිද/සැමියා
- ගෘහ මූලිකයාගේ අවිවාහක දරුවන්ගේ නම් (වැඩිමහල් දරුවාගෙන් පටන් ගන්න) ඔවුන්ද මෙහි සාමාන්‍ය පදිංචිකරුවන් විය යුතුය.
- ගෘහ මූලිකයාගේ විවාහක දරුවන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් (මොවුන් මෙම ගෘහ ඒකකයේ සාමාන්‍ය පදිංචිකරුවන් විය යුතුය.)
- මෙම ගෘහ ඒකකයේ සිටින ගෘහ සේවකයින්, ලැගුම්ගන්නන් හා නවාතැන්කරුවන්ගේ නම්
- ඊයේ රාත්‍රියේ මෙම ගෘහ ඒකකයේ නිදාගත් අමුත්තන්ගේ නම්

| **පුද්ගල උපලේඛණය පුරවන සියළුම අය ගෘහ කාණ්ඩ උපලේඛණයේ ඇතුළත් විය යුතුයි.** |
|---|

**පුද්ගල උපලේඛණය පිරවීමට සුදුසු කාන්තාවන් හඳුනා ගැනීම.**

ඔබ විසින් ගෘහ කාණ්ඩ උපලේඛණය පුරවනු ලැබූ සෑම නිවසකම සාමාන්‍යයෙන් පදිංචි අයගෙන් පෙර දින රාත්‍රිය එම නිවසේ ගත කළ වයස අවුරුදු 15-49 (50 ට අඩු) අතර කවදා හෝ විවාහක ස්ත්‍රීන් මෙම සමීක්ෂණයේදී පුද්ගල උපලේකණය සඳහා සුදුසුකම් ලබයි. එම නිවසෙහි සාමාන්‍යයෙන් පදිංචි කාන්තාවන් මෙන්ම, ඉහත අවශ්‍යතා සපුරන අමුත්තන් (කාන්තාවන්) ද පුද්ගල උපලේඛණය පිරවීම සඳහා සුදුසු වන බව මතක තබා ගත යුතුයි.

මෙහිදී තව දුරටත් පැහැදිලි කරගත යුතු කරුණු කීපයකි. එනම්,

- නිවසේ සාමාන්‍යයෙන් පදිංචි නොවන එහෙත් පෙර දින රාත්‍රිය එම නිවසේ ගත කළ ඒ අවස්ථාවේදීත් එහි සිටින අය ගෘහ කාණ්ඩ උපලේඛණයේ සටහන් විය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා අවශ්‍ය අයකු සේ සුදුසුකම් සැපිරේ නම් පුද්ගල උපලේඛණයද පිරවිය යුතුය.
- නිවසේ සාමාන්‍යයෙන් පදිංචි අයෙකු පෙර දින රාත්‍රියේ නිවසේ නොසිටියද ඒ තැනැත්තා අනිවාර්යයෙන් ගෘහ කාණ්ඩ උපලේඛණයට ඇතුලත් කළ යුතු වේ.
- නිවසේ සාමාන්‍යයෙන් පදිංචි අයෙකු රාත්‍රියේ රැකියාව සඳහා හෝ වෙනත් හේතූන් නිසා පෙර දින රාත්‍රියේ නිවසේ නිදා නොගෙන දැන් ආපසු පැමිණ ඇත්තේ නම් සම්මුඛ පරීක්ෂණය සඳහා අවශ්‍ය අනෙකුත් අවශ්‍යතා සපිරේ නම් ඇය සඳහා පුද්ගල උපලේඛණයක්ද පිරවිය යුතුය.

මෙම කරුණු කීපය පහත දැක්වෙන සටහනෙන් වඩාත් පැහැදිලිව දැක්විය හැක. එය හොඳින් කියවා වටහා ගන්න.

## ප්‍රතිචාරකයන් හඳුනා ගැනීමේ සටහන

| | | |
|---|---|---|
| සාමාන්‍ය පදිංචිය ඇති හෝ නැති පෙර දින රාත්‍රියේ නිවසේ සිටි අය | → ගෘහ කාණ්ඩ උපලේඛණයේ ඇතුලත් කරන්න. | |
| සාමාන්‍ය පදිංචිය ඇති වයස අවුරුදු (15-49) අතර කවදා හෝ විවාහ වූ කාන්තාවන් (තීරු 5 = 1, 6 = 1) | පෙරදින රෑ නිවසේ සිටියා සමීක්ෂණයට යනවිට සිටියේ නෑ | → නැවත වතාවක් ගොස් පුද්ගල උපලේඛණ පුරවන්න. 11 තීරයේ පේලි අංකය කව කරන්න. |
| | පෙරදින රෑ නිවසේ සිටියා සමීක්ෂණයට යනවිට සිටියා | → පුද්ගල උපලේඛණ පුරවන්න. 11 තීරයේ පේලි අංකය කව කරන්න. |
| සාමාන්‍ය පදිංචිය ඇති වයස අවුරුදු (15-49) අතර කවදා හෝ විවාහ වූ කාන්තාවන් (තීරු 5 = 1, 6 = 2) | පෙරදින රෑ නිවසේ සිටියේ නෑ සමීක්ෂණයට යනවිට සිටියා | → පුද්ගල උපලේඛණ පුරවන්න. 11 තීරයේ පේලි අංකය කව කරන්න. |
| | පෙරදින රෑ නිවසේ සිටියේ නෑ සමීක්ෂණයට යනවිට සිටියේ නෑ ඔබ ක්ෂේත්‍රයේ සිටින කාලය තුලදී නැවත ඇයට මුණ ගැසිය නොහැකි නම් | → 11 තීරයේ පේලි අංකය කව කරන්න. පුද්ගල උපලේඛණ පිරවිය නොහැක. |
| **සාමාන්‍ය පදිංචිය නැති** වයස අවුරුදු (15-49) අතර කවදා හෝ විවාහ වූ කාන්තාවන් (තීරු 5 = 2, 6 = 1) | පෙරදින රෑ නිවසේ සිටියා සමීක්ෂණයට යනවිට සිටියා | → පුද්ගල උපලේඛණ පුරවන්න. 11 තීරයේ පේලි අංකය කව කරන්න. |
| | පෙරදින රෑ නිවසේ සිටියා සමීක්ෂණයට යනවිට සිටියේ නෑ ඔබ ක්ෂේත්‍රයේ සිටින කාලය තුලදී එම කාන්තාව එම ගෘහ ඒකකයේ රැඳී සිටිනවා නම් | → පුද්ගල උපලේඛණ පුරවන්න. 11 තීරයේ පේලි අංකය කව කරන්න. |

**03 තීරය ගෘහ මුලිකයාට ඇති නෑදෑකම**

මෙහිදී ගෘහ මුලික සඳහා මෙය 01 කේතය ලෙස සටහන් කළ යුතු අතර අනෙකුත් සාමාජිකයන් සඳහා අදාළ කේත පහත දක්වා ඇති පරිදි සඳහන් කරන්න.

**04 තීරය ස්ත්‍රී පුරුෂ භාවය**

මෙහිදී විමසන්නේ ගෘහ කාණ්ඩ උපලේඛණයට ඇතුලත් කළ අයගේ ස්ත්‍රී/පුරුෂ භාවයයි. අදාළ කේතය සටහන් කරන්න.

### 05 තීරය සාමාන්‍යයෙන් පදිංචි මෙහිද ?

ගෘහ මූලික සඳහා සාමාන්‍ය පදිංචිය අනිවාර්යයෙන්ම කේත අංක 1 විය යුතුයි. මෙම ඡේදයේ මුලින් දක්වා ඇති අර්ථ දැක්වීම අනුව සාමාන්‍ය පදිංචිය පුද්ගලයින් නිවැරදිව හඳුනා ගෙන ලැයිස්තු ගත කළා නම් ඔවුන් සියලු දෙනා සඳහා සාමාන්‍ය පදිංචිය කේතය 1 විය යුතුයි. මෙහි කේත 2 විය හැක්කේ පෙර දින රාත්‍රිය මෙහි ගත කළ අමුත්තන් සහ ගෘහ ඒකකයේ සාමාන්‍ය පදිංචිය නොමැති සාමාජිකයෙක් වුවත් සමීක්ෂණයට යන අවස්ථාවේ නිවසට පැමිණ සිටි හා පෙර දින රාත්‍රියේ මෙහි ගත කළ පුද්ගලයින් සඳහාය.

### 06 තීරය ඊයේ රාත්‍රියේ මෙහි සිටියාද ?

උපලේඛණයට ඇතුලත් කල සියළුම පුද්ගලයන් හා අමුත්තන් ඊයේ රාත්‍රියේ මෙහි ගත කළාද / යන්න විමසා දැනගෙන අදාල කේතය කව කරන්න. ඔවුන් පිළිබඳ මුලින් විස්තර දක්වා ඇත.

### 07 තීරය/08 තීරය උපන් දිනය හා වයස

අදාල පුද්ගලයාගේ උපන් අවුරුද්ද හා මාසය හැඳුනුම්පත හෝ වෙනත් ලිඛිත ලියවිල්ලක් මගින් නිවැරදිව සටහන් කරන්න. එවැනි ලියවිල්ලක් නොමැති නම් හැකි තරම් දුරට පුද්ගලයාගේ ජීවිතයේ අනිකුත් සිදුවීම් (විවාහ වූ වයස, පළමු දරුවාගේ ඉපදීම) හෝ පසුගිය වැදගත් සිදුවීම් අනුව හැකි තරම් දුරට ඇස්තමේන්තු වයසක් ලබා ගන්න. වර්ෂය පමණක් දැනගත්තත් මාසය නොදනී නම් මාසය සඳහා 00 යොදන්න. පසුගිය උපන් දිනයට සම්පූර්ණ වූ වයස 8 තීරයේ අදාල කොටුවල යොදන්න. වයස අවුරුදු 1 ට අඩු නම් 00 ද අවු. 96 ට වැඩි නම් 96 ද කිසිසේත්ම නොදනී නම් 99 ද සඳහන් කරන්න. (මෙහිදී වයස් නිශ්චායක වගුව අනුව නිවැරදි වයස ඇස්තමේන්තු කළ හැක)

**මෙතැන් සිට අති තීරුවල වයස් කාණ්ඩ බලා සම්පූර්ණ කරන්න. අදාල නොවන්නේ නම් තීරු හිස්ව තබන්න.**

### 09 තීරය විවාහක/අවිවාහක තත්වය

පුද්ගලයා වයස අවුරුදු 10 ට හෝ ඊට වැඩි නම් දී ඇති කේත අනුව අදාල කේතය කොටුව තුළ ලියන්න. මෙහි 5 කේතය යොදා ඇත්තේ ලියාපදිංචි කර ඇති නමුත් තවම එකට ජීවත් නොවන අවස්ථාවන් සඳහාය.

### 10A, 10B තීර රෝගී පුද්ගලයින්

මෙහි දක්වා ඇති රෝගවලට පසුගිය මාස 3 ක් තරම් කාලයකදීවත් ප්‍රතිකාර ලබා තිබේ නම් හා දැනටත් ප්‍රතිකාර ලබමින් සිටින්නේ නම් 10A තීරයේ 1 කව කර 10B තීරයේ රෝගයට අදාල කේතය/කේත කව කරන්න. එක් පුද්ගලයකුට රෝග කිපයක් ඇත්නම් අදාල සියළු කේත කව කරන්න.

11 තීරය සුදුසු බව - 5 හෝ 6 තීරුවේ 1 යෙදූ සහ අවුරුදු 15 - 49 ත් අතර කවදා හෝ විවාහක සියළුම කාන්තාවන්ගේ පේළි අංකය කව කරන්න.

පුද්ගල උපලේඛණය සම්පූර්ණ කිරීමට සුදුසු ප්‍රතිචාරක වන්නේ මෙම ගෘහ ඒකකයේ සාමාන්‍යයෙන් පදිංචි හෝ සමීක්ෂණ දිනට පෙර දින රාත්‍රියේ මෙම ගෘහ කාණ්ඩයේ නිදාගත් වයස අවුරුදු 15 - 49 (අවු. 50 ට අඩු) අතර කවදා හෝ විවාහක කාන්තාවන් වේ. එවිට ඔවුන්ගේ පේළි අංකය කව කිරීමට පලමු පහත අවශ්‍යතා සම්පූර්ණ වී ඇත්දැයි බලන්න.

තීරු අංක 4 = 2 හා
තීරු අංක 5 = 1 හෝ තීරු අංක 6 = 1 සහ
තීරු අංක 8 = 15 - 49 හා (අවු. 50 ට අඩු)
තීරු අංක 9 = 1 හෝ 2 හෝ 3

ඉහත අවශ්‍යතා සම්පූර්ණ කරන සියලු කාන්තාවන් සඳහා අදාල පේළි අංකය කව කරන්න.

12 තීරය 2001 ජනවාරි හෝ ඊට පසු ඉපදුනු දරුවන්ගේ පේළි අංක

8 තීරයේ උපන් දිනය අනුව 2001 ජනවාරි හෝ ඊට පසු ඉපදුනු දරුවන්ගේ පේළි අංක කව කරන්න.

13 තීරය හා 14 තීරය අවුරුදු 5 හෝ ඊට වැඩි පුද්ගලයින් සඳහා කවදා හෝ ලද පාසල් අධ්‍යාපනය කවදා හෝ පාසල් ගොස් තිබෙනවාද ?

පුද්ගලයාගේ සම්පූර්ණ වූ වයස අවුරුදු 5 හෝ ඊට වැඩි නම් (වයස් නිශ්චායක වගුව අනුව) ඔහු කවදා හෝ පාසල් ගොස් ඇත්දැයි විමසන්න. සමත්ව ඇති ඉහළම අධ්‍යාපන මට්ටම අනුව පිටුවෙහි අග දී ඇති කේතයන්ගෙන් සුදුසු කේතය කොටු දෙකෙහි සඳහන් කරන්න. උපාධිය හෝ ඊට ඉහළ අධ්‍යාපනය ලත් (පශ්චාත් උපාධි) සියළුම දෙනා සඳහා 14 කේතය යොදන්න. කෙදිනකවත් පාසැල් ගොස් නැත හෝ නොදනී බව පැවසුවහොත් ප්‍ර. 20 ට යන්න. 13 තීරයේ ඔව් කියා 14 තීරයට නොදනී නම් 14 තීරයට 19 යොදන්න.

15 තීරය 2006 වසර තුළ කෙදිනක හෝ පාසල් හෝ පෙර පාසල් ගියාද ?

පුද්ගලයාගේ වර්තමාන වයස අවුරුදු 5 - 22 (වයස් නිශ්චායක වගුව අනුව) අතර නම් ඔහු / ඇය 2006 වසර තුළදී පාසල් ගියාද ? යන්න විමසන්න. ඔව් නම් 1 හා නැතිනම් හෝ නොදනී නම් ප්‍රශ්න අංක 18 ට යන්න.

16 තීරය පසුගිය ලිත් සතිය තුල දින කීයක් පාසල් ගියාද ?

15 තීරයේ 1 කේත කල පුද්ගලයින්ගෙන් මෙම ප්‍රශ්නය අසන්නේ පසුගිය ලිත් සතියේ පාසල් ගිය දින ගණන දැන ගැනීම සඳහාය. පසුගිය සතියේ පාසල් ගොස් නැත්නම් 0 යොදන්න. අදාල දින ගණන කොටුවේ සඳහන් කරන්න. නිවාඩු කාලය නිසා පාසල් නොගියේ නම් '9' හා දින ගණන නොදනී නම් '8' යොදන්න.

17 තීරය	**මෙම පාසල් වර්ෂය තුල පුද්ගලයා සිටියේ/සිටින්නේ කුමන ශ්‍රේණියකද ?**

මෙම අවුරුද්දේ පුද්ගලයා සිටින ශ්‍රේණිය අසා දී ඇති කේත අනුව අදාල කේතය කොටු දෙකෙහි ලියන්න.

18 තීරය	**2005 වර්ෂයේ කෙදිනක හෝ මෙම පුද්ගලයා පාසල් / පෙර පාසල් ගියාද ?**

කලින් වසර තුල කෙදිනක හෝ පුද්ගලයා පාසල් ගියාද / නැද්ද යන්න විමසා ඔව් නම් 1 හෝ නැත නම් 2 ද නොදනීනම් 8 ද කව කරන්න. 1 කව කල අයගෙන් ඊළඟ ප්‍රශ්නය අසන්න. නැත නම් 20 ට යන්න.

19 තීරය	**එම වසරේ සිටියේ කුමන ශ්‍රේණියකද ?**

කලින් වසර තුල අධ්‍යාපනය ලැබූ ශ්‍රේණිය මෙයින් විමසනු ලැබේ. පෙර පාසල් ගියා නම් 88 යොදන්න. නොදනී නම් 19 යොදන්න.

20, 21 තීර	**0-17 අතර දරුවන්ගෙන් මව ජීවත්වනවාද ?**

වයස 0-17 අතර දරුවෙක් (වයස් නිශ්චායක වගුව අනුව) නම් ඔහු/ඇය බිහි කළ මව ජීවත් වන්නේද යන්න විමසා අදාල කේතය කව කරන්න. ඇය ජීවත්ව නැත හෝ නොදනී නම් 22 ට යන්න. ජීවත් වන්නේ මේ නිවසේ නම් අදාල පේළි අංකය 21 තීරයේ සදහන් කරන්න. ඇය මෙම නිවසේ නැති නම් අදාල තීරයේ 00 සදහන් කරන්න.

22, 23 තීර	**පියා ජීවත්ව සිටීද ?**

ඉහත වයසේ දරුවෙක් නම් පියා ජීවත්ව සිටී නම් 22 තීරයේ 1 කේතය කව කරන්න. නැත හෝ නොදනී නම් 24 තීරයට යන්න. පියා මේ නිවසේ ජීවත්වන්නේ නම් අදාල අංකය කොටුව තුල ලියන්න. නැතිනම් 00 යොදන්න.

24 තීරය	**රුබෙල්ලා එන්නත ලබා ගෙන තිබේද ?**

වයස අවුරුදු 11 - 44 අතර (වයස් නිශ්චායක වගුව අනුව) සියළුම කාන්තාවන්ගේ පමණක් රුබෙල්ලා එන්නත හෙවත් ජර්මන් සරම්ප සදහා එන්නත ලබා තිබේදැයි විමසා 24 වන තීරුවේ අදාල කේතය සටහන් කළ යුතුය. රුබෙල්ලා එන්නතට ජර්මන් සරම්ප එන්නත යයි ද පවසන බැවින් රුබෙල්ලා නම අසා නැතැයි පවසුවහොත් ජර්මන් සරම්ප සදහා එන්නත ලබා තිබේදැයි විමසන්න. එන්නත ලබා තිබෙන බව හරියටම දන්නවා නම් 1 ද, එන්නත ලබා නැති බව හරියටම දන්නේ නම් 2 ද එන්නත ලබා තිබේදැයි හරියටම දන්නේ නැත්නම් 3 ද කව කරන්න.

25 තිරය අවු. 5 - 17 අතර දරුවන් සඳහා
(නම) ට පාසල් පොත් තිබෙනවාද ?

ඉහත වයස් කාණ්ඩයේ (වයස් නිශ්චායක වගුව අනුව) දරුවාගේ අධ්‍යාපනයට අවශ්‍ය මූලික අවශ්‍යතාවයක් වන පාසල් පොත් තිබෙනවාද යන්න දැන ගැනීම මෙහි අරමුණයි. ප්‍රමාණවත් තරමින් ඇත්නම්1 ද ප්‍රමාණවත් තරමින් නොමැති නම් 2 ද පොත් නැති නම් හෝ පාසල් නොයන්නේ නම්3 ද නොදනී නම් 4 ද අදාල කොටුවේ සඳහන් කරන්න.

26 තිරය නම ට සපත්තු කුට්ටමක් හෝ සෙරෙප්පු කුට්ටමක් තිබෙනවාද ?

අදාල කේතය කව කරන්න.

27 තිරය නිල ඇඳුම් 2 ක් වත් තිබෙනවාද ?

ප්‍රශ්නය අසා අදාල කේතය කව කරන්න.

28 තිරය 2001 ජනවාර් හෝ ඊට පසු ඉපදුනු දරුවන් සඳහා උප්පැන්න සහතිකයක් තිබෙනවාද ?

අදාල වයසේ දරුවන්ගේ උප්පැන්න සහතිකය ඔවුන්ගේ අනාගත කටයුතු සඳහා ඉතා වැදගත් ලියවිල්ලකි. උප්පැන්නයක් නැතිවීම දරුවකුගේ සියළු අයිතිවාසිකම් සීමාවීමට හේතු වේ. එම නිසා මෙම ප්‍රශ්නය ඇසීම මගින් දරුවකුගේ අනාගත සුරක්ෂිතභාවය පිළිබඳ විමසීමක් කරනු ලබන අතර ප්‍රතිචාරක විසින් පිළිතුරු දෙන පරිදි සුදුසු කේතය කොටුව තුළ ලියන්න. උප්පැන්නය නැතිවුවත් ලියාපදිංචි කළ නොකළ බව විමසීම කල යුතුවේ. ලියාපදිංචි කර ඇත්නම් එම අංකය සහිත රිසිට්පතක් පුද්ගලයාට ලබා දී ඇත.

## 5.2 B කොටස

| |
|---|
| ගෘහ කාණ්ඩ එකකට වඩා ඇත්නම් එක් එක් ගෘහ කාණ්ඩය සඳහා B කොටස වෙන වෙනම පිරවිය යුතුය. |

### B 1 ඔබේ ගෙදර අය බීමට ජලය ලබා ගන්නා ප්‍රධාන මාර්ගය කුමක්ද ?

මෙම ප්‍රශ්නයේ ප්‍රධාන අරමුණ වන්නේ බීමට ලබාගන්නා ජලයේ පිරිසිදු බව පිළිබඳව විමසීමයි. බීමට ජලය මාර්ග කිහිපයකින් ලබා ගන්නේ නම් වැඩි වශයෙන් ජලය ලබා ගන්නා මාර්ගය කේත කරන්න.

**නල මාර්ගයෙන් ලබා ගන්නා ජලය**

* නිවස තුළ හෝ ගෙවත්තේ ඇති ජලනල
  මෙයින් අදහස් වන්නේ ජල සම්පත් මණ්ඩලය වැනි ආයතන හෝ වෙනත් එවැනි විශාල පරිමාණ ව්‍යාපෘති මගින් මහජනයා කරා ලබාදෙන ජලයයි. මේවා ජලාශවලින් ලබා ගත්තත් විෂබීජ නාශක යොදා ප්‍රමිතියකට ලබා දෙන බැවින් සෞඛ්‍යාරක්ෂිත ජලය බව කිව හැක.
* පොදු ජල නල
  යනු මහා මාර්ගයේ හෝ එවැනි පොදු තැනක ඉහත සඳහන් ආයතනයක් මගින් නල මගින් ලබා දෙන ජලය වේ.
* නල ළිඳ
  බොහෝ ගම්බද පළාත්වල ජලය ලබා ගන්නා ප්‍රධාන මාර්ගයක් වේ.

ළිඳ

* ආරක්ෂිත ළිඳ
  ආරක්ෂිත ළිඳ යනු පිටතින් ගලා එන වැසි ජලය හෝ වෙනත් අපද්‍රව්‍ය නොයන පරිදි වටේට බැම්මකින් ආවරණය කර ඇති ළිඳය.
* අනාරක්ෂිත ළිඳ
  ඉහත සඳහන් කිසිම ආවරණයක් නැති පොළවේ හාරන ලද වලක් වැනි ළිඳකි.

| |
|---|
| **මෙවැනි කිසියම් ළිඳකින් නිවස තුලට මෝටරයක් මාර්ගයෙන් ජලය ලබාදී ඇති අවස්ථාවක කට විය යුත්තේ ළිඳ (ආරක්ෂිත හෝ අනාරක්ෂිත) මිස ජලනල නොවන බව සලකන්න.** |

**උල්පතකින් ලබා ගන්නා ජලය**

✳ ආරක්ෂිත උල්පත

උඩරට පළාත්වල කඳු මුදුන් වලින් පැන නගින උල්පත් වලින් ජලය බීමට ගන්නා අවස්ථා ඇත. නමුත් මෙය ආරක්ෂිත උල්පතක් වන්නේ ජල උල්පත පටන් ගත් තැනම එය ටැංකියක් බැඳ ආරක්ෂිතව ජල නල මගින් ලබා ගන්නේ නම් පමණි. එවිට එම ජලයට කිසිම ආකාරයකින් බාහිර අපවිත්‍ර ද්‍රව්‍ය මිශ්‍ර නොවේ.

✳ අනාරක්ෂිත උල්පත

උල්පතකින් එන ජලය පහලට ආපසු හෝ අතර මගදී ටැංකියකට එක් රැස් කර බෙදාහැරීමක් සිදු කරන අවස්ථා ඇත. මෙම ජලයට මගදී අපවිත්‍ර ද්‍රව්‍ය එක්වීමට බොහෝ ඉඩ කඩ ඇත. සෞඛ්‍යාරක්ෂිත ජලය ලෙස සැලකීමට නොහැක.

වැසි වතුර

සමහර ප්‍රදේශවල වර්ෂා කාලයට ජලය එක් රැස් කරගෙන පසුව ප්‍රයෝජනයට ගැනීම සඳහා තබා ගන්නා අවස්ථා දක්නට ඇත. සමහර පළාත්වල යම් සංවිධාන මගින් මෙවැනි වැසි ජලය එක් රැස් කිරීමේ ව්‍යාපෘති ආරම්භ කර ඇත.

**බවුසරය**

ජලය හිඟ පළාත්වලට යම් යම් ජලාශ හෝ වෙනත් ස්ථානවලින් බවුසර් යොදාගෙන බීමට සුදුසු ජලය බෙදන අවස්ථා ඇත. මේවා පළාත් පාලන හෝ රජයේ ආයතන මගින් සිදු කරන අවස්ථා ඇත.

**ජලාශ හෝ දිය පහරවලින් ලබා ගන්නා ජලය**

සමහර නිවැසියන් බීමට ජලය ලබා ගන්නේ අසල පිහිටි වැවක්, ඇළ දොළ, ගංගා වැනි ස්ථානයකිනි. මේවා කෙසේවත් සෞඛ්‍යාරක්ෂිත ජල ප්‍රභවයක් ලෙස සැලකිය නොහැක.

**බෝතල් වතුර**

නිවැසියන් වැඩි වශයෙන් පාවිච්චි කරන්නේ වර්තමානයේ වෙළඳපොලට එන සෞඛ්‍යාරක්ෂිත බෝතල්වල අසුරන ලද වතුර විය හැක.

**වෙනත්**

ඉහත එක් මාර්ගයකින්වත් නොවේ නම් වෙනත් යටතේ ප්‍රභවය සඳහන් කර අදාල කේතය කව කරන්න.

**B 2 ඔබේ නිවසේ ආහාර පිසීම අත සේදීම වැනි කටයුතු සඳහා ජලය ලබා ගන්නා ප්‍රධාන මාර්ගය කුමක්ද ?**

නිවැසියන් බීමට හැර අනිකුත් කටයුතු සඳහා ජලය ලබා ගන්නා **ප්‍රධාන මාර්ගය** අසා අදාල කේතය කව කරන්න.

**B 3 පානීය ජල පහසුකම නිවස තුළ තිබේද ?**

බීමට ජලය ලබා ගන්නේ වැසි ජලය හෝ බෝතල් වතුර මගින් නොවේ නම් ජල පහසුකම ගෘහ කාණ්ඩය පිහිටි නිවස තුළ තිබේද? වත්ත තුළ තිබේද ? නැතිනම් ඉන් පිට වෙනත් ස්ථානයකද යන්න අසා සුදුසු කේතය කව කරන්න. කේතය 1 හෝ 2 කව කර ඇත්නම් B6 ට යන්න. මෙහිදී ළිඳකින් මෝටරයක් මගින් නිවස තුළට ජලය ලබාගෙන ඇත්නම් 'නිවස තුළ' ලෙස සැලකිය යුතුය.

**B 4 බීමට ජලය ලබා ගන්නා ස්ථානයට ගොස් ජලය ලබාගෙන ආපසු ඒමට ගතවන කාලය**

බීමට ජලය ලබා ගන්නේ තමා වාසය කරන බිම් කොටසේ පිටතින් නම් පමණක් මෙම ප්‍රශ්නය අසනු ලැබේ.

මෙහිදී එම ස්ථානයට ළඟාවීමට ගතවන කාලය සමහර විට ජලය ලබා ගන්නා තුරු බලා සිටින කාලය හා ආපසු නිවසට ඒමට ගතවන කාලය ඇතුලත් කල යුතුය.

**B 5 ඔබේ නිවසට අවශ්‍ය ජලය ගෙන ඒම සාමාන්‍යයෙන් සිදුකරන්නේ කවුද ?**

මෙම ප්‍රශ්නයේ අරමුණ වන්නේ සාමාන්‍යයෙන් පවුලේ සාමාජිකයින් අතරින් ජලය ගෙනඒමේ කටයුත්ත සිදු කරන්නේ ස්ත්‍රීන්ද/පුරුෂයින්ද යන්න දැන ගැනීමට හා එමෙන්ම අවු. 15ට අඩු දරුවන් මෙම කටයුත්තේ සාමාන්‍යයෙන් නිරතවනවාද ? යන්න දැන ගැනීමයි. නිවසේ පරිභෝජනය සඳහා ජලය ගෙන ඒම ගෘහ මට්ටමින් සිදු කෙරෙන නිෂ්පාදන කාර්යයකට ආර්ථික විද්‍යාඥයින් අර්ථ දක්වා ඇත. පවුලේ සාමාජිකයින් කිහිප දෙනෙක් මෙම කටයුත්තෙහි නිරතවන බව පැවසුවොත් සාමාන්‍යයෙන් /වැඩියෙන් නිරතවන පුද්ගලයාව විමසන්න.

**B 6 බීමට සුදුසු තත්වයට පත් කර ගැනීමට යම් දෙයක් කරනවාද ?**

අදාල එක් කේතයක් කව කරන්න. නැත හෝ නොදනී නම් B8 ට යන්න.

**B 7 බීමට සුදුසු තත්වයට පත් කර ගැනීම සඳහා ඔබ එම ජලයට කරන්නේ කුමක්ද ?**

ගෘහ ඒකකයට ලැබෙන හෝ ගෙන එන ජලය බීමට සුදුසු තත්වයට පත් කර ගැනීම සඳහා නිවස තුලදී යම් ක්‍රියාමාර්ගයක් ගනු ලැබේද යන්න මෙයින් විමසනු ලැබේ. අදාල ක්‍රමයන් වෙන වෙනම විමසා සියලුම කේතයන් කව කරන්න.

**B 8 ඔබේ ගෘහ කාණ්ඩයේ සාමාජිකයින් සාමාන්‍යයෙන් භාවිතා කරන්නේ කුමන වර්ගයේ වැසිකිළියක්ද ?**

ගෘහ කාණ්ඩයේ සනිපාරක්ෂාවය හා සෞඛ්‍යාරක්ෂිත වැසිකිළියක් භාවිතා කෙරෙන්නේද යන්න විමසා බැලීම මෙහි අරමුණයි.

## Cistern එකක් මගින් සෝදා හරින ජල මුද්‍රිත වැසිකිළි/අතින් වතුරවත්කර සෝදා හරින ජල මුද්‍රිත වැසිකිළි

Cistern එකක් මගින් සෝදා හරින වැසිකිළියේ Squating Pan කොටසට යටින් U හැඩයේ බටයක් ඇති අතර එමගින් වැසිකිළියේ නිතරම ජලය ස්වල්පයක් රැඳී ඇත. මෙයින් මැස්සන් වැනි සතුන් වැසීමෙන් වලකින නිසා සෞඛ්‍යාරක්ෂිත බවින් ඉහළය.

අතින් වතුර ගසා සෝදාහරින වැසිකිළිද බොහෝ විට වැසිකිළි පෝච්චියට යටින් ඇති U හැඩයේ බටය මගින් ජලය රදා පැවැත්මක් සිදු කෙරේ. (water seal) මේවාගේ අප ද්‍රව්‍ය සෝදා හරින වල සමහර විට වැසිකිළිය සමගම හෝ තරමක් දුරින් පිහිටා තිබිය හැක. ජල මුද්‍රිත වැසිකිළි පහත සඳහන් අයුරින් වර්ග කළ හැක.

* අපද්‍රව්‍යය බැස යන නල පද්ධතියකට සෝදා හරින (Severage System)
  අප රටේ කොළඹ නගර සභාවට අයිති ප්‍රදේශයේ කලකට ඉහත සාදන ලද සමහර නිවාසවල වැසිකිළි මෙවැනි කාණු පද්ධතියකට සම්බන්ධකර ඇත. එම අප ද්‍රව්‍යය ප්‍රධාන කාණුවකට එකතුවීමෙන් පසු වෙනත් ස්ථානයකට බැහැරවීමක් සිදු කෙරේ. (කොළඹ නගරයේ මහල් නිවාස සඳහා වෙනම අපද්‍රව්‍ය බැහැර කිරමේ ටැංකි සාදා ඇත.)

* සෞඛ්‍යාරක්ෂිත
  ටැංකියකට සෝදා හරින සමහර නිවාසවල වැසිකිළි අපද්‍රව්‍ය නිවසට හා වැසිකිළියට තරමක් දුරින් සෞඛ්‍යාරක්ෂිතව පොළව යට සාදන ලද ටැංකියකට (Septic Tank) එකතු කිරමට සලස්වා ඇත. මෙම ටැංකි කොටස් කිහිපයකට වෙන් කර ඇති අතර අපද්‍රව්‍ය ඉක්මනින් දිරාපත්වීමක් සිදුවේ. ජල මුද්‍රිත වැසිකිළියේ අපද්‍රව්‍ය එවැනි ටැංකියකට එකතු වන්නේ නම් එම අදාල කේතය කව කරන්න.

* පොළවෙහි හාරන ලද බදින ලද හෝ නොබදින ලද වළකට සෝදා හරින ලද;
  බොහෝ ගම්බද මෙන්ම නගරබද නිවෙස්වලත් ඇත්තේ වැසිකිළියට කිට්ටුවෙන් සාදන ලද මෙවැනි වලකට අපද්‍රව්‍ය සෝදා හරින ලද වැසිකිළිය.

* වෙනත් තැනකට සෝදා හරින ඉහත සඳහන් කළ අවස්ථා තුනටම නොව වෙනත් තැනකට සෝදා හරින බව සඳහන් කළහොත්, උදා : නගරයේ ප්‍රධාන නළ පද්ධතියකට, වෙනත් ඉඩමකට, කැත කුණු බයින කාණුවකට ආදිය එම අදාල කේතය කව කරන්න.

* අපද්‍රව්‍ය බැස යන ස්ථානය නොදනී නම් ඊට අදාල කේතය කව කරන්න.

## වල වැසිකිළි

ජලයෙන් සෝදා හැරීමකින් තොරව අපද්‍රව්‍ය කෙලින්ම පොළවේ හාරන ලද වලකට එක්රැස්වීම මෙම වැසිකිළි මගින් සිදුවේ. මෙම වැසිකිළිද වර්ග කිහිපයකට වෙන් කෙරේ.

✳ වාත්‍රාශ්‍රය ලැබෙන ලෙස සකස් කරන ලද වල වැසිකිළි

මෙම වැසිකිළි වර්ගයේ දුර්ගන්ධය හා මැස්සන් වැනි සතුන් වැලැක්වීම පිණිස වාතාශ්‍රය ගලා ඒමට බටයක් යොදා ඇත. මෙම බටය PVC ප්ලාස්ටික් හෝ සිමෙන්ති විය හැක. වැසිකිළි වලේ සිට වැසිකිළි වහලයෙන් උඩට යන පිරිදි සවි කළ මෙම බටයේ උඩ කෙලවර දැලකින් ආවරණය කර ඇත. මෙම බටය මගින් වාත්‍රාශ්‍රය ගලා ඒම හා දුර්ගන්ධය බැහැරවීම සිදු කෙරේ.

✳ පොළවෙන් උඩට පිහිටන සේ කොන්ක්‍රීට් හෝ වෙනත් දෙයක් යොදා සකස් කල වල වැසිකිළි

මෙම වර්ගයේ වල වැසිකිළි පිටින් ගලා එන වතුර වැසිකිළි වල ඇතුලට නොඑන පරිදි පොළවෙන් උඩට පිහිටන සේ සිමෙන්ති හෝ ලැලි මගින් ඇතුලත සකස් කර ඇත. මෙය පිරිසිදු කිරීමට පහසුය.

✳ කොන්ක්‍රීට් ලැල්ලක් හෝ වෙනත් ආවරණයක් නැති වල වැසිකිළි

මේවා සෞඛ්‍යාරක්ෂිත බවින් ඉතා අඩු අතර කොන්ක්‍රීට් ලැල්ලක් හෝ වෙනත් ආවරණයක් නැත. පොලොවෙහි හාරන ලද වලකට තාවකාලික ද්‍රව්‍ය යොදා සාදන ලද සිදුරක් තුළින අපද්‍රව්‍ය එකතු වීමත් මෙයින් සිදුවේ.

## Composting Toilet

මෙය දැනට හඳුන්වා දී ඇති පරිසර හිතකාමී ව:සිකිළි වර්ගයකි. මෙහි විශේෂ ලක්ෂණය වන්නේ මල පහවන කොටස වෙන් වශයෙන්ද මුත්‍රා සහ ජලය :වන් වශයෙන්ද එක් රැස් කිරීමත් සිදුවීමයි. මලපහ කල පසු සෝදා ගැනීම සඳහා වෙනම ස්ථානයක්ද එ: ජලය හා මුත්‍රා එක් රැස්වීම වෙනම ස්ථානයක සිදුවන අතර මලපහ පසුව කොම්පෝස්ට් බවට පත්වීමක් :ිදුවේ.

## බාල්දි වැසිකිළි

දැනට භාවිතයෙන් ඉතා අඩු අතර නිතර අස් කිරීමට හැකිවන පරිදි වැසිකිලියෙහි යටින් ඇති බාල්දියකට අපද්‍රව්‍යය එක් රැස්වේ.

## B 9 - B 10

මෙම වැසිකිළිය වෙනත් ගෘහකාණ්ඩ සමඟ හුවමාරු කර ගන්නවාද, මෙම වැසිකිළිය වෙනත් ගෘහකාණ්ඩ සමඟ හුවමාරු කරගත්තාද, හා එසේ නම් එම ගණන දැන ගැනීම මෙමගින් බලාපොරොත්තු වේ. ගෘහ කාණ්ඩයේ සෞඛ්‍ය තත්වය මැන බැලීම මෙම ප්‍රශ්නයේ අරමුණයි.

## B 11 ඔබේ ගෘහ කාණ්ඩයේ පහත දක්වා ඇති දේ තිබෙනවාද ?

ගෘහ ඒකකයේ සමාජ ආර්ථික තත්වය පිළිබඳව දළ අදහසක් ගැනීම මෙම ප්‍රශ්නයේ අරමුණයි. සඳහන් කර ඇති එක් එක් අයිතමය කියවා අදාල කේතය කව කරන්න. දැනට කැඩී ඇති රේඩියෝ හෝ රූපවාහිනියක් ඇති බව පැවසුවහොත් එය ඉක්මනින් අළුත්වැඩියා කර ගැනීමේ අදහසක් ඇති නම් පමණක් එම අයිතමය කව කරන්න. නැතිනම් 2 කව කරන්න.

**B 12 ඔබේ ගෘහ කාණ්ඩයේ ආහාර පිසීම සඳහා වැඩියෙන්ම භාවිතා කරන ඉන්ධන වර්ගය කුමක්ද ?**

ඉන්ධන වර්ගයද ගෘහ කාණ්ඩයේ සමාජ ආර්ථික රටාව පිළිබඳ මැනීමේ තවත් මිනුම් දණ්ඩක් ලෙස භාවිතා කෙරේ. ඉන්ධන වර්ගය එකකට වඩා යොදා ගන්නේ නම් වැඩියෙන් භාවිතා කරන වර්ගයට අදාල කේතය කව කරන්න.

**B 14 ඔබ ආහාර පිසින ලිපට/උදුනට දුම පිටතට යන පරිදි සකස් කළ පෝරණුවක් හෝ නවීන ආකාරයට සකස් කල චිමිනියක් තිබේද ?**

මෙයින් බලාපොරොත්තු වන්නේ සෞඛ්‍යයට හානියක් නොවන පරිදි ලිපෙන් පිටවන දුම බැහැර කිරීමට සකස් කළ චිමිනියක් තිබේද යන්න දැන ගැනීමයි. දර ලිපක් නම් ගලින් බඳින ලද චිමිනියක් තිබිය හැකි අතර සමහර ලිප් වර්ග සඳහා නවීන චිමිනි සකස් කර ඇත.

**B 15 ආහාර පිසීම සාමාන්‍යයෙන් සිදු කරන්නේ නිවස තුලද ? නිවසෙන් පිට ස්ථානයකද ? ගොඩනැගිල්ලකද ? එසේ නැත්නම් තාවකාලික මඩුවකද ? එළිමහනකද ?**

මෙයින් අදහස් කරන්නේ නිවස තුළ හා නිවස අවට වාතයේ ඇති තත්වය පිළිබඳ දැන ගැනීමයි. නිවසින් පිටත තාවකාලික මඩුවක ආහාර පිළියෙල කරන්නේ නම් අදාල කේතය කව කරන්න. එසේ ආවරණයක් නොමැති එළිමහනේ කැම පිළියෙල කිරීම එළිමහන් ලෙස 4 කේතය කව කරන්න. නිවස තුළ හෝ වෙනත් නම් B16 ට යන්න. 2, 3, 4 නම් B17 ට යන්න.

**B 16 මුළුතැන් ගෙය සඳහා භාවිතා කල හැකි වෙනම කාමරයක් තිබේද ?**

B 15 සඳහා නිවස තුළ යනුවෙන් කේත කළ අයගෙන් මෙම ප්‍රශ්නය අසනු ලැබේ. නිවැසියන්ගේ සනීපාරක්ෂාව පිළිබඳ වඩාත් තොරතුරු දැන ගැනීම වෙනත් මුළු තැන්ගෙයක් ඇත්ද යන්න ඇසීමේ අරමුණයි.

B 17, 18, 19

ඔබ විසින් නිරීක්ෂණය කර සටහන් කර නිවසෙහි බිමට හා වහලයට යොදා ඇති ද්‍රව්‍යය සටහන් කරන්න. බිත්තිවල ද්‍රව්‍යය ඔබට නිරීක්ෂණය කළ නොහැකි නම් ප්‍රතිචාරකගෙන් අසා කේත කරන්න. මේවා ප්‍රධාන කාණ්ඩ 3 ක් යටතේ වර්ග කෙරේ. එනම්,

ස්වාභාවික ද්‍රව්‍යයන් යෙදූ

තාවකාලික ද්‍රව්‍යයන් යෙදූ

ස්ථිර ද්‍රව්‍යයන් යෙදූ යනුවෙනි.

වර්ග කීපයක් නිමකර ඇත්නම් වැඩි ප්‍රමාණයක් යෙදූ ද්‍රව්‍යය කේත කරන්න.

**B 20 නිදා ගැනීමට කොපමණ කාමර භාවිතා කෙරේද ?**

අදාල සංඛ්‍යාව කොටු තුල ලියන්න.

**B 21 කිසියම් සාමාජිකයෙකුට පහත සඳහන් දෑ තිබේද ?**

මෙයද ගෘහ කාණ්ඩයේ සාමාජ ආර්ථික තත්වය පිළිබඳ විමසා බැලීමකි. එක් එක් අයිතමය ගැන විමසා අදාල කේතය කව කරන්න. සාමාන්‍ය පදිංචිය යටතේ සඳහන් නොමැති වුවත් ස්ථිර පදිංචිය ඇති එනම් වෙනත් තැනක සාමාන්‍ය පදිංචිය ඇති වුවත් මෙම ගෘහ කාණ්ඩයේ ස්ථිර පදිංචිය ඇති සාමාජිකයෙකුට මෙවැනි දේ අයිතිව තිබිය හැක. (නේවාසිකයින්, ගෘහ සේවකයින්, අමුත්තන් හැර)

**B 22 සාමාජිකයෙකුට අයිති කෘෂිකාර්මික ඉඩමක් තිබේද ?**

කෘෂිකාර්මික ඉඩම් අයිතියද සමාජ ආර්ථික තත්වය මැන බැලීමේ තවත් දර්ශකයක් වේ. කෘෂිකාර්මික වගාවක් සඳහා භාවිතා කරන ඉඩමක් ගෘහ කාණ්ඩයේ ස්ථිර පදිංචිය ඇති සාමාජිකයෙකුට එනම් වෙනත් තැනක සාමාන්‍ය පදිංචිය ඇති වුවත් මම ගෘහ කාණ්ඩයේ ස්ථිර පදිංචිය ඇති සාමාජිකයෙකුට (නේවාසිකයින්, ගෘහ සේවකයින්, අමුත්තන් හැර) අයත්ව තිබේදැයි විමසන්න. කෘෂිකාර්මික ඉඩම යන්න පහත සඳහන් අයුරින් නිර්වචනය කළ හැක.

a පර්චස් 20 ට සමාන හෝ ඊට වඩි ඉඩමක අවම වශයෙන් ස්ථිර බෝග (පොල් වැනි) එක් වර්ගයකින් ගස් හතරක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් තිබීම හෝ/හා

| | |
|---|---|
| එළ හරක්/මී හරක් | දෙකක් හෝ වැඩි |
| ඌරන් | දෙකක් හෝ වැඩි |
| එළුවන් | දෙකක් හෝ වැඩි |
| කුකුළන් | පහක් හෝ වැඩි |

සතුන් ගණනක් ඇති කරන ඉඩමක් විය යුතුයි.

නැතහොත්

b පර්චස් 20 ට අඩු වුවත් තාවකාලික බෝග හෝ අර්ධ ස්ථිර බෝග වගා කර ඇති මෙන්ම එයින් වර්ෂයකට රු. 2400/= කට වැඩි ආදායමක් ලැබිය හැකි වගාවක් ඇති ඉඩමක්

නැතහොත්

c ඕනෑම ප්‍රමාණයක කුඹුරු ඉඩමක් (අඩු වශයෙන් වසරකට එක් කන්නයක්වත් වගා කළ හැකි) නැත නම් B24 ට යන්න.

**B 23 අයිති කෘෂි ඉඩමේ ප්‍රමාණය අක්කර, රූඩ්, පර්චස් වලින් සඳහන් කරන්න.**

පර්චස් 40 = රූඩ් 1

රූඩ් 4 = අක්කර 1 ලෙස සලකන්න.

**B 24, 25 ගෘහ කාණ්ඩයට අයත් ගොවිපල සතුන්, කුකුළන් ආදීන් සිටීද ?**

සතුන් පිළිබඳව අයිතියද, සමාජ ආර්ථික රටා මැනීමේ අතිරේක දර්ශකාංකයක් වේ. ස්ථිර පදිංචිය ඇති එනම් වෙනත් තැනක සාමාන්‍ය පදිංචිය ඇති වුවත් මම ගෘහ කාණ්ඩයේ ස්ථිර පදිංචිය ඇති සාමාජිකයින්

සඳහා එසේ සිටී නම් අදාල සතුන් ගණන කොටු තුල සඳහන් කරන්න. (නේවාසිකයින්, ගෘහ සේවකයින්, අමුත්තන් හැර)

**B 26 ගිණුමක් තිබේද ?**

මෙහිදී ළමයින් සඳහා විවෘත කර ඇති පාසල් ගිණුම් වලංගු නොවේ. ස්ථිර පදිංචිය ඇති සාමාජිකයකුට එනම් වෙනත් තැනක සාමාන්‍ය පදිංචිය ඇති වුවත් මෙම ගෘහ කාණ්ඩයේ ස්ථිර පදිංචිය ඇති සාමාජිකයෙකුට ගිණුමක් ඇත්දැයි විමසා අදාල කේතය කව කරන්න. සමෘද්ධි ගිණුමද අදාල නොවේ. (නේවාසිකයින්, ගෘහ සේවකයින්, අමුත්තන් හැර)

**B 27 දේපල අයිතිය**

ගෘහ කාණ්ඩය පදිංචි ඉඩම හා නිවසේ අයිතිය විමසනු ලැබේ. තමන් සතු හෝ බද්දට ගනු ලැබුවේ නම් B 28 ටද අනිකුත් අය සඳහා B 29 ටද යා යුතුයි. අයිතිය පිළිබඳ ප්‍රතිචාරක පවසන විස්තරය පැහැදිලි නොමැති නම් තිත් ඉරි මත විස්තර සඳහන් කරන්න.

**B 28 අයිතිය සඳහා පෙන්විය හැකි ලියකියවිලි**

තමන් සතු හෝ බද්දට ගන්නා ලද නම් පෙන්විය හැකි ලියකියවිලි විමසා අදාල කේත සියල්ල කව කරන්න. A හෝ B කව කර ඇත්නම් B 33 ටද, අනිකුත් අය B 30 ටද යායුතු වේ. කේත කීපයක් කව වී ඇත්නම් ඉහලින්ම ඇති කේතයේ යොමුවීම අනුගමනය කරන්න.

**B 29 කුලිය සම්බන්ධයෙන් පෙන්විය හැකි ලියකිවිලි**

B27 හි කුලී ගෙවන හෝ නොගෙවන දේපල සඳහා පෙන්විය හැකි ලියකියවිලි මෙමගින් විමසනු ලැබේ. අදාල කේත සියල්ල කව කරන්න.

**B 30 භුක්තිය පිළිබඳ විශ්වාසය**

B 28 හි ඉඩම පිළිබඳ ඔප්පුවක් හෝ සහතිකයක් නැති අයගෙන් භුක්තිය පිළිබඳ විශ්වාසය වමසනු ලැබේ. අදාල කේතය කව කරන්න.

**B 31 කොපමණ විශ්වාසයක් ඇත්ද ?**

B 30 සඳහා 1 හෝ 2 කේත කව කරන්නේ නම් එම විශ්වාසය පිළිබඳ තව දුරටත් ප්‍රශ්න කෙරේ. අදාල කේතය කව කරන්න.

**B 32 කවදා හෝ බැහැර කර තිබේද ?**

අදාල කේතය කව කරන්න.

**B 33 පිහිටා ඇත්තේ උපද්‍රව සහිත ප්‍රදේශයකද ?**

පිහිටීම ගැන නිරීක්ෂණය කර හෝ ප්‍රතිචාරකගෙන් අසා අදාල කේත සියල්ල කව කරන්න. කිසිවක් නැතිනම් Z කව කරන්න.

**B 34 නඩත්තුව**

නිවසෙහි නඩත්තුව පිළිබඳ නිරීක්ෂණයෙන් හෝ අසා දැන ගැනීමෙන් පසු අදාල කේත සියල්ල කව කරන්න.

**B 35 ව්‍යවසන වලට ලක්වීමට ඇති ඉඩ**

පිහිටා ඇත්තේ මෙහි සඳහන් කර ඇති ව්‍යවසන සිදුවිය හැකි ස්ථානයක නම් නිරීක්ෂණයෙන් හෝ අසා දැන ගැනීමෙන් අදාල කේත සියල්ල කව කරන්න. එවැනි කිසිවක් නැතිනම් Z කව කරන්න.

**B 36 කැලි කසලවලට කරන්නේ කුමක්ද ?**

මීට අදාල කේත සියල්ල කව කරන්න.

**B 37A ගෘහ කාණ්ඩය මදුරුවන්ගෙන් ආරක්ෂාවීම සඳහා යම්කිසි ක්‍රමයක් අනුගමනය කරනවාද ?**

මදුරුවන්ගෙන් බෝවන රෝග වර්තමානයේ බොහෝ රටවල මෙන්ම ශ්‍රී ලංකාවේද ඉතා බලවත් සෞඛ්‍ය ප්‍රශ්නයක් වී ඇත. මේ නිසා මදුරුවන් වැලැක්වීම සඳහා මහජනයා භාවිතා කරන ක්‍රම හා ඒ පිළිබඳ විස්තර ලබා ගැනීම B37A ප්‍රශ්නයේ සිට සිදු කෙරේ.

ගෘහ කාණ්ඩය මදුරුවන්ගෙන් ආරක්ෂාවීමට යම් ක්‍රමයක් භාවිතා කරයි නම් 1 කව කර 37B ට යා යුතු අතර නැත නම් මග හැර 50A ප්‍රශ්නයට යන්න.

**B 37B මදුරුවන්ගෙන් ආරක්ෂාවීම සඳහා භාවිතා කරන ප්‍රධාන ක්‍රම 3 ක්**

මෙහිදී ක්‍රම 1 ට වැඩි නම් 3 ක් දක්වා කව කළ හැක. වෙනත් ක්‍රමයක් නම් X කව කර එම ක්‍රමය සඳහන් කරන්න.

**B38 / 37B හා 37C** අනුව මදුරුදැල් පාවිච්චි කරයි නම් පාවිච්චි කරන මදුරු දැල් ගණන කොටුව තුල ලියන්න. කුඩා දරුවන් දවල් කාලයේ වැසීමට භාවිතා කරන දැල් ආවරණය මදුරු දැල් නොවේ. මදුරුදැල් 6 ට වැඩි නම් 6 යොදන්න.

**B39** සිට විමසනු ලබන්නේ මදුරුදැල් පාවිච්චි කරනු ලබන ගෘහ ඒකකවලින් ඒ පිළිබඳ විස්තරයකි. මදුරුවන් පලවා හැරීම සඳහා වර්තමානයේ හඳුන්වා දී ඇති මදුරුනාශක ගල්වනු ලැබූ මදුරු දැල් මැලේරියා සහ අනිකුත් මදුරුවන් නිසා බෝවන රෝග වලක්වා ලීමට සමත්වී ඇති බව හෙළිවී ඇත.

බොහෝ රටවල් විශේෂයෙන් කුඩා දරුවන්ගේ ආරක්ෂාව සඳහා මෙම මදුරු දැල් විශේෂය වැඩි දියුණු කර හඳුන්වාදීමේ වැඩපිළිවෙල දියත්කර ඇත. එක් එක් මදුරුදැල ඔබට නිරීක්ෂණය කිරීමට හැකිවූවාද ? නැද්ද ? යන්න අනුව අදාල තීරුවේ B39 ට අදාල කේතය කව කරන්න. මදුරුදැල දැකීමට නොහැකිවුවත් අදාල ප්‍රශ්න අසන්න. එක් එක් මදුරු දැල සඳහා වෙන වෙනම ප්‍රශ්න අසන්න.

**B40 මදුරු දැල ලැබුනේ කොහෙන්ද ?**

එක් එක් මදුරු දැල ලැබුණ ක්‍රමය අනුව අදාල කේතය කව කරන්න.

**B41 කොපමණ කලකට පෙරද ?**

එක් එක් මදුරු දැල ගෘහ කාණ්ඩයට ලැබුනේදැයි එසේත් නැත්නම් මිලදී ගත්තේ කොපමණ කලකට පෙරද යන්න විමසා අදාල කාලය අනුව කේත කව කරන්න.

**B42 මදුරු දැලේ ප්‍රමාණය**

බොහෝ දෙනා පාවිච්චි කරන මදුරු දැල් කේතු ආකාරයක් ගන්නා අතර ඒවායේ ප්‍රමාණය අනුව වර්ග කිහිපයකට වෙන් කළ හැක. ඒ අනුව අදාල කේතය කව කරන්න. සමහර පුද්ගලයින් හතරැස් ආකාරයට මසන ලද මදුරු දැල් පාවිච්චි කරනු ලබන අතර එවැන්නක් නම් 4 කේතය කව කරන්න.

**B43 එක් එක් මදුරුදැල ප්‍රධාන වර්ග 3 කට වෙන් කරනු ලැබේ.**

1. ස්ථිර වශයෙන්ම මදුරු නාශක ගල්වනු ලැබූ මදුරු දැල්
2. තාවකාලික මදුරු නාශක ගල්වනු ලැබූ මදුරු දැල්
3. සාමාන්‍ය දැල්

**ස්ථිර වශයෙන්ම මදුරු නාශක ගල්වනු ලැබූ මදුරු දැල්**
ශ්‍රී ලංකාවේද මැලේරියා ආශ්‍රිත ප්‍රදේශවල යම් යම් සංවිධාන මගින් බෙදා දී ඇත. මේවා පිළිබඳ එම සංවිධාන මගින්ම යම් කාල සීමාවක් යනතුරු (අවුරුදු 3 ක් හෝ අවුරුදු 5ක්) නොසෝදා පාවිච්චි කරන ලෙස නිවැසියන්ට උපදෙස් දී ඇත. ඒ පිළිබඳ විමසීමේදී ප්‍රතිචාරක හෝ ගෘහ සාමාජිකයින් ඒ පිළිබඳ දන්නා අතර සාමාන්‍යයෙන් ඒ පළාතේ එවැනි බෙදා දී ඇත්නම් විමසීමෙන් දැනගත හැක. අදාල දැල එවැනි එකක් නම් 1 කේතය කව කර B42 ප්‍රශ්නයට යන්න.

**තාවකාලික මදුරු නාශක ගල්වනු ලැබූ මදුරු දැල්**
මේවා යම් කාලසීමාවකට වරක් නැවත මදුරු නාශක ගැල්විය යුතුය. සමහර ප්‍රදේශවල ස්වේච්ඡා හෝ සෞඛ්‍ය සංවිධාන මගින් පළාත්වාසීන්ට ගමන්ට අයිති දැල් යම් ස්ථානයකට ගෙන එන ලෙස දන්වා බෙහෙත් ගල්වා දෙනු ලැබූ අවස්ථා ඇත. ඒවා මාස කිහිපයක් පමණක් බලපවත්වන නමුත් ඊට පසු නැවත බෙහෙත් ගැල්විය යුතුය. සමහර විට දැල් බෙදා දෙන විට එම සංවිධානය මගින් එය නැවත මාස

කිහිපයකට පසු බෙහෙත් ගැල්විය යුතු බවට ජනතාව දැනුවත් කර ඇත. ප්‍රතිචාරකගෙන් අදාල විස්තරය විමසා එවැනි දැලක් නම් 2 කේතය කව කර B45 ප්‍රශ්නයට යන්න.

**සාමාන්‍යය දැල්**

ඉහත කිසිම ආකාරයක බෙහෙත් ගල්වනු නොලැබූ සාමාන්‍ය දැල් ශ්‍රී ලංකාවේ බහුලව භාවිතා වේ. එවැන්නක් නම් 3 කව කරන්න.

B44 මදුරු නාශක ගල්වා තිබුණාද ?

සාමාන්‍ය දැලක් ලෙස හැඳින්වුවත් මදුරු නාශක ගල්වා තිබුණාදැයි දැන ගැනීම මෙහි අරමුණයි. ඔව් නම් B47 ට යන්න.

B45, 46 තාවකාලික ලෙස මදුරු නාශක ගල්වා ඇති දැලක් බව පැවසුවොත් එය නැවත කවදා හෝ මදුරු නාශක ගල්වා ඇත්දැයි ප්‍රශ්න කරන්න. එය නියමිත ආකාරයෙන් මදුරු නාශක ගැල්වීම සිදුකලේදැයි දැන ගැනීමට B45 ප්‍රශ්නයෙන් සිදු කෙරේ. නැත හෝ නොදනී යැයි පැවසුවහොත් B47 ට යන්න. ගල්වනු ලැබූ බව පැවසුවේ නම් B46 ට ගොස් අන්තිම වරට එසේ ගල්වනු ලැබුවේ කොපමණ කලකට පෙරදැයි විමසා අදාල කේතය කව කරන්න. මදුරු නාශක ගැල්වීම ශ්‍රී ලංකාව තුළ අදාල කාල සීමාව තුලදීම එම ප්‍රදේශවල සිදු කෙරේද ? එසේ නැතහොත් එම ව්‍යාපාරය ඵලදායී එකක් නොවේ. එවැනි තොරතුරු දැන ගැනීම මෙම ප්‍රශ්නවල අරමුණයි.

B47, B 48 මදුරු නාශක ගැල්වීමේ ව්‍යාපාරය සාර්ථක වුවත් අදාල නිවැසියන් එය නිසියාකාරයෙන් ප්‍රයෝජනයට නොගන්නේ නම් එම ප්‍රයත්නය සාර්ථක වීමක් දැකිය නොහැක. සමහර විට නිවැසියන් මදුරුනාශක ගැල්වූ දැල් අල්මාරිතුල තබා සාමානය දැල් එසේ නැත්නම් කිසිත් නැතිවම නිදා ගන්නා අවස්ථා ඇත.

මෙම ප්‍රශ්නයෙන් බලාපොරොත්තුවන්නේ නිවැසියන් අදාල වැඩසටහන්වලින් යම් ප්‍රයෝජනයක් ලැබුවාද යන්නයි. එය ප්‍රයෝජනයට නොගන්නේ නම් රෝග පැතිර යන්නේ මිනිසුන්ගේ නොසැලකිලිමත්කම නිසා මිස ව්‍යාපාරයේ දුර්වලතා නිසා නොවේ. පෙරදින රාත්‍රියේ එක් එක් දැලෙන් ආවරණය වූ පුද්ගලයින්ගේ පේළි අංක හා නම් B48 යටතේ සඳහන් කරන්න. පුද්ගලයින් 5 කට වඩා සිටි බව කීවොත් මුල් 5 දෙනාගේ නම් සඳහන් කරන්න. නිදා නොගන්නේ නම් B50A ට යන්න.

B50A/50B/50C/50D

අයඩීන් ලුණු භාවිතය පිළිබඳ දැන ගැනීම මෙම ප්‍රශ්නවල අරමුණයි. අයඩීන් හිඟකම නිසා සමහර ප්‍රදේශවල බහුල වශයෙන් මෙන්ම සාමාන්‍යයෙන් සෑම ප්‍රදේශයකමද ජනයා තයිරොයිඩ් ග්‍රන්ථියේ ආබාධයන්ට ගොදුරුවීම දක්නට ලැබේ. B50A, B, C, D සඳහා අදාලවන කේතයන් කව කරන්න.

B51 ඔබට ලබා දී ඇති කුප්පියේ ද්‍රව බිංදු 1 ක් හෝ 2 ක් නිවසේ ඇති ලුණු භාජනයෙන් (ලුණු කැට නම් වතුර දමා ඇති භාජනයෙන් නොව ලුණු තැන්පත් කර ඇති භාජනයෙන් ගන්න) ස්වල්පයක් පීරිසියකට දමා ඒ මතට දමන්න. ලුණු දම් පාට හෝ නිල් පාට වූයේ නම් 1 කේතය කව කරන්න. නැත්නම් 2 කේතය කව කරන්න.

| |
|---|
| **ගෘහ කාණ්ඩ උපලේඛණය සම්පූර්ණ කර අවසන් වූ පසු නැවත එම ප්‍රශ්නාවලියේ මුල ඇති හඳුනා ගැනීමේ තොරතුරු කොටසට ගොස් ඉතිරි තොරතුරු සම්පූර්ණ කළ යුතුය.** |

## මුල් පිටුවේ ඉතිරි කොටස් සම්පූර්ණ කිරීම සඳහා උපදෙස්

**ප්‍රතිචාරක හමුවීම්**

ප්‍රතිචාරක හමුවීම් අවස්ථා 3 දක්වා සම්පූර්ණ කිරීමට ඉඩ කඩ ඇත. මුල් අවස්ථාවේ යම් හේතුවක් නිසා උපලේඛණය සම්පූර්ණ කර ගැනීමට නොහැකි වුවා නම් අදාල ප්‍රතිඵල කේතය හා දිනය සම්පූර්ණ කර රළනට හමුවිය හැකි දිනයක් අනුව තවත් අවස්ථා 2 කදී අදාල නිවෙසට යා යුතුයි. 2 වන හෝ 3 වන අවස්ථාවලදීද අදාල ප්‍රතිඵල කේත යොදන්න.

**ප්‍රතිඵල කේත**

✳ **සම්පූර්ණ කරන ලදි**

ගෘහ කාණ්ඩ උපලේඛණය සම්පූර්ණ කර ගත හැකි වුවා නම් අදාල තීරුවේ 1 කේතය යොදන්න.

✳ **සුදුසු ප්‍රතිචාරකයකු මුණ ගැසිය නොහැකිවීම.**

ගෘහ ඒකකයට යන අවස්ථාවේ නිවැසියන් බැහැරට ගොස් සුදුසු ප්‍රතිචාරකයකු මුණ ගැසීමට නොහැකිවුවානම් සමහර විට මෙම අවස්ථාවේ නිවසේ සිටියේ කුඩා දරුවකු හෝ මානසික ආබාධිත අයකු පමණක් විය හැක. කේත 2 යොදා නැවත දිනයක එම ස්ථානයට යා යුතුවේ.

✳ **නිවැසියන් දිගු කලකට මුණ ගැසිය නොහැක.**

දිගු කාලයක් සඳහා නිවැසියන් බැහැරට යන අවස්ථාවේ නිවැසියන් නැවත පැමිණෙන දිනය ගැන පැවසිය නොහැකි බව අසල්වැසියන් පවසන්නේ නම් කේත 3 කට කරන්න. නමුත් නැවත ඔබ එම ස්ථානයට ගොස් පරීක්ෂා කළ යුතුවේ. සමහර විට කිසිවකුත් මුණ ගැසිය නොහැකිව හෝ නැවත ළගකදී පැමිනේදැයි දැනගත නොහැකිවුවා නම් කේත 2 කට කරන්න.

✳ **කල් දැමීම**

ඔබ නිවසට යන අවස්ථාවේ යම් හේතුවක් නිසා එය සමීක්ෂණයට සුදුසු අවස්ථාවක් නොවේ නම් 4 කේතය යොදා නැවත පැමිණිය හැකි දිනයක් අසා ලියාගන්න. සමහර විශේෂ අවස්ථාවක් තිබිය හැකියි. කෙදිනකවත් සමීක්ෂණය සිදු කළ නොහැකි වන යම් හේතුමත එසේ වුවා නම් 4 කේතය යොදා අවසන් කරන්න.

✳ **ප්‍රතික්ෂේප කළා**

ඔබ නිවසට ගොස් ඔබව හඳුන්වාදීමේ හා සමීක්ෂණයේ අරමුණ හා තොරතුරුවල රහස්‍යභාවය ගැන විස්තර කළ පසු මෙම කටයුත්ත ගැන ඔබට හමුවූ පුද්ගලයා මේ පිළිබඳ එතරම් කැමැත්තක් දක්වන බවක් නොපෙනේ නම් නිවසේ තවත් සුදුසු ප්‍රතිචාරකයෙකු සමග කතා කිරීමට උත්සාහ කර නැවත ඔබේ අරමුණ

පැහැදිලි කරන්න. නිවැසියන්ගේ ප්‍රතිචාරය යහපත් නොවේ නම් හා තොරතුරු හෙළි කිරීමට අකමැති බව පවසන්නේ නම් ප්‍රතික්ෂේප කළා යන 5 කේතය යොදන්න. ඔබේ අධීක්ෂණ නිලධාරියාට දන්වන්න.

✳ **හිස් නිවස/ස්ථානය නිවාස ඒකකයක් නොවේ.**

සමහර විට ඔබ යන අවස්ථාවේ නිවාස ඒකකයේ සියලු බඩු බාහිරාදිය ඉවත් කර නිවැසියන් ඉවත්ව ගොස් හිස් නිවසක් පමණක් තිබිය හැක.මෙවැනි අවස්ථාවකදී කේත 6 යොදන්න. සමහර අවස්ථාවක අදාල ඒකකය පදිංචි නිවාස ඒකකයක් නොව වෙළඳ සැලක්, සාප්පුවක් වැනි වෙනත් වර්ගයේ ඒකකයක් විය හැක. මෙහි ගෘහ කාණ්ඩයක් පදිංචිව සිටිදැයි හොඳින් සොයා බැලීමෙන් පසු එසේ නොමැති නම් 6 කේතය යොදා ඔබේ අධීක්ෂණ නිලධාරියාට දන්වන්න.

✳ **නිවස විනාශ වී ඇත. (කඩා දමා ඇත)**

නිවාස ඒකකය ගිනිගෙන හෝ වෙනත් ආකාරයකින් විනාශ කර දමා ඇත්නම් කේතය 7 යොදන්න. නිවැසියන් එම ස්ථානයේම නැවත යම් ආකාරයකින් පදිංචිවී ඇත්නම් තොරතුරු ලබා ගන්න.

✳ **නිවස සොයා ගත නොහැක.**

දී ඇති ලැයිස්තු ගත කිරීමේ පෝරමයට අනුව අදාල නිවස සොයාගත නොහැකි නම් අධීක්ෂණ නිලධාරී සමඟ නැවත උත්සාහ කරන්න. කෙසේවත් සොයා ගත නොහැකි නම් 8 කේතය කව කරන්න. මෙවැනි අවස්ථා ඉතා විරලයි.

✳ **වෙනත්**

ඉහත සඳහන් හේතුවලට අමතර හේතුවක් නිසා ඔබට සම්මුඛ පරීක්ෂණ සිදු කළ නොහැකි නම් 9 කව කර අදාල හේතුව සඳහන් කරන්න.

## අවසන් ප්‍රතිඵලය

අවසන් දිනයට පසු ඔබ අවසන් ප්‍රතිඵල කේතය හා අවසන් වරට නිවසට ගිය දිනය මාසය හා අවුරුද්ද කොටු තුළ සඳහන් කළ යුතුයි.

## ගෘහ කාණ්ඩයේ මුළු පුද්ගලයින් ගණන හා සුදුසු කාන්තාවන් ගණන

ගෘහ කාණ්ඩ උපලේඛණය සම්පූර්ණ කිරීමෙන් පසු ගෘහ කාණ්ඩයේ මුළු පුද්ගලයින් ගණන අදාල කොටු තුල සඳහන් කරන්න. එසේම කාන්තාවන්ගේ උපලේඛණය පිරවීමට සුදුසු කාන්තාවන් ගණනද ඒ සඳහා ඇති කොටුවේ සඳහන් කරන්න. සුදුසු ප්‍රතිචාරක කාන්තාවගේ පේළි අංකය ඒ සඳහා ඇති කොටුවල සඳහන් කරන්න.

## සුදුසු කාන්තාවන් එක් අයකුට වඩා වැඩි වූ අවස්ථාවක

ගෘහ කාණ්ඩ උපලේඛණය සම්පූර්ණ කිරමෙන් පසු සුදුසු සියළුම කාන්තාවන් සඳහා කාන්තාවන්ට අදාල උපලේඛණය බැගින් පිරවිය යුතුවේ. එම උපලේඛණයේ මුල් පිටුවේ ඇති හඳුනා ගැනීමේ තොරතුරු කොටස සම්පූර්ණ කළ යුතුය. ගෘහ කාණ්ඩ උපලේඛණ සඳහා සම්පූර්ණ කළ හඳුනා ගැනීමේ තොරතුරු මෙම උපලේඛණය සඳහාද සමානවන අතර සුදුසු ප්‍රතිචාරකගේ පේලි අංකය (ගෘහ කාණ්ඩ උපලේඛණයේ තිරු අංක 1 ට අනුව) සඳහන් කරන්න. සියලු උපලේඛණ සඳහා උස, බර හා හිමොග්ලොබින් මිණුම් අදාල කාන්තාවන් හා දරුවන් සඳහා සටහන් කල යුතුවේ.

## B(I) සහ B(II) කොටස - දරුවන් සහ දරුවන්ගේ මව (සුදුසු කාන්තාව) සඳහා බර, උස සහ හිමොග්ලොබින් මිනුම්

## (1.) හඳුනා ගැනීම

<u>දරුවන් හඳුනා ගැනීම (B(I) හි දක්වන්න)</u>

**ප්‍රශ්න අංක B60 සුදුසු දරුවන් හඳුනා ගැනීම**

<u>A කොටසෙහි තිරු අංක 12 පරීක්ෂා කර එහි ලැයිස්තුගත වී ඇති 2001 ජනවාරි හෝ ඊට පසු ඉපදුන සියළුම ජීවත් වන දරුවන් ඇතුලත් කළ යුතුය.</u>
ප්‍රතිචාරකගේ බාලම දරුවාගෙන් පටන් ගෙන ඊට වැඩිමල් දරුවන් පිළිවලට ඇතුළත් වන ආකාරයට ප්‍රශ්නාවලියේ දී ඇති වගුව සම්පුර්ණ කල යුතුය. ප්‍රතිචාරක කාන්තාවට 2001 ජනවාරි හෝ ඊට පසු දරුවන් 4 දෙනෙකුට වඩා සිටියි නම් ප්‍රතිචාරකගේ දරුවන් සඳහා ඇති අතිරේක පත්‍රිකාවේ (පත්‍රිකා අංක 1) අදාල විස්තර සටහන් කර ප්‍රශ්නාවලියට අමුණා තබන්න.

ප්‍රතිචාරක භාරයේ සිටින නමුත් ප්‍රතිචාරකගේ නොවන හෝ වෙනත් අයෙකු වග කියන, 2001 ජනවාරි හෝ ඊට පසු ඉපදුන දරුවන් <u>A කොටසෙහි ලැයිස්තුගත වී ඇත්නම්</u> එම දරුවන්ගේ පේලි අංකය අනුව උස හා බර මැනීම සහ රුධිර පරීක්ෂාව කළ යුතු අතර ඔවුන්ගේ එම තොරතුරු සටහන් කිරීමට ඒ සඳහා දී ඇති අතිරේක පත්‍රිකාව (පත්‍රිකා අංක 2) භාවිතා කර ප්‍රශ්නාවලියට අමුණා තබන්න.

**ප්‍රශ්න අංක B61 දරුවාගේ පේලි අංකය හා නම**

A කොටසේ තිරු අංක 12 සහ 2 නිරීක්ෂණය කර ප්‍රතිචාරක කාන්තාවගේ 2001 ජනවාරි හෝ ඊට පසු ඉපදුන දැනට ජීවත්ව සිටින සියළුම දරුවන්ගේ නම් බාලම දරුවාගෙන් පටන් ගෙන ලියා අදාල පේලි අංකය කොටුව තුල ලියන්න.

ප්‍රතිචාරක කාන්තාවගේ භාරයේ සිටින නමුත් ඇයගේ නොවන හෝ වෙනත් අයෙකු වග කියන, 2001 ජනවාරි හෝ ඊට පසු ඉපදුන දරුවන් <u>A කොටසේ ලැයිස්තුගත වී ඇත්නම්</u> එම දරුවන්ගේ පේලි අංකය අනුව උස, බර මැනීම සහ රුධිර පරීක්ෂාව කළ යුතු අතර, තොරතුරු ඔවුන් සඳහා දී ඇති අතිරේක පත්‍රිකාවේ සටහන් කරන්න.

**ප්‍රශ්න අංක B62 උපන්දිනය**

2 කොටසේ ප්‍රශ්න අංක 215 හි සටහන් කර ඇති ආකාරයට උපන් වර්ෂය, මාසය හා දිනය නිවැරදිව ලබා ගෙන මෙහි සටහන් කරන්න. මව සම්මුඛ පරීක්ෂණයට ලක් කලේ නොමැති නම් උපන් වර්ෂය, මාසය හා දිනය අසා දැන ගන්න. පිටපත් කිරීමේදී කිසිම වරදක් සිදු නොවන බවට වග බලා ගන්න.

**ප්‍රශ්න අංක B63 වයස පරීක්ෂාව**

B62 පරීක්ෂා කර දරුවන් ඉපදී ඇත්තේ 2001 ජනවාරි හෝ ඊට පසුදැයි නැවත පරීක්ෂා කරන්න. සටහන් කරන ලද බාලම දරුවා ඉපදී ඇත්තේ 2001 ජනවාරි වලට පෙර නම් BII කොටසේ B74 ට ගොස් කාන්තාවගේ මිනුම් ලබා ගන්න. බාලම දරුවා ඉපදී ඇත්තේ 2001 ජනවාරි හෝ ඊට පසු නම් ඔහුගේ හෝ ඇයගේ මිණුම් ලබාගෙන ඊට වැඩිමල් දරුවාගේ වයස පරීක්ෂා කරන්න. මෙලෙස ඇයගේ දරුවන් සියල්ලන්ගේම වයස පරීක්ෂා කර මිණුම් ලබා ගෙන කාන්තාවගේ මිණුම් ලබා ගන්න.

අනතුරුව ප්‍රතිචාරක කාන්තාව භාරයේ සිටින හෝ වෙනත් වැඩිහිටි අයෙකු වගකියන, A කොටසේ ලැයිස්තුගත වී ඇති 2001 ජනවාරි හෝ ඊට පසු ඉපදුන දරුවන්ගේ වයස පරීක්ෂා කර මිණුම් ලබා ගන්න.

<u>කාන්තාව (මව) හඳුනා ගැනීම ( B(II) හි දක්වන්න)</u>

**ප්‍රශ්න අංක B74 දරුවන්ගේ මව (සුදුසු කාන්තාව) හඳුනා ගැනීම**

A කොටසේ තීරු අංක 11 පරීක්ෂා කර සුදුසු කාන්තාව හඳුනාගන්න.

**ප්‍රශ්න අංක B75 මවගේ පේළි අංකය හා නම**

A කොටසේ තීරු අංක 11 සහ 2 නිරීක්ෂණය කර සුදුසු කාන්තාවගේ නම සහ අදාල පේළි අංකය කොටුව තුල ලියන්න.

**ප්‍රශ්න අංක B76 පසු ගිය උපන් දිනයට වයස**

A කොටසේ තීරු අංක 8 පරීක්ෂා කර සුදුසු කාන්තාවගේ පසුගිය උපන් දිනට වයස දක්වා ඇති කොටු තුළ ලියන්න.

## (2.) උස සහ බර මිනුම්

<u>දරුවන්ගේ උස සහ බර මිනුම් (B (I) හි දක්වන්න)</u>

**ප්‍රශ්න අංක B64 සහ B65 දරුවන්ගේ උස හෝ දිග, බර මැනීම**

උස/දිග මැනීම හා බර කිරීම සඳහා පත්කර ඇති ඔබ කණ්ඩායමේ නිළධාරීන් පුද්ගල ප්‍රශ්නාවලිය පුරවන අවස්ථාවේ දී ඒ අසලම සිටියි නම් සහ උස/දිග මැනීමට සහ බර කිරීමට සුදුසුකම් ලබන දරුවන් එම නිවසෙහි සිටියි නම් ඒ අවස්ථාවේදීම මේ කාර්‍යය නිමකර එම තොරතුරු දී ඇති කොටු තුල දක්වන්න.

එම නිළධාරීන් ඔබ පුද්ගල ප්‍රශ්නාවලිය පුරවා නිම කල අවස්ථාවේදී ඒ අසළ නොසිටියි නම් සහ උස/දිග මැනීමට සහ බර කිරීමට සුදුසුකම් ලබන දරුවන්ද සිටියි නම් ප්‍රශ්න අංක B61, B62 හා B63 දී හඳුනා ගැනීමේ තොරතුරු සටහන් කරන්න. සුදුසු දරුවන්ගේ නම් සහ පේළි අංක ද උපන් දිනද නිවැරදිව සටහන්

කර අධීක්ෂණ නිළධාරිගේ උපදෙස් පරිදි මේ තොරතුරු උස/දිග හා බර මනින නිළධාරියාට ලැබීමට සලස්වන්න. ඔහු විසින් එය නිවැරදිව ඉටු කල පසුව එම උස/ දිග හා බර තොරතුරු (ප්‍රශ්න අංක B64 හා B65) නිවැරදිව අදාල ප්‍රශ්න මාලාවේ නිවැරදි ස්ථානයේ ඇතුලත් කරන්න.

පහත දක්වා ඇති ආකාරයට උස හා බර සටහන් කරන්න.

උදා :

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| උස සෙ.මී 90.3 නම් | 0 | 9 | 0 | . | 3 |
| බර කි.ග්‍රෑ. 69.6 නම් | | 6 | 9 | . | 6 |

**ප්‍රශ්න අංක B66 උස මනින ලද අකාරය**

දරුවාගේ උස හෝ දිග මැන්නේ බිම දිගාකර තබාද එසේ නැති නම් සිටුවා තබා දැයි මෙහිදී සටහන් කරන්න. තොරතුරු ඇතුළත් කිරීමේදී මිනුම් ගැනීම 100% නිවැරදිව කළ බවට ඔබ වග බලා ගන්න.

**ප්‍රශ්න අංක B67 ප්‍රතිඵලය**

දරුවාගේ උස / දිග හා බර විවිධ හේතු නිසා සමහර විට මැන ගත නොහැකි වේ. ප්‍රශ්නයට පහලින් ඒ සඳහා අදාල කේත දී ඇත. එම කේත අනුව උස සඳහා අදාල තීරුවෙත් බර සඳහා අදාල තීරුවෙත් වෙන් වශයෙන් මිණුමේ ප්‍රතිඵලයට අදාල කේතය කව කළ යුතු අතර, තීරු දෙකෙහි අනිවාර්යයෙන්ම එක කේතය බැගින් කව වී තිබිය යුතුය.

<u>කාන්තාවගේ (මවගේ) උස සහ බර මිනුම් (B(II) හි දක්වන්න)</u>

**ප්‍රශ්න අංක B77 සහ B78 මවගේ උස සහ බර මැනීම**

දරුවන්ගේ උස සහ බර මනින අවස්ථාවේදීම මවගේ උස සහ බර ද මනින්න. ප්‍රශ්න අංක B64 සහ B65 හි දී ඇති උපදෙස් මේ සඳහා අනුගමනය කරන්න.

**ප්‍රශ්න අංක B79 ප්‍රතිඵලය**

මවගේ උස සහ බර ද විවිධ හේතු නිසා සමහර විට මැන ගත නොහැකි වේ. ප්‍රශ්නයට පහලින් ඒ සඳහා අදාල කේත දී ඇත. එම කේත අනුව උස සඳහා අදාල තීරුවෙත් බර සඳහා අදාල තීරුවෙත් වෙන් වශයෙන් මිණුමේ ප්‍රතිඵලයට අදාල කේතය කව කළ යුතු අතර, තීරු දෙකෙහි අනිවාර්යයෙන්ම එක කේතය බැගින් කව වී තිබිය යුතුය.

## (3.) හිමොග්ලොබින් මිනුම්

**දරුවන්ගේ හිමොග්ලොබින් මිනුම් (B (I) හි දක්වන්න)**

**ප්‍රශ්න අංක B68 ඇනිමියා පරීක්ෂාව සඳහා වයස පරීක්ෂාව**

වයස මාස 0 - 5 ත් අතර දරුවන් සඳහා ඇනිමියා පරීක්ෂාව සිදු නොකරයි. වයස මාස 6 හෝ ඊට වැඩි දරුවන් පමණක් මේ සඳහා යොදා ගැනේ. එම නිසා පළමුව දරුවන් මාස 0 - 5 අතරද දැයි පරීක්ෂා කළ යුතුය.

එනම් දරුවා ඉපදී ඇත්තේ සම්මුඛ පරීක්ෂණය සිදු කරන මාසයේ හෝ පෙර මාස 5 අතර නම් අදාල කේතය කව කරන්න. බාලම දරුවාගෙන් පටන් ගෙන මෙසේ දරුවන් වයස අනුව පරීක්ෂා කරන්න. වයස මාස 6 හෝ ඊට වැඩි දරුවන් B69 වෙත යොමු කරන්න. සිටින දරුවා මාස 0 - 5 ත් අතර නම් සහ තවත් දරුවන් නොමැති නම් BII කොටසේ B74 ට යන්න. සියළුම දරුවන් සඳහා මෙය පරීක්ෂා කරන්න.

| |
|---|
| බාලම දරුවා 0 - 5 ත් අතර සිටියි නම් සැමවිටම අනෙකුත් දරුවන්ගේ වයස ඊට වැඩි යැයි අනුමාන නොකරන්න. නිවුන් දරුවන් සිටින අවස්ථාවක මාස 0 - 5ත් අතර දරුවන් දෙදෙනෙකු හෝ ඊට වැඩිය සිටිය හැක. |

ප්‍රතිචාරක භාරයේ හෝ වෙනත් අයෙකු වග කියන දරුවන් ලැයිස්තු ගත වී ඇත්නම් ඔවුන්ගේ වයසද පරීක්ෂා කරන්න.

**ප්‍රශ්න අංක B69 මවගේ හෝ දරුවා සඳහා වගකිව යුතු වැඩිහිටි කෙනෙකුගේ පේළි අංකය**

A කොටසේ තීරු අංක 1 අනුව මව හෝ දරුවා සඳහා වගකිව යුතු වැඩිහිටි කෙනෙකුගේ පේළි අංකය මෙහි ඇති කොටු තුළ ලියා දක්වන්න. එම පුද්ගලයා ලැයිස්තු ගත වී නොමැති නම් '00' කොටු තුළ සටහන් කරන්න.

**ප්‍රශ්න අංක B70 ඇනිමියා පරීක්ෂාව සඳහා අවසර ගැනීම**

වයස මාස 6 හෝ ඊට වැඩි දරුවන් ඇනිමියා සඳහා පරීක්ෂා කිරීමට මවගෙන් හෝ දරුවා සඳහා වගකිව යුතු පුද්ගලයාගෙන් අවසර ලබා ගත යුතුය. ඒ සඳහා ඔබ ළඟ ඇති නිවේදනය ප්‍රතිචාරකට හෝ අදාල පුද්ගලයාට පවසන්න. දරුවා සඳහා ඇනිමියා පරීක්ෂාව සිදු කිරීමට අවසර දෙයි නම් කේත අංක 1 කව කර පරීක්ෂාව සිදු කරන්න. ප්‍රතික්ෂේප කළේ නම් කේත අංක 2 ද කව කර ප්‍රශ්න අංක B72 වෙත යොමුවන්න. පරීක්ෂාවට අවසර දුන්නත්, ප්‍රතික්ෂේප කළත් එම පුද්ගලයාගේ නම සහ අත්සන මෙහිදී ලබා ගැනීම කළ යුතුය.

**ප්‍රශ්න අංක B71 හිමොග්ලොබින් මට්ටම**

මෙහි දක්වා ඇති කොටු තුළ හිමොග්ලොබින් ප්‍රමාණය ලියා දක්වන්න.

**ප්‍රශ්න අංක B72 ප්‍රතිඵලය**

ඇනීමියා සඳහා පරීක්ෂා කලේ නම් කේත අංක 1 ද, පරීක්ෂා කලේ නැති නම් 2 හෝ 3 අතුරින් අදාල කේතයද කව කරන්න. වෙනත් හේතුවක් නම් කේත අංක 6 යටතේ එය සඳහන් කරන්න.

**ප්‍රශ්න අංක B73 යොමුවීම**

එම දරුවා සඳහා සියළුම මිනුම් නිම කළ පසු ඊලඟ දරුවා සඳහා ප්‍රශ්න අංක B61 ට යන්න. ප්‍රතිචාරකට තවත් දරුවන් නොමැති නම් B74 ට යන්න. ප්‍රතිචාරකගේ තවත් මෙම වයසේ දරුවන් නොමැති නම් මෙම නිවසේ සිටින අදාල වයසේම තවත් දරුවන් A කොටසේ ලැයිස්තුගත කර ඇත්දැයි බලන්න. එසේ ඇත්නම් පත්‍රිකා අංක 2 සම්පූර්ණ කරන්න.

අතිරේක පත්‍රිකා යොදා ගත්තේ නම් අදාල කොටු තුළ භාවිතා කළ පත්‍රිකා ගණන සටහන් කරන්න. අතිරේක පත්‍රිකා භාවිතා නොකලේ නම් එහි '0' සටහන් කරන්න.

<u>කාන්තාවගේ (මවගේ) හිමොග්ලොබින් මිනුම් (B(II) හි දක්වන්න)</u>

**ප්‍රශ්න අංක B80 ඇනීමියා පරීක්ෂාව සඳහා අවසර ගැනීම**

මව (සුදුසු කාන්තාව) ඇනීමියා සඳහා පරීක්ෂා කිරීමට අවසර ලබා ගත යුතුය. ඒ සඳහා ඔබ ලඟ ඇති නිවේදනය ප්‍රතිචාරකට පවසන්න. ප්‍රතිචාරක ඇනීමියා පරීක්ෂාව සිදු කිරීමට අවසර දෙයි නම් කේත අංක 1 කව කර පරීක්ෂාව සිදු කරන්න. ප්‍රතික්ෂේප කලේ නම් කේත අංක 2 ද කව කරන්න. පරීක්ෂාවට අවසර දුන්නත්, ප්‍රතික්ෂේප කළත් ප්‍රතිචාරක කාන්තාවගේ නම සහ අත්සන මෙහිදී ලබා ගැනීම කළ යුතුය.

**ප්‍රශ්න අංක B81 ගර්භනී භාවය පරීක්ෂා කිරීම**

මේ සඳහා ප්‍රශ්න අංක 226 නැවත බලන්න හෝ ඔබ ගැබ් ගෙනද ලෙස අසන්න. ඒ අනුව අදාල කේතය කව කරන්න.

**ප්‍රශ්න අංක B82 ඇනීමියා පරීක්ෂාව සඳහා උපකරණ සූදානම් කර ගැනීම**

**ප්‍රශ්න අංක B83 හිමොග්ලොබින් මට්ටම**

මෙහි දක්වා ඇති කොටු තුළ ඇයගේ හිමොග්ලොබින් ප්‍රමාණය ලියා දක්වන්න.

**ප්‍රශ්න අංක B84 ප්‍රතිඵලය**

ඇනීමියා සඳහා පරීක්ෂා කලේ නම් කේත අංක 1 ද, පරීක්ෂා කලේ නැති නම් 2 හෝ 3 අතුරින් අදාල කේතයද කව කරන්න. වෙනත් හේතුවක් නම් කේත අංක 6 යටතේ එය සඳහන් කරන්න.

ප්‍රශ්න අංක B85 Bar Code Label

## 6. පුද්ගල උපලේඛණය

**පුද්ගල උපලේඛණය පහත කොටස් වලින් සමන්විතය.**

1. ප්‍රතිචාරකගේ පසුබිම
2. ප්‍රජනනය
3. උපත් පාලනය
4. පෙර හා පසු ප්‍රසව පරීක්ෂාව
5. දරුවාගේ ප්‍රතිශක්තිකරණය, සෞඛ්‍ය තත්වය හා දරුවාගේ හා මවගේ පෝෂණය
6. ලිංගික හැසිරීම් රටාව
7. දරුඵල ගැන කැමැත්ත
8. සැමියාගේ පසුබිම, රැකියාව හා ප්‍රතිචාරකගේ රැකියාව පිළිබඳ තොරතුරු
9. ඒඩ්ස් රෝගය හා වෙනත් ලිංගික රෝග පිළිබඳ දැනුම
10. වෙනත් සෞඛ්‍ය විස්තර

**හඳුනාගැනීමේ තොරතුරු**

මෙහි හඳුනාගැනීමේ තොරතුරු ගෘහ කාණ්ඩ උපලේඛණයේ අදාල තොරතුරුවලට බොහෝ දුරට සමානය. ප්‍රධාන වෙනස වන්නේ සම්මුඛ පරීක්ෂණයට භාජනය වන කාන්තාවගේ පේලි අංකය මෙම උපලේකණයේ සඳහන් කළ යුතුය. මීට අමතරව අවසාන ප්‍රතිඵල සඳහා දී ඇති කේත වලද වෙනසක් ඇත. පුද්ගල උපලේඛණයක් පුරවන්නේ නම් අනිවාර්යයෙන්ම හඳුනා ගැනීමේ තොරතුරු සම්පූර්ණ කළ යුතුය.

**පුද්ගල උපලේඛනය සම්පූර්ණ කිරීමේදී ඇතිවිය හැකි ගැටළු හා ප්‍රතිඵල කේත යෙදීම**

සුදුසු කාන්තාව ඔබ නිවසට යන අවස්ථාවේ නිවසේ නොසිටියේ නම් දිනය හා ප්‍රතිඵල කේත 2 යොදා නැවත ඇය මුනගැසිය හැකි දිනයක් නිවසේ සාමාජිකයන්ගෙන් අසා ගන්න. වාර තුනක් දක්වා මුණගැසීමට උත්සාහ කරන්න.

උපලේඛනයේ කොටසක් පමණක් සම්පූර්ණ කර ගත හැකි වූවා නම් දිනය හා 3 කේතය යොදා නැවත පැමිණිය හැකි දිනයක් අසා දැනගන්න.

ඔබ විසින් සමීක්ෂණයේ සියලු අරමුණු හා රහස්‍යභාවය විස්තර කර දීමෙන් පසුව වුවද ප්‍රතිචාරක තොරතුරු දීම ප්‍රතික්ෂේප කිරීමේ අවස්ථා තිබිය හැක. ඇයට මේ අවස්ථාවේ අපහසු නම් නැවත මුණගැසිය හැකිදැයි විමසන්න. එසේ වුවත් අකමැති බව පවසන්නේ නම් කේත 4 යොදා අධීක්ෂණ නිලධාරිණියට දන්වන්න.

උපලේඛණයේ කොටසක් පමණක් සම්පූර්ණ කර ගත් විට යම් හේතුවක් නිසා ඉදිරියට ගෙනයාමට අපහසු වූවා නම් යන වෙනත් දිනයක්ද යොදා ගැනීමට නොහැකිවුවහොත් දිනය හා 5 කේතය යොදන්න. කෙසේ වුවත් නැවත දිනයක ගොස් සම්පූර්ණ කර ගැනීමට උත්සාහ කරන්න.

උපලේඛණය සම්පුර්ණ කිර්මට ප්‍රතිචාරකට නිවැරදිව පිළිතුරු දීමට අපොහොසත් බව හෝ යම් ආකාරයක පසුබැමක් ප්‍රශ්න අවබෝධ නොවීමක් වැනි අබාධයක් ඇති බව ඔබට තේරුනොත් ඇයගේ තොරතුරු නිවැරදි ඒවා නොවිය හැක. එවැනි අවස්ථාවක් හොදින් තේරුම් ගෙන දිනය හා කේත 6 කව කරන්න.

අවසානය පැමිණීමෙන් පසු අදාල අවසන් ප්‍රතිඵලය හා දිනය මාසය අවුරුද්ද සම්පූර්ණ කරන්න.

## 6.1 කොටස

### පළමු කොටස - ප්‍රතිචාරකගේ පසුබිම

මෙහිදී මුලින්ම ඔබ විසින් සමීක්ෂණය සඳහා ප්‍රතිචාරකගේ අවසරය ලබා ගත යුතු වාක්‍ය කොටස කියවා ඒ පිළිබඳව ඇයගේ කැමැත්ත ලබා ගත යුතුවේ. සමීක්ෂණයේ සම්පූර්ණ අරමුණ හා රහස්‍යභාවය එහි අඩංගු වන අතර ප්‍රතිචාරක ස්ව කැමැත්තෙන් මේ සඳහා සහයෝගය දිය යුතු වේ. වාක්‍ය කියවීමෙන් අනතුරුව ඒ පිළිබඳ සහතිකවන බවට එහි ඇති සම්මුඛ පරීක්ෂක නිලධාරිනියගේ අත්සන යන කොටසේ ඔබ අත්සන් තබා දිනය යෙදිය යුතුය. අනතුරුව ප්‍රතිචාරක සම්මුඛ පරීක්ෂණයට එකඟ වන්නේ නම් 1 කේතය යොදා ආරම්භ කරන්න. එකඟ නොවූයේ නම් 2 කේතය කව කර ප්‍රතිඵල සඳහන් කළ යුතු කොටුවේ 4 කේතය යොදා සම්මුඛ පරීක්ෂණ අවසන් කරන්න.

#### අදාල ලියකියවිලි සොයා ගන්නා ලෙස ප්‍රතිචාරකගෙන් ඉල්ලීම

සම්මුඛ පරීක්ෂණය පටන් ගැනීමට පෙර අදාල වයස් කාණ්ඩවල දරුවන්ගේ උප්පැන්න සහතික, මවගේ හා ගර්භනී සටහන් පත් ආදිය සොයා ගෙනෙන ලෙස ඇයගෙන් ඉල්ලීමක් කරන්න. නැතහොත් ඔබට මේවා සොයනතුරු කාලය වැය කිරීමට සිදුවනු ඇත.

**ආරම්භක වේලාව**

**ප්‍රශ්න අංක 101** **වේලාව 24 පැයෙන් සටහන් කරන්න.**

| | | | |
|---|---|---|---|
| උදා - | උදෑසන 9.30 | පැය | 09 |
| | | මිනිත්තු | 30 |
| | සවස 4.30 | පැය | 16 |
| | | මිනිත්තු | 30 |

**ප්‍රශ්න අංක 102** **ඔබ කොපමණ කාලයක් මෙම ස්ථානයේ නොකඩවා ජීවත්ව සිටිනවාද ?**

ප්‍රතිචාරක කාන්තාව මෙම සමීක්ෂණය සිදු කරන ස්ථානයේ ජීවත්වූ කාල සීමාව දැන ගැනීම මෙහි අරමුණයි. නොකඩවා ජීවත්වීම යනු එම ප්‍රදේශයෙන් පිටත පදිංචියට නොගොස් ජීවත්වූ කාලයයි.

උදා :- ප්‍රතිචාරක යම් අවශ්‍යතාවයක් සඳහා ප්‍රදේශයෙන් පිටතට කීප වරක් ගොස් ආපසු පැමිණීම ප්‍රදේශයෙන් පිටත ජීවත්වීමක් ලෙස සැලකිය නොහැක. ජීවත්වන ප්‍රදේශයේම එක් වාසස්ථානයකින් තවත් වාසස්ථානයකට පදිංචිය මාරු කිරීමද ප්‍රදේශය වෙනස්වීමක් ලෙස සැලකිය නොහැක. අවුරුද්දකට වඩා වෙනත් ස්ථානයක ජීවත්ව සිට නැවත පැමිණියේ නම් පදිංචිය වෙනස්වීමක් ලෙස සැලකිය හැක.

ඇය උපන්දා සිට දිගටම මෙම ස්ථානයේ පදිංචිව සිටියේ නම් 95 කව කරන්න. ප්‍රතිචාරක අමුත්තෙක් නම් 96 කව කරන්න. ඇය වෙනත් ප්‍රදේශවල ජීවත්ව සිටි කෙනෙක් නම් මෙම ප්‍රදේශයට අවසන් වරට පැමිණ

දැනට කොපමණ කල්දැයි ප්‍රශ්න කරන්න. සම්පූර්ණ වූ අවුරුදු ගණන කොටු තුල ලියන්න. අවුරුද්දට අඩු නම් 00 ලියන්න.

**ප්‍රශ්න අංක 103 කලින් ජීවත්වූයේ නගරබද ප්‍රදේශයකද, ග්‍රාමීය හෝ වතු ප්‍රදේශයකද ?**

මෙම ප්‍රදේශයට පැමිණීමට කලින් අවසාන වර ජීවත්වූ ප්‍රදේශයට අනුව අදාල කේතය කව කරන්න. පිටරටක නම් 104 ට යන්න.

**ප්‍රශ්න අංක 103A කලින් සිටි දිස්ත්‍රික්කය**

මෙම ස්ථානයට කලින් පදිංචිව සිටි දිස්ත්‍රික්කය සඳහන් කරන්න. එම දිස්ත්‍රික්කයේම නම් 99 කව කරන්න.

**ප්‍රශ්න අංක 104 පසුගිය උපන් දිනයට ඔබේ වයස කීයද ?**

ප්‍රතිචාරක කාන්තාවගේ වයස හා උපන් දිනය ගෘහ කාණ්ඩ උපලේඛණයේදී දැනටමත් සඳහන් කරගෙන ඇතත් නැවතත් ඔබ විසින් ඇයගේ උපන් දිනය විමසා ඒ අනුව වයස (වයස් නිශ්චායක වගුව අනුව) සඳහන් කර ගත යුතු වේ.

**ප්‍රශ්න අංක 105 - ෆිල්ටර්**

ප්‍රතිචාරකගේ අධ්‍යාපන තත්වය අනුව කොටස් 2 කට යොමු කෙරේ. A කොටසේ තීර 13 සඳහා නොදනී හෝ තීර 14 සඳහා නොදනී යයි පවසා ඇත්නම් ප්‍රතිචාරකගෙන් නැවත විමසා පිළිතුරු දැන ගන්න. අනතුරුව ද්විතියික හෝ උසස් අධ්‍යාපනය ලබා ඇත්නම් ප්‍රශ්න අංක 108 ටද අනිකුත් අය ප්‍රශ්න අංක 106 ටද යොමු කෙරේ.

**ප්‍රශ්න අංක 106** ප්‍රශ්න 106 දී කියවීමේ හැකියාව විමසා බලනු ලැබේ. නිරීක්ෂණයෙන් පසු අදාල කේත වලින් එකක් කව කරන්න.

**ප්‍රශ්න අංක 107 ෆිල්ටර්**

ප්‍රශ්න අංක 106 හි සඳහන් කේත අනුව මෙහි දක්වා ඇති අදාල ප්‍රශ්නවලට යොමු කරන්න.

**ප්‍රශ්න අංක 108**

ප්‍ර. 106 හි 2 හෝ 3 කව කළ හා ප්‍ර. 105 න් ඉහළ අධ්‍යාපනය ලැබූ කාන්තාවන් මෙම ප්‍රශ්නය සඳහා යොමු වේ. මෙම ප්‍රශ්නයෙන් බලාපොරොත්තු වන්නේ කාන්තාව පත්තර, සඟරා වැනි කියවීමේ මාධ්‍යය තුලින් බාහිර ලෝකයේ සිදුවීම් පිළිබඳ දැනුවත්වී ඇත්ද යන්න දැනගැනීමයි.

**ප්‍රශ්න අංක 109/ප්‍රශ්න අංක 110**

ඇය විසින් පවසන අන්දමට අදාල කේතයන් කව කරන්න.

**ප්‍රශ්න අංක 111**

අසා ඇති එක් එක් අවස්ථාවන් වලදී සබන් යොදා අත් සෝදා ගැනීමේ පුරුද්දක් ඇත්දැයි යන්න විමසා සුදුසු කේතය කව කරන්න.

**ප්‍රශ්න අංක 112/ ප්‍රශ්න අංක 113**

ප්‍රතිචාරකගේ ආගම හා ජාතිය විමසා අදාල කේතය කව කරන්න.

**ප්‍රශ්න අංක 114 වර්තමාන විවාහක තත්වය**

මෙහිදී ප්‍රතිචාරකගේ දැන් පවතින විවාහක තත්වය අසනු ලබයි. එනම් වර්තමානයේ විවාහකද, විවාහ නොවී පුරුෂයකු සමග ජීවත්වනවාද, නැතිනම් පුරුෂයකු සමග ජීවත් නොවේද යන්න විමසිය යුතුය. 1 සහ 2 කේත අතර වෙනස පැහැදිලිව වටහා ගන්න. මෙහිදී ප්‍රතිචාරක විවාහවී ඇත හෝ විවාහ නොවී පුරුෂයකු සමග එකට ජීවත්වනවා යැයි පැවසුවහොත් ඒ අනුව (එනම් කව විය යුත්තේ 1 හෝ 2 කේතය) අදාල කේතය කව කල යුතුය.

කලින් විවාහයෙන්/සහකරුගෙන් දික්කසාද හෝ වෙන් වී හෝ පෙර ස්වාමි පුරුෂයා/සහකරු මිය ගිය බැවින් දැනට විවාහක හෝ පුරුෂයකු සමග ජීවත් වේ නම් ප්‍රතිචාරකගේ පිළිතුර පරිදි 1 හෝ 2 කව කරන්න.

කලින් විවාහයෙන් දික්කසාද හෝ වෙන් වී දැනට අවිවාහක හෝ පුරුෂයකු සමග ජීවත් නොවේ නම් හෝ පෙර ස්වාමිපුරුෂයා හෝ එකට ජීවත් වූ පුද්ගලයා මිය ගොස් ඇය තනිව ජීවත් වේ නම් කේත අංක 3 කව විය යුතුය.

තම විවාහයෙන් දික්කසාද වී නැතත් දැනට කසාදයෙන් පිටත කිසියම් පුරුෂයකු සමග ජීවත් වේ නම් ඇය සඳහා කේත 2 කව කරන්න.

<u>සටහන</u>

"විවාහ නොවී පුරුෂයකු සමග ජීවත් වේ" යන්නෙන් අදහස් කරනුයේ ප්‍රතිචාරක යම්කිසි පුරුෂයකු සමග කල් පවතින නිත්‍ය බැඳීමක් සහිතව කිසියම් කාලයක් එකට ජීවත් වන නමුත් ලියාපදිංචිවීමකින් ආරම්භ නොකල සබඳතාවයකි. එනම් ඔවුන් දීර්ඝ කාලීනව ජීවත් වන හෝ ඉදිරියේදී දීර්ඝ කාලීනව ස්ථිරවම එකට ජීවත් වීමේ බලාපොරොත්තුවෙන් එකට වාසය කරයි. කෙටි කාලීන ලිංගික සබඳතාවයන් මෙහිදී ඇතුලත් කල යුතු නැත.

උදා :
යම්කිසි කාන්තාවක් තම පෙම්වතා සහ ඔහුගේ පවුලේ අය සමග අවුරුදු ගණනක් එකට ජීවත් වුයේ නම්, දරුවන් සිටියත් නැතත් ඇය " පුරුෂයකු සමග ජීවත් වන " ලෙස සැලකිය යුතුය. කාන්තාවක් තම පෙම්වතා සමග එකට ජීවත් නොවේ නම් ඇය අවිවාහක හෝ පුරුෂයකු සමග ජීවත් නොවන ලෙස සැලකිය යුතුය.

කේත අංක 1 සහ 2 කව කල අය සදහා අදාල යොමු වීම (ප්‍රශ්න අංක 117) අනුගමනය කරන්න. පුරුෂයකු සමග එකට ජීවත් නොවන කාන්තාවන් හා ස්වාමිපුරුෂයා/සහකරු මිය ගිය කාන්තාවන් සදහා කේත අංක 3 කව කර ප්‍රශ්න අංක 115 වෙත යොමු කරන්න.

**ප්‍රශ්න අංක 115 කවදා හෝ පැවති විවාහකත්වය**

ප්‍රශ්න අංක 114 සදහා කේත අංක 3 කව කල කාන්තාවන්ගෙන් මෙය විමසිය යුතුය. එනම් වර්තමානයේ පුරුෂයකු සමග එකට ජීවත් නොවන හා පුරුෂයා මිය ගියේ යයි සදහන් කළ කාන්තාවන් පුරුෂයකු සමහ විවාහ වී සිටියේද ? එසේ නැත්නම් පුරුෂයකු සමග එකට ජීවත්ව සිටියේද ? යන්න පැහැදිලිව විමසන්න. ඇය දෙන පිළිතුර අනුව අදාල කේතය කව කරන්න.

**ප්‍රශ්න අංක 116 වර්තමාන විවාහකත්වය (දික්කසාද, වැන්දඹු, වෙන්වූ)**

සම්මුඛ පරීක්ෂණ දිනයේදී පුරුෂයකු සමග එකට ජීවත් නොවන කාන්තාවන් වෙත මෙම ප්‍රශ්නය යොමු විය යුතුය. මෙම කාන්තාවන් මීට පෙර විවාහ වී ඇති හෝ පුරුෂයකු සමග ජීවත් වූ කාන්තාවන්ය. දැන් ඇය දික්කසාද, වැන්දඹු හෝ වෙන් වී සිටී දැයි විමසන්න.

ඇය විවාහ වී සිටි ස්වාමිපුරුෂයා හෝ එකට ජීවත් වූ සහකරු මිය ගොස් ඇත්නම් සහ ඇය දැනට තනිකඩ ජීවිතයක් ගෙවයි නම් එවැනි කාන්තාවන් සදහා "වැන්දඹු" එනම් 1 කේතය කව විය යුතුය. ප්‍රශ්න අංක 114 දී ස්වාමි පුරුෂයා මියගොස් ඇය තනිව ජීවත්වේ යැයි ප්‍රතිචාරක පැවසුවහොත් නොවිමසා "වැන්දඹු -1" කව කරන්න. පෙර පැවති විවාහයෙන් දික්කසාද වී හෝ වෙන් වී සිටී නම් සහ ඇය දැනට තනිව ජීවත් වේ නම් ඒ අනුව "දික්කසාද" හෝ "වෙන් වී සිටියි" යන කේත කව කරන්න.

**ප්‍රශ්න අංක 117 ස්වාමි පුරුෂයා/සහකරු ජීවත් වන ස්ථානය**

ප්‍රතිචාරක කාන්තාව, ස්වාමිපුරුෂයා හෝ එකට ජීවත් වන සහකරු සමග සැමදාම නිවසේ එකට ජීවත් වනවාදැයි අසා ඇන ගන්න. ප්‍රතිචාරකගේ සහකරු සාමාන්‍යයෙන් ඇය සමග ජීවත් වනවා නම් එනම් තාවකාලිකව වෙනත් තැනක නැවතී රැකියාවට ගියත් ඇය සමහ ජීවත්වන ලෙස සදහන් කරන්න. මාස 6කට වත් වරක් නිවසට නොපැමිණියේ නම් (එනම් විදේශගත වැනි දිගු කලකට වරක් පැමිණෙන) වෙනත් තැනක ජීවත්වන ලෙස සලකන්න.

**ප්‍රශ්න අංක 118 ස්වාමිපුරුෂයා/සහකරුගේ නම සහ පේළි අංකය**

A කොටසේ (1) තීරුවේ සහ (2) තීරුවේ දක්වා ඇති පරිදි ඇයගේ ස්වාමිපුරුෂයා/සහකරුගේ පේළි අංකය සහ නම සටහන් කරන්න. ස්වාමිපුරුෂයා/සහකරු නිවසේ සිටින සාමාජිකයකු ලෙස A කොටසේ ලැයිස්තු ගත වී නොමැති නම් පේළි අංකය සඳහා '00' සටහන් කරන්න.

**ප්‍රශ්න අංක 119 විවාහ වූ වාර ගණන**

ප්‍රශ්න අංක 114 දී නීත්‍යානුකූල මෙන්ම නීත්‍යානුකූල නොවන (දීර්ඝ කාලයක් පුරුෂයකු සමග ජීවත් වන) විවාහ ගැනද විමසා බලයි. මෙහිදී එසේ විවාහ වූ වාර ගණන අසනු ලබයි.

ඇය තම ජීවිත කාලය තුලදී (සම්මුඛ පරීක්ෂණ දිනය දක්වා) විවාහ වී සිටියේ හෝ පුරුෂයකු සමග ජීවත් වූයේ එක් වරක් පමණක් නම් කේත අංක 1 කව විය යුතුය.

විවාහ වූ හෝ පුරුෂයකු සමග ජීවත් වූ කාන්තාවක් දික්කසාද හෝ වැන්දඹු හෝ වෙන්වී නැවත විවාහ වී හෝ දීර්ඝ කාලයක් තිස්සේ ස්ථිරවම එකට පුරුෂයකු සමග ජීවත් විය හැක. මෙවිට එම කාන්තාව එක් වරකට වඩා විවාහ වී හෝ පුරුෂයකු සමග ජීවත් වූ කාන්තාවක් ලෙස සැලකේ . මෙසේ කාන්තාවක්, කිහිපවරක් විවාහ වී හෝ පුරුෂයින් සමග එකට ජීවත් විය හැක. මෙවැනි අය සඳහා කේත අංක 2 කව කරන්න.

කාන්තාව සම්මුඛ පරීක්ෂණ සිදු කරන මාසයේ තනි ජීවිතයක් ගත කලත්, ඊට පෙර විවාහ වී හෝ පුරුෂයකු සමග ජීවත් වූයේ එක් වරක් පමණක් නම් කේත අංක 1 කව විය යුතු අතර ඇය එක් වරකට වඩා විවාහ වී හෝ පුරුෂයකු සමහ ජීවත් වූයේ නම් කේත අංක 2 කව විය යුතුය.

**ප්‍රශ්න අංක 120 සැමියා/සහකරු සමග ස්ථිරවම එකට ජීවත් වීමට පටන් ගත් මුල්ම දිනය**

මෙම ප්‍රශ්නය සඳහා ද ප්‍රශ්න අංක 119 පරීක්ෂා කරන්න. ඒ අනුව ප්‍රශ්න අංක 120 හිදී අදාල කොටුව තුල " ✓" ලකුණ දමා එයට අදාල ප්‍රශ්නය ප්‍රතිචාරක වෙත යොමු කර පිළිතුර සටහන් කරන්න.

විවාහ වී ඇත්තේ හෝ පුරුෂයකු සමහ ජීවත් වී ඇත්තේ එක් වරක් පමණක් නම් වම් පැත්තේ කොටුව තුළ "✓" ලකුණ දමා සැමියා/පුරුෂයා සමහ ජීවත්වීමට පටන්ගත් වර්ෂය හා මාසය විමසන්න.

කිහිපවරක් විවාහ වී හෝ පුරුෂයන් කිහිප දෙනෙකු සමහ ප්‍රතිචාරක ජීවත් වී ඇත්නම්, දකුණු පැත්තේ කොටුවේ " ✓" ලකුණ දමා ප්‍රථම ස්වාමිපුරුෂයා සමග හෝ ප්‍රථමයෙන්ම එකට ජීවත් වූ පුද්ගලයා සමග ස්ථිරවම එකට ජීවත් වීමට පටන් ගත් වර්ෂය හා මාසය විමසිය යුතුය.

ඇයට එම කාලය මතක නැති නම් ඔබ තව දුරටත් විමසිය යුතුය. මේ සඳහා දරුවන් ඉපදී ඇති කාලසීමාවන් ප්‍රයෝජනයට ගත හැක. ඇයගේ ප්‍රථම දරු උපත සිදු වූ වර්ෂය සහ මාසය විමසීමෙන් ඊට කොපමණ කාලයකට පෙර ඇය ස්වාමිපුරුෂයා සහකරු සමග ජීවත් වීමට පටන් ගත්තා දැයි විමසන්න.

මෙහිදී අප දැන ගැනීමට විමසිලිමත් විය යුත්තේ ඇය ප්‍රථම වරට විවාහ වූ හෝ දීර්ඝ කාලයක් ජීවත්වීමට සිතා ප්‍රථම වරට ස්ථිරවම පුරුෂයකු සමග එකට ජීවත් වීමට පටන්ගත් වර්ෂය සහ මාසයයි.

විවාහ වූ දිනයේ දී හෝ දීර්ඝ කාලයක් ජීවත් වීම අරමුණු කොට ගෙන ප්‍රථම වරට පුරුෂයකු සමග ස්ථිරවම එකට ජීවත් වීමට පටන් ගත් දිනයේ දී ප්‍රථම ලිංගික එකතු වීම සිදුවිය හැක. එසේම ප්‍රථම ලිංගික එකතු වීමට පසු කාලයකදී විවාහය හෝ පුරුෂයකු සමග ස්ථිරවම එකට ජීවත් වීමට පටන් ගත හැක.

උදා :
ප්‍රථමයෙන් අනපේක්ෂිත ලෙස කාන්තාවකට පුරුෂයකු සමග ලිංගිකව එකතු වීමට සිදු වූයේ යැයි සිතන්න. එම සිදු වීමෙන් පසු එතැන් පටන් ඇය ඔහු සමග විවාහ වී හෝ ස්ථිරවම එකට ජීවත්වීමට පටන් ගත්තේ නම්, එය ඇය **ප්‍රථමයෙන්ම පුරුෂයකු සමග විවාහ වීම හෝ ජීවත් වීම පටන් ගත් දිනය** වේ. එම සිදුවීමෙන් පසු, කාලයක් ඇය තනිව ජීවත් වී පසුව සිදුවීමට සම්බන්ධ පුද්ගලයා සමග හෝ වෙනත් පුරුෂයකු සමග ස්ථිරවම එකට ජීවත් වීමට පටන් ගත්තේ නම් එසේ එකට ජීවත් වීමට පටන් ගත් දිනය ඇය ප්‍රථමයෙන්ම පුරුෂයකු සමග විවාහ වීම හෝ ජීවත් වීම පටන් ගත් දිනය වේ. එවිට ඇයට අනපේක්ෂිත සිදුවීමෙන් ගැබ් ගැනීම නිසා දරු ප්‍රසූතියක්ද සිදුවී තිබිය හැක.

අනපේක්ෂිත ලිංගික හැසිරීමකට පසු හෝ එහි ප්‍රතිඵලයක් ලෙස ඇති වූ ප්‍රථම දරු උපතට පසු තම ප්‍රථම විවාහක ස්වාමිපුරුෂයා හෝ ප්‍රථම සහකරු සමග දීර්ඝ කාලයක් ස්ථිරවම එකට ජීවත් වීමට පටන් ගත් මෙවැනි අවස්ථා හමු විය හැක. ප්‍රථම දරු උපත සිදු වූ වර්ෂය හා මාසය අනුව මෙයද විමසිය හැක.

එබැවින් ඇයගේ විවාහය හෝ පුරුෂයකු සමග ස්ථිරවම එකට ජීවත් වීමට පටන් ගැනීම සැමවිටම ප්‍රථම දරු ප්‍රසූතියට පෙර යැයි අනුමාන නොකරන්න.

මෙහිදී ඇය අවුරුදු දෙකකට පෙරදී විවාහය හෝ එකට ජීවත් වීමට පටන් ගත්තා යැයි පැවසුවහොත් එමගින් වර්ෂය හෝ මාසය දැන ගැනීමට විමසන්න. ප්‍රථම දරු උපත සිදු වූ හෝ ප්‍රථම ගැබ් ගැනීම සිදු වූ හෝ ප්‍රථම වරට ලිංගිකව එකතු වූ හෝ වර්ෂය හෝ මාසය දැන ගැනීම මෙහි අරමුණ නොවේ.

ප්‍රශ්න අංක 120 දී වර්ෂය හා මාසය යන දෙවර්ගයම සටහන් කල යුතුය. මාසය නොදනී නම් '98' කේතයද වර්ෂය නොදනී නම් '9998' කේතයද කව කර අදාල යොමුවීම අනුගමනය කරන්න.

## ප්‍රශ්න අංක 121 ස්වාමිපුරුෂයා/සහකරු සමග ස්ථිරවම එකට ජීවත් වීමට පටන් ගන්නා විට ප්‍රතිචාරකගේ වයස

ප්‍රතිචාරක තම ප්‍රථම ස්වාමිපුරුෂයා හෝ ප්‍රථම සහකරු සමග ප්‍රථම වරට ස්ථිරවම එකට ජීවත්වීමට පටන් ගත් වර්ෂය අසා දැන ගැනීමට නොහැකි නම් මෙම ප්‍රශ්නය ප්‍රතිචාරක වෙත යොමු කල යුතුය. ඇය ප්‍රථම වරට එසේ ප්‍රථම සැමියා /ප්‍රථම සහකරු සමග ස්ථිරවම එකට ජීවත් වීමට පටන්ගන්නා විට වයස අසා දැන ගන්න. ඇය වයස නොදනී නම් හෝ අමතක නම්, වයස නොදන්නා විට දැන ගැනීමට විමසන අයුරු තව දුරටත් විමසන්න. මේ සඳහා ඔබ ලග දැනටමත් ඇති තොරතුරු උදව් කර ගන්න.

උදා :

ඇයට ප්‍රථම දරු උපත සිදුවන විට වයස කීයද, ප්‍රථම දරු උපත සිදුවීමට කොපමණ කාලයට පෙර හෝ පසු ඇය ප්‍රථම ස්වාමිපුරුෂයා හෝ සහකරු සමග ස්ථිරවම එකට ජීවත් වීමට පටන් ගත්තාද ලෙස විමසන්න. කෙසේ හෝ සියළුම සැසදුම් හෝ ඇස්තමේන්තු සිදුකර ප්‍රථම ස්වාමිපුරුෂයා/සහකරු සමග ස්ථිරවම එකට ජීවත් වීමට පටන් ගන්නා විට ප්‍රතිචාරකගේ වයස දැන ගත යුතු අතර කිසිවිටකත් මෙම කොටු හිස්ව නොතබන්න.

**ප්‍රශ්න අංක 122 විවාහක හෝ පුරුෂයින් සමග විටක ජීවත් වූ කාල සීමාවන් කැලැන්ඩරයේ ලකුණු කිරීම.**

ප්‍රතිචාරක වර්ෂ 2001 සිට විවාහ වී හෝ පුරුෂයකු සමග එකට සිටි මාස නිශ්චිතව දැන ගන්න. 2001 වර්ෂයේ සිට ඇය එසේ සිටි සෑම මාසයක් සඳහාම කැලැන්ඩරයේ තීරු 4 හි " X" සටහන් කරන්න. ඇය අවිවාහකව හෝ පුරුෂයකු සමග එසේ නොසිටි සෑම මාසයක් සඳහාම "0" සටහන් කරන්න. දැනට විවාහක හෝ පුරුෂයකු සමග ජීවත් වන කාන්තාවන්ට මෙන්ම දැනට පුරුෂයකු සමග ජීවත් නොවන කාන්තාවන්ට, විවාහයන් හෝ පුරුෂයින් කිහිප දෙනෙකු සමග වරින් වර ජීවත්වීම් පෙර තිබුණි නම් ඒවා පටන් ගත් සහ නිමා කල දිනයන් විමසා දැන ගැනීමෙන් අදාල කාලය සඳහා කැලැන්ඩරයේ " X" සහ " 0" ලකුණු කිරීම පහසුවේ.

## 6.2 කොටස

### දෙවන කොටස - ප්‍රජනනය

මෙම කොටසේදී කාන්තාවගේ ජීවිත කාලය තුළදී ඇයට ලැබුණු සියළුම උපත්, ඇගේ වර්තමාන ගැබ් ගැනීමක් ඇත්නම් ඒ පිළිබඳ තොරතුරු එමෙන්ම සමීක්ෂණයට අවු. 05 ට කලින් කාලය තුල සජීවී උපතකින් නිමනොවී ඇයට තිබූ ගැබ් ගැනීම්, ඇගේ අවසාන මාස් ශුද්ධිය සිදු වූ කාලය හා මාසික ඔසප් චක්‍රය පිළිබඳ ඇගේ දැනුම පිළිබඳ තොරතුරු ආදිය විමසනු ලැබේ.

**ප්‍රශ්න අංක 201-211 සහ 221 දක්වා ප්‍රශ්න සම්පූර්ණ කිරීමේදී අවධානය යොමු කළ යුතු කරුණු**

මෙම කොටස් දෙකට අදාල ප්‍රශ්නවලින් විමසනු ලබන්නේ පියා කවරකු වුවද ප්‍රතිචාරකට ලැබුණු සියළුම උපත් පිළිබඳ තොරතුරුයි. එමෙන්ම මෙහිදී ඇතුලත් කළ යුතු උපත් ලෙස සලකනු ලබන්නේ කුමන වර්ගයේ උපත්ද යන්න දැන ගැනීම වැදගත් වේ. ප්‍රතිචාරකට ලැබුණු සියළුම සජීවී උපත් (එනම් හැඩීමෙන්, හුස්ම ගැනීමෙන් හෝ සෙලවීමෙන් ඉපදෙනවිට ජීවත්වන බවට සංඥාවක් පෙන්නුවා නම්) ඉපදී මිනිත්තු කීපයකින් පසු මිය ගියත් මෙම කොටසට අදාල වේ. එමෙන්ම දරුවන් ප්‍රතිචාරක ළඟ ජීවත් නොවුවත් පසු කාලෙක මිය ගිය දරුවකු වුවත්, විවාහ කීපයකින් ලැබුණු දරුවන් වුවත් මෙම කොටසට ඇතුලත් කල යුතුය.

**මෙම කොටසට ඇතුලත් නොකල යුතු දරුවන් කවරේද ?**

යන්නත් ඔබ විසින් දැන ගත යුතුය. හදාගත් දරුවන් හා ගෘහ කාණ්ඩය සමඟ ජීවත්වන නෑදෑ දරුවන් මෙහි ඇතුලත් නොකරන්න. එමෙන්ම ප්‍රතිචාරකගේ සැමියාට වෙනත් විවාහයකින් ලැබුණු දරුවන් සිටී නම් ඔවුන්ද මෙහි ඇතුලත් නොකරන්න. එමෙන්ම ප්‍රතිචාරකට ලැබුණු සජීවී උපතකින් අවසන් නොවූ ගබ්සාවීම්, ගබ්සාකිරීම් හා මළ දරු උපත්ද ඉහත ප්‍රශ්න අංක වලින් යුත් කොටසට ඇතුල් නොකරන්න.

**ප්‍රශ්න අංක 201 ඔබට කවදා හෝ දරුවන් ලැබුණාද ?**

මෙම ප්‍රශ්නය ඇසීමේ අරමුණු 2 ක් ඇත. මෙම ප්‍රශ්න අඩංගු කොටස හඳුන්වාදීම හා ප්‍රතිචාරක කවදා හෝ දරුවන් බිහිකලේද යන්න දැන ගැනීමයි. ප්‍රතිචාරක දරුවන් නොලැබුණු බව කීවත් ඇයට ලැබුණු දරුවකු මිය ගියාද යන්න පැහැදිලිව දැන ගැනීම සඳහා ප්‍ර. 206 පැහැදිලිව ඇසිය යුතුය.

**ප්‍රශ්න අංක 202/ ප්‍රශ්න අංක 203 ඔබ ළඟ ජීවත්වන දරුවන් සිටීද ?**

සමීක්ෂණය සිදු කරන ස්ථානයේ ඇය සමඟ දැනට ජීවත්වන ඇය බිහි කළ දරුවන් ගණන මෙයින් විමසනු ලැබේ. ප්‍රතිචාරක කවදා හෝ බිහිකළ දරුවන් අතරින් ඇයගේ නිවසේ ඇය සමඟ ජීවත්වන දරුවන් පුතුන් හා දූවරුන් වශයෙන් වෙන වෙනම විමසා කොටු තුළ සටහන් කරන්න. ඇය සමඟ ජීවත් වන්නේ පුතුන් පමණක් හෝ දූවරුන් පමණක් නම් අනිත් කොටු දෙකෙහි 00 යොදන්න. මෙහිදී දූවරුන් හා පුතුන් සඳහා වන සියලුම කොටු 00 විය නොහැක. එසේ නම් ප්‍ර. 202 නැත (2) යනුවෙන් කව වී 203 මග හැර යා යුතුය.

**ප්‍රශ්න අංක 204/ ප්‍රශ්න අංක 205 ඔබ ළඟ ජීවත් නොවන දරුවන්**

ප්‍රශ්න අංක 204 ට 1 කව වී ඇති විට ප්‍රශ්න අංක 205 සඳහා කොටු තුළ අංකයක් පිරවී තිබිය යුතුය. ප්‍රතිචාරක ළඟ දැනට ජීවත් නොවන දරුවන් ගැන විමසීම මෙහි අරමුණයි. ඔවුන් දැනට ඥාතියෙකුගේ නිවසේ හෝ ඉගෙනීම සඳහා නතර වී සිටිනවා විය හැක. හදාගැනීම සඳහා පවරා දී නැත්නම් හෝ ළමා නිවාසයක සිටිනවා විය හැක. පුතුන් පමණක් වෙනත් තැනක සිටිනවා නම් ඉදිරියෙන් එම ගණන සඳහන් කර දූවරුන් සඳහා අදාල කොටුවේ 00 යොදන්න. එසේම දූවරුන් වෙනත් තැනක සිටිනම් ඉදිරියෙන් ගණන සඳහන් කර පුතුන් සඳහා දී ඇති කොටු තුළ 00 යොදන්න.

**ප්‍රශ්න අංක 206/ ප්‍රශ්න අංක 207 මිය ගිය දරුවන්**

මිය ගිය දරුවන්ගේ විස්තර ඉතා වැදගත් තොරතුරක් වන අතර මේ පිළිබඳ නිවැරදි තොරතුරු ලබා ගැනීම තරමක් අසීරු කාර්‍යයකි. උපන් ගමන් මිය ගිය දරුවකු පිළිබඳව සමහර විට තොරතුරු දීම මගහැරයාමට ඉඩ ඇත. එම නිසා කිසිම දරුවකු මිය ගියේ නැති බව පැවසුවොත් නැවතත් එවැනි අවස්ථාවක් තිබුනේදැයි විමසිය යුතුවේ. (එනම් ඉපදී මිනිත්තු කීපයකදී මිය ගියත් ජීවත්වන බවට සංඥාවක් පෙන්වූ දරුවෙක් ඉපදුනාද යන්න) දරුවකුගේ මියයාම ගැන මතක් වීම මවකට ඉතා සංවේගදායී සිද්ධියක් නිසා ඇය පීඩනයට පත්වීමට ඉඩ ඇත. නමුත් ඔබගේ දැනුම හා බුද්ධිය ප්‍රයෝජනයට ගනිමින් ඇයව අපහසුතාවයට පත් නොකර අවශ්‍ය තොරතුරු ලබා ගැනීමට උත්සාහ කල යුතුය.

**ප්‍රශ්න අංක 208 එකතුව සඳහන් කරන්න.**

ප්‍රශ්න අංක 203/205 හා 207 එකතුව අදාල කොටු දෙකෙහි ලියන්න. පිළිතුර 00 නම් 209 B ප්‍රශ්නයට යන්න.

**ප්‍රශ්න අංක 209 ෆිල්ටර්**

ප්‍රශ්න අංක 208 හි සඳහන් මුළු උපත් ගණන නිවැරදිදැයි ප්‍රතිචාරකගෙන් විමසන්න. නිවැරදි නම් ඔව් "✓" යොදන්න. එය වැරදි නම් නැත "✓" යොදා නැවත 203 , 205 හා 207 අයගෙන් විමසා නිවැරදි කරගෙන මුළු උපත් සංඛ්‍යාව සටහන් කරගන්න.

**ප්‍රශ්න අංක 209A, 209B එක් විවාහයකින් ලැබුනු දරුවන් ද ?**

මෙතෙක් අප විස්තර විමසූ සියළු දරුවන් එක් විවාහයකින් ලැබුණු දරුවන්ද ? නැත්නම් සැමියන් කීප දෙනෙකු නිසා ලැබුණු දරුවන්ද යන්න දැන ගත යුතු නිසා විවාහ වූ වාර ගණන 209 B සඳහා ඇති කොටු දෙකෙහි සඳහන් කරන්න. වාර ගණන එක නම් 01 යොදන්න.

**ප්‍රශ්න අංක 210 ෆිල්ටර්**

කවදා හෝ උපතක් සිදු කළ කාන්තාවක් නම් ඊළඟ 211 සිට ඇති උපත් පිළිබඳ විස්තර අසන කොටසට යන්න. නැත්නම් 226 ට යන්න.

**ප්‍රශ්න අංක 211 උපත් වගුව**

| |
|---|
| මෙම උපත් වගුවේ සටහන් කළ යුත්තේ ප්‍රතිචාරකට ලැබුණු සියළුම දරුවන් පිළිබඳවයි. එම ඇතුලත් කළ යුතු හා නොකළ යුතු දරුවන් කවරේදැයි ඉහතින් සඳහන් කළ උපදෙස් අනුව තීරණය කළ යුතුවේ. මෙහිදී දරුවන්ගේ වැඩිමහල් පිළිවෙල අනුව උපත් සටහන් කළ යුතුය. එනම් මුලින්ම ලැබුණු දරුවා, දෙවන දරුවා, ඊළඟටත් යනාදී අනුපිළිවෙළට සඳහන් කරන්න. මෙහිදී උපත් අමතක වී අනුපිළිවෙල වෙනස්වූ විටක 212 තීරුවේ සඳහන් අනුක්‍රමික අංකය ඉරකින් කපා නිවැරදි අංකය එයට පහලින් පැහැදිලිව ලියන්න. |

**ප්‍රශ්න අංක 212 දරුවාගේ නම**

මෙම තීරුවේ ප්‍රතිචාරකට ලැබුණු සියළුම සජීවී උපත්වල නම් ලියන්න. දින කිහිපයක් සිට මිය ගියේ නම් හෝ දින කිහිපයකට පෙර ඉපදී තවම නමක්දී නොමැති නම් ළදරුවා ලෙස සටහන් කර තොරතුරු ඇතුලත් කරන්න.

**ප්‍රශ්න අංක 213 තනි උපතක්ද නිවුන් උපතක්ද යන බව**

(212 නම) ට අදාලව උපත තනි උපතක් ද නැතිනම් නිවුන් උපතක්ද යන වග විමසා අදාල කේතය 1 හෝ 2 කව කරන්න.

**ප්‍රශ්න අංක 214 ගැහැණු/පිරිමි බව**

මෙහිදී දරුවාගේ නමින් පමණක් ස්ත්‍රී/පුරුෂ භාවය තීරණය නොකර ප්‍රතිචාරකගෙන් විමසා (නම) ට අදාලව කේතය 1 හෝ 2 කව කරන්න. (නම දෙස බලා තීරණය නොකරන්න)

**ප්‍රශ්න අංක 215 උපන් දිනය**

212 හි සඳහන් (නම) උපන් අවුරුද්ද, මාසය සහ දිනය අදාල කොටු තුළ සඳහන් කරන්න. මෙලෙස සජීවී උපත් සියල්ලටම (දැනට ජීවත් වන හෝ නොවන) සටහන් කළ යුතුය. යම් විදියකින් මාසය අමතක වී ඇති නම් මාසය කොටුවේ 99 යොදන්න. මේ සඳහා දරුවාගේ උප්පැන්න සහතිකය හෝ වර්ධන සටහන බලා ප්‍රතිචාරක දෙන පිළිතුරු නිවැරදිදැයි නිගමනය කළ හැක. උපන් සටහන නිවැරදි කළ යුතුය.

**ප්‍රශ්න අංක 216 ජීවත්ව සිටීද ?**

(නම) දැනට ජීවත්ව සිටීද නැතිද යන්න විමසා අදාල කේතය 1 හෝ 2 කව කරන්න. දැනට ජීවත් නොවේ නම් 2 කව කර ප්‍රශ්න අංක 220 ට යන්න.

**ප්‍රශ්න අංක 217 සම්පූර්ණ වූ වයස**

දැනට ජීවත්වන දරුවන් සඳහා පසුගිය උපන් දිනට සම්පූර්ණ වූ වයස සඳහන් කරන්න. තවම අවුරුද්දක් සම්පූර්ණ නොවුනි නම් 00 යොදන්න. වයස් නිශ්චායක වගුව ප්‍රයෝජනයට ගත හැක.

**ප්‍රශ්න අංක 218 ජීවත් වන්නේ ඔබ සමඟද ?**

දරුවා මව සමඟ සිටිද නැද්ද යන වග අසා දැන ගත යුතුය. පාසැල් යැවීමට හෝ නෑදෑ ගෙදරක හෝ නතර වී සිටී නම් නැත යන්න 2 කව කරන්න. කෙටි දින කිහිපයක් නිවසින් පිට වී සිටී නම් මව සමඟ ජීවත්වේ යැයි නිගමනය කරන්න.

**ප්‍රශ්න අංක 219 පේළි අංකය**

මෙහි සඳහන් කර ඇති නමට, ගෘහ කාණ්ඩ තොරතුරු ඇතුලත් පිටුවේ ඇති නමට අදාල පේළි අංකයම කොටුතුල සදහන් කරන්න. එහි සදහන් නොමැති නමක් නම් අදාල කොටු තුළ 00 සදහන් කරන්න. ඉන් පසු නැවත ඊළඟ උපතට යන්න. (එනම් ඊළඟ අංකයට යන්න) ගෘහ කාණ්ඩ තොරතුරු පිටුවේ ඇතුලත් නොවිය හැකි වන්නේ දරුවා මේ නිවසේ පදිංචි නැත්නම් පමණි.

**ප්‍රශ්න අංක 220 මියයන විට වයස**

දරුවා මිය ගොස් ඇති නම් පමණක් පිරවිය යුතුය. මිය යන විට දරුවාගේ සම්පූර්ණ වූ වයස කීයද යන්න සඳහන් කළ යුතුය. මෙහිදී දරුවා උපන් දිනය හා මිය ගිය දිනය නැවත විමසා ඒ අනුව වයස ගණනය කර සදහන් කරන්න.

දරුවා මිය යන විට වයස මාසයට අඩු නම් දින ඉදිරියෙන් ඇති 1 කව කර ජීවත්ව සිටි දින ගණන අදාල කොටු දෙක තුල ලියන්න. 10 ට අඩු සංඛ්‍යාවක් නම් ඉදිරියට "0" යොදා දින ගණන ලියන්න. ඉපදුන දිනයේම මිය ගියේ නම් කොටුව තුළ "00" යොදන්න.

දරුවා මිය යන විට වයස මාස 1 ක් හෝ ඊට වැඩි නම් හා අවුරුදු 2 ට අඩු නම් 2 කව කර කොටු තුල මාස ගණන සදහන් කරන්න. මෙම කොටුව තුල මාස 1 සිට 23 දක්වා ලිවිය හැක.

මාස 12 ක් යැයි පැවසුවහොත් ඒ පිළිබඳව ප්‍රශ්න කර හරියටම මාස 12 ද නැත්නම් දින ගණනක් ඊට වඩා වැඩිද අඩුද යන්න විමසා දැන ගත යුතුය. මාස 12 ට දින ගණනක් අඩු නම් මාස 11 ලෙසද දින ගණනක් වැඩි නම් මාස 12 ලෙසද සඳහන් කළ යුතුය. ළදරු මරණ අනුපාත ගණනය කිරීම සඳහා අවශ්‍යවන්නේ අවුරුද්දට අඩු ළදරුවන් වන බැවින් මිය යන විට වයස නිවැරදිව සටහන් කර ගත යුතුය.

දරුවා මිය යන විට වයස මාස 24 සම්පූර්ණ වූ හෝ ඊට වැඩි නම් 3 කට කර කොටුව තුල අවුරුදු ගණන සඳහන් කරන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| උදා - | 1. | දරුවා ඉපදුන දිනයේම මියගියේ නම් | දින | 1 | 00 |
| | | | මාස | 2 | |
| | | | අවු. | 3 | |
| උදා - | 2. | දරුවා මිය යන විට වයස දින 5 ක් නම් | දින | (1) | 05 |
| | | | මාස | 2 | |
| | | | අවු. | 3 | |
| උදා - | 3. | දරුවා මිය යන විට වයස මාස 4 දින 15 ක් නම් | දින | 1 | |
| | | | මාස | (2) | 04 |
| | | | අවු. | 3 | |
| උදා - | 4. | දරුවා මිය යන විට වයස සති 2 ක් නම් | දින | (1) | 14 |
| | | | මාස | 2 | |
| | | | අවු. | 3 | |
| උදා - | 5. | දරුවා මිය යන විට වයස අවු. 3 යි මාස 1 ක් නම් | දින | 1 | |
| | | | මාස | 2 | |
| | | | අවු. | (3) | 03 |

**නැවත පරීක්ෂා කිරීම.**

**උපත් වගුව පිරවූ පසු පහත සඳහන් කරුණු නැවත පරීක්ෂා කරන්න.**

**විශේෂ අවස්ථාවක්**

මිය යන විට මාස 12 ක් යැයි පැවසුවහොත් ඒ පිළිබඳව ප්‍රශ්න කර හරියටම මාස 12 ද නැත්නම් දින ගණනක් ඊට වඩා වැඩිද අඩු ද යන්න විමසා දැන ගත යුතුය. මාස 12 ට දින ගණනක් අඩු නම් මාස 11 ලෙසද, දින ගණනක් වැඩි නම් මාස 12 ලෙසද උසඳහන් කළ යුතුය. ළදරු මරණ අනුපාත ගණනය කිරීම සඳහා අවශ්‍යවන්නේ අවුරුද්දට අඩු ළදරුවන් වන බැවින් මිය යන විට වයස නිවැරදිව සටහන් කර ගත යුතුය.

1. සියළුම සජීවී උපත් සටහන් කර ගත යුතුය. දරුවන් දෙදෙනෙකු අතර විශාල පරතරයක් ඇත්නම් විමසන්න. එම උපත් අතර පරතරය විශාල වීමට විශේෂ හේතුවක් තිබුනේද කියා විමසන්න.
2. දරුවා ඉපදුන මොහොතේම මිය ගියේ යැයි පැවසුවහොත් දරුවාගේ ඇඩීම ඔබට ඇසුනාද නැත්නම් වෙනයම් පණ ඇති බවට සළකුණක් තිබුණිද යන්න ප්‍රශ්න කර අසා දැන ගත යුතුය.

3. නිවුන් දරු උපතක් උපත් 2 ක් ලෙස සටහන් කරන්න. ප්‍රශ්න අංක 212 හි පේලි අංක 2 ක් යටතේ පුරවන්න.
4. යම් ප්‍රතිචාරක කෙනෙකුට උපත් 10 කට වඩා තිබෙන අවස්ථාවක මෙවැනි වෙනත් පිටුවක් ගෙන අනුක්‍රමික අංක 11 සිට පිරවිය යුතුය. එහි වෙනත් පිටුවකට ගෙන ගියා යන්න එම පොතේ එම පිටුවේ කෙලවරින් සඳහන් කරන්න.
5. දරු උපත් 2 ක් අතර පරතරය මාස 7 ට අඩු නම් ඒ පිළිබඳවද තවදුරටත් විමසා නිවැරදි කරන්න.

**ප්‍රශ්න අංක 221 තවත් දරුවකු ඉපදී මිය ගියාද ?**

ඉපදී පසුව මිය ගිය දරුවකු පිළිබඳ ඇයට (ප්‍රතිචාරකට) පසුව මතක් වුනි නම් ඔව් යන්න 1 කව කරන්න. මෙම ප්‍රශ්නය සෑම උපත් දෙකක් අතරම ඇසිය යුතුය. එසේ 1 කව කර එම තොරතුරුද 212 තීරයේ පහලින් ඇතුලත් කරගන්න. ඉන් පසු අනුක්‍රමික අංක නිවැරදි කර ගන්න. නැවත ප්‍රශ්න අංක 202 ට ගොස් එයද නිවැරදිකර 210 දක්වා පරීක්ෂා කර නිවැරදි කරගත යුතුය.

**ප්‍රශ්න අංක 222 අවසන් දරුවාට පසු උපතක් සිදු වුනාද ?**

අවසන් දරුවා (නම) ඉපදුනාට පසුව ඇයට කිසියම් සජීවී දරු උපතක් සිදුවුනාද යන්න විමසන්න. මෙමගින් විමසන්නේ තවත් අමතක වීමකින් හෝ දරු උපතක් ගැන පැවසුවේ නැත්ද යන වග දැන ගැනීමටයි. ඒ අනුව උපත් වගුවේ එය සටහන් කළ යුතුය. ඔව් නම් නැවත 212 ට යන්න. 212 සිට 220 දක්වා පිරවිය යුතුය. නැවත ප්‍රශ්න අංක 202 - ප්‍රශ්න අංක 210 ද නිවැරදි කළ යුතුය.

**ප්‍රශ්න අංක 223 උපත් ගණන සැසඳීම**

ප්‍රශ්න අංක 208 බලන්න. උපත් ගණන නිවැරදි දැයි බලන්න. ඒ අනුව එක් එක් කරුණ හොඳින් කියවා පරීක්ෂා කර ඉදිරියෙන් ඇති කොටුතුල හරි ලකුණක් යොදන්න.

**ප්‍රශ්න අංක 224 2001 හෝ ඊට පසු ඇති වූ උපත් ගණන**

ප්‍රශ්න අංක 215 පරීක්ෂා කරන්න. වර්ෂ 2001 හෝ ඊට පසු ඇති වූ උපත් ගණන කොටුව තුළ සටහන් කරන්න. උපත් නොමැති නම් "0" සටහන් කර 226 ට යන්න 2001 හෝ ඊට පසු උපත් ඇතිවී මිය ගොස් ඇත්නම් එයද සටහන් කල යුතුය.

**ප්‍රශ්න අංක 225 කැලැන්ඩරය ලකුණු කිරීම**

ප්‍රතිචාරක සඳහා සම්පූර්ණ කරන ප්‍රශ්නාවලියේ අග ඇති කැලැන්ඩරයේ ඇයට 2001 වසරේ සිට ලැබුනු උපත් ඇතුලත් කල යුතුයි. මුලින්ම ඉපදුන මාසය සඳහා 'B' ලකුණු කර එයට වමෙන් ළමයාගේ නම ලියන්න. ඊට පසු උපත සිදුවන විට ඇය ගැබ් ගෙන මාස කීයදැයි අසන්න. ඒ අනුව උපතට කලින් ඇති

ගර්භනී කාලයට අදාල සෑම මාසයක් සඳහාම P ලකුණුක රන්න. ගර්භනී භාවය පැවති කාලයට වඩා P ලකුණු ගණන එකකින් අඩුවිය යුතුය.

උදා :- කාන්තාවක් විසින් 2004 නොවැම්බර් මස රමණී නැමැති දැරිය බිහි කරන විට ඇය ගැබ් ගෙන මාස 8 ක් බව පැවසුවාය. කැලැන්ඩරයේ 2004 නොවැම්බර් මාසය සඳහා B ලකුණු කර ඊට කලින් ඇති මාස 7 සඳහා P ලකුණු කරන්න. එනම් 2004 අප්‍රේල් මාසය දක්වා P ලකුණු කර රමණී ඉපදුනු 2004 නොවැම්බර් මාසයේ වම් පැත්තෙන් රමණී යනුවෙන් ලියන්න.

**ප්‍රශ්න අංක 226 දැනට දරුවෙක් ලැබීමට සිටිනවාද ?**

අදාල කේතය කව කරන්න.
හරියටම කිව නොහැකි බව පවසන්නේ නම් 8 කව කරන්න. ඔව් කිවහොත් 227 ප්‍රශ්නය අසන්න. නැතහොත් 229ට යන්න.

**ප්‍රශ්න අංක 227 දරු ගැබට මාස කීයද ?**

දරුවකු ලැබීමට සිටී නම් **සම්පූර්ණ** වූ මාස ගණන අසා ලියන්න. දැනට සම්පූර්ණ කර ඇති මාස ගණන ඉදිරියෙන් දී ඇති කොටුවේ සඳහන් කරන්න. එමෙන්ම ප්‍රතිචාරකගේ දරු ගැබට සම්පූර්ණ වූ මාස ගණන විමසා දැන ගත යුතුය. උදා : ප්‍රතිචාරක දරු ගැබට මාස 5 ක් බව පවසයි නම් පස්වන මාසය සම්පූර්ණ වුවාද නැත්නම් ඔබ දැනට ගත කරන්නේ 5 වන මාසයදැයි විමසන්න. පස්වන මාසය සම්පූර්ණ කර ඇත්නම් කොටු 2 හි 05 යොදන්න. දැනට ගත කරන්නේ 5 වන මාසය නම් කොටු 2 හි 04 යොදන්න.

ඒ සමඟ කැලැන්ඩරයේ 1 තීරුවෙහි ඇගේ ගර්භනීභාවය ලකුණු කළ යුතුයි. සමීක්ෂණ මාසයෙන් පටන්ගෙන ඊට කලින් මාස සඳහා P ලකුණු කරන්න. වර්ථමාන ගර්භනීභාවය සඳහා කැලැන්ඩරයේ ලකුණු කළ P ගණන ප්‍රශ්න 227 හි සඳහන් කළ සම්පූර්ණ මාස ගණනට සමාන විය යුතුයි. කාන්තාව ගැබ් ගත් මාසය හරියටම කීමට නොදනී නම් ඇය ට අන්තිම වරට මාස් ශුද්ධිය සිදුවූ දිනය ආදිය නැවත විමසා ඒ පිළිබඳව තීරණය කරන්න.

**ප්‍රශ්න අංක 227A ප්‍රසූතිය සඳහා යෑමට බලාපොරොත්තුවන ස්ථානය**

ප්‍රතිචාරක යෑමට බලාපොරොත්තු වන රෝහල අයත් වන්නේ දී ඇති ලැයිස්තුවෙන් කුමකටදැයි විමසා අදාල කේතය කව කරන්න. නිවසේදී බව පැවසුවහොත් 227C යන්න.

**ප්‍රශ්න අංක 227B ප්‍රසූතිය එම ස්ථානයේ සිදු කිරීමට හේතුව**

ප්‍රතිචාරක පවසන හේතුවට වඩාත්ම සුදුසු කේතය කව කරන්න. වෙනත් හේතුවක් නම් හේතුව සඳහන් කර 5 කේතය කව කරන්න.

**ප්‍රශ්න අංක 227C පිටගැස්ම එන්නත ලබාගත්තාද?**

ගර්භනී සටහන් පතෙහිද මේ පිළිබද ලකුණු කර ඇත.නොදනී යයි පැවසුව හොත් ගර්භනී සටහන් පත බලා ලකුණු කරන්න.

**ප්‍රශ්න අංක 228 ගැබ් ගන්නා විට දරුවෙකුගේ අවශ්‍යතාවය.**

මෙම ගැබ් ගැනීම සිදුවන විට දරුවෙක් අවශ්‍යව තිබුනාද? නැත්නම් පමාවී ලබා ගැනීමේ අවශ්‍යතාවයක් තිබුනාද නැත්නම් අවශ්‍යව තිබුනේම නැද්ද යන්න ප්‍රතිචාරකගෙන් පැහැදිලිව විමසා අදාල කේතය කව කරන්න.

**ප්‍රශ්න අංක 229/ ප්‍රශ්න අංක 229A සජීවී උපතකින් අවසන් නොවූ ගැබ් ගැනීම.**

මෙම ප්‍රශ්නය දැනට ගැබ් ගෙන ඇති හෝ නැති සියලු කාන්තාවන්ගෙන් ඇසිය යුතු වේ. මෙහිදී දැන ගැනීමට අවශ්‍යවන්නේ සජීවී උපතකින් කෙලවර නොවූ යම් ගැබ් ගැනීම් කාන්තාවකට තිබුණාද යන්න හා එම ගැබ් ගැනීම් කවර ආකාරද යන්නයි. සජීවී උපතකින් අවසන් නොවන ගැබ් ගැනීම් පහත ආකාරයෙන් වර්ග කල හැක.

1. ගැබ් ගැනීම මුල් අවදියේදීම ඉබේම අවසන් වුයේ නම් එය ගබ්සාවීමක් (miscarriage) ලෙස හැදින් විය හැක.
2. ගැබ් ගැනීම කාන්තාව විසින් හිතාමතාම යම් ක්‍රමයක් භාවිතයෙන් අවසන් කලේ නම් එය ගබ්සා කිරීමක් ලෙස හැදින් විය හැක.
3. කාන්තාව සිදු කල දරු ප්‍රසූතියේදී දරුවා ජීවත් වන බවට සංඥාවක් නොපෙන්වුයේ නම් (හැඩීමක්, හුස්ම ගැනීම, අත පය සෙලවීම) එය මළ දරු උපතක් ලෙස හැදින්වේ.

මෙයින් ගබ්සා කිරීම් ගැන හෙළි කිරීමට බොහෝ කාන්තාවන් මැලිවන අතර එවැනි තොරතුරක් හෙලිවුවොත් ඔබ එය 229A හි අදාල තැන සදහන් කරගන්න. එක් එක් සිදුවීම් සදහා දී ඇති කොටුවේ සිදුවීම් ගණන සදහන් කරන්න. එවැනි ගැබ් ගැනීම් නොවුනානම් 2 කේත කර 237 ට යන්න.

**ප්‍රශ්න අංක 230 එවැනි අවසාන ගැබ් ගැනීමක් අවසන් වූ දිනය**

ඉහත සදහන් කල යම් ආකාරයක ගැබ් ගැනීමක් තිබුණ බව පැවසූ කාන්තාවකගෙන් එම අවසාන ගැබ් ගැනීම අවසන්වූ වර්ෂය, මාසය හා දිනය අදාල කොටු තුල සදහන් කරන්න.මාසය මතක නැති බව පැවසුව හොත් ප්‍රතිචාරකට අදාල යම් සිදුවීම් හෝ වෙනත් දරු උපත්වල කාලය මතක් කර මාසය දැන ගැනීමට උත්සාහ කරන්න. එසේත් නොහැකි වුවොත් මාසය සදහා 98 කව කරන්න.

**ප්‍රශ්න අංක 231 ෆිල්ටර්**

ප්‍රශ්න අංක 230 අනුව එවැනි අන්තිම ගැබ් ගැනීම අවසන් වුයේ 2001 හෝ ඊට පසු නම් 232 ට ද 2001 ට කලින් නම් 237 ටද යන්න.

**ප්‍රශ්න අංක 232 එවැනි අවසන් ගැබ් ගැනීම අවසන් වූ විට මාස ගනණ**

2001 ජනවාරි හෝ ඊට පසුව ඉහත සදහන් අන්දමේ ගැබ් ගැනීමක් සිදුවී අවසන් වූ කාන්තාවකගෙන් එම ගැබ් ගැනීම පිළිබඳව මෙම ප්‍රශ්නය අසනු ලැබේ.

මෙම ප්‍රශ්නයේ දෙආකාරයකින් සම්පූර්ණ කළ යුතුය. මුලින්ම එම අවසාන ගැබ් ගැනීම අවසන් වූ විට ගැබ්ගෙන මාස කීයක් වූවාදැයි විමසා සම්පූර්ණ වූ මාස ගණන කොටුවල ලියන්න. එමෙන්ම ඇය සඳහන් කළ මාස ගණන කැලැන්ඩරයේද සටහන් විය යුතුය. උදා : කාන්තාවකගේ ගැබ් ගැනීමක් මාස 8 සම්පූර්ණ වූ පසු 2004 මැයි මාසයේද මළ දරු උපතක් අවසන් විය. ප්‍ර. 232 සඳහා 8 යොදන්න. කැලැන්ඩරයේ 2004 මැයි මාසය සඳහා T යොදා ඊට කලින් ඇති මාස 7 ක් සඳහා P ලකුණු කරන්න. (2003 නොවැම්බර් සිට 2004 අප්‍රේල් දක්වා)

**ප්‍රශ්න අංක 233 තවත් එවැනි ගැබ් ගැනීම් තිබුනාද ?**

කාන්තාව ඔබට ප්‍රශ්න අංක 232 දී පැවසුවේ එසේ අවසන් වූ අවසාන ගැබ් ගැනීමක් ගැනයි. මෙහිදී නැවතත් විමසනු ලබන්නේ ඊට අමතරව තවත් සජීවී උපතක් ලෙස අවසන් නොවූ ගැබ් ගැනීම් 2001 ජනවාරි හෝ ඊට පසුව ඇයට තිබුනාද යන්න දැන ගැනීමයි. එසේ තිබූ බව පැවසුවොත් 1 කව කර 234 ට යන්න. නැත්නම් 2 කව කර 235 ට යන්න.

**ප්‍රශ්න අංක 234 කැලැන්ඩරයේ ලකුණු කරන්න.**

ප්‍ර. 233 දී එවැනි තවත් ගැබ් ගැනීම් ගැන ප්‍රතිචාරක පැවසුවොත් ඔබ විසින් ප්‍රශ්න 232 දී ලකුණු කල පරිදි එම ගැබ් ගැනීම් සියල්ල සඳහා අවසන් වූ මාසය සහ ගැබ් ගැනීම් පැවති මාස සඳහා කැලැන්ඩරය ලකුණු කළ යුතු වේ.

**ප්‍රශ්න අංක 235 එසේ අවසන් වූ ගැබ් ගැනීම් 2001 ට පෙර ඔබට සිදුවූවාද ?**

2001 හෝ ඊට පසු ඉහත සදහන් ගැබ් ගැනීම් තිබුණ බව පැවසූ කාන්තාවන්ගෙන් එවැනි ගැබ් ගැනීම් 2001 ට පෙරත් එවැනි සිදුවීම් තිබුණාදැයි අසනු ලැබේ. ඔව් නම් 236 ටද නැත නම් 237 ටද යන්න.

**ප්‍රශ්න අංක 236 2001 ට පෙර සිදු වූ එවැනි අවසාන ගැබ් ගැනීම අවසන් වූ දිනය**

එවැනි ගැබ් ගැනීමක් තිබුනේ නම් අදාල දිනය කොටු තුළ යොදන්න. මාසය මතක නැත්නම් වෙනත් සිදුවීම් භාවිතයෙන් මතක් කිරීමට උත්සාහ කරන්න. මතක නැතිනම් 98 යොදන්න.

**ප්‍රශ්න අංක 237 අන්තිම වරට මාස් ශුද්ධිය ඇතිවූයේ කවදාද ?**

මෙම ප්‍රශ්නයෙන් ලබා ගන්නා තොරතුරු වැදගත් වන්නේ දරු උපතක් හා කාන්තාවකගේ මාස් ශුද්ධිය අතර පැහැදිලි සම්බන්ධතාවයක් ඇති නිසාය. ප්‍රතිචාරක පවසන කාලය අනුව අදාල කේතය කව කරන්න. දින 7 ට අඩු නම් 1 කව කර දින ගණනද, දින 7 හෝ ඊට වැඩි නම් (දින 27 දක්වා) 2 කව කර සති

ගණනද, සති 4 හෝ ඊට වැඩි නම් 3 කව කර මාස ගණනද, සඳහන් කරන්න. මාස 2 1/2 නම් මාස 2 ලෙස සඳහන් කරන්න.

ප්‍රතිචාරක තමාගේ පිළිතුර කෙටියෙන් කිරීමට උත්සාහ කරන්නේ නම් උදා : සතියකට කලින් යැයි පැවසුවොත් නැවත ඔබට දිනය මතකද එය සති අන්තයට පෙර හෝ පසුදැයි නැවත අසන්න.

ඇයට වයස සම්පූර්ණ වීම නිසා මාස් ශුද්ධිය සිදු නොවන බව පැවසුවොත් හෝ සැත්කමකින් ගර්භාෂය ඉවත් කර ඇති බව පැවසුවොත් 994 කව කරන්න අවසාන දරු උපතින් පසු තවමත් මාස් ශුද්ධිය සිදුවී නැත්නම් 995 කව කරන්න. කිසිදාක සිදුවී නැත්නම් 996 කව කරන්න. සමහර කාන්තාවන්ට උපත් පාලන ක්‍රම භාවිතය නිසා මාස් ශුද්ධිය සිදු නොවන අවස්ථා ඇත. එහිදී අවසන් වරට සිදුවූ දිනය සඳහන් කරන්න.

සමහර අවස්ථාවල ප්‍රතිචාරක අවසන් මාස් ශුද්ධිය සිදුවූ දිනය පැවසීමට ඉඩ ඇත. එවිට එම දිනය අදාල ස්ථානයේ ලියන්න. එම දිනයේ සිට කාල සීමාව ගණනය කර අදාල කොටු සම්පූර්ණ කරන්න. දිනය සඳහන් කිරීම අවශ්‍යම නොවන අතර එය ප්‍රතිචාරක දිනය පැවසුවොත් පමණක් භාවිතා කරන්න. මෙහිදී කව විය හැක්කේ එක් කේතයක් පමණි.

**ප්‍රශ්න අංක 238 දරු ගැබක් ඇතිවිය හැකි කාලය**

දරු ගැබක් ඇතිවිය හැකි කාලය පිළිබඳ ප්‍රතිචාරකට ඇති දැනුම මෙම ප්‍රශ්නයෙන් විමසනු ලැබේ. එක් මාස් ශුද්ධියක් පටන්ගත් දින සිට ඊළඟ මාස් ශුද්ධිය පටන් ගැනීමේ දින දක්වා කාලය තුළ දරු ගැබක් ඇතිවීමට වඩාත්ම ඉඩ ඇති වකවානුව කුමක්ද යන්න විමසනු ලැබේ. මෙහිදී ප්‍රතිචාරකට හරි පිළිතුර පැවසීමට යෑමෙන් වලකී ඉවසිලිමත්ව පිළිතුර ලබා දෙන එයට අදාල කේතය කේතය කව කරන්න. එම පිළිතුරට අදාල කේතයක් නැතිනම් 6 කේතය කව කර එම පිළිතුර සඳහන් කරන්න. කිසි ලෙසකින්වත් නොදනී නම් 9 කව කරන්න.

මාසයක් යනු පෙර මාස් ශුද්ධිය පටන් ගත් දින සිට ඊළඟ මාස් ශුද්ධිය පටන් ගන්නා දින දක්වාය. ඒ බව පැහැදිලි කරන්න.

## 6.3 කොටස

## තුන්වන කොටස - උපත් පාලනය

ප්‍රජා විද්‍යාත්මක හා සෞඛ්‍ය සමීක්ෂණයේ "උපත් පාලනය" යනු ඉතා වැදගත් පරිච්ඡේද වලින් එකකි. යුවලකට ගැබ් ගැනීම වැලැක්වීම හෝ ප්‍රමාද කිරීම සඳහා භාවිතා කල හැකි උපත් පාලන ක්‍රම පිළිබඳ දැනුම හා ඒවායේ භාවිතය පිළිබඳ කරුණු මෙම කොටසින් විමසා බලනු ලබේ. උපත් පාලනය සහ පවුල් සැලසුම් ක්‍රම පිළිබඳ තොරතුරු ඉතාමත් පෞද්ගලික විස්තර ලෙස ප්‍රතිචාරක සැලකිය හැකි නිසා ඒ ගැන කථා කිරීමේදී ඇය අපහසුතාවයට පත් විය හැකිය. ඇයට ඇති වන අපහසුතාවයන් මග හරවා ගැනීමට නම් කුමන අවස්ථාවකදීවත් ඔබ අපහසුතාවයකට පත්වන බවක් පෙන්වන්න එපා. ප්‍රශ්නාවලියේ ඇති අනෙකුත් ප්‍රශ්න මෙන් සාමාන්‍ය ආකාරයට මෙම ප්‍රශ්නද අසන්න. කිසියම් ප්‍රශ්නයකට ඇය පිළිතුරු දීමට අකමැත්තක් හෝ මැලිකමක් දක්වන්නේ නම් සමීක්ෂණය පිළිබඳ ඇයව තව දුරටත් දැනුවත් කර, ඇය ලබා දෙන සියළුම පිළිතුරු රහසිගතව තබා ගන්නා බවත්, පුද්ගලික මට්ටමින් මෙම තොරතුරු භාවිතා නොකරන බවත්, අහඹු ලෙස තෝරා ගත් කාන්තාවන් විශාල ප්‍රමාණයකගෙන් මෙම ප්‍රශ්නාවලිය අසන බවත්, පැහැදිලි කරන්න.

### උපත් පාලන ක්‍රම

උපත් පාලන වගුව නිවැරදිව සම්පූර්ණ ලෙස සටහන් කර ගැනීම සඳහා උපත් පාලන ක්‍රම පිළිබඳ මනා දැනුමක් ඔබට තිබීම අත්‍යවශ්‍ය කරුණකි. උපත් පාලනය සඳහා භාවිතා කරන ක්‍රම හඳුන්වන නම් ඉතා හොඳින් දැනගැනීම ඔබ විසින් කල යුත්තකි. උපත් පාලන වගුව සම්පූර්ණ කිරීම සඳහා එහි සඳහන් ක්‍රම පිළිබඳ සවිස්තරාත්මක සටහනක් පහත දක්වා ඇත.

### ස්ත්‍රී සැත්කම

කාන්තාවන්ට වන්ධ්‍යාකරණය සඳහා කල හැකි සැත්කම් කිහිපයකි. ඒවා නම් නාල අවහිර කිරීම, ගර්භාෂය ඉවත් කිරීම, ඩිම්බ කෝෂ ඉවත් කිරීම, ආදිය වේ. ගර්භාෂය හෝ ඩිම්බ කෝෂ ඉවත් කිරීම, උපත් පාලනයට නොව වෙනත් යම් කිසි හේතුවක් නිසා විය හැක. ප්‍රසූතියේදී ඇතිවන ගැටළුවක් හේතුවෙන් වරින් වර සිදුවන අධික රුධිර වහනය හෝ ගර්භාෂ පිළිකා වැනි තත්ව වලදී මෙවැනි සැත්කම් වලට මුහුණ දීමට කාන්තාවන්ට සිදුවේ. **දරුවන් ලැබීම වැලැක්වීම සඳහා කරන ලද සැත්කම් පමණක් ස්ත්‍රී සැත්කම් යටතේ සටහන් කරන්න.**

### පුරුෂ සැත්කම

සන්සන්ධනාත්මකව සැලකීමේදී උපත් පාලනයට පුරුෂයන් සඳහා කරනු ලබන සුළු සැත්කමකි. මෙය වාසෙක්ටමි ශල්‍යකර්මය ලෙස හඳුන්වයි.

**නික්ෂේපණ (එන්නත්)**

උපත් පාලනය සඳහා එන්නතක් මගින් සෙමින් රුධිරයට එකතු කරන හෝමෝනයකි. මෙය නියමිත කාලයකට ලබාදිය යුතුය. බහුලව භාවිතා වන්නේ මාස තුනකට වරක් එන්නත් කරනු ලබන උපත් පාලන එන්නතකි. මෙය "ඩිපොමෙඩ්‍රොක්සි ප්‍රොජෙස්ටොරෝන් ඇසිටේට් (DMPA)", "ඩිප්‍රොවේරා", "ඩිපෝ" හෝ "මෙජෙස්ටරෝන්" ලෙස හඳුන්වයි. "නෝර්ස්ටරැට් (NETEN)" උපත් පාලන එන්නත මාස 2 ට වරක් ලබා දේ.

**නෝර්ප්ලාන්ට් (හෝමෝන තැන්පතු)**

කාන්තාවගේ අතෙහි උඩ බාහුවේ තැන්පත් කරනු ලබන කුඩා කරල් විශේෂයකි. මෙමගින් කාන්තාවකට අවුරුදු 5 ක් හෝ ඊට වැඩි කාලයක් දරුවන් ලැබීමෙන් වැලකී සිටිය හැක.

**ස්ත්‍රී කොන්ඩම්**

එකතු වීමට ප්‍රථම උපත් පාලනය වැලැක්වීම සඳහා යෝනි මාර්ගයේ රැඳවිය හැකි කුඩා, විනිවිද පෙනෙන රබර් කොපුවකි.

**කිරිදීමේ කාලය (LAM ක්‍රමය)**

දරු උපතකට පසු කිරිදීමෙන් කාන්තාවකගේ මාස් ශුද්ධිය නැවත ඇතිවීම ප්‍රමාද වේ. මේ නිසා නැවත දරු ගැබක් ඇතිවීමට බාධා පැමිණේ. මෙසේ දරුවන් පමා කිරීමේ ක්‍රමය "කිරිදීමේ කාලය" (Lactational Amenorrhea Method) ලෙස හඳුන්වනු ලැබේ. මෙහිදී මව්කිරි දීම (ජලය හැර සමහර ආහාර වර්ග දරුවාට ලබා නොදීමෙන්) නිරන්තරයෙන්ම කළ යුතුය. මෙම ක්‍රමය දරු උපතක් සිදුවී මාස් ශුද්ධිය නැවත ඇති නොවීම හේතුවෙන් මාස 6 ක පමණ කාලයක් දක්වා භාවිතා කළ හැක.

දරුවාට වයස මාස 6 ක් වන විට මව මව්කිරි හා ජලයට අමතරව වෙනත් ආහාර වර්ග දරුවාට දීමට පටන් ගනී. මව් කිරි දීම අඩුවීම නිසා එවිට මාස් ශුද්ධිය නැවත ඇති වුවහොත් තව දුරටත් දරු උපත් වැලැක්වීමට ඔවුන් බලාපොරොත්තු වන්නේ නම් ඒ සඳහා වෙනත් ක්‍රමයක් භාවිතා කළ යුතුය.

**ආරක්ෂිත කාලය**

මෙය දින දර්ශන කාලය, නියමිත කාලයන්හි එකතු වීමෙන් වැලකීම ලෙස හඳුන්වයි. කාන්තාවකගේ මාස් ශුද්ධි චක්‍රයේදී සරු දිනයන්හි ලිංගිකව එකතුනොවීමෙන් ගැබ් ගැනීමෙන් වැලකී සිටීම ආරක්ෂිත කාලය භාවිතා කිරීම වේ. ප්‍රතිචාරක එය අවබෝධ කර ගත්තේ දැයි සැක හැර දැන ගැනීමට <u>කාන්තාවකට ගැබ් ගැනීමට වඩා ඉඩ ඇති දින</u> යන වාක්‍ය ඇයට පවසන්න.

- ගැබ් ගැනීමෙන් වැලකීම සඳහා කාන්තාවක් මාස් ශුද්ධි චක්‍රය ගැන නොසිතා මාස ගණනක් වැනි දීර්ඝ කාලයක් ලිංගිකව එකතු නොවී සිටීම ආරක්ෂිත කාලය භාවිතා කිරීම නොවේ.
- කාන්තාවක් ඇගේ මාස් ශුද්ධීන් ඇතිවීමේ චක්‍රය තුල සමහර දිනයන්හි ලිංගිකව එකතු වීමට අකමැති නම් එයද ආරක්ෂිත කාලය භාවිතා කිරීම නොවේ.

**හදිසි උපත් පාලනය**

කාන්තාවකට ලිංගිකව එකතු වීමෙන් පසු "Mornning After Pills" යන විශේෂිත පෙති වර්ගය නොනවත්වා දින 3 ක් තුල ගැනීමෙන් ගැබ් ගැනීමෙන් වැලකී සිටිය හැක.

**වෙනත් ක්‍රම**

උපත් පාලන වගුවේ විස්තර කර නැති වෙනත් ක්‍රම වර්ග කාන්තාවන් සදහන් කළ හැක. ඩිම්බ අසලට ළගා නොවන සේ ශුක්‍රාණු අක්‍රිය කිරීම, ශුක්‍රාණු විනාශ කිරීම සදහා භාවිතා වන විවිධ ජෙලි වර්ග, ක්‍රීම් වර්ග, පෙණ වර්ග, ස්ත්‍රී ලිංගේන්ද්‍රියේ යෙදවිය හැකි දියවන බෙහෙත් වර්ග වැනි නවීන ක්‍රම මේ සදහා ඇත.

ඔවුන් ඩයප්‍රම් සහ සර්විකල් කැප් යන ක්‍රමද සදහන් කළ හැක. ඩයප්‍රම් සහ සර්විකල් කැප් යනු ගැබ්ගෙළ ආවරණය වන සේ යෝනි මාර්ගය තුල ස්ථාන ගත කිරීමෙන් ගර්භාෂය සහ පැලෝපීය නාල තුලට ශුක්‍රාණු යාම අවහිර කර ඩිම්බ සමග එක්වීම වලක්වන මෘදු රබර් කොපු වර්ගයකි. මේවා ශුක්‍රාණු නසන ජෙලි වර්ගයක් හෝ ක්‍රීම් වර්ගයක් සමග භාවිතා කළ යුතුය.

දීර්ඝ කාලයක් වැලකී සිටීම, ශාබ වර්ග භාවිතය වැනි පාරම්පරික ක්‍රමද පැවසිය හැක.

**ප්‍රශ්න අංක 301 සහ 302 උපත් පාලන ක්‍රම පිළිබද දැනුම සහ භාවිතය**

මෙහිදී උපත් පාලන දැනුම හා භාවිතය පිළිබදව ප්‍රතිචාරකගෙන් විමසා සටහන් කල යුතුය. ප්‍රශ්න අංක 301 හා 302 දක්වා ඇති වගුව ප්‍රතිචාරකගේ උපත් පාලනය පිළිබද දැනුවත්කම හා භාවිතය ගැන තොරතුරු සටහන් කිරීමට භාවිතා කරන්න. වගුව සම්පූර්ණ කිරීමට පහත උපදෙස් කියවන්න.

1) 301 ප්‍රශ්නයේ ඉහලින්ම දක්වා ඇති හදුන්වාදීමේ වැකිය එලෙසම කියවන්න. අනතුරුව ප්‍රශ්නය අසන්න. ප්‍රතිචාරක හදුනන උපත් පාලන ක්‍රම සදහන් කිරීමට ඇයටම ඉඩ දෙන්න. ඇය විසින්ම සදහන් කරන සෑම ක්‍රමයක් සදහාම තීරුවේ '1' කව කරන්න.

   ප්‍රතිචාරක ඉක්මන් කරවන්න එපා. ඇය දන්නා සියළුම ක්‍රම ඇයටම ප්‍රකාශ කිරීමට ඉඩ හරින්න. වගුවේ ලැයිස්තු ගත කර නොමැති යම් කිසි ක්‍රමයක් ඇය සදහන් කල හොත් (උදා : ශාබ යොදා ගෙන කරනු ලබන පාරම්පරික ක්‍රම) වගුවේ පහතින් දක්වා ඇති 13 වන ක්‍රමය සදහා '1' කේතය කව කර , දී ඇති ඉඩ ප්‍රමානයෙහි ක්‍රමයේ නම සදහන් කරන්න. මෙසේ ඇය අසා තිබෙන වෙන ක්‍රම මොනවාදැයි කිහිපවරක් විමසා ඊට පසු ඇය සදහන් නොකළ ක්‍රම ඇයට පවසන්න.

2) ප්‍රතිචාරක සදහන් නොකල ක්‍රම සදහා ලැයිස්තුවේ ඉහලින්ම පටන්ගෙන
   "ඔබ කවදා හෝ (ක්‍රමය) අසා තිබේද ?" ලෙස අසන්න.

   ඇය සදහන් නොකල ක්‍රම ඇයට පවසන විට ක්‍රමයේ නම මෙන්ම තීරුවේ ඇති අයුරු ඒ පිළිබද විස්තරයක් ද පවසන්න. ඊට හේතුව කිසියම් ක්‍රමයක් හදුන්වන නම අසා නොමැති නමුත් ක්‍රමය ගැන ඇය දන්නවා විය හැක. ඔබ කථා කරන්නේ හෝ විස්තර කරන්නේ කුමක්දැයි ප්‍රතිචාරකට සැමවිටම අවබෝධ නොවේ. එසේ ඇය තේරුම් නොගත් බව පෙනියන්නේ නම්, එවැනි අවස්ථාවල ඇයට නැවත

පැහැදිලි කරන්න. එවිටත් ඇයට අවබෝධ නොවූයේ නම් හෝ තේරුම් නොගත්තේ නම් , වෙනත් ආකාරයකට හෝ වැඩි විස්තර සහිතව ඇයට පැහැදිලි කිරීමට සිදුවේ. මේ සඳහා උපත් පාලන ක්‍රම ගැන හොඳ දැනුමක් ඔබ ලබා ගත යුතුය.

3) උපත් පාලන ක්‍රම පිළිබඳ දැනුම විමසමින් ලැයිස්තුවේ ඇති ක්‍රම සියල්ල අසා නිම කල පසු නැවතත් උපත් පාලන ක්‍රම ලැයිස්තුවේ මුල සිට, ප්‍රශ්න අංක 302 (කවදා හෝ භාවිතා කිරීම) ආරම්භ කරන්න.

මෙම ප්‍රශ්නය ඇසිය යුත්තේ යම් ක්‍රමයක් ගැන කුමන හෝ දැනුමක් ඇති අයගෙන් පමණි. ප්‍රතිචාරක අසා ඇති සෑම ක්‍රමයක් සඳහාම එනම්, ප්‍රශ්න අංක 301 හි '1' කේතය කව වූ සෑම ක්‍රමයක් සඳහාම ප්‍රශ්න අංක 302 අසන්න. ඇය දන්නා පළමු ක්‍රමයෙන් පටන් ගෙන අනෙකුත් එක් එක් ක්‍රමය කවදා හෝ භාවිතා කර ඇතිදැයි වෙන වෙනම අසන්න. ටික දිනකට හෝ භාවිතා කර ඇත්නම් ඇය එම ක්‍රමය භාවිතා කල අයෙකු ලෙස සැලකිය යුතුය.

- ස්ත්‍රී සැත්කම පිළිබඳ විමසීමේදී
  "තවත් දරුවන් ලැබීම වැලැක්වීම සඳහා ඔබ කවදා හෝ සැත්කමක් කර තිබෙනවාද?" ලෙස විමසන්න.

එවැනි සැත්කමක් කල බව ඇය සඳහන් කලේ නම් එම සැත්කම උපත් පාලනය සඳහා කරන ලද සැත්කමක් දැයි නිශ්චිතව දැනගත යුතුය. මක් නිසාද යත් සෞඛ්‍යමය හේතූන් නිසා ඩිම්බ කෝෂ හෝ ගර්භාෂය ඉවත් කිරීම වැනි සැත්කම් හේතුවෙන් කාන්තාවන්ට ගැබ් ගත නොහැක. නමුත් ගැබ් ගැනීම වැළැක්වීමට කරන ලද සැත්කම් පමණක් මෙහිදී වෙන් කර ගත යුතුය

- පුරුෂයින් භාවිතා කරන ක්‍රම වලට අදාලව ප්‍රශ්නය ඇසීමේදී (රබර් කොපුව, ධාතු බැහැරලීම හෝ පුරුෂ සැත්කම වැනි)
  "ඔබගේ ස්වාමි පුරුෂයා/සහකරු ඔබ සමඟ එකතුවීමේදී (මෙම ක්‍රමය) භාවිතා කර තිබෙනවාද?" ලෙස විමසන්න.

| |
|---|
| වරකට වඩා විවාහ වූ හෝ පුරුෂයින් කිපදෙනෙකු සමග ජිවත් වූ කාන්තාවක් දැන් එම පුද්ගලයෙක් සමග ජිවත් නොවී වෙනත් කෙනෙක් සමග විවාහ වී හෝ ජිවත් වුවත් පෙර පුද්ගලයින් සමග ජිවත් වූ කාලයේදී ඇය භාවිතා කල උපත් පාලන ක්‍රම ඇයගේ ජිවිත කාලය තුළ උපත් පාලනයට භාවිතා කල ක්‍රම ලෙස සැලකිය යුතුය.<br><br>එවැනි කාන්තාවකගේ කිනම් පුරුෂයකු විසින් හෝ භාවිතා කරන ලද "පිරිමි ක්‍රම" ද ඇය කවදා හෝ උපත් පාලනයට භාවිතා කල ක්‍රම ලෙස සැලකිය යුතුය. |

එක් වරකට වඩා විවාහ වූ හෝ පුරුෂයින් කිහිප දෙනෙකු සමග වරින් වර ජිවත් වූ කාන්තාවක් භාවිතා කල ක්‍රම ඇයගේ කුමන පුරුෂයා සමග ජිවත් වීමේදී ඇය හෝ ඔහු භාවිතා කලේද යන්න දැන ගැනීම අවශ්‍ය නොවේ. කවදා හෝ ප්‍රතිචාරක උපත් පාලනයට භාවිතා කල ක්‍රම ගැන දැන ගැනීම ප්‍රශ්න අංක 302 හි අරමුණ වේ.

කිහිපවරක් විවාහ වූ කාන්තාවන්ගෙන් පුරුෂ සැත්කම ගැන ඇසීමේදී

"තවත් දරුවන් ලැබීම වැලැක්වීම සඳහා පුරුෂ සැත්කම කල සහකරුවෙක් ඔබට කවදා හෝ සිටියාද?" ලෙස අසන්න.

ඇයට එක් ස්වාමිපුරුෂයෙක්/සහකරුවෙකුට වඩා සිටියේ නම් ඇය සමග විවාහ වී හෝ එකට සිටි සමයේ ස්වාමිපුරුෂයෙක්/සහකරුවෙක් ධාතු බැහැරලීම හෝ රබර් කොපු උපත් පාලනය සඳහා භාවිතා කලේ දැයි අසා දැන ගන්න.

ප්‍රතිචාරක එක් සහකරුවෙකු සමග ජිවත් වීමේදී පමණක් උපත් පාලන ක්‍රමයක් භාවිතා කලේ නම් හෝ එක් ස්වාමිපුරුෂයකු /සහකරුවෙකු ටික කලකට යම්කිසි ක්‍රමයක් භාවිතා කලේ නම් හෝ මෙම ප්‍රශ්නයට පිළිතුර 'ඔව්' ලෙස මතක තබා ගන්න.

ප්‍රශ්න අංක 301 දී ඇය සඳහන් කල "වෙනත් ක්‍රමය" (13 ක්‍රමය) ඇය භාවිතා කලේදැයි නිශ්චිතව දැනගැනීමට ප්‍රශ්න අංක 302 දී විමසා පිළිතුරු සටහන් කරන්න.

**ප්‍රශ්න අංක 303 ෆිල්ටර් (උපත් පාලන ක්‍රම භාවිතා කිරීම සහ නොකිරීම)**

මෙම ප්‍රශ්නයේදී කිසියම් උපත් පාලන ක්‍රමයක් <u>භාවිතා කර ඇති</u> හා කිසිම උපත් පාලන ක්‍රමයක් <u>භාවිතා කර නැති</u> අය තෝරාගනු ලබන අතර, ඒ අනුව යොමු විය යුතු ප්‍රශ්නය තීරණය කරනු ඇත. මේ සඳහා ප්‍රශ්න අංක 302 හි සඳහන් කේතයන් පරීක්ෂා කර බලා ඒ අනුව අදාල කොටුවේ "✓ " ලකුණ සටහන් කරන්න. ප්‍රශ්න අංක 302 හි එක් ක්‍රමයක් සඳහා වත් '1' කව වී නැති, එනම් ' ඔව් ' කේතය එකක්වත් කව වී නැති සහ එක ක්‍රමයක් සඳහාවත් '1' කව වී ඇති, එනම් 'ඔව්' කේතය එකක්වත් කව වී ඇති යන සංකල්ප මත "✓ " ලකුණ යොදන්න. අනතුරුව අදාල ප්‍රශ්න වෙත යොමුවන්න.

**ප්‍රශ්න අංක 304 සහ 306 භාවිතා කළ ක්‍රම තව දුරටත් තහවුරු කිරීම**

මෙම ප්‍රශ්න, ප්‍රශ්න අංක 302 හි 1-13 දක්වා ඇති ක්‍රම සඳහා අංක '2' කවවූ එනම් කවදා හෝ භාවිතා කර නැති ලෙස පැවසූ අය සඳහාය. උපත් පාලන ක්‍රම භාවිතා කර නැත ලෙස පැවසුවත් ඇය (ප්‍රතිචාරක) හෝ ඇයගේ ස්වාමිපුරුෂයා/සහකරු කවදා හෝ උපත් පාලන ක්‍රමයක් භාවිතා කර ඇත්දැයි තවදුරටත් ස්ථිරව දැන ගැනීම සඳහා මෙහිදී විමසයි. එනම් ඇත්ත වශයෙන්ම කිසියම් දිනක, කිසියම් ක්‍රමයක් භාවිතා කර ඇති දැයි තහවුරු කර ගැනීමයි. ප්‍රශ්න අංක 304 සඳහා 'ඔව්' ලෙස පැවසුවහොත් (භාවිතා කර ඇති ලෙස පිළිතුරු ලැබුනහොත්) ප්‍රශ්න අංක 306 සඳහා යොමුවන්න. එහිදී ඇය භාවිතා කලේ කුමක්දැයි අසා දැනගන්න. ප්‍රශ්න අංක 306 හි දකුණු පැත්තේ කේත සඳහා ඇති ඉඩ ප්‍රමාණයෙහි ප්‍රතිචාරක සඳහන් කරන ක්‍රම සටහන් නොකිරීමට මතක තබා ගන්න. නැවත උපත් පාලන වගුව වෙත යොමුවී ප්‍රශ්න අංක 302 සහ 303 නිවැරදි කරන්න. අවශ්‍ය නම් ප්‍රශ්න අංක 301 ද නිවැරදි කරන්න .

**ප්‍රශ්න අංක 305 උපත් පාලන ක්‍රම භාවිතා නොකිරීම කැලැන්ඩරයේ දැක්වීම**

ප්‍රශ්න අංක 304 දී කවදා හෝ ගැබ් ගැනීම ප්‍රමාද කිරීම හෝ වැළැක්වීම සඳහා ඇය (ප්‍රතිචාරක) හෝ ඇයගේ ස්වාමිපුරුෂයා/සහකරු කිසිම ක්‍රමයක් භාවිතා කර නොමැති යයි පැවසුවහොත් දින දර්ශණයේ උපත් පාලන ක්‍රම භාවිතා කර නැති සෑම මාසයකටම භාවිතා කරන ක්‍රම වල කේතය සටහන් කළ යුතු තීරුවේ '0' සටහන් කරන්න. (එම මාස සඳහා කිසි විටකදිවත් B, P හෝ T සටහන් නොකළ යුතුය). එනම් කිසිම දිනක උපත් පාලන ක්‍රමයක් භාවිතා නොකල කාන්තාවක් සඳහා දින දර්ශනයේ සෑම මාසයක් සඳහාම '0' සටහන් වී තිබිය යුතුය. අනතුරුව ඔවුන් ප්‍රශ්න අංක 331 සඳහා යොමුකරන්න.

**ප්‍රශ්න අංක 307 ප්‍රථම ක්‍රමය භාවිතා කරන විට සිටි දරුවන් ගණන**

මෙම ප්‍රශ්නයට යොමු වන්නේ ප්‍රශ්න අංක 303 හිදී "ඔව් කේතය අඩු තරමේ එකක් වත් කව වී ඇත" යන වැකියට " ✓ " යෙදූ අය වේ. එනම් උපත් පාලන ක්‍රමයක් කවදා හෝ භාවිතා කළ අයයි.

මෙහිදී ප්‍රතිචාරකගේ ජීවිතයේ මුල්ම වරට උපත් පාලන ක්‍රමයක් භාවිතා කරන විට ජීවත්ව සිටි දරුවන් ගණන දැනගෙන සටහන් කරන්න. ඒ වන විට දරුවන් නොසිටියේ නම් දී ඇති කොටු තුල '00' ලියන්න. ප්‍රථම වරට උපත් පාලන ක්‍රම භාවිතා කරන විට මිය ගිය දරුවන්ද ඇතුළුව ජීවත්වන දරුවන් ගණන සටහන් කළ යුතුය. අවශ්‍ය විටදී ඉදිරි කොටුවට '0' සටහන් කර දී ඇති කොටු දෙකම සම්පූර්ණ කරන්න.

උදා : ප්‍රථමයෙන්ම උපත් පාලනය කරන විට ලද එකම දරුවාද මියගොස් සිටියේ නම් එවිට සිටින දරුවන් ගණන | 0 | 1 | ලෙස දක්වන්න.

ප්‍රථමයෙන්ම උපත් පාලනය කරන විට ලද එක් දරුවෙක් මියගොස් තවත් ජීවත් වන දරුවෙක් සිටියේ නම් එවිට සිටින දරුවන් ගණන | 0 | 2 | ලෙස දක්වන්න.

**ප්‍රශ්න අංක 307A මුල්ම උපත් පාලනයේ තීරණය**

ප්‍රශ්න 307A මගින් ප්‍රථම වරට උපත් පාලන ක්‍රමයක් භාවිතා කිරීමට තීරණය කාගේද, පවුල් සැලසුම් ක්‍රම භාවිතයට ඇයව යොමු කලේ කවුද යන්න දැන ගැනීම මෙහි අරමුණයි. එය ප්‍රතිචාරකගේ තනි තීරණයක් (කේත1) මෙන්ම ස්වාමි පුරුෂයාගේ/සහකරුගේ, එසේ නැත්නම් දෙදෙනාගේම විය හැක. සමහර විට පවුල් සෞඛ්‍ය සේවිකාව පැවසූ නිසා කළා විය හැක. පළමු කේත 4 ට අමතර දෙයක් පැවසුවොත් (උදා : වෛද්‍යවරයෙක්, හෙදියක්, නැදෑයෙක්) වෙනත් යටතේ එය සටහන් කර 5 කේතය කව කරන්න.

**ප්‍රශ්න අංක 307B ෆිල්ටර් (විවාහක තත්වය අනුව)**

මෙහිදී ප්‍රශ්න අංක 114 සහ 116 පරීක්ෂා කර ප්‍රතිචාරකගේ විවාහක තත්වය අනුව වර්ග කිරීමක් සිදු කරයි. ප්‍රතිචාරක වර්තමානයේ විවාහක හෝ පුරුෂයෙකු සමඟ ජීවත් වේ නම් අදාල කොටුව තුල " ✓ " දමා 308 ප්‍රශ්නය වෙත යොමුවන්න. ප්‍රතිචාරකගේ වර්තමාන විවාහක තත්වය වැන්දඹු/දික්කසාද හෝ වෙන්වී ජීවත්වීම නම් අදාල කොටුව තුල " ✓ " දමා ප්‍රශ්න අංක 322 වෙතට යොමු වන්න.

**ප්‍රශ්න අංක 308 පිල්ටර් ( වඳ සැත්කම කර ඇත/නැත)**

මෙහි පරමාර්ථය වඳ සැත්කම කළ හා වඳ සැත්කම නොකළ කාන්තාවන් හඳුනා ගැනීමයි. මේ සඳහා තොරතුරු ලබා ගන්නේ ප්‍රශ්න අංක 302 (1) මගිනි. වඳ සැත්කම නොකල කාන්තාවන් ප්‍රශ්න අංක 309 ට යොමු කල යුතු අතර වඳ සැත්කම කල කාන්තාවන් ප්‍රශ්න අංක 311A වෙත යොමු කරන්න.

**ප්‍රශ්න අංක 309 පිල්ටර් (ගැබ් ගෙන ඇති සහ නැති)**

මෙහිදී ගැබ් ගෙන සිටින හා ගැබ්ගෙන නොසිටින කාන්තාවන් වෙන් කර ගනියි. මේ සඳහා තොරතුරු ප්‍රශ්න අංක 226 නි. ගැබ් ගෙන නොමැති කාන්තාවන් ප්‍රශ්න අංක 310 ටත් ගැබ්ගත් කාන්තාවන් ප්‍රශ්න අංක 322 ටත් යොමුකරන්න.

**ප්‍රශ්න අංක 310 දැනට (වර්තමානයේ) උපත් පාලනය**

මෙහිදී ප්‍රතිචාරක දැනට (වර්තමානයේ) උපත් පාලන ක්‍රමයක් අනුගමනය කරනවාදැයි දැන ගැනීමට විමසිය යුතුය. දැනට දරුවන් ලැබීම වැලැක්වීමට උපත්පාලන ක්‍රමයක් භාවිතා නොකරන කාන්තාවන් ප්‍රශ්න අංක 310B වෙත යොමු කරන්න.

**ප්‍රශ්න අංක 310A දැනට උපත් පාලනයේ තීරණය**

ප්‍රශ්න අංක 310 A මගින් (වර්තමානයේ) දැනට උපත් පාලන ක්‍රමයක් භාවිතා කිරීමට තීරණය කලේ කවුදැයි දැන ගැනීමට විමසයි. ප්‍රතිචාරකගේ පිළිතුරු අනුව අදාල කේතය කව කරන්න. (ප්‍රශ්න අංක 307A හි උපදෙස් අනුගමනය කරන්න.) ප්‍රශ්න අංක 311 ට යොමුවන්න.

**ප්‍රශ්න අංක 310B දැනට උපත් පාලන ක්‍රමයක් භාවිතා නොකිරීමට හේතුව**

මෙම ප්‍රශ්නය අසන්නේ දැනට උපත් පාලන ක්‍රමයක් භාවිතා නොකරන කාන්තාවන්ගෙනි. උපත් පාලන ක්‍රම භාවිතා නොකිරීමට ඔවුනට විවිධ හේතු තිබිය හැකිය. ප්‍රතිචාරකට හොඳින් සවන් දෙන්න. උපත් පාලන ක්‍රමයක් භාවිතා නොකිරීමට ඔවුන් සඳහන් කරන මූලිකම හේතුවට අදාල කේතය කව කරන්න. 'වෙනත්' හේතුවක් නම් එය කුමක්දැයි සටහන් කරන්න. මෙහිදී ඇය උපත් පාලන ක්‍රමයක් භාවිතා නොකිරීමේ ප්‍රධාන හේතුව පමණක් කව කිරීමට මතක තබා ගන්න.

උපත් පාලන ක්‍රමයක් භාවිතා නොකරන්නේ ඇයි දැයි ඇය කොහෙත්ම නොදනී නම් නොදනී යටතේ '99' කව කරන්න.

වර්තමානයේ උපත් පාලනය නොකරන මෙම කාන්තාවන් මෙම ප්‍රශ්නයෙන් පසු ප්‍රශ්න අංක 322 ට යොමු කර කැලැන්ඩරයේ තොරතුරු සටහන් කිරීම කර ගත යුතුය.

**ප්‍රශ්න අංක 311/311A වර්තමානයේ භාවිතා කරන උපත් පාලන ක්‍රම**

ප්‍රශ්නාවලියේ මෙම ප්‍රශ්න ඉතා වැදගත්වේ. ප්‍රශ්න අංක 302 හිදී ප්‍රතිචාරක භාවිතා කලේ යැයි සඳහන් කළ ක්‍රම අනුව ගැබ් ගැනීම වැලැක්වීම සඳහා ඇය දැනට (වර්තමානයේ) භාවිතා කරන උපත් පාලන ක්‍රමය කුමක්දැයි නිශ්චිතව විමසන්න. මෙහිදී "දැනට භාවිතා කරනවා" යන්න පැහැදිලි කරගත යුතුය. හේතුව සමහර ක්‍රම දින පතාත්, සමහර ක්‍රම මාස් පතාත්, සමහර ක්‍රම අවුරුදු පතාත්. සමහර ක්‍රම සදාකාලිකවත් යනාදී වශයෙන් වෙනස් වන නිසාය.

ස්ත්‍රී සැත්කම සහ පුරුෂ සැත්කම මගින් නැවත කිසිම දිනක (ඉතාමත් කලාතුරකින් හැර) දරු ගැබක් ඇතිවීමක් සිදු නොවේ. ප්‍රශ්න අංක 302 දී නැවත දරුවන් ඇතිවීම වැලැක්වීම සඳහා ස්ත්‍රී සැත්කම කර ඇත්නම් වර්තමානයෙදී භාවිතා කරන ක්‍රමය ලෙස ඔබ ස්ත්‍රී සැත්කම එනම් ' A ' කේතය කව කල යුතුය.

ප්‍රතිචාරකගේ ස්වාමිපුරුෂයා/සහකරුට දරුවන් නොලැබීම සඳහා පුරුෂ සැත්කම කර ඇත්නම් පුරුෂ සැත්කම වර්තමාන ක්‍රමය වේ. **කෙසේ වෙතත් පුරුෂ සැත්කම කල සහකරුවෙක් හෝ ස්වාමිපුරුෂයෙක් පෙර ඇයට සිටියේ නම් වර්තමාන ක්‍රමය පුරුෂ සැත්කම නොවේ.**

වර්තමානයේ භාවිතා කරන ක්‍රම ලෙස පෙති සඳහන් කලහොත්, ඔවුන් දිනපතා පෙති භාවිතා කරන්නන් විය යුතුය. උපත් පාලන එන්නත මගින් මාස 2 සිට මාස 6 දක්වා කාලයක් තුල දරු ගැබක් ඇතිවීම වලක්වා ගත හැක. නෝර්ප්ලාන්ට් ක්‍රමය මගින් අවුරුදු 5 ක කාලයකට හෝ අවුරුදු 5 කට අඩු කාලයකදී නම් එය ඉවත් කරන තුරු දරු ගැබක් ඇතිවීම වැලැක්විය හැකි අතර උපත් පාලනය ලෙස ලූපය (IUD) භාවිතා කළ විට එය ඉවත් කරනතුරු දරුගැබක් ඇතිවීමෙන් ප්‍රවේශම් විය හැක. එබැවින් සම්මුඛ සාකච්ඡා දිනට පෙර සිට අදාල කාල පරිච්ඡේදය තුලදී යම්කිසි ක්‍රමයක් භාවිතා කර ඇත්නම්, එම ක්‍රමය දැනට (වර්තමානයේ) භාවිතා කරන ක්‍රමය ලෙස සලකන්න.

- කිසියම් කාන්තාවක් ක්‍රම 2 ක් එකවර භාවිතා කරනවා යයි පැවසුවහොත් ඇය වර්තමානයේ අඹු සැමි සම්බන්ධතාවයේදී උපයෝගී කරගත් ක්‍රමය වන්නේ ලැයිස්තුවේ ඇති ක්‍රම අනුපිළිවෙලට ඉහලින්ම සඳහන් වන ක්‍රමයයි. **එක ක්‍රමයකට වඩා කව වුවහොත් ලැයිස්තුවේ ඉහලින්ම සඳහන්වූ ක්‍රමයේ යොමුවීම අනුගමනය කරන්න.**

  උදා : "පෙති" භාවිතා කරන කාන්තාවක් ඇයගේ <u>අවසන් එක්වීමේදී</u> "ධාතු බැහැරලීම" ද භාවිතා කල හොත් ඇය දැනට භාවිතා කරන ක්‍රමය ලෙස "පෙති" භාවිතය යෙදිය යුතුය.

**විශේෂ අවස්ථා**

- <u>රබර් කොපු හා ධාතු බැහැරලීම</u> යන ක්‍රම පමණක් උපත් පාලනය සඳහා වරින්වර භාවිතා කරයි නම් ඇයගේ වර්තමාන උපත්පාලන ක්‍රමය ඇය අවසන් වතාවට එක්වූ අවස්ථාවේ භාවිතා කළ උපත් පාලන ක්‍රමයයි. එනම් උපත් පාලන ක්‍රමය ලෙස "රබර් කොපු" වැඩි වශයෙන් භාවිතා කරත් අවසන් වර භාවිතා කලේ " ධාතු බැහැරලීම" නම් වර්තමානයේ භාවිතා කරන ක්‍රමය වන්නේ ඉවතට ගැනීමයි.

ප්‍රශ්නය විමසා අදාල කේතය කව කර කේත අංකය ඉදිරියේ දක්වා ඇති ප්‍රශ්න සඳහා යොමුවන්න. වෙනත් යටතේ 'X' කව කලා නම් එම ක්‍රමය කුමක්දැයි තිත් ඉර මත ලියන්න.

**<u>ප්‍රශ්න අංක 311, 301 හා 302 සමඟ ගැලපීම</u>**

ප්‍රශ්න අංක 311 සඳහා දැක්වූ ප්‍රතිචාර ඇය ප්‍රශ්න අංක 301 හා 302 ට දැක්වූ ප්‍රතිචාර සමඟ ගැලපේ දැයි පරික්ෂා කරන්න.

උදා : දැනට (වර්තමානයේ) "පෙති" භාවිතා කරන ලෙස පැවසුවහොත් ප්‍රශ්න අංක 301 දී ඇය "පෙති" නොහඳුනන බවත්, කවදා හෝ භාවිතා කර නොමැති බවත් සඳහන් කර තිබිය හැක. මෙවැනි අවස්ථාවලදී තවදුරටත් විමසා ප්‍රතිචාර අනුව ප්‍රශ්න අංක 301 හෝ 311 නිවැරදි කරන්න.

**ප්‍රශ්න අංක 312/313 පෙති සහ රබර් කොපු භාවිතය**

ප්‍රශ්න අංක 311 දී උපත් පාලනය සඳහා වැඩි වශයෙන් පෙති හෝ රබර් කොපු (කේත C සහ G කවකල අය) සඳහන් කල අයගෙන් මෙම ප්‍රශ්නය ඇසිය යුතුය. එම උපත් පාලන ක්‍රම භාවිතය පිළිබඳ තවදුරටත් තොරතුරු ලබා ගැනීම මෙමගින් සිදුකෙරේ.

පලමුවෙන්ම භාවිතා කරන පෙති හෝ කොන්ඩම් වල වෙළඳ නාමය සටහන් කළ යුතුය. ඒ සඳහා ඇසුරුමක් ලබා ගත හැකි දැයි විමසන්න. භාවිතා කරන පෙති හෝ කොන්ඩම් වල ඇසුරුමක් දක්නට ලැබුනේ නම් '1' කේතය කවකර ඇසුරුමේ වෙළඳ නාමය සටහන් කර ප්‍රශ්න අංක 314 වෙත යොමුවන්න. වෙළඳ නාමයක් දක්නට නොමැති නම් ඒ බව වෙළඳ නාමය ලිවීමට ඇති ස්ථානයේ සඳහන් කරන්න.

ඇසුරුම දක්නට නොලැබුනේ නම් '2' කේතය කව කරන්න. ඇයගෙන් 313 ප්‍රශ්නය අසන්න. මෙහිදී ඇය වෙළඳ නාමය දන්නේ නම් එය සටහන් කරන්න. තව දුරටත් විමසා ඇය වෙළඳ නාමය නොදනී නම් '98' කව කරන්න.

ප්‍රශ්න අංක 312 හා 313 දී වෙළඳ නාමය ඉදිරියේ ඇති කොටු හිස්ව තැබීමට මතක තබා ගන්න.

**<u>ප්‍රශ්න අංක 313, 311 සමඟ ගැලපීම</u>**

මෙහිදී ඇය දැනට (වර්තමානයේ) භාවිතා කරන ක්‍රමය පිළිබඳව නිවැරදිව අවබෝධ කර ගත හැක. එනම් ඇය ප්‍රශ්න අංක 311 හිදී වර්තමානයේ පෙති හෝ රබර් කොපු භාවිතා කළේ යැයි පවසා, ඔබ වෙළඳ නාමය විමසන විට ඇය ටික දවසක් පෙති හෝ රබර් කොපු භාවිතා කළේ නැත යන්නෙන් පැවසිය හැක. ඉන් පැහැදිලි වන්නේ දැනට වර්තමානයේ ඇය භාවිතා කරන ක්‍රමය පෙති හෝ රබර් කොපු නොවන බවයි. එවිට නැවත ප්‍රශ්න අංක 311 නිවැරදි කල යුතුය. සමහර විට ප්‍රශ්න අංක 310 ද නිවැරදි කිරීමට සිදුවනු ඇත.

ප්‍රශ්න අංක 314 පෙති හෝ රබර් කොපු ප්‍රමාණය

මෙම තොරතුරු, පෙති හෝ රබර් කොපු භාවිතා කරන්නන්ට අවශ්‍ය තරමට සැපයුමක් තිබේ දැයි සැකහැර දැන ගැනීම සඳහා උපත් පාලන සැලසුම් සම්බන්ධයෙන් ඇති උපත් පාලන වැඩමුළු වලට අත්‍යවශ්‍ය වේ. තවද යුවලක් උපත් පාලන සඳහා භාවිතා කරන පෙති හෝ කොන්ඩම් ප්‍රමාණය, ඒවායේ භාවිතය සහ ඔවුන් එම පවුල් සැලසුම් ක්‍රම භාවිතය කඩ කිරීම ගැන අවබෝධයක් ලබා ගැනීම, ඉදිරි උපත් පාලන අත්‍යවශ්‍යතාවයන් විග්‍රහ කිරීමට ප්‍රයෝජනවත් වේ.

ඇය හෝ ඇගේ ස්වාමිපුරුෂයා **අවසන්වරට** පෙති හෝ රබර් කොපු කොපමණ ලබා ගත්තාද හෝ මිලදී ගත්තාද ලෙස විමසන්න. ඇය භාවිතා කරන උපත් පාලන ක්‍රමය පෙති නම් ලබාගත් හෝ මිලදී ගත් (සුදු පෙති 21 + දුඹුරු පෙති 7) ප්‍රමාණයද, භාවිතා කරන උපත් පාලන ක්‍රමය රබර් කොපු නම් ලබාගත් හෝ මිලදී ගත් රබර් කොපු ප්‍රමාණයද සඳහන් කරන්න.

සමහර විට ලබාගත් ප්‍රමාණය (උදා :- රබර් කොපු නම්) ඇය නොදැන සිටීමට ඉඩ ඇත. විමසා සටහන් කර ප්‍රශ්න අංක 315 ට යන්න. අවශ්‍ය විටදී ඉදිරි කොටු වලට '0' යොදා සම්පූර්ණ කරන්න.

උදා :- ලබාගත්/මිලදී ගත් රබර් කොපු ප්‍රමාණය 10 ක් නම් | 0 | 1 | 0 | ලෙස සටහන් කරන්න.

ලබාගත් /මිලදී ගත් පෙති අඩංගු කාඩ් ගණන 3 ක් නම් | 0 | 0 | 3 | ලෙස සටහන් කරන්න.

ප්‍රශ්න අංක 315 උපත් පාලන ක්‍රමය සඳහා ගෙවන ලද මුළු මුදල

**ස්ත්‍රී සැත්කම හෝ පුරුෂ සැත්කම නොකල, දැනට වෙනත් උපත් පාලන ක්‍රම භාවිතා කරන කාන්තාවන් වෙත මෙම ප්‍රශ්නය යොමු කල යුතුයි.** ක්‍රම කිහිපයක් සඳහන් කර ඇත්නම් ලැයිස්තුවේ ඉහලින් ඇති ක්‍රමය සඳහා මෙම ප්‍රශ්නය යොමු කළ යුතු වේ. ප්‍රශ්නය ඉතා නිවැරදිව, ප්‍රතිචාරකට අවබෝධ වන ආකාරයට ඇසීම ඉතා වැදගත් වේ.

උපත් පාලන ක්‍රමය ලබා ගැනීම සඳහා භාවිතා කරන්නාට (ප්‍රතිචාරකට) වැය වූ මුදලේ ප්‍රමාණය මෙහිදී විමසයි. වැයවූ මුදල දක්වා ඇති කොටු තුළ රුපියල් හා ශත වලින් සටහන් කළ යුතු අතර මිල සටහන් කිරීමේදී අවශ්‍ය නම් ඉදිරි කොටු වලට '0' යොදා සම්පූර්ණ කරන්න. රු. 10,000 හෝ ඊට වැඩි ගණනක් නම් 9999.99 යොදන්න.

ඇය භාවිතා කල ක්‍රමය <u>අවසන් වතාවට</u> ලබා ගැනීමේදී ලබා ගත් ඕනෑම <u>විශේෂඥ සේවාවක් සඳහා ගෙවූ මුදල ඇතුළුව ගෙවීමට සිදු වූ මුළු මුදල</u> ඔබ විසින් විමසා සටහන් කළ යුතුය.

උදා :- උපත් පාලන ක්‍රමයට ගෙවන ලද මුදල රුපියල් 100/- ක් නම්

| | | | | | |
|---|---|---|---|---|---|
| 0 | 1 | 0 | 0 | 0 | 0 |

ලෙස සටහන් කරන්න.

උපත් පාලන ක්‍රමයට ගෙවන ලද මුදල රුපියල් 60.50 ක් නම්

| | | | | | |
|---|---|---|---|---|---|
| 0 | 0 | 6 | 0 | 5 | 0 |

ලෙස සටහන් කරන්න.

උපත් පාලන ක්‍රමයට ගෙවන ලද මුදල රුපියල් 12,000/- ක් නම්

| | | | | | |
|---|---|---|---|---|---|
| 9 | 9 | 9 | 9 | 9 | 9 |

ලෙස සටහන් කරන්න.

මේ සඳහා ඉතා නිවැරදි ප්‍රතිචාරයක් ලබා ගැනීම තරමක් අපහසුය. සමීක්ෂණ දිනට තරමක් පෙර කාලයකදී ක්‍රමය මිලදී ගෙන ඇත්නම් ඇයට වැය වූ මුදල මතකයේ නොතිබීමට ඉඩ ඇත. සමහර විට උපත් පාලන ක්‍රමය සඳහා මුදල් වියදම් කලේ ඇය නොවේ නම් නිවැරදිම මුදල ඇය නොදැන සිටීමට ඉඩ ඇත. සමහර අවස්ථාවල පවුල් සැලසුම් ක්‍රමය සඳහා මුදල් ගෙවන ලද්දේ රක්ෂණයකින් වීමට ද පුළුවන. නමුත් එම ක්‍රමය ලබා ගැනීමේදී කුමන හෝ වියදමක් කර ඇත්දැයි විමසා ඇය එම වියදම නොදනී නම්, මෙවැනි අවස්ථා වල "නොදනී" යන කේතය එනම් '9998' කව කරන්න. උපත් පාලන ක්‍රමය සඳහා විශේෂඥ සේවාවකට හෝ වෙනත් වියදමක් හෝ දරා නොමැති නම්, '9995' කේතය, එනම් "නොමිලේ" යන කේතය කව කල යුතුයි. ප්‍රශ්නය සම්පූර්ණ කළ පසු ප්‍රශ්න අංක 319A ට යොමු කරන්න.

ඔබට මෙහිදී දෙන ලද පිළිතුර සටහන් කිරීමේදී ගැටළුවක් මතු වේ නම් එය ප්‍රශ්නාවලියේ සටහන් කර අධීක්ෂක නිලධාරී සමග සාකච්ඡා කර සුදුසු ප්‍රතිචාරය සටහන් කරන්න.

ප්‍රශ්න අංක 315 හි තොරතුරු, එනම් ක්‍රමය භාවිතා කරන්නාට ගෙවීමට සිදු වූ මුදල සමග ගලපා, පෙති හෝ රබර් කොපු සඳහා වැයවන සාමාන්‍ය වියදම මෙම තොරතුරු මගින් ඇස්තමේන්තු කල හැක.

**ප්‍රශ්න අංක 316 සැත්කම කර ගත් ස්ථානය**

මෙම ප්‍රශ්නය අසනු ලබන්නේ ප්‍රශ්න අංක 311 දී ස්ත්‍රී සැත්කම හෝ පුරුෂ සැත්කම කර ගත් බව පැවසූ අයගෙන් පමණි. එනම් කේත අංක 1 හා 2 කව කල අයගෙනි. සැත්කම කල ස්ථානයට අදාල කේතය කව කරන්න. මෙහිදී සඳහන් කරන ස්ථානය රජයේ ආයතනයක්ද හෝ පෞද්ගලික ආයතනයක්ද යන්න දැන ගැනීම අවශ්‍ය වේ. ඒ අනුව කේතය කව කල යුතුයි. සඳහන් කරන ලද ආයතනය රාජ්‍ය නොවන සංවිධානයක් නම් එම ස්ථානය පෞද්ගලික අංශය ලෙස සැලකිය යුතුය. සඳහන් කල ස්ථානය පෞද්ගලික අංශයේ ද හෝ රාජ්‍ය අංශයේදැයි ඔබට අවබෝධ කර ගත නොහැකි අවස්ථාවන්හිදී ස්ථානයේ නම දී ඇති ඉඩෙහි සටහන් කරන්න. සමීක්ෂණය අවසන් කල පසු අධීක්ෂක නිලධාරී සමග සාකච්ඡා කර ස්ථානය තීරණය කරන්න.

**ප්‍රශ්න අංක 317 සැත්කම හේතුවෙන් දරුවන් නොමැති බව**

මෙහිදී ස්ත්‍රී සැත්කම හෝ පුරුෂ සැත්කම නිසා නැවත දරුවන් ලැබිය නොහැකි බව ඇයට හෝ ඔහුට පැවසුවාද යන්න විමසිය යුතුය. එනම් වද සැත්කම හේතුවෙන් නැවත ගැබ් ගැනීමක් සිදු නොවන බවට ඔවුන් දැනුවත් වී ඇති දැයි මෙහිදී විමසයි. ප්‍රතිචාර අනුව අදාල කේත කව කරන්න.

**ප්‍රශ්න අංක 318 / 318 A සැත්කම සඳහා ගිය වියදම**

සැත්කම සඳහා ගෙවන ලද මුදල දැන ගැනීම මෙම ප්‍රශ්නයේ අරමුණයි. ගෙවන ලද මුදල තීරණය කිරීමේදී, සැත්කමෙහි ගාස්තුව, ලබා ගත් විශේෂඥ සේවාවල ගාස්තුව, ඇතුළු සියල්ලටම ගිය වියදම අසා දැනගත යුතුය. ඇය එම වියදම නොදනී නම් '9998' ද වියදමක් දරා නොමැති නම් '9995' ද කව කරන්න. වැයවූ මුදල දක්වා ඇති කොටු තුළ රුපියල් වලින් සටහන් කළ යුතු අතර මිල සටහන් කිරීමේදී ඉදිරි කොටු තුලට අවශ්‍ය නම් '0' යොදා සම්පූර්ණ කරන්න. රු. 10000 හෝ ඊට වැඩි නම් 9999 කොටුතුළ සටහන් කරන්න.

උදා :- සැත්කම සඳහා වැයවූ මුදල රුපියල් 800/- ක් නම්

| | | | |
|---|---|---|---|
| 0 | 8 | 0 | 0 |

ලෙස සටහන් කරන්න.

සැත්කම සඳහා වැයවූ මුදල රුපියල් 15000/- ක් නම්

| | | | |
|---|---|---|---|
| 9 | 9 | 9 | 9 |

ලෙස සටහන් කරන්න.

සැත්කම "නොමිලේ" කලා යැයි ප්‍රශ්න අංක 318 දී ඇය සදහන් කලේ නම් පමණක් ප්‍රශ්න අංක 318 A හිදී ඇයට හෝ ඔහුට සැත්කම වෙනුවෙන් රු 500/= දීමනාව ලැබුනා දැයි විමසන්න.

**ප්‍රශ්න අංක 319 / 319A සැත්කම කල දිනය හෝ වර්තමාන ක්‍රමය ආරම්භ කල දිනය**

**සැත්කම කල දිනය**

ප්‍රතිචාරක හෝ ස්වාමිපුරුෂයා වද සැත්කම කර ගත් වර්ෂය හා මාසය අසා දැන ගන්න. අඹු සැමි දෙපළම වද සැත්කම කර තිබේ නම් **ස්ත්‍රී සැත්කම** කරන ලද අවුරුද්ද සහ මාසය අදාල කොටුව තුල සඳහන් කරන්න. එම දිනයන් ප්‍රතිචාරකට අමතක නම් ඇයට මතක් කර ගැනීම සඳහා විමසන්න. බාල දරුවාගේ වයස සහ උපන් දිනය වැනි තොරතුරු සැලකිල්ලට ගනිමින් හැකි තරම් නිවැරදිව වර්ෂය සහ මාසය සටහන් කරන්න. එසේත් නොහැකි නම් හැකි තරම් නිවැරදිව ඇස්තමේන්තු කර වර්ෂය සහ මාසය සටහන් කල යුතුය. ඇයට කොහෙත්ම වර්ෂය හා මාසය අමතක නම් ඇය හෝ ඔහු සැත්කම කලේ කොපමණ කාලයකට පෙර දැයි විමසා කාලය මාස වලින් සටහන් කරන්න. කාලය සඳහන් කිරීමේදී අවශ්‍ය විටදී ඉදිරි කොටුව තුලට '0' යොදා කොටු දෙකම සම්පූර්ණ කරන්න.

**වර්තමාන ක්‍රමය ආරම්භ කල දිනය**

දැනට භාවිතා කරන ක්‍රමය <u>නොකඩවා</u> කිරීමට පටන් ගත්තේ කවදාදැයි විමසන්න. මෙම ක්‍රමය ටික කලකට හෝ නැවැත්වූයේ නම් අවසාන වතාවට නැවත පටන් ගත් වර්ෂය හා මාසය සටහන් කරන්න. ඇය නොකඩවා භාවිතා කලේ යැයි සඳහන් කරන කාලය දීර්ඝ වැඩි බව අවබෝධ වුවහොත් තවදුරටත් එම කාලය නිවැරදි බව තහවුරු කර ගන්න. වර්ෂය හා මාසය නිවැරදිව ලබා ගැනීමට උත්සාහ කරන්න.

උදා : කාන්තාවක් වර්ෂ 2001ජූනි මාසයේ සිට උපත් පාලනය සඳහා "පෙති" භාවිතා කලේ යැයි සිතන්න. මාස කිහිපයකට පසු දරුවෙකු ලබා ගැනීමේ අරමුණින් ඇය "පෙති" භාවිතය නවත්වයි. ඇයගේ අරමුණ සාර්ථකවී, වර්ෂ 2004 ජනවාරි මාසයේදී ඇයට දරු උපතක් සිදු විය. 2004 අප්‍රේල් මාසයේ සිට නැවතත් ඇය උපත් පාලනය සඳහා "පෙති" භාවිතා කිරීමට පටන් ගන්නා ලදී. මෙහිදී එම කාන්තාව දැනට භාවිතා කරන ක්‍රමය <u>නොකඩවා</u> කිරීමට පටන් ගත් වර්ෂය වන්නේ 2004 සහ මාසය අප්‍රේල් එනම් '04' වේ.

ස්වාමි පුරුෂයා පිටරට ගිය නිසා එම කාලය තුල පෙති භාවිතය නවත්වා, නැවත භාවිතයට පටන් ගත්තේ නම්, නැවත පටන් ගත් වර්ෂය හා මාසය සටහන් කරන්න.

වර්තමානයේ භාවිතා කරන ක්‍රමය නොනවත්වා භාවිතා කිරීම ආරම්භ කල වර්ෂය හා මාසය කොහෙත්ම ඇයට අමතක නම්, ඇය හෝ ඔහු දැන් භාවිතා කරන ක්‍රමය ආරම්භ කලේ කොපමණ කාලයකට පෙර දැයි විමසා භාවිතා කල කාලය මාස වලින් සටහන් කරන්න.

**ප්‍රශ්න අංක 320 ෆිල්ටර් (දැනට (වර්තමාන) භාවිතා කරන ක්‍රමයේ කාල සීමාව පරීක්ෂා කිරීම)**

මෙහිදී වර්තමාන ක්‍රමය භාවිතා කිරීමට ආරම්භ කිරීමෙන් පසුව දරු උපතක් හෝ සජීවී දරු උපතකින් අවසන් නොවූ ගැබ් ගැනීමක්, එනම් ගබ්සා වීමක්, ගබ්සාකිරීමක්, මළ දරු උපතක් සිදු වී ඇතිදැයි පරීක්ෂා කරයි.

ඒ සඳහා 2 කොටසේ , ප්‍රශ්න අංක 215 සහ 230 සමග ප්‍රශ්න අංක 319/ 319A සැසඳිය යුතුය.

ඇය දැනට භාවිතා කරන ක්‍රමය පටන් ගත්තාට පසු උපතක් හෝ දරු ගැබට හානියක් සිදු වී ඇත්නම්, නැවත ප්‍රශ්න අංක 319/319A විමසිය යුතුය. එහිදී දරුවෙකු බලාපොරොත්තුවෙන් හෝ වෙනත් කිසිම හේතුවක් සඳහාවත් <u>නොනවත්වා</u>, ඇය දැනට භාවිතා කරන ක්‍රමය <u>නොකඩවා</u> පටන් ගත් වර්ෂය හා මාසය සඳහන් කරන මෙන් පැහැදිලිව විස්තර කර විමසන්න. දැනට භාවිතා කරන ක්‍රමය නොකඩවා කිරීමට පටන් ගත් මාසය සහ වර්ෂය අවසන් උපතට හෝ අවසන් වරට දරු ගැබට හානියක් වුවාට පසුව විය යුතුය.

උදා : පසුගිය අවුරුද්දේ උපන් දරුවෙක් ප්‍රතිචාරකට සිටියේ නම් දැනට භාවිතා කරන ක්‍රමය ඇය අවුරුදු 3 ක් තිස්සේ භාවිතා කරනවා යැයි ඇයට පැවසිය නොහැක.

**ප්‍රශ්න අංක 321 ෆිල්ටර් (වර්තමානයේ භාවිතා කරන ක්‍රමය කැලැන්ඩරයේ සටහන් කිරීම)**

ප්‍රශ්න අංක 319/319A හි වර්ෂය 2001 හෝ ඊට පසුව නම්, එනම් දැනට භාවිතා කරන ක්‍රමය පටන් ගත් වර්ෂය 2001 හෝ ඊට පසු නම් වම් පැත්තේ ඇති කොටුව තුල "✓ " ලකුණක් දමා කැලැන්ඩරයේ, සම්මුඛ පරීක්ෂණය සිදු කරන මාසයට, දැනට (වර්තමානයේ) භාවිතා කරන ක්‍රමයට අදාල කේතය සටහන් කර, එම ක්‍රමය ආරම්භ කල මාසය දක්වා අදාල කේතය කැලැන්ඩරයේ සටහන් කරන්න. දැන් භාවිතා කරන ක්‍රමය ස්ත්‍රී/පුරුෂ සැත්කම නම්, එය සිදු කල මාසය දක්වා එම ක්‍රමයේ කේතය කැලැන්ඩරයේ සෑම මාසයකම සටහන් කරන්න.

දැනට භාවිතා කරන ක්‍රමය පටන් ගෙන දිගු කාලයක් නම් සම්මුඛ පරීක්ෂණය සිදු කරන මාසය සහ පටන් ගත් මාසය සම්බන්ධ කර රේඛාවක් අඳින්න. එසේ රේඛාවක් ඇඳීමේදී, දැනට භාවිතා කරන ක්‍රමය භාවිතා නොකල මාස සඳහා රේඛාව සටහන් නොකිරීමට මතක තබා ගන්න.

අනතුරුව ප්‍රශ්න අංක 322 වෙත යොමු වන්න.

ප්‍රතිචාරක දැනට භාවිතා කරන ක්‍රමය පටන් ගත්තේ වර්ෂ 2000 හෝ ඊට පෙර නම් දකුණු පැත්තේ කොටුව තුල "✓ " ලකුනක් දමා දැනට භාවිතා කරන ක්‍රමයේ කේතය කැලැන්ඩරයේ සම්මුඛ පරීක්ෂණය සිදු කරන මාසයට සටහන් කර, වර්ෂ 2001 දක්වාම එම කේතය සටහන් කරන්න.

අනතුරුව ප්‍රශ්න අංක 329 වෙත යොමු වන්න.

ප්‍රශ්න අංක 311 හි දක්වා ඇති කේත අංක කැලැන්ඩරයේ ද සඳහන් කර ඇති දැයි සැක හැර දැන ගන්න.

**ප්‍රශ්න අංක 322 උපත් පාලනය කල සහ නොකල කාල සීමාවන් කැලැන්ඩරය තුල සටහන් කිරීම.**

දැනට (වර්තමානයේ ) උපත් පාලන ක්‍රම භාවිතා කරන සහ මීට පෙර කවදා හෝ උපත් පාලන ක්‍රම භාවිතා කල කාන්තාවන්ගේ, වර්ෂ 2001 සිට උපත් පාලන ක්‍රම භාවිතය සහ භාවිතය නැවැත්වීම් සම්බන්ධයෙන් තොරතුරු ප්‍රශ්න අංක 322 දී අසනු ලැබේ.

මෙම ප්‍රශ්නයේ හඳුන්වා දීමේ වාක්‍ය පැවසීමෙන් ඔබ අසන්නේ කුමන තොරතුරු දැයි ප්‍රතිචාරකට මනාව අවබෝධ වේ. කැලැන්ඩරයේ දැනටමත් දක්වා ඇති උපත් (B), ගැබ් ගැනීම් (P), ගැබ් ගැනීමක් උපතක් නොවී අවසන් වීම් (T), ඔබට සහ ප්‍රතිචාරකට උපත් පාලන ක්‍රම භාවිතා කල කාලසීමාවන් මනාව වටහා ගැනීමට ඉවහල් වේ. කැලැන්ඩරයේ සමහර කාල සීමාවන් (මාස) දැනටමත් හිස්ව තිබේ නම්, එනම් B, P, T හෝ උපත් පාලන කේතයක් සටහන් වී නොමැති නම් ඇය භාවිතා කල උපත් පාලන ක්‍රම පිළිබඳව පැහැදිලි අවබෝධයක් ලබා ගත නොහැක. (නිවුන් දරුවන් එක් උපතක් ලෙස සලකන්න)

මේ සදහා ඔබට තවත් තොරතුරු දැන ගැනීමට අවශ්‍ය වේ. පහත ලෙස විමසා කැලැන්ඩරය සටහන් කිරීම සම්පූර්ණ කරන්න. ප්‍රතිචාරක දැනට ගැබ් ගෙන සිටීද නැද්ද යන්න මත හා ඇයට සිටින දරුවන් ගණන සුදුසු පරිදි විමසන්න.

1) ප්‍රතිචාරක උපත් පාලන ක්‍රමයක් (දක්වන ලද කාලය) තුල භාවිතා කලේ දැයි අසා එසේ නම් ඇය භාවිතා කල දේ කුමක්ද?
2) එම ක්‍රමය භාවිතා කිරීමට පටන් ගත්තේ කවදාද?
3) එම ක්‍රමය නොනවත්වා කිරීමට පටන් ගත්තේ කුමන කාලයක සිටද සහ එම ක්‍රමය නැවැත්වූයේ කවදාද?
4) එම ක්‍රමය නැවැත්වූ පසු වූයේ කුමක්ද? ඇය මෙම ක්‍රමය අනුගමනය කලේ නැද්ද? ඇය වෙනත් ක්‍රමයක් භාවිතා කිරීමට පටන් ගත්තාද හෝ ඇය ගැබ් ගත්තාද?

(විවාහවූ දිනයේ සිට භාවිතා කළාද, විවාහ වූ දිනයත් පළමු ගැබ් ගැනීමත් අතරදී භාවිතා කළාද, නැවැත්වූයේ කවදාද, පළමු දරුවාත් දෙවන ගැබ් ගැනීමත් අතර භාවිතා කළාද, දෙවන දරුවා බිහිවීමෙන් පසු භාවිතා කළාද, ඊට පසු නැවැත්වූයේ කවදාද, දැන් භාවිතා නොකරයිද, දැන් ගැබ් ගෙන නම් ඊට පෙර දරුවාත් දැන් ගැබ් ගැනීමත් අතර භාවිතා කළාද ආදී ලෙස සුදුසු පරිදි විමසන්න.)

උදා :

ප්‍රතිචාරකට සමන් සහ මාලා ලෙස දරුවන් දෙදෙනෙක් සිටියි යැයි සිතන්න. ඇගේ එම දරුවන් අතර (එනම් සමන් සහ මාලා අතර ) ඇය භාවිතා කල උපත් පාලනය පිළිබද අවබෝධය ලබා ගැනීම සදහා විමසන්න. සමන් ඇගේ වැඩිමහල් දරුවා ලෙස සිතන්න.

සමන් ඉපදුනාට පසු සහ මාලා ඉපදෙන්නට පෙර උපත් පාලනය කිරීම සදහා ඔබ යම්කිසි ක්‍රමයක් අනුගමනය කරාද?

ඇය "ඔව් රබර් කොපු" ලෙස පැවසුවේ යැයි සිතන්න.

අනතුරුව

ඔබ උපත් පාලනය කිරීමට පටන් ගත්තේ සමන් ඉපදුනාට කොපමණ කාලයකට පසුද? ලෙස අසන්න.

ඇය සමන් ඉපදී මාස තුනකට පසු උපත් පාලනය කිරීම ඇරඹුවේ යයි සිතන්න. මේ මගින් ඔබට ඇය උපත් පාලනය ආරම්භ කල මාසය සිතා ගත හැක.

ඇය භාවිතා කල උපත් පාලන ක්‍රමය (උදා : කොන්ඩම්) නොකඩවා කොපමන කල් භාවිතා කලාද යන්න දැන ගැනීමට ඔබට අවශ්‍ය වේ. මේ සදහා ඇය එම උපත් පාලන ක්‍රමය භාවිතය නැවැත්වූ දිනය දැන ගත යුතුය. ඇය භාවිතා කල උපත් පාලන ක්‍රමය "රබර් කොපු "නිසා

ඔබ කොපමන කාලයක් උපත් පාලන ක්‍රමය ලෙස රබර් කොපු භාවිතා කලාද? ලෙස විමසන්න. "ඇය මාස 10 ක් ලෙස පැවසුවේ" යැයි සිතන්න.

දැන් ඔබට ඇය උපත් පාලන ආරම්භ කල දිනයත් අවසන් කල දිනයත් ගැන පැහැදිලි අවබෝධයක් ඇත.

ඇය උපත් පාලන අවසන් කිරීමෙන් මාස ගණනකට පසු ගැබ් ගත්තේ නම් එම මාස ගණන තුල ඇය භාවිතා කලේ මොනවාද යන්න විමසා දැන ගත යුතුය. ඇය භාවිතා කල උපත් පාලන ක්‍රමය කොන්ඩම් (රබර් කොපු) නිසා

ඔබ උපත් පාලන සඳහා කොන්ඩම් භාවිතය නැවැත්වූ පසු මාලා වෙනුවෙන් ගැබ්ගැනීමට පෙර උපත් පාලන සඳහා වෙනත් ක්‍රමයක් භාවිතා කලාද? ලෙස විමසන්න.

"ඇය කිසිවක් භාවිතා කලේ නැත" ලෙස පැවසුවේ යැයි සිතන්න.

දැන් ඔබට සමන් සහ මාලා වෙනුවෙන් ගැබ් ගැනීම අතර ඇය භාවිතා කල උපත් පාලන ක්‍රම පිළිබඳ සම්පූර්ණ අදහසක් ඇත.

එනම්

1) ඇගේ දරු දෙදෙනා අතර කාලය තුල භාවිතා කල උපත් පාලන ක්‍රමයක් භාවිතා කලාද සහ එම ක්‍රමය කුමක්ද යන්නත්,
2) සමන්ගේ ඉපදීමෙන් පසු ඇය උපත් පාලන ක්‍රම ආරම්භ කල දිනයත්,
3) එම ක්‍රමය නොකඩවා කොපමන කල් භාවිතා කලාද සහ එම ක්‍රමය භාවිතය නැවැත්වූයේ කවදාද යන්නත්
4) එම උපත් පාලන ක්‍රමය නැවැත්වූ පසු මාලා වෙනුවෙන් ගැබ් ගැනීමට පෙර වෙනත් යම් කිසි ක්‍රමයක් භාවිතා කලාද යන්නත් ඔබට අවබෝධයක් ලැබේ.

දරු උපත්, ගැබ් ගැනීම්, දරු උපතක් නොවුන ගැබ් ගැනීම්, උපත් පාලන ක්‍රම භාවිතය සහ උපත් පාලන ක්‍රම භාවිතය නැවැත් වීම් වලට අදාල කාල සීමාවන් විමසමින් හිස්ව ඇති සැම මාසයක් සඳහාම 2001 වර්ෂය දක්වා කැලැන්ඩරයේ තීරු 1 සම්පූර්ණ කිරීමට මතක තබා ගන්න.

ප්‍රතිවාරක උපත් පාලන ක්‍රම භාවිතා කල සැම මාසයක් සඳහාම අදාල ක්‍රමයේ කේතය සටහන් කරන්න. උපත් පාලන ක්‍රම භාවිතා නොකල සැම මාසයකටම '0' සටහන් කරන්න. උපත් පාලන ක්‍රම භාවිතා කල සහ නොකල මාස සඳහා අදාල කේත සටහන් කල පසු කැලැන්ඩරයේ තීරු අංක 1 හි සැම පේළියක්ම සම්පූර්ණ වී තිබිය යුතුය. <u>කැලැන්ඩරයේ සැම මාසයක් සඳහාම වර්ෂ 2001 ට පසු සිදු වූ උපත්, දැනට (වර්තමාන) ඇති ගැබ්ගැනීම්, උපතක් නොවී අවසන් වූ ගැබ්ගැනීම්, භාවිතා කරන ලද උපත් පාලන ක්‍රම සහ උපත් පාලන ක්‍රම භාවිතා නොකරන ලද නම් එම කාල සීමාවන් සටහන් වී කැලැන්ඩරය සම්පූර්ණ වී තිබේදැයි නැවත බලන්න.</u>

ප්‍රශ්න අංක 323 පිල්ටර් (දැනට වර්තමානයේ භාවිතා කරන ක්‍රමය වෙන් කර ගැනීම)

නැවත ප්‍රශ්න අංක 311/311A බලන්න. ඒ අනුව මෙහිදී දැනට භාවිතා කරන ක්‍රමයට අදාල කේතය කව කරන්න. ප්‍රශ්න අංක 311/311A හි කේත අංක 1 ට වඩා කව වී ඇත්නම් ලැයිස්තුවේ ඉහලින්ම ඇති ක්‍රමයට අදාල කේතය මෙහි කව කරන්න. අදාල කේත වල දක්වා ඇති යොමුවීම් අනුගමනය කරන්න.

මෙහිදී '00' කේතය කව වන්නේ 311/311A ප්‍රශ්නයට යොමු නොවූ කාන්තාවන්ටය. එනම් දැනට වැන්දඹු/දික්කසාද/වෙන්ව වාසය කරන (ප්‍රශ්න අංක 307B) හෝ සමීක්ෂණ දිනයේදී ගැබ් ගෙන ඇති (ප්‍රශ්න අංක 309) හෝ වර්තමානයේ උපත් පාලන ක්‍රම භාවිතා නොකරන (ප්‍රශ්න අංක 310) අය වේ.

**ප්‍රශ්න අංක 324/325 අතුරු ආබාධ පිළිබඳ දැනුවත් වීම**

ප්‍රශ්න අංක 324 - 327 දක්වා ප්‍රශ්න වලදී දැනට භාවිතා කරන උපත් පාලන ක්‍රමය නිසා ඇතිවන අතුරු ආබාධ ගැන දැනුවත් කිරීමක් කර ඇතිදැයි සොයා බලයි.

**ප්‍රශ්න අංක 324**

මෙහිදී ප්‍රතිචාරක දැනට භාවිතා කරන ක්‍රමය ඇය සඳහන් කල ස්ථානයෙන් ලබා ගනිද්දී, ක්‍රමය භාවිතයේදී මතු විය හැකි ගැටළු පිළිබඳව ඇය දැනුවත් කර තිබේ දැයි අසා දැන ගත යුතුය. මෙහිදී ඇය එක් ක්‍රමයකට වඩා භාවිතා කල කාන්තාවක් නම්, ඇය දැනට (වර්තමානයේ) නොකඩවා භාවිතා කරන ක්‍රමය පටන් ගනිද්දී එය ලබා ගත් ස්ථානයෙන් <u>අතුරු ආබාධ සම්බන්ධයෙන් ඇයව දැනුවත් කලා</u> දැයි දැනගැනීමට අවශ්‍ය බව ප්‍රතිචාරකට පැහැදිලිව පැවසිය යුතුය. ඔව් නම් ප්‍රශ්න අංක 326 ට යන්න.

**ප්‍රශ්න අංක 325**

මෙම ප්‍රශ්නය ඇසිය යුත්තේ ප්‍රශ්න අංක 324 සඳහා "නැත"ලෙස පැවසූ කාන්තාවගෙනි. එනම් ඇය දැනට භාවිතා කරන ක්‍රමය ලබා ගනිද්දී ඇතිවිය හැකි අතුරු ආබාධ සම්බන්ධයෙන් දැනුවත් කළේ නැති බව පැවසුවහොත්, ප්‍රශ්න අංක 325 දි, දැනට (වර්තමානයේ) භාවිතා කරන උපත් පාලන ක්‍රමය භාවිතයේදී ඇතිවිය හැකි අතුරු ආබාධ පිළිබඳව **<u>සෞඛ්‍ය හෝ පවුල් සැලසුම් නිලධාරියෙකු</u>** මගින් කවදා හෝ ඇය දැනුවත් වී ඇත්දැයි තව දුරටත් විමසයි. දැනට භාවිතා කරන ක්‍රමය භාවිතා කරන අතරතුරදී හෝ ඊට පෙර කාලයකදී, සෞඛ්‍ය හෝ පවුල් සැලසුම් නිලධාරියෙකු විසින් එම ක්‍රමය භාවිතයේදී ඕනෑම අවස්ථාවක ක්‍රමය නිසා ඇතිවිය හැකි අතුරු ආබාධ ගැන ප්‍රතිචාරකට පැවසුවේදැයි අසන්න. ඇයගේ යහළුවෙකු හෝ නෑදෑයෙකු එම ක්‍රමය භාවිතයේදී ඇති වියහැකි අතරු ආබාධ ගැන ඇයට පවසා ඇත යන ලෙස ඇය සඳහන් කළොත් ප්‍රශ්න අංක 325 ට අදාළ කේතය වන්නේ 'නැත' ලෙසයි. නැත කව කලේ නම් ප්‍රශ්න අංක 327 ට යන්න.

**ප්‍රශ්න අංක 326 අතුරු ආබාධ ඇති වුවහොත් කළ යුතු දේ**

දැනට (වර්තමානයේ) භාවිතා කරන ක්‍රමයේදී ඇතිවිය හැකි අතුරු ආබාධ හෝ ගැටළු පිළිබඳ ව දැනුවත් වී ඇති කාන්තාවගෙන් මෙම ප්‍රශ්නය සඳහා තොරතුරු ලබා ගත යුතුය. දැනට භාවිතා කරන ක්‍රමයේදී අතුරු ආබාධ හෝ ගැටළු ඇති වුවහොත් <u>කුමක් කල යුතු දැයි</u> කවදා හෝ ඇය දැනුවත් වී තිබේ දැයි විමසන්න.

**ප්‍රශ්න අංක 327/328 දැනට භාවිතා කරන ක්‍රමය ලබා ගනිද්දී භාවිතා කල හැකි වෙනත් ක්‍රම ගැන දැනුවත් වීම**

දැනට භාවිතා කරන ක්‍රමය ලබා ගනිද්දී අතුරු ආබාධ ගැන දැනුවත් කර ඇති කාන්තාවන්ගෙන් මෙන්ම අතුරු ආබාධ ගැන දැනුවත් කර නැති කාන්තාවන්ගෙන් මෙම ප්‍රශ්න ඇසිය යුතුය.

### ප්‍රශ්න අංක 327

මෙහිදී නැවත ප්‍රශ්න අංක 324 බලන්න. එහිදී කේත අංක 1 කව වී ඇත්නම් වම් පැත්තේ ඇති කොටුවේ "✓" ලකුණ දමා අදාල ප්‍රශ්නය විමසන්න. දැනට භාවිතා කරන ක්‍රමය ලබා ගන්නා අවස්ථාවේ භාවිතා කල හැකි වෙනත් ක්‍රම හෝ පවුල් සැලසුම් පිලිබඳව දැනුවත් කර ඇත්දැයි විමසා අදාල කේතය කව කරන්න.

ප්‍රශ්න අංක 324 දී කේත අංක 1 කව වී නැත්නම් දකුණු පැත්තේ ඇති කොටුවේ "✓ " ලකුණ දමා දැනට භාවිතා කරන ක්‍රමය ලබා ගනිද්දී වෙනත් ක්‍රම සහ පවුල් සැලසුම් පිලිබඳව ඇයව දැනුවත් කර ඇතිදැයි විමසන්න. දැනුවත් කර ඇත්නම් කේත අංක 1 කව කර ප්‍රශ්න අංක 329 ට යන්න.

උදා: දැනට (වර්තමානයේ) උපත් පාලන ක්‍රමයක් ලෙස පෙති භාවිතා කිරීමට පටන් ගන්නා අවස්ථා වේදී උපත් පාලන පෙති මෙන්ම, එන්නත් සහ IUD පිලිබඳව ඇයව දැනුවත් කර ඇත්නම් කේත අංක 1 කව කරන්න.

ප්‍රශ්න අංක 323 දී කේත අංක 8, 9 කව වූ කාන්තාවන් මේ සඳහා යොමුවන බැවින් ඔවුන් ප්‍රශ්න අංක 24 ට යොමු නොවීම නිසා ඔවුන් සඳහාද දකුණු පැත්තේ ඇති කොටුවේ "✓ " දමා අදාල ප්‍රශ්නය අසන්න.

### ප්‍රශ්න අංක 328

ප්‍රශ්න අංක 327 සමග මෙය සම්බන්ධ වේ. එනම් දැනට (වර්තමානයේ) භාවිතා කරන ක්‍රමය ලබා ගන්නා විට එම ක්‍රමය හැර භාවිතා කල හැකි වෙනත් ක්‍රම ගැන දැනුවත් නොවූ කාන්තාවන්ගෙන් ඇසිය යුතුය. භාවිතා කල හැකි වෙනත් පවුල් සැලසුම් ක්‍රම ගැන, **සෞඛ්‍ය හෝ පවුල් සැලසුම් නිලධාරියෙකු** විසින් කවදා හෝ ප්‍රතිචාරකව දැනුවත්කර ඇත්දැයි විමසා සටහන් කර ගන්න. ප්‍රශ්න අංක 329 ට යන්න.

### ප්‍රශ්න අංක 329 ෆිල්ටර් (භාවිතා කරන උපත් පාලන ක්‍රමය අනුව වෙන් කිරීම)

ප්‍රශ්න අංක 311/311(A) වෙතට නැවත අවධානය යොමු කරන්න. දැනට භාවිතා කරන ක්‍රමයට අදාල කේතය කව කරන්න. ක්‍රම කීපයක් සඳහන් කර ඇත්නම් ලැයිස්තුවේ ඉහලින්ම ඇති ක්‍රමය යොමු වීම අනුගමනය කරන්න. මෙහිදී කේත අංක 01, 02, 09, 10, 11, 96 කව කල සියල්ලන්ම (දැනට උපත් පාලන ක්‍රම භාවිතා කරන කාන්තාවන්) ප්‍රශ්න අංක 333 වෙත යොමු කරන්න. අනිකුත් අය 330 ට යොමු කරන්න.

### ප්‍රශ්න අංක 330 දැනට භාවිතා කරන ක්‍රමය අන්තිම වර ලබා ගත් ස්ථානය

ප්‍රතිචාරක දැනට භාවිතා කරන ක්‍රමය අවසන් වරට ඇය භාවිතා කරන විට, ලබා ගත් ස්ථානය ඇයගෙන් විමසා සටහන් කල යුතුය. ඇය සඳහන් කරන ස්ථානය රජයේ හෝ පෞද්ගලික ලෙස වෙන් කර සටහන් කරන්න. සමහර අවස්ථාවල ප්‍රතිචාරක සඳහන් කරන ස්ථානය රජයේ හෝ පෞද්ගලික ලෙස නිශ්චිතව තීරණය කර ගැනීමට නොහැකි වේ. එවැනි අවස්ථා වලදී ඇති ඉඩ ප්‍රමාණයේ ක්‍රමය ලබාගත් ස්ථානයේ නම ලියන්න. අනතුරුව ප්‍රශ්න අංක 333 වෙත යොමු කරන්න.

**ප්‍රශ්න අංක 331** **දැනට උපත් පාලන ක්‍රම භාවිතා නොකරන අය උපත් පාලන ක්‍රම ලබා ගත හැකි ස්ථාන පිළිබඳව දැනුවත් වීම.**

මෙම ප්‍රශ්නය වෙත යොමු වන්නේ ප්‍රශ්න අංක 323 හි කේත අංක '00' කට වූ කාන්තාවන් සහ කවදා හෝ උපත් පාලන ක්‍රම භාවිතා නොකල (ප්‍රශ්න අංක 304) කාන්තාවන්ය. අවශ්‍ය වුවහොත් උපත් පාලන ක්‍රමයක් ලබා ගත හැකි ස්ථානයක් ඔවුන් දැන සිටිනවාද යන්න අවබෝධ කර ගැනීම මෙම ප්‍රශ්නයේ අරමුණයි. නැත නම් ප්‍රශ්න අංක 333 ට යොමුවන්න.

**ප්‍රශ්න අංක 332** **පවුල් සැලසුම් ක්‍රමයක් ලබා ගත හැකි ස්ථානය**

ප්‍රශ්න අංක 331 දී අවශ්‍ය වුවහොත් පවුල් සැලසුම් ක්‍රමයක් ලබා ගත හැකි ස්ථානයක් දන්නා කාන්තාවන්ගෙන් එම ස්ථානය හෝ ස්ථාන මොනවාද යන්න අසා දැන ගත යුතුය. ක්‍රමයක් ලබා ගත හැකි බොහෝ ස්ථාන කාන්තාව දැන සිටිනවාදැයි අවබෝධ කර ගැනීම ඉතා වැදගත් වේ. ඇය එක් ස්ථානයක් සදහන් කල පසු තවත් දන්නා ස්ථාන තිබේ දැයි විමසා ඇය සදහන් කරන සියල්ලටම අදාල කේත කව කරන්න. ප්‍රතිචාරක සදහන් කරන ස්ථානය රජයේ හෝ පෞද්ගලික ලෙස වෙන් වශයෙන් දැක්විය යුතු අතර නිශ්චිතව වෙන් කළ නොහැකි නම් වෙනත් යටතේ සදහන් කළ ස්ථානය සටහන් කරන්න.

**ප්‍රශ්න අංක 333** **සෞඛ්‍ය හෝ පවුල් සැලසුම් නිලධාරියෙක් හමුවීම**

මෙහිදී පසුගිය මාස 12 තුල <u>සෞඛ්‍ය හෝ පවුල් සැලසුම් නිලධාරියෙක්</u> (පවුල් සැලසුම් ගැන කථා කල වෙනත් පුද්ගලයෙක් නොවේ) කාන්තාව හමු වී පවුල් සැලසුම් පිළිබඳව ඇයව දැනුවත් කර ඇත්දැයි අසා දැන ගන්න. එම නිලධාරියා ප්‍රතිචාරක හමුවුයේ පවුල් සැලසුම් ක්‍රම ගැන ඇයව දැනුවත් කිරීමට නොවනු ඇත. නමුත් එම නිලධාරියා පසු ගිය මාස 12 තුල අවස්ථාවකදී ප්‍රතිචාරක හමු වූ විට පවුල් සැලසුම් ක්‍රම ගැනද ඇ සමග කථා කර ඇත්නම් පමණක් කේත අංක 1 කව කරන්න.

| |
|---|
| **ප්‍රශ්න අංක 328 සමඟ ගැලපීම -** මෙහිදී නිවසට පැමිණ සෞඛ්‍ය හෝ පවුල් සැලසුම් නිලධාරියෙකු පවුල් සැලසුම් ගැන ඇය දැනුවත් කර ඇත්නම් (කේත අංක 01 කව වූ) නැවත ප්‍රශ්න අංක 328 පරීක්ෂා කර තවදුරටත් විමසා නිවැරදි කිරීම් ඇත්නම් නිවැරදි කරන්න. |

- ප්‍රශ්න අංක 310B හිදී කේත අංක 8 කව කළ කාන්තාවන්ගේ මාස් ශුද්ධිය නැවතී හෝ දරුගැබක් හට ගැනීමට බාධාවන් ඇතිවී ඇත්තේ පසුගිය මාස 12 කට පෙර නම් මෙහිදී ප්‍රශ්නය නොවිමසා, "නැත - 2" කව කරන්න.
- A කොටසේ ප්‍රශ්න අංක 9 අනුව දැනට වැන්දඹු/දික්කසාද/වෙන්ව වාසය කරන ලෙස හඳුනා ගත් කාන්තාවන් එම තත්වයට පත්ව ඇත්තේ පසුගිය මාස 12 ට පෙරදැයි විමසා එසේ නම් ප්‍රශ්නය නොවිමසා "නැත - 2" කව කරන්න.

**ප්‍රශ්න අංක 334 සෞඛ්‍ය සේවා ආයතන වෙත යෑම**

පසුගිය මාස 12 ඇතුලත ඇය කුමන හෝ සෞඛ්‍ය උපදෙස් ලබා ගැනීම සඳහා සෞඛ්‍ය සේවා ආයතනයකට ගොස් තිබේ දැයි පරීක්ෂා කිරීම මෙහි අරමුණයි. සෞඛ්‍ය ආයතනයකට ගියේ උපත් පාලනය සඳහා උපදෙස් ලබා ගැනීම සඳහාදැයි විමසීම මෙහි අරමුණ නොවේ. පසුගිය මාස 12 ඇතුලත ඇයගේ හෝ ඇගේ දරුවකුගේ කුමන හෝ සෞඛ්‍යමය ගැටළුවකදී සෞඛ්‍ය ආයතනයකට ගොස් තිබේ දැයි විමසන්න. නැත නම් 2 කව කර ප්‍රශ්න අංක 336A ට යොමු වන්න.

**ප්‍රශ්න අංක 335 උපත් පාලන පිළිබඳ උපදෙස් ලැබුනාද?**

මෙහි දී ඇය සෞඛ්‍ය ආයතනයකට ගියේ පවුල් සැලසුම් පිළිබඳ කථා කිරීමේ අරමුණින්ම නොවිය හැක. නමුත් එවැනි අවස්ථාවකදී සෞඛ්‍ය ආයතනයකට ගිය විට එහි කාර්‍ය මණ්ඩලය පවුල් සැලසුම් පිළිබඳ කතා කලා දැයි විමසා අදාල කේතය කව කරන්න.

- ප්‍රශ්න අංක 310B හිදී කේත අංක 8 කව කළ කාන්තාවන්ගේ මාස් ශුද්ධිය නැවතී ඇත්තේ හෝ දරුගැබක් හට ගැනීමට බාධාවන් ඇතිවී ඇත්තේ පසුගිය මාස 12 ට පෙර නම් මෙහිදී නොවිමසා, "නැත - 2" කව කරන්න. (ප්‍රශ්න අංක 333 මෙනි)
- A කොටසේ ප්‍රශ්න අංක 9 අනුව දැනට වැන්දඹු/දික්කසාද/වෙන්ව වාසය කරන ලෙස හඳුනා ගත් කාන්තාවන් එම තත්වයට පත්ව ඇත්තේ පසුගිය මාස 12 ට පෙරදැයි විමසා එසේ නම් ප්‍රශ්නය නොවිමසා "නැත - 2" කව කරන්න. (ප්‍රශ්න අංක 333 මෙනි)

| |
|---|
| **ප්‍රශ්න අංක 328 සමඟ ගැලපීම** - ප්‍රශ්න අංක 334 දී ඇයට දැනුවත් කර පුද්ගලයා කවුදැයි නොවිමසයි. නමුත් ඇයට එහිදී දැනුවත් කලේ පවුල් සැලසුම් නිලධාරියෙකු යැයි ඇය පැවසුවහොත් ඉන් පෙනී යන්නේ කවදා හෝ පවුල් සැලසුම් නිලධාරියෙකු පවුල් සැලසුම් පිළිබඳ ඇය දැනුවත් කර ඇති බවයි. ඒ අනුව ප්‍රශ්න අංක 328 නැවත පරීක්ෂා කර තවදුරටත් විමසා නිවැරදි කිරීම් කරන්න. |

**ප්‍රශ්න අංක 336A වැලකී සිටීම**

මෙම ප්‍රශ්නය සියළුම කාන්තාවන්ගෙන් විමසන්න. එනම් ඇය කවදා හෝ තම විවාහ ජීවිතයේදී මාසයක් හෝ දෙකක් හෝ ඊට වඩා දිගු කාලයක් අඹු සැමි සම්බන්ධතාවයෙන් වැලකී සිටියා දැයි අසන්න. දරු උපතකට පසු හෝ ගැබ් ගත් විට අඹු-සැමි සබඳතා වලින් මසකට දෙකකට හෝ වැලකී සිටියා නම් එයද මේ සඳහා අදාළ වේ. "ඔව් " යැයි පිළිතුරු දුන්නේ නම් '1' කව කර ප්‍රශ්න අංක 336B ට යොමුවන්න. නැත යැයි පිළිතුර දුන්නේ නම් කේත අංක 2 කව කර ප්‍රශ්න අංක 401 ට යොමු වන්න.

**ප්‍රශ්න අංක 336B අඹු සැමි සම්බන්ධතාවලින් වැලකී සිටීමට හේතුව**

ප්‍රශ්න අංක 336A හිදී ඇය දිගු කාලයක් අඹු සැමි සම්බන්ධතාවයේ වැලකී සිටියා යැයි පැවසුවේ නම්, ඊට හේතුව විමසන්න. හේතුවට අදාල කේතය කව කරන්න. දක්වා ඇති කේත වලින් බැහැර වෙනත් හේතුවක් සඳහන් කරයි නම් කේත අංක '7' යටතේ හේතුව තිත් ඉරි මත ලියන්න. අදාල කාලය කැලැන්ඩරයේ ලකුණු වී ඇතිදැයි පරීක්ෂා කර බලන්න.

## 6.4 කොටස

### හතරවන කොටස - පෙර හා පසු ප්‍රසව පරීක්ෂාව

මෙම කොටසෙහි අසන ප්‍රශ්නවල අරමුණ වන්නේ ප්‍රතිචාරක දරුවන් බිහි කළා නම් පූර්ව ප්‍රසව පරීක්ෂා කිරීම් පිළිබඳ තොරතුරු, දරු ප්‍රසූතිය පිළිබඳ තොරතුරු, ප්‍රසූතියෙන් පසු තොරතුරු ආදිය දැන ගැනීමයි. මෙම කොටසට අදාල වන්නේ 2001 ජනවාරි හෝ ඊට පසුව උපතක් සිදුකල කාන්තාවන් පමණි. කාන්තාව අදාල කාලය තුළ උපතක් සිදුකර නැත්නම් 401 ට අදාල කොටුවේ '✓' ලකුණ යොදා ප්‍රශ්න අංක 549 ට යන්න.

ප්‍රශ්න අංක 402 - 404

ප්‍රශ්න අංක 403 දී 2001 ජනවාරි හෝ ඊට පසුව ඉපදුනු සියලුම දරුවන්ගේ 2 කොටසෙහි සඳහන් පේළි අංකය හා නම් පිළිවෙලින් ඇතුලත් කරන්න. අවසාන උපතෙන් පටන්ගෙන උපත් 3 ක් සඳහා තොරතුරු සඳහන් කිරීමට ඉඩ ඇත. දරුවා ජීවත්වේද නැද්ද යන්න 404 හි අදාල කොටුවේ '✓' ලකුණින් සඳහන් කරන්න.

**විශේෂ අවස්ථාවක්**
**නිවුන් දරුවන් ජීවත්ව සිටී නම් එම උපත් සඳහා පත්‍රිකා අංක 3 යොදා ගන්න. එක් නිවුන් දරුවකු මිය ගියා නම් ඉතිරි දරුවා සඳහාද පත්‍රිකා අංක 3 යොදා ගන්න. එම පත්‍රිකාවේ අග පිටුවේ ඇති හඳුනා ගැනීමේ තොරතුරු කොටසද සම්පූර්ණ කර පත්‍රිකාව අදාල උපලේඛණයේ 4 කොටසට අමුණන්න.**

**මෙම කොටස සම්පූර්ණ කිරීමේදී බාලම දරුවාට අදාල සියලු තොරතුරු අන්තිම ප්‍රශ්නය දක්වා ඇසීමෙන් අනතුරුව ඊළඟ දරුවාට අදාල ප්‍රශ්නවලට යන්න. අන්තිම උපත හැර අනිත් උපත් සඳහා අසනු ලබන්නේ ප්‍රශ්න අඩු ප්‍රමාණයකි. මග හැරයාමේ උපදෙස් අනුව සියලු උපත් සඳහා තොරතුරු ලබා ගැනීමෙන් අනතුරුව පමණක් ඊළඟ කොටසට යන්න.**

ප්‍රශ්න අංක 405 **දරුවෙක් ලබා ගැනීමේ උවමනාව**

ප්‍රශ්නයෙන් ඇසීමට අවශ්‍යවන කරුණ ප්‍රතිචාරකට ඇසෙන සේ කියවා දරුවෙකු ලබා ගැනීමේ උවමනාව තිබුණේ කුමන ආකාරයෙන්ද යන්න ඇය ප්‍රකාශ කරන පිළිතුර අනුව කේත කරන්න. ප්‍රමාදවී යයි පිළිතුරු දුන් අය 406 ටත් අනිකුත් අය 407 ටත් යන්න.

ප්‍රශ්න අංක 406 **පමා කිරීමට කැමති වූ කාලය**

ගැබ් ගැනීම ප්‍රමාද කිරීමට කැමතිව සිටි කාලය ඇය පවසන අවුරුදු හෝ මාස ගණන අනුව කොටු තුල යොදන්න.

**ප්‍රශ්න අංක 407 පූර්ව ප්‍රසව පරීක්ෂාව**

අවසන් උපතේ පූර්ව ප්‍රසව පරීක්ෂාව සඳහා ඇය ගිය සියළු ස්ථාන හා මුණ ගැසුණු සියළුම පුද්ගලයින්ට අදාල කේත අදාල කොටු තුල සඳහන් කළ යුතුයි. අදාල ස්ථාන රජයට සම්බන්ධද නැතහොත් පෞද්ගලික අංශයට සම්බන්ධද යන්න විමසා අදාල කේත ලියන්න. එක් එක් ස්ථානයට ගිය වාර ගණනද සඳහන් කරන්න. මුණ ගැසුණු සෞඛ්‍ය නිලධාරීන්ට අදාල කේතද සඳහන් කරන්න. වාර ගණන මතක නැත්නම් 99 කොටුතුල සඳහන් කරන්න. මෙහිදී ස්ථාන කීපයකදීම සාමාන්‍ය බටහිර වෛද්‍යවරයා හෝ වෙනත් නිලධාරියෙක් මුණ ගැසුනේ වුවත් එම කේතය සඳහන් කළ යුත්තේ එක් වරක් පමණි.

**ප්‍රශ්න අංක 408 ප්‍රථම පූර්ව ප්‍රසව පරීක්ෂාවේදී සම්පූර්ණ වූ සති ගණන කීයද ?**

ප්‍රථම පූර්ව ප්‍රසව පරීක්ෂාවේදී අදාල උපතට සම්පූර්ණ වූ සති ගණන කොටු තුළ ලියන්න. මෙය ගර්භනී සටහන් පතෙහිද ඇත. නොදනී නම් 98 කව කරන්න.

**ප්‍රශ්න අංක 410 ගර්භනී සටහන තිබේද ?**

ගර්භනී සටහන තිබෙන බව විමසා දුටුවා නම් හෝ දුටුවේ නැත්නම් හෝ නැති නම් අදාල කේතය කව කර ප්‍රශ්න අංක 411 ට යන්න.

**ප්‍රශ්න අංක 411 ගර්භනී පරීක්ෂාව**

ගර්භනී සටහන් පත ඇත්නම් ඒ අනුව ප්‍රශ්න අංක411 න් අසා ඇති පරීක්ෂණ පිළිබඳ අදාල කේතය කව කරන්න. කාඩ්පත නැති නම් ප්‍රතිචාරකගේ මතකයෙන් අදාල පිළිතුරු ලබා ගැනීමට උත්සාහ කරන්න. නොදනී නම් 9 කේතය කව කරන්න.

**ප්‍රශ්න අංක 412/413 ගර්භනී කාලය තුල ඇතිවන අපහසුතා ගැන දැනුවත්වීම**

ගර්භනී කාලය තුල ඇතිවන සමහර අපහසුතා ගැන හා යා යුතු ස්ථාන ගැන පූර්ව ප්‍රසව පරීක්ෂාවේදී ප්‍රතිචාරකව දැනුවත් කිරීමක් සිදු වුවාද යන්න විමසා අදාල කේතය කව කරන්න. 412 සඳහා නැත හෝ මතක නැත පිළිතුරු දුන් අය ප්‍රශ්න අංක 413A ට යා යුතුයි. ඔව් ලෙස සඳහන් අයව 413 ට ගෙන යන්න.

**ප්‍රශ්න අංක 413A/413B පවුල් සෞඛ්‍ය සේවිකාවගේ පැමිණීම**

ගර්භනී කාලය තුළ අදාල ප්‍රදේශයභාර පවුල් සෞඛ්‍ය සේවිකාව මෙම කාන්තාවගේ සෞඛ්‍ය තත්වය පිළිබඳ දැක්වූ උනන්දුව මෙම ප්‍රශ්න 2 මගින් විමසා බලනු ලැබේ. ඇය පැමිණුනා නම් 413A සඳහා 1 කව කර පැමිණුන මුළු වාර ගණන 413B හි සඳහන් කරන්න. කොටුවක් ඇද වාර ගණන කොටු දෙකෙහි සඳහන් කරන්න. පැමිණුනේ නැත නම් 413A හි 2 කව කර 414 ට යන්න.

**ප්‍රශ්න අංක 414 - 420 පිට ගැස්ම එන්නත**

පිටගැස්ම බොහෝ ළදරු මරණවලට හේතුවන රෝගයකි. දරුවා කුසෙහි සිටින කාලය තුල ප්‍රමාණවත් පිටගැස්ම එන්නත් ගණනක් මවට ලබාදීම මගින් දරුවා ආරක්ෂාවීමක් සිදුවේ. ගැබිණි වාරයක් තුල

පිටගැස්ම එන්නත් දෙකක් ලබා දුනහොත් දරුවා පිටගැස්මෙන් ආරක්ෂා වන බව පිලිගැනේ. එමෙන්ම මවගේ ජීවිත කාලය තුල පිටගැස්ම සඳහා එන්නත් 5 ක් ලබා ඇත්නම් හා ගැබ්ගෙන සිටින්නේ අවසාන එන්නත ලබා ගැනිමෙන් අවු. 10 ක් ඇතුලත නම්ද දරුවා පිටගැස්මෙන් ආරක්ෂිත බව පිළි ගනී.

ප්‍රශ්න අංක 414 හා 415 න් මෙම ගර්භනී කාලය තුල එම එන්නත ලබා දුන්නාද හා දුන් වාර ගණන පරීක්ෂා කෙරේ. ගර්භනී සටහන් පත ඇත්නම් එන්නත දුන් වාර ගණන සඳහන් කර ඇත. ප්‍රශ්න අංක 416 න් එන්නත දුන් වාර ගණන අනුව ප්‍රතිචාරක මගහැර යාමේ ප්‍රශ්නවලට යොමු කෙරේ. ගර්භනී කාලය තුල පිට ගැස්ම එන්නත් අඩු කරමින් දෙකක්වත් ලබාගෙන නොමැති නම් (එකක් හෝ නොදනී නම් ) ඇයගෙන් අමතර ප්‍රශ්න කීපයක් අසනු ලැබේ. ප්‍රශ්න අංක 417/417A /418 න් මීට කලින් (ගැබ් ගත් අවස්ථාවලදී හෝ ඊට කලින් කවදා හෝ) එන්නත් ලබාගත්තාද යන්න විමසන අතර එසේ ලබාගත්තා නම් අවසාන එන්නත් ලබා ගත් හේතුව හා එන්නත් ලබාගත් මුළු වාර ගණන විමසනු ලැබේ. එසේම අවසානයට ලබා ගත් අවුරුද්ද ප්‍රශ්න අංක 419 න් විමසනු ලැබේ. එම වර්ෂය මතක නැති බව පවසන්නේ නම් 419 හි 9998 කවකර ප්‍රශ්න අංක 420 න් මීට අවුරුදු කීයකට කලින් ලබා ගත්තේ දැයි ඇසිය යුතුය. වර්ෂය දන්නේ නම් 421 ට යොමු වන්න. මෙහි ඇති "↵" ලකුණ වර්ෂයට සම්බන්ධ විය යුතුයි.

**ප්‍රශ්න අංක 421/421A යකඩ අඩංගු විටමින් භාවිතය.**

ඇනිමියා රෝගය ගර්භනී කාලය තුල බොහෝ විට ඇතිවිය හැකි අතර යකඩ අඩංගු විටමින් භාවිතයෙන් බොහෝ දුරට එම රෝගයෙන් වැලකී සිටිය හැක. ප්‍රතිචාරක එම පෙති භාවිත කළ බව නොදන්නවා නම් ඔබ ළඟ ඇති එම වර්ගයේ පෙති පෙන්වා නැවත ඒවා සායන මගින් ලබා දුන්නාද එසේ නැතහොත් මිලදී ගත්තාදැයි ප්‍රශ්න කරන්න. මෙහිදී දැන ගත යුතු වන්නේ අදාල පෙති වර්ගය ගැබිනි කාලය තුල ඇය පාවිච්චි කළේද නොකළේද යන්න දැන ගැනීමයි. නැත හෝ නොදනී නම් 423 ට යන්න. එම පෙති පාවිච්චි කළා නම් ඒවා ලැබුන හෝ මිලදී ගත් ස්ථානය 421A ප්‍රශ්නය මගින් අසා අදාල කේත සියල්ල කව කරන්න.

421B මගින් ඇයගේ දැනුම පරීක්ෂා කිරීම පිණිස එම පෙති ඇයට ලබා දුන් හේතුව විමසනු ලැබේ. ඇය පවසන සියලුම හේතු වලට අදාල කේත කව කරන්න. වෙනත් හේතුවක් නම් X කව කර සඳහන් කරන්න.

**ප්‍රශ්න අංක 422/422A/422B යකඩ අඩංගු විටමින් භාවිතා නොකලේ ඇයි.**

ප්‍රතිචාරක සතුව යකඩ අඩංගු පෙති තිබුණ බව පැවසුවොත් මුළු ගැබිණි කාලය තුල **කෙදිනක හෝ** මෙම පෙති භාවිතා කළාද යන්න අසන්න. ඔව් යනුවෙන් පිළිතුරු දුනහොත් ඇයගෙන් 422A ප්‍රශ්නය ඇසිය යුතු අතර නැත කිවහොත් 422B වද මතක නැති කිවහොත් 423 වද යන්න.

422A ප්‍රශ්නයෙන් ඇය එම පෙති භාවිතා කළ බව පැවසුවහොත් එය ප්‍රයෝජනවත් වන අයුරින් කලාද යන්න දැන ගැනීමට බලාපොරොත්තුවේ. අදාල කේතය කව කර 423 ට යන්න.
යකඩ අඩංගු පෙති භාවිතා නොකලේ ඇයි යන්න 422B මගින් ප්‍රශ්න කෙරේ. බොහෝ කාන්තාවන් නොයෙක් හේතුමත මෙම පෙති භාවිතයට මැලිවෙන අවස්ථා ඇත. මෙහි දක්වා ඇති හේතුවලට අමතරව හේතුවක් කිවහොත් වෙනත් X කව කර සඳහන් කරන්න. ප්‍රතිචාරක පවසන සියළු කේත කව කරන්න.

**ප්‍රශ්න අංක 423 පණු බෙහෙත් භාවිතය**

ගැබිනි කාලය තුල ඇනිමියා රෝගය හට ගැනීමට තවත් හේතුවක් වී ඇත්තේ පණු රෝගයයි. එම නිසා එම කාලය තුල පණුවන් සඳහා බෙහෙත් ගත්තාද ? යන්න දැන ගැනීම අවශ්‍ය වී තිබේ. ගර්භනී සටහන් පත්වල මේ බව ලකුණු කර ඇත. අදාල කේතය කව කර 424 ට යන්න.

**ප්‍රශ්න අංක 424/425 දවල්/රාත්‍රී අන්ධතාවය**

ප්‍රතිචාරකට ගැබිනි කාලය තුල දවල් කාලයේ පෙනීමේ අපහසුතාවයක් තිබුණාද යන්න දැන ගැනීමේ අරමුණ වන්නේ VIT A ඌණතාවය නිසා බොහෝ කාන්තාවන් මෙම තත්වයට පත්වන බව සොයා ගෙන තිබීමයි. දවල් කාලයේ පෙනීමේ අපහසුතාව යනු ළඟ පෙනීමේ හෝ දුර පෙනීමේ අපහසුතා වැනි තත්වයක් නොව සාමාන්‍යයෙන් නිතර පවතින දෘශ්‍යාබාධයකි (බොඳවී පෙනීම වැනි). රාත්‍රී කාලයේ අන්ධතාවයෙන් යුතු පුද්ගලයාට මද අඳුරේ හෝ අඳුරේදී සාමාන්‍ය පුද්ගලයාට වඩා අපහසුතාවයෙන් යුතු තත්වයක් ඇත. ප්‍රශ්නය පැහැදිලිව අසා අදාල කේතය කව කර 426 ට යන්න.

**ප්‍රශ්න අංක 426/ ප්‍රශ්න අංක 427 මැලේරියා ඖෂධ ලබා ගත්තාද ? පාවිච්චි කළාද ?**

මැලේරියා රෝගය සමහර පළාත්වල මරණ සංඛ්‍යාව ඉහළ යාමට හේතුවක් වී ඇත. දැනට බොහෝ දුරට පාලනය කර තිබුණත් ශ්‍රී ලංකාවේද තවමත් සමහර පළාත් මෙම රෝගයට ගොදුරුවී තිබේ. මෙම නිසා එම පළාත්වල ගර්භනී කාන්තාවන්ට එම රෝගය නොසැදුනත් ගැබිනි කාලය තුල මැලේරියා ඖෂධ භාවිතයට සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් නිර්දේශ කර ඇත. මෙම නිර්දේශ කොතරම් දුරට කාන්තාවන් විසින් අනුගමනය කළාද යන්න මෙම ප්‍රශ්න ඇසීමෙන් අවබෝධ කර ගත හැක. කාන්තාවන්ගේ ගර්භනී සටහන් පතේද මෙය නිකුත් කළ බව ලකුණු කර ඇත. බෙහෙත් ලැබුනේ නම් 1 කව කර ප්‍රශ්න අංක 427 ටද නැත හෝ නොදනී නම් 434 ටද යන්න. ගර්භනී සටහන් පතේ බෙහෙත් නිකුත් කළ බවට ලකුණු කළත් ඇය ඒවා පාවිච්චි නොකළේ නම් ප්‍රශ්න අංක 427 සඳහා නැත යනුවෙන් කේත කරන්න. නැත හෝ නොදනී නම් 434 ට යන්න.

**ප්‍රශ්න අංක 428 එම බෙහෙත් පාවිච්චි කළා නම් නිර්දේශිත ආකාරයෙන් පාවිච්චි කළාද ?**

යන්න මෙයින් අසනු ලැබේ. පෙති 2 බැගින් සතියකට එක් වරක් පාවිච්චි කිරමට නිර්දේශ කර තිබේ. ඇය පාවිච්චි කළ ආකාරය විමසා අදාල කේතය කව කරන්න.

සටහන

**කාන්තාවට ගැබිණි කාලය තුල මැලේරියා රෝගය වැලදී ඒ සඳහා ප්‍රතිකාර ලබා ගත්තා නම් එය රෝගයෙන් වැලකීමට ගත් ඖෂධයක් ලෙස සැලකිය නොහැක.**

**ප්‍රශ්න අංක 434 සිට ප්‍රශ්න අංක 439 දක්වා 2001 ට පසු සියලු උපත් සඳහා අසන්න.**

**ප්‍රශ්න අංක 434 ප්‍රසූත කළ අවස්ථාවේ උදව් කළේ කවුද ?**

නැවතත් උපතට සම්බන්ධ දරුවාගේ නම මතක් කර ප්‍රසූත කරන අවස්ථාවේ උදව් කළ පුද්ගලයින් කවුදැයි විමසන්න. මෙය දරු ප්‍රසූතියේදී එයට සම්බන්ධ වූ පුද්ගලයින් මිස වෙනත් කටයුතු වලින් උදව් කළ පුද්ගලයින් නොවේ. කිහිපදෙනෙකු ගැන පැවසුවහොත් සියලු දෙනා සඳහා අදාල කේත කව කරන්න. දරු ප්‍රසූතිය රෝහලක හැර වෙනත් ස්ථානයක සිදුවූවා නම් කවුරුත් සිටියේ නැත යනුවෙන් පැවසිය හැක. එවිට නැවත විමසා වැඩිහිටි කාන්තාවක්වත් සිටියාද යන්න දැන ගන්න.

**ප්‍රශ්න අංක 435 ඔබට සැලකුවේ කෙසේද ?**

ප්‍රසූති අවස්ථාවේ එතැන සිටි කාර්ය මණ්ඩලය ගැන ඇයගේ ආකල්පය මෙයින් බලාපොරොත්තුවේ. ඇයගේ අදහස අනුව අදාල කේතය කව කරන්න.

**ප්‍රශ්න අංක 436 උපන්නේ කොහේද ?**

ප්‍රසූතිය සිදුවූයේ පහසුකම් සහිත ස්ථානයකද යන්න දැන ගැනීම මෙහි අරමුණයි. ස්ථානය රජයේද පුද්ගලික ස්ථානයක්ද වශයෙන් පැහැදිලිව අසා අදාල කේතය කව කරන්න. නිවසක සිදුවූවා නම් ප්‍රශ්න අංක 443 ට යා යුතු වේ. අනිකුත් ස්ථානයක උපන්නා නම් ඊළඟ ප්‍රශ්නයට යන්න. රෝහල් සඳහා දී ඇති ලැයිස්තුවෙන් අදාල රෝහලට දිය යුතු කේතය හඳුනාගෙන කව කරන්න.

**ප්‍රශ්න අංක 437 කොපමණ කාලයක් එහි රැඳී සිටියාද ?**

ප්‍රසූතිය සිදුවූ පසු සෞඛ්‍ය පහසුකම් සහිතව කොපමණ දින ගණනක් රැඳී සිටියාද යන්න මෙයින් දැන ගැනීමට බලාපොරොත්තු වේ. මෙහිදී **රෝහලට ඇතුලු වී ගත කල මුළු දින ගණන නොව <u>ප්‍රසූතියෙන් පසු</u> ගත කළ දින ගණන දැන ගැනීම වැදගත් වේ.**

පැය ගණනක් නම් (දවසකට වඩා අඩු නම්) 1 කව කර පැය ගණනද
දින ගණනක් නම් 2 කව කර දින ගණනද
සති ගණනක් නම් 3 කව කර සති ගණනද ලියන්න. මතක නැති බව පැවසුවහොත් 998 කව කරන්න. හැකි තරම් දුරට ප්‍රතිචාරකගෙන් සුදුසු පිළිතුරක් ලබා ගැනීමට උත්සාහ කරන්න. ප්‍රශ්න අංක 438 ට යන්න.

**ප්‍රශ්න අංක 438 බිහිවුණේ සිසේරියන් සැත්කමකින්ද ?**

සාමාන්‍ය දරු ප්‍රසූතිය සිදුවන ආකාරයට වඩා වෙනස් අයුරින් සැත්කමක් මගින් දරුවා බිහිවූයේද යන්න දැන ගැනීම මෙයින් අසනු ලැබේ. ඔව් නම් 1 කව කර ප්‍රශ්න අංක 442 ට යන්න

**ප්‍රශ්න අංක 439 - 446 ප්‍රසූතියෙන් පසු මවගේ පරීක්ෂාව**

දරු ප්‍රසූතියෙන් පසු මවගේ සෞඛ්‍ය තත්වය ගැන අවධානය යොමු කිරීම ඉතා වැදගත් වේ. මෙම ප්‍රශ්න වලදී ඒ පිළිබඳව විමසා බැලීමක් සිදු කෙරේ.

| |
|---|
| **ප්‍රශ්න අංක 439 සිට 446 දක්වා ප්‍රශ්න දරු උපතින් පසු මවගේ සෞඛ්‍ය තත්වය පරීක්ෂා කිරීම පිළිබඳ අසන ඒවා වේ.** |

**ප්‍රශ්න අංක 439 රෝහලේදී සෞඛ්‍ය තත්වය පරීක්ෂා කළාද ?**

දරු උපතින් පසු මුදා හැරීමට ප්‍රථම මවගේ සෞඛ්‍ය තත්වය බැලුවාද ? යන්න මෙම ප්‍රශ්නයෙන් අසනු ලැබේ. එසේ පරීක්ෂා කළා නම් 440 ටද නැති බව පැවසුවොත් 442 ටද යන්න.

**ප්‍රශ්න අංක 440 කොපමණ වේලාවකට පසුවද ?**

දරු උපතින් පසු ප්‍රථමයෙන්ම මව පරීක්ෂා කලේ කොපමණ වේලාවකට පසුවද යන්න සෞඛ්‍ය සේවාව පිළිබඳ කරුණු සලකා බැලීම පිණිස ලබා ගන්නා තොරතුරු වේ. මවගේ සෞඛ්‍ය තත්වය පිළිබඳ අවධානය යොමුවූවාද යන්න මෙයින් විමසා බැලේ. කාලය අනුව දී ඇති අදාල කේතය කව කර පැය හෝ දින ලියන්න. මතක නැතිනම් 998 කව කරන්න.

**ප්‍රශ්න අංක 441 පරීක්ෂා කලේ කවුද ?**

උපතින් පසු පරීක්ෂාව සිදු කළ පුද්ගලයා පිළිබඳ විමසීමක් මෙයින් සිදු කෙරේ. සෞඛ්‍ය නිලධාරීන් කිහිප දෙනෙක් සහභාගී වුවා නම් වඩාත් සුදුසු පුද්ගලයාට අදාල කේතය කව කරන්න. මතක නැති නම් 98 කව කරන්න. අනතුරුව ප්‍රශ්න අංක 444 ට යන්න.

| |
|---|
| **ප්‍රශ්න අංක 442 සිට ප්‍රශ්න අංක 446 දක්වාප්‍රශ්න (ප්‍රශ්න අංක 443 හැර) විමසා බලන්නේ පවුල් සෞඛ්‍ය සේවිකාව දරු ප්‍රසූතියෙන් පසු මවගේ සෞඛ්‍ය පිළිබඳ සැලකිලිමත් වූවාද යන්න පිළිබඳව දැන ගැනීමටයි.** |

**ප්‍රශ්න අංක 442 පවුල් සෞඛ්‍ය සේවිකාව පැමිණියාද ?**

මෙම ප්‍රශ්නයට යොමු වූයේ රෝහලක ප්‍රසූතිය සිදු කළ නමුත් මුදා හැරීමට ප්‍රථම සෞඛ්‍ය තත්වය පරීක්ෂාවක් සිදු නොකල බව පවසන කාන්තාවන්ගෙන්ය. අවසාන උපතින් පසු ඇය නිවසට පැමිනි පසු පවුල් සෞඛ්‍ය සේවිකාව නිවසට පැමිණියාද ? යන්න විමසා පැමිණියා නම් ප්‍රශ්න අංක 445 ටද පැමිණියේ නැතිනම් ප්‍රශ්න අංක 449 ටද යන්න.

**ප්‍රශ්න අංක 443 ප්‍රසූතිය සෞඛ්‍ය ආයතනයක සිදු නොකළේ ඇයි ?**

මෙම ප්‍රශ්නය අසනු ලබන්නේ ප්‍රශ්න 436 අනුව රෝහලක නොව නිවසක ප්‍රසූතිය සිදු කළ කාන්තාවන්ගෙනි. පහසුකම් අඩු ස්ථානයක තවමත් දරු උපත් සිදුවන්නේද යන්න දැන ගැනීම මෙහි අරමුණ වන අතර එවැනි උපත් මවගේ දරුවාගේ සෞඛ්‍ය තත්වයට බෙහෙවින් බලපානු ලැබේ. ඇය ප්‍රසූතිය සඳහා සෞඛ්‍ය පහසුකම් සහිත ස්ථානයකට නොගියේ ඇයි ? යන ප්‍රශ්නය අනුව අදාල කේත සියල්ලම කව කර ප්‍රශ්න අංක 444 ට යන්න.

**ප්‍රශ්න අංක 444 ප්‍රසූතියෙන් මාසයක් ඇතුලත පවුල් සෞඛ්‍ය සේවිකාව පැමිණියාද ?**

මෙම ප්‍රශ්නයට යොමුවූ කාන්තාවන් වන්නේ

1. රෝහලේ ප්‍රසූතිය සිදු කළ අතර සෞඛ්‍ය පරීක්ෂාවට ලක්වූ අය.
2. එමෙන්ම නිවසේ ප්‍රසූතිය සිදු කල අය.

මෙම ප්‍රශ්නයේ අරමුණ කුමන ස්ථානයක ප්‍රසූතිය සිදු කලත් ප්‍රසූතියෙන් පසු මාසයක් ඇතුලත මෙම මව්වරුන් පවුල් සෞඛ්‍ය සේවිකාව විසින් පරීක්ෂා කළාද යන්න දැන ගැනීමටයි. පැමිණියා නම් 1 කව කර 445 ටද නැති නම් 2 කව කර 449 ටද යන්න.

**ප්‍රශ්න අංක 445 ප්‍රථම පරීක්ෂාව කලේ කොපමණ කලකට පසුවද ?**

ප්‍රශ්න අංක 444 හි සඳහන් කාන්තාවන්ට අමතරව ප්‍රශ්න අංක 442 දී රෝහලේදී පරීක්ෂා නොකළ නමුත් පවුල් සෞඛ්‍ය සේවිකාව නිවසට ආ බව පැවසූ කාන්තාවන්ද මෙම ප්‍රශ්නයට යොමු වේ. ඒ අනුව පහත සඳහන් ආකාරයට ප්‍රසූතිය සිදු කල සියලු කාන්තාවන් මෙම ප්‍රශ්නයට යොමුවී ඇත.

1. රෝහලේදී ප්‍රසූතිය සිදු කළ හා පරීක්ෂාවට ලක් වූ හා නිවසේදී පවුල් සෞඛ්‍ය සේවිකාව පරීක්ෂා කළ අය (ප්‍රශ්න අංක 441 හා ප්‍රශ්න අංක 444)
2. නිවසේදී ප්‍රසූතිය සිදු කළ අතර පවුල් සෞඛ්‍ය සේවිකාව නිවසේදී පරීක්ෂා කළ අය (ප්‍රශ්න අංක 443 හා ප්‍රශ්න අංක 444)
3. රෝහලේදී ප්‍රසූතිය සිදු කළ නමුත් රෝහලෙන් පරීක්ෂා නොකළ නමුත් නිවසේදී පවුල් සෞඛ්‍ය සේවිකාව පරීක්ෂා කළ අය (ප්‍රශ්න අංක 439 හා ප්‍රශ්න අංක 442න්)
4. දරුවා බිහි වූයේ සීසේරියන් සැත්කමකින් නම් ගෙදරදී පවුල් සෞඛ්‍ය සේවිකාව පරීක්ෂා කළ අය.

ඉහත ඕනෑම ආකාරයක ස්ථානයක ප්‍රසූතියකින් පසු පවුල් සෞඛ්‍ය සේවිකාව නිවසට පැමිණියා නම් ඇය මුලින්ම පැමිණියේ කොපමණ කාලයකට පසුවද යන්න මෙයින් විමසා බලනු ලැබේ. අදාල කේත කව කර කොටු තුල කාලය සඳහන් කරන්න. මතක නැති නම් 998 කව කරන්න.

**ප්‍රශ්න අංක 446 කී වරක් පැමිණියාද ?**

පවුල් සෞඛ්‍ය සේවිකාව පැමිණියා නම් ඇය පැමිණි වාර ගණන මෙයින් අසනු ලැබේ. කොටු තුල සංඛ්‍යාව ලියන්න.

| |
|---|
| **ප්‍රශ්න අංක 449 සිට ප්‍රශ්න අංක 452 දක්වා අසනු ලබන්නේ අවසන් වරට උපත ලැබූ දරුවාගේ සෞඛ්‍ය තත්වය පරීක්ෂා කිරීම පිළිබඳවයි.** |

**ප්‍රශ්න අංක 449 පළමු මාස 2 තුළ දරුව ගේ සෞඛ්‍ය තත්වය පරීක්ෂා කළාද ?**

නිවසක සෞඛ්‍ය පහසුකම් නොමතිව උපත ලැ දරුවා හා අනෙකුත් දරුවන් පළමු මාස 2 තුළදී පවුල් සෞඛ්‍ය සේවිකාව හෝ වෙනත් සෞඛ්‍ය නිලධා යකු විසින් පරීක්ෂා කළාද යන්න දැන ගැනීම මෙයින් බලාපොරොත්තුවේ. දරුවා පරීක්ෂා කිරීම සඳහ රෝහලකට හෝ සායනයකට ගෙන ගියාද ? නැතහොත් පවුල් සෞඛ්‍ය සේවිකාව පැමිණියාද යන්න පැහ ලිව විමසන්න. ඔව් නම් තවත් තොරතුරු සඳහා 450 වද නැත හෝ නොදනී නම් 453 වද යන්න.

**ප්‍රශ්න අංක 450 ප්‍රථමයෙන් දරුවා පරී ා කළේ කොපමණ කලකින්ද ?**

එසේ ප්‍රථම පරීක්ෂාවට ලක් කලේ උපතින් කො මණ වේලාවකට පසුද යන්න මින් දැන ගැනීමට අදහස් කෙරේ. අදාල කේතය කව කර සංඛ්‍යාව කොටු ඇ ලියන්න. ප්‍රශ්න අංක 451 ට යන්න.

**ප්‍රශ්න අංක 451 පරීක්ෂා කළේ කවුද ?**

දරුවා ප්‍රථමයෙන්ම පරීක්ෂා කළ පුද්ගලයා කවු යන්න විමසන්න. වඩාත් සුදුසු පුද්ගලයාට අදාල කේතය කව කරන්න. ප්‍රශ්න අංක 452 ට යන්න.

**ප්‍රශ්න අංක 452 පරීක්ෂා කළේ කුමන ස්ථානයකදීද ?**

දරුවා ප්‍රථමයෙන් පරීක්ෂාවට ලක්වූයේ නිවසේදී නැතිනම් වෙනත් ස්ථානයකදීදැයි විමසා අදාල කේතය කව කරන්න. ප්‍රශ්න අංක 453 ට යන්න.

**මෙතැන් සිට මව පිළිබඳ ප්‍රශ්න කිහිපයක් අසනු ලැබේ.**

**ප්‍රශ්න අංක 453 විටමින් A ලබා දුන්නාද ?**

දරු ප්‍රසූතියෙන් පසු මවට විටමින් A අඩංගු කරලක් රෝහලෙන් හෝ වෙනත් සෞඛ්‍ය ආයතනයකින් හෝ සෞඛ්‍ය නිලධාරියෙක් විසින් ලබා දුන්නාද යන්න දැන ගැනීමට මෙම ප්‍රශ්නය අසනු ලැබේ. මෙම කරල් ගැන ඔබට සපයා ඇති සාම්පල් පෙන්වා අසන්න. අදාල කේතය කව කර 454 ට යන්න.

**ප්‍රශ්න අංක 454/ප්‍රශ්න අංක 455 මාස් ශුද්ධිය ආරම්භ වී තිබේද ?**

දරු ප්‍රසූතියෙන් පසු ටික කලක් යනතුරු මාස් ශුද්ධිය සාමාන්‍ය පරිදි සිදු නොවේ. මෙම ප්‍රශ්නයෙන් අසනු ලබන්නේ අවසාන දරු ප්‍රසූතියෙන් පසු මේ වන විට මාස් ශුද්ධිය නැවත ආරම්භවී තිබේද යන්නයි. ඔව් නම් ප්‍රශ්න අංක 456 ටද නැත නම් ප්‍රශ්න අංක 457 ටද යන්න.

ප්‍රශ්න අංක 455 න් අසනු ලබන්නේ මීට කලින් සිදුවූ උපත් ඇත්නම් ඒ අතරතුර කාලයේදී මාස් ශුද්ධිය නැවත ආරම්භවී තිබුණාද යන්නයි. ප්‍රශ්න අංක 455 සඳහා ඔව් නම් 456 ටද නැත නම් 459 ටද යන්න.

**ප්‍රශ්න අංක 456 කොපමණ මාස් ගණනක් මාස් ශුද්ධිය සිදුවූයේ නැද්ද ?**

උපතින් පසු මාස් ශුද්ධිය ආරම්භ වී ඇති බව ප්‍රශ්න අංක 454 දී පැවසුවහොත් එම කාන්තාවන් සඳහා 456 දී මාස් ශුද්ධිය නතර වී තිබූ මාස ගණන විමසනු ලැබේ. එමෙන්ම කලින් උපත් අතර කාලයේදී මාස් ශුද්ධිය ආරම්භ වී තිබුණ (ඔව්) යයි පැවසූ කාන්තාවන් සඳහා එම එක් එක් උපත්වලට අදාලව මාස් ශුද්ධිය නැවති තිබූ මාස ගණන සඳහන් කරන්න. නොදනී බව පැවසුහොත් 98 කේත කර කරන්න.

**ප්‍රශ්න අංක 457 පිල්ටර් ගැබිණියක්/ගැබිණියක් නොවේ.**

ප්‍රශ්න අංක 226 සඳහන් කර ඇති පරිදි ඇයගේ වර්තමාන තත්වය ලකුණු කරන්න. ගැබිණියක් නොවේ නම් 458 ටද ගැබිණියක් නම් 459 ටද යන්න.

**ප්‍රශ්න අංක 458/ප්‍රශ්න අංක 459 ලිංගිකව එකතුවීමට පටන්ගෙන තිබේද ?**

සමහර අඹු සැමියන් දරු උපතකින් පසු යම් කාලයක් ලිංගිකව එක් වීමෙන් වැලකී සිටින අවස්ථා ඇත.

ප්‍රශ්න අංක 458 න් අසනු ලබන්නේ අවසන් උපතින් පසු දැනට එසේ එක්වීමට පටන් ගෙන තිබේද යන්නයි. ඔව් නම් 459 ටද නැත නම් 460 ටද යන්න.

ප්‍රශ්න අංක 459 දී අවසාන උපතින් පසු හා ඊට කලින් උපත් වලින් ද පසු නැවත එක්වූයේ කොපමණ මාස ගණනකින් පසුවදැයි විමසනු ලැබේ. අදාල මාස ගණන ලියන්න. නොදනී නම් 98 කර කරන්න. ප්‍රශ්න අංක 460 ට යන්න.

**ප්‍රශ්න අංක 460 කවදා හෝ මව් කිරි දුන්නාද ?**

මව් කිරි දීම උපත් පාලනය හා දරුවාගේ සෞඛ්‍ය කෙරෙහි විශේෂ බලපෑමක් ඇති කරන සාධකයක් ලෙස පිළි ගැනේ. අවසාන උපතින් පසු මෙන්ම ඊට කලින් සිදුවූ උපත් සඳහාද කෙදිනක හෝ මව් කිරි දුන්, නොදුන් බව මෙයින් විමසනු ලැබේ. මෙහිදී මව්කිරි දුන් කාලසීමාව වැදගත් නොවේ. කවදා හෝ මව්කිරි දුන්නා නම් ප්‍රශ්න අංක 461A ටද නැත්නම් 467 ට ද යන්න.

**ප්‍රශ්න අංක 461 A මුලින්ම මව්කිරි දුන්නේ කොපමණ වේලාවකට පසුද ?**

දරුවාට මව්කිරි දී ඇති බව 460 දී පැවසූ මවගෙන් ඇගේ අවසාන උපත සඳහා පමණක් මුලින්ම මව් කිරි දුන්නේ කොපමණ වේලාවකට පසුදැයි විමසනු ලැබේ. උපත් විගසම මව් කිරි දුන් බව පැවසුවහොත් 000

කේත කරන්න. එසේ නැතහොත් පැයක් ඇතුලත දුන් බව පැවසුවොත් 1 කව කර කොටු තුල 00 ද පැය ගණනකදී නම් 1 කව කර අදාල පැය ගණන කොටු තුලද ලියන්න. පැය 24 ට වැඩි නම් 2 කව කර දින වලින් ලියන්න. ප්‍රශ්න අංක 461B ට යන්න.

**ප්‍රශ්න අංක 461B/ 461C/ 461D කිරි දොවා විසි කළාද ?**

ප්‍රසූතියෙන් පසු දරුවාට දෙන මුල් කිරි දරුවා කෙරේ ප්‍රතිශක්තිකරණයක් ඇති කරන බව වෛද්‍ය මතයයි. නමුත් ශ්‍රී ලංකාවේ සමහර මව්වරුන් එම කිරි දරුවාට දීමට බියෙන් බැහැර කරන අවස්ථා ඇත. ඉහත ප්‍රශ්න 3 න් දැන ගැනීමට උත්සාහ කරන්නේ අවසාන උපතින් පසු එම කිරි දොවා විසි කළාද? එසේ විසි කළා නම් එයට හේතුව, එසේ කිරීමට උපදෙස් දුන්නේ කවුද යන්නයි. මුල් කිරි විසිකලේ නැත්නම් 462ට යන්න.

**ප්‍රශ්න අංක 462/462A/463 පළමු මාස 4 දී හෝ මේ වන විට මව්කිරි හැර වෙනත් දෙයක් බීමට දුන්නාද ?**

පළමු මාස 4 දී මව්කිරි පමණක් දීමට ප්‍රමාණවත් බව වෛද්‍ය වරුන් නිගමනය කර තිබේ. නමුත් සමහර මව්වරු පළමු මාස 4 දී ජලය හෝ අමතර දියර වර්ග දීම සිදු කරන අතර එය දරුවාගේ සෞඛ්‍ය තත්වය කෙරේ බලපෑම් ඇති කිරීමට හේතුවක් වී ඇත. ඉහත ප්‍රශ්නවලින් දැන ගැනීමට අවශ්‍යවී ඇත්තේ එවැනි යමක් දුන්නාද දුන්නා නම් ඊට හේතුව හා බීමට දුන්නේ මොනවාද යන්න දැනගැනීමයි. මව් කිරි පමණක් දුන් බව පැවසුවොත් 462 හි 2 කව කර 464 ට යන්න. දරුවා දැනට මාස 4 ට අඩු නම් මේ වන විට වෙනත් දෙයක් දී ඇත්දැයි අසා දැනගන්න.

**ප්‍රශ්න අංක 464 පිල්ටර් දරුවා ජීවත්වන/නොවන බව**

ප්‍රශ්න අංක 404 බලා අදාල සියළු දරුවන් සඳහා ජීවත්වේ නම් 465A ටද ජීවත් නොවේ නම් 466 ට යන්න.

**ප්‍රශ්න අංක 465A මව්කිරි පමණක් දුන් කාල සීමාව**

කලින් සඳහන් කළ පරිදි දරුවකුට මුල් මාස කීපයේදී මව් කිරි පමණක් ප්‍රමාණවත් බව වෛද්‍ය මතය වී ඇත. **ජලයවත් නොදී මව්කිරි පමණක් දුන් කාලසීමාව සම්පූර්ණ මාස වලින් අසා දැන ගන්න.** අදාල කාලයන් එක් එක් දරුවා සඳහා වෙන වෙනම අසා දැන ගත යුතු අතර ඒ සඳහා මවට කාලය ලබාදී මතක් කර ගැනීමට ඉඩ දෙන්න. බාලම දරුවා සඳහා තවමත් මව්කිරි පමණක් දෙන බව පැවසුවහොත් 77 කව කරන්න. එසේ කව කරන අය 468 ට යන්න. අනිකුත් අය 465B ප්‍රශ්නයට යොමු කරන්න.

**ප්‍රශ්න අංක 465B තවමත් මව් කිරි දෙනවාද?**

අවසාන උපතට පෙර උපත් සඳහාත් මෙම ප්‍රශ්නය අදාල වේ. සමහර විට කලින් උපන් දරුවන්ද අවසාන උපතින් පසු මව්කිරි බොන අවස්ථා දක්නට ඇත. එම නිසා අදාල සැම දරුවකු සඳහාම ප්‍රශ්නය අසා එක් එක් දරුවා මව්කිරි බොනවා නම් 468 ද නැත නම් 466ටද යන්න.

**ප්‍රශ්න අංක 466 මව් කිරි දුන් කාලසීමාව**

දැනට මව්කිරි නවතා ඇති දරුවන් සඳහා මව්කිරි දුන් කාල සීමාව අසන්න. මාස ගණන සඳහන් කරන්න. නොදනී නම් 98 කට කරන්න.

**ප්‍රශ්න අංක 467 ජීවත්වන නොවන බව (ෆිල්ටර්)**

මෙම ප්‍රශ්නයෙන් නැවත 404 බලා ජීවත්වන නොවන බව ලකුණු කර ඉතිරි ප්‍රශ්නවලට යොමු කිරීමක් සිදු කෙරේ. ජීවත් වේ නම් "✓" ලකුණ යොදා 468 වද ජීවත් නොවේ නම් 470 වද යන්න.

**ප්‍රශ්න අංක 468 ෆිල්ටර් මව් කිරි දෙයි / නොදෙයි**

ප්‍රශ්න අංක 465A හෝ 465B අනුව දරුවා තවම මව්කිරි බොන නොබොන බව ලකුණු කර ගන්න. තවම මව් කිරි බොන දරුවෙක් නම් ප්‍රශ්න අංක 470 ට යන්න. දැනට මව්කිරි නොබොන දරුවෙක් නම් ප්‍රශ්න අංක 469 ට යන්න.

**ප්‍රශ්න අංක 469 මව් කිරි නොදීමට හේතුව**

මව් කිරි නොබොන දරුවෙක් නම් මව් කිරි බීම නැවැත්වීමට ප්‍රධාන හේතුව අසා අදාල කේතය කව කරන්න. ප්‍රශ්න අංක 470 ට යන්න.

**ප්‍රශ්න අංක 470 ඝන ආහාර දුන් වයස**

දැනට මව්කිරි බොන හෝ නොබොන දරුවන් සඳහා හා ජීවත් නොවන දරුවන් සඳහාත් ඝන ආහාර හෝ අර්ධ ඝන ආහාර මුලින්ම ලබා දුන් වයස අසනු ලැබේ. අදාල වයස එළඹෙන විට අර්ධ ඝන ආහාර/ඝන ආහාර ලබා දිය යුතු බවට වෛද්‍ය නිර්දේශය වුවත් සමහර මව්වරුන් එය අතපසු කරන අවස්ථා ඇත. දරුවාගේ වැඩීමට නියමිත වයසේදී ආහාර නොදීම පෝෂණ තත්වය කෙරේ බලපාන කරුණකි. එවැනි ආහාර වලට සුප් වර්ග, කැඳ වතුර, බත් තලප, පළතුරු යුෂ, සීරියල් වර්ග වැනි දෑ අයත් වේ. අදාල සෑම දරුවකු සඳහාම මාස ගණන සඳහන් කරන්න. තවම එවැනි ආහාරයක් ලබා දී නැති දරුවකු නම් හෝ කලින් මිය ගිය දරුවකු 77 කට කර 471 ප්‍රශ්නයට යන්න. අනිකුත් අය 470A ප්‍රශ්නයට යොමු කරන්න.

**ප්‍රශ්න අංක 470 A මුලින්ම හඳුන්වා දුන් ආහාරය**

දැනට වෙනත් ආහාර ලබා දුන් දරුවකු නම් මුලින්ම එම ලබා දුන් ආහාරය අසා අදාල කේතය කව කරන්න. නොදනී නම් හෝ මතක නැති නම් 9 කේතය කව කරන්න.

**ප්‍රශ්න අංක 471 අවසන් කිරීම**

එක් උපතකට අදාල තොරතුරු අසා අවසන් වූ පසු තවත් උපත් ඇත්නම් එම තොරතුරුද සම්පූර්ණ කරන්න. නැත්නම් 5 කොටසට යන්න.

## 6.5 කොටස

### පස්වන කොටස - දරුවාගේ ප්‍රතිශක්තිකරණය, සෞඛ්‍ය තත්වය හා දරුවාගේ සහ මවගේ පෝෂණය

ප්‍රශ්න අංක 501

2001 හෝ ඊට පසු ඉපදුන සෑම උපතක්ම සඳහා මෙම කොටස පිරවිය යුතුය. සෑම උපතක් සඳහාම පේලි අංකය, නම හා ජීවත්ව සිටීද යන්න මෙම තීරුවල සඳහන් කල යුතුය. පලමුව අවසන් උපතෙන් පටන් ගෙන අවසන් උපතට පෙර උපත, අවසන් උපතට පෙර දෙවන උපත යන ආදී ලෙස පිරවිය යුතුය. මෙහිදී උපත් තුනකට වැඩි අවස්ථාවක තවත් ප්‍රශ්නාවලියක් භාවිතා කල යුතුය. එම ප්‍රශ්නාවලියේ පස්වන කොටසට ඉහලින් "අනිත් පොත හා සම්බන්ධයි" යන්න සඳහන් කර එම පොතේ පිට කවරයේද එය සඳහන් කල යුතුය. එම පොතේ මුල් තීරුව හැර අවසන් තීරු දෙක ඒ සඳහා භාවිතා කරන්න. එහි හතර වන උපත අවසන් උපතට පෙර තුන්වන උපත හා පස් වන උපත, අවසන් උපතට පෙර හතර වන උපත ලෙස වෙනස් කර ගත යුතුය.

අදාල වයස් කාණ්ඩයේ උපත් නොමැති නම් ප්‍රශ්න අංක 549 ට යන්න.

ප්‍රශ්න අංක 502 **පේලි අංකය**

2 කොටසේ ප්‍රශ්න අංක 212ට අනුව පේලි අංකය නිවැරදිව සටහන් කර ගන්න.

ප්‍රශ්න අංක 503 **නම, ජීවත් වන නොවන බව**

2 කොටසේ ප්‍රශ්න අංක 212 සිට 216 දක්වා හොඳින් පරීක්ෂාකර අවසන් උපතෙන් පටන් ගෙන දරුවාගේ නම ලියන්න. (මෙහිදී 2001හා ඊට පසු උපත් පමණක් ඇතුලත් කල යුතුය.) දරුවා දැනට ජීවත්වේද, නැද්ද යන්න අදාල කොටුවේ "✓" ලකුණු කරන්න.

- ජීවත් වේ නම් ප්‍රශ්න අංක 504 ට යා යුතුය.
- ජීවත් නොවේ නම් ඊලග තීරුවට යන්න. තවත් උපත් නොමැති නම් ප්‍රශ්න අංක 549 ට යා යුතුය.

| |
|---|
| ප්‍රශ්න අංක 504 සිට 557 දක්වා එක් එක් දරුවා සඳහා තීරුව පහළට සම්පූර්ණ කරන්න. අවසන් උපතෙන් පටන් ගෙන පහළට සම්පූර්ණ කල පසු ඊලග දරුවා සඳහා සම්පූර්ණ කරන්න. |

ප්‍රශ්න අංක 504 **එන්නත් සටහන් පත**

ප්‍රතිචාරකට සිටින දරුවන්ගෙන් අදාල වයස් කාණ්ඩයේ සිටින සියළුම දරුවන්ගේ උප්පැන්න සහතික හා ක්ලිනික් කාඩ් පත් තිබේ දැයි අසා දැන ගත යුතුය. දැන් එය බැලීමට පුළුවන් දැයි විමසා හැකි නම් ඒවා

ලබා ගත යුතුය. මෙවැනි අවස්ථාවක ප්‍රතිචාරක අපහසුතාවයට පත් නොවන ආකාරයෙන් කාඩ් පත් ලබා ගැනීමට වග බලා ගත යුතුය.

ප්‍රතිචාරක කාඩ් පත් ලබා දුන්නේ නම් කේත අංක 1 කව කර ප්‍රශ්න අංක 506 ට යන්න. කාඩ් පත් නොදුටු වේනම් 2 කව කර ප්‍රශ්න අංක 508 ට යන්න. සටහන් පතක් නොමැති නම් 3 කවවිය යුතුය.

**ප්‍රශ්න අංක 505 සටහන් පතක් තිබුණාද**

ප්‍රශ්න අංක 504 හි 3 කව කර ඇත්නම් පමණක් මෙම ප්‍රශ්නය ඇසිය යුතුය. කවදා හෝ එන්නත් සටහන් පතක් තිබුණි නම් 1 කව කර ප්‍රශ්න අංක 508 ට යන්න. නැත්නම් 2 කව කර ප්‍රශ්න අංක 508ට යන්න.

**ප්‍රශ්න අංක 506 එන්නත් කල දිනය**

කාඩ් පත ඇති දරුවන් සඳහා 506 සම්පූර්ණ කරන්න.
කාඩ් පතේ සඳහන් ආකාරයට දරුවාට ලබා දී ඇති එන්නත් හා එය ලබා දුන් දිනය සඳහන් කරන්න. නියමිත එන්නත් සුදුසු කලට ලබා දී නොමැති නම් එම එන්නත ඉදිරියෙන් 2 කව විය යුතුය. අදාල එන්නත් සටහන් කිරීමේදී සාමාන්‍යයෙන් (DPT) ත්‍රිපල් (1,2,3,4) එන්නත් ලබා දෙන දින වලදීම පෝලියෝ (1,2,3,4) එන්නත් ද ලබා දෙන බැවින් ඒ ගැන විමසිලිමත් විය යුතුය. (එකම දින සටහන් විය යුතුය) එසේ වෙනස් වීමක් ඇති විට විමසා හේතුව දැනගන්න. එවැනි අවස්ථාවල පහලින් හේතුව සඳහන් කරන්න.

| | | | |
|---|---|---|---|
| උදා: | ත්‍රිපල් 1 | - | 2003.03.20 |
| | පෝලියෝ 1 | - | 2003.03.20 |
| | ත්‍රිපල් 2 | - | 2003.05.24 |
| | පෝලියෝ 2 | - | 2003.05.24 |

මෙවැනි උපත් කිපයක් ඇති විට එක් එක් කාඩ් පතට අදාල දරුවාගේ අනුක්‍රමික අංක යටතේ මෙම තොරතුරු පිරවිය යුතුය.

සටහන :

- ඇතැම් විට ඉදිරියේදී දීමට ඇති එන්නත් සඳහා කලින් දින වෙන් කරවා ගැනීමක් සිදු කර ඇති විට එවැනි අවස්ථාවක දැනට දරුවාට ලබා දී නොමැති එන්නත් සටහන් නොකරන්න.
- තවද එම කාඩ් පතෙහි එන්නත් ලබා දී ඇති වර්ෂය හා මාසය සඳහන් කර ඇති අතර දිනය සටහන් කර නොමැති නම් දිනය තීරුව සඳහා "98" යොදන්න.
- ඇතැම් විට ලබා දී ඇති එන්නතෙහි නම පමනක් සඳහන් කර දිනයක් සඳහන් කර නොමැති අවස්ථාවක දිනය තීරුවට "44" යොදා වර්ෂය හා මාසය තීරු හිස්ව තබන්න.

ප්‍රශ්න අංක 507 ජාතික ප්‍රතිශක්තිකරණය

ජාතික ප්‍රතිශක්ති කරන දින වැනි විශේෂ අවස්ථා වලදී ලබා දෙන එන්නත් බොහෝ විට එන්නත් සටහන් පතෙහි සදහන් නොකරයි.එසේ එන්නත් කිරීමක් සිදු කලේ නම් ඒ බව ප්‍රතිචාරකගෙන් විමසා දැනගත යුතුය. එවැනි එන්නත් ලබා දී ඇත්නම් කේත අංක 1 කව කර ප්‍රශ්ණ අංක 506ට යා යුතුය. ප්‍රශ්න අංක 506 හි අවසාන තීරුවේ එන්නතේ නම ලියන්න. දින තීරුවේ 66 යොදා අවුරුදු හා මාස තීරු හිස්ව තබන්න. කාඩ් පතේ සදහන් එන්නත් වලට අමතරව කිසිම එන්නතක් ලබා දී නොමැති බව ප්‍රතිචාරක පවසයි නම් කේත අංක 2 කව කර ප්‍රශ්න අංක 510 ට යන්න. ඇය එසේ කීමට නොදනී යැයි පැවසුවහොත් 8 කව කර ප්‍රශ්න අංක 510 ට යන්න. ඔබට ලබා දී ඇති එන්නත් කාඩ් පතට අනුව දී ඇති එන්නත් ගැන නිරීක්ෂණය කිරීමෙන් හා ප්‍රශ්න කිරීමෙන් තව දුරටත් නිවැරදිව සටහන් කල හැකි වේ.

ප්‍රශ්න අංක 508 - කුමන හෝ එන්නතක්

මෙම ප්‍රශ්නය ඔබ ඇසිය යුත්තේ එන්නත් කාඩ්පත ඔබ නොදැක්කේ නම් පමණි. රෝග වැලදීමෙන් ආරක්ෂා වීමට කුමන හෝ එන්නත් කිරීමක් සිදු කර තිබේද යන්න ප්‍රතිචාරකගේ මතකයෙන් ලබා ගත යුතුය. ඔව් නම් 1 කේතය කව කර ප්‍රශ්න අංක 509 ට යන්න. නැත හෝ නොදනී නම් ප්‍රශ්න අංක 516 ට යන්න. නැත යැයි පැවසූ දරුවන් කාඩ්පත නොමැති නිසා 511 ට යොමු නොවේ.

ප්‍රශ්න අංක 509 - එන්නත් දී තිබෙනවාද

මෙම ප්‍රශ්නය ඇසිය යුත්තේ එන්නත් කාඩ් පතක් නොමැති දරුවන් සදහා පමණි.(508 හි 1 කව කල අය) මෙවිට එක් එක් එන්නත නම් කරමින් ඇසිය යුතුය.

උදා : BCG එන්නත ලබා දී තිබේද?
පොලියෝ 1
ත්‍රිපල් 1 ලබා දී තිබේද?

යනාදී ලෙස ඇසිය යුතුය. බොහෝ විට මෙම එන්නත් දෙකම එකම දිනයේ ලබා දේ. එසේ ඔව් නම් කේත අංක 1 කව කරන්න. නැත් නම් 2 කව කරන්න. නොදනීනම් 3 කව විය යුතුය. මෙහිදී ත්‍රිපල්, පෝලියෝ එන්නත් ලබා දී තිබේ නම් කොපමණ වාරයක් ලබා දී තිබේද කියා ඇසිය යුතුය. මෙහිදී මාස 2 දී , මාස 4 දී, මාස 6 යනආදී කාල වකවානු වලදී ලබාදී ඇති එන්නත් ගැන අසා දැන ගත යුතුය. සම්පූර්ණ කල පසු 510 ට යන්න.

ප්‍රශ්න අංක 510 - ලබා දුන් අවුරුද්ද

ජාතික ප්‍රතිශක්තිකරණ දින එන්නත් ව්‍යාපාර මගින් පසු ගිය අවුරුදු 5 ඇතුලත එන්නත් ලබා දී තිබේද කියා විමසා දැන ගත යුතුය. එම ව්‍යාපාර වලින් විශේෂ දින මේ සදහා යොදා ගෙන තිබේ. ඒ අනුව පෝලියෝ මුඛ එන්නත වැනි විශේෂ එන්නත් දරුවාට කුමන වර්ෂ වලදී ලබාදී තිබේද යන්න දැන ගත යුතුය. මෙහිදී බලාපොරොත්තු වන්නේ එන්නත් ලබා දී ඇති දරුවන්ගේ ප්‍රතිශතය ගණනය කිරීමයි. වෙනත් ක්‍රම වලින් පෝලියෝ මුඛ එන්නත් ලබා දී ඇත්නම් ඒවා ඇතුලත් නොකල යුතුය. එසේ ජාතික

ප්‍රතිශක්තිකරණ දින එන්නත් ව්‍යාපාර මගින් එන්නත් ලබා ගත් වර්ෂයන් විමසා අදාල කේත අංක කව කරන්න. වර්ෂ කීපයකදී ලබා දුනි නම් ඒ සියල්ලම සදහන් කල යුතුය. ලබාදී එම ව්‍යාපාරයකදී එන්නත් ලබා දී නැති නම් කේත අංක 6 කව විය යුතුය. නොදනී නම් 8 කව කරන්න. 511 ට යන්න

**ප්‍රශ්න අංක 511 - උපත් හා බර**

දරුවාගේ වර්ධන සටහන් පතට අනුව උපත් බර සදහන් කළ යුතුය. එය කිලෝ ග්‍රෑම් වලින් සදහන් කල යුතු අතර වර්ධන සටහන් පතක් නොමැති නම් ප්‍රශ්න අංක 516 ට යන්න. බර දශම ස්ථාන 3 කින් ලබා දිය යුතුය.

**ප්‍රශ්න අංක 516 - යකඩ අඩංගු විටමින් දුන්නාද?**

මෙහිදී බලාපොරොත්තු වන්නේ ඇනිමියා රෝගය මර්දනය සදහා දරුවාට යකඩ අඩංගු විටමින් වර්ග ලබා දී තිබේද යන්න සොයා බැලීමයි.

පසු ගිය දින 7 ඇතුලත දී දරුවාට යකඩ අඩංගු සිරප් වර්ගයක් ලබා දී තිබේදැයි ඇසිය යුතුය. දරුවාට විටමින් සිරප් දෙන බව ප්‍රතිචාරක පැවසුවහොත් එම සිරප් බෝතලය ගෙන්වා ලේබලය හොඳින් කියවන්න. එහි යකඩද අඩංගු නම් පමණක් ඔව් යැයි සදහන් කල යුතුය. අනතුරුව 517 ට යන්න.

**ප්‍රශ්න අංක 517 - පණු බෙහෙත් දුන්නාද?**

පසු ගිය මාස 6 ඇතුලත දරුවාට පණු බෙහෙත් හෝ පනුවන් සදහා කුමන හෝ ඖෂධයක් ලබා දී තිබේද කියා ඇසිය යුතුය. ඒ අනුව අදාල කේතය කව කර518 ට යන්න.

**ප්‍රශ්න අංක 518 - පාචනය ඇති වුවාද?**

පාචනය වැනි රෝග සංවර්ධිත රටවල දරුවන්ට බොහෝ තදින් පැතිර යාමට ඉඩ ඇත. ඇතැම් විට ප්‍රතිචාරක පාචනය යන වචනය එකවර ඇසීමට අකමැති වීමට ඉඩ ඇත. එම නිසා **පසුගිය සති 2 ඇතුලත** දරුවාට සාමාන්‍ය වාර ගණනට වඩා වැඩි වාර ගණනක් මළ පහ පිට වුනිද කියා ඇසිය යුතුය. දිනකට තුන් වරකට වැඩි වාර ගණනක් දියර සහිතව හෝ සෙවල සහිතව මල පහ පිටවුණි ද කියා අසා දැන ගත යුතුය. ඒ අනුව අදාල කේතය කව කල යුතුය නැත හෝ නොදනී නම් අදාල කේතය කව කර ප්‍රශ්න අංක 533ට යන්න.

**ප්‍රශ්න අංක 519 - පාචන තත්වය**

එසේ ඔව් යැයි පැවසූ විට එය දියර සහිත ද නැත්නම් ලේ සහ සෙම සහිත පාචන තත්වයක් ද යන්න විමසා අදාල කේතය කව කර 520 ට යන්න.

**ප්‍රශ්න අංක 520 - මව් කිරි දුන්නාද?**

මෙම ප්‍රශ්නය පාවනය පැවති කාලය තුල දරුවාට මව් කිරිදීමේ වෙනසක් සිදු කලාද යන්න දැන ගැනීම සඳහායි.

මෙම කාලය තුල දරුවාට **මව් කිරි දුන්නේ** දරුවා සාමාන්‍යයෙන් බොන කිරි ප්‍රමානයටද නැත්නම් ඊට වැඩියෙන්ද නැතහොත් අඩුවෙන් ද යන්න විමසා දැන ගත යුතුය. අඩුවෙන් යැයි පැවසුවහොත් තව දුරටත් විමසා ඒ අනුව අදාල කේතය කව කරන්න. මෙහිදී අවසන් උපත හෝ ඊට පෙර උපත් සඳහා දැනට මව් කිරි දීම නවතා ඇත්නම් කේත අංක 1කව කල යුතුය. (පාවනය වැලදීමට කලින්) මීලගට 520A ට යන්න.

**ප්‍රශ්න අංක 520A - බීමට දුන්නාද?**

මවගේ දැනුම මැන බැලීමක් මෙහිදී සිදු කෙරේ.

මෙහිදී බලාපොරොත්තු වන්නේ පාවනය පැවති කාලය තුල දරුවාට බීමට යමක් දුන්නේ නම් එම දුන් ප්‍රමානය මැණ බැලීමයි. දරුවා ඉල්ලුවත් නැතත් මව දරුවාට දුන් ප්‍රමාණය දැනගැනීම මෙමගින් අදහස් කරයි. දරුවා සාමාන්‍යයෙන් බීමට ගන්නා ප්‍රමානයට වඩා අඩුවෙන් දියර වර්ග ලබා දුන්නාද, වැඩියෙන් ලබා දුන්නා ද යන්න විමසා දැන ගත යුතුය. සාමාන්‍ය ආකාරයට වඩා අඩුවෙන් ලබා දී තිබේ නම් එය පැහැදිලිව විමසා බොහෝ අඩුවෙන්ද නැත්නම් තරමක් අඩුවෙන්ද කියා දැන ගත යුතුය. මෙහිදී ප්‍රතිචාරකගෙන් විමසා නිවැරදිව කේතය සටහන් කර 521 ට යන්න.

**ප්‍රශ්න අංක 521- ආහාර දුන්නාද?**

මෙයින්ද මවගේ දැනුම තව දුරටත් මැනීමක් සිදු කෙරේ.

ඉහත ආකාරයටම මව දරුවාට ආහාර ලබා දී ඇති ප්‍රමානය මැන බැලීමක් මෙමගින් සිදු කෙරේ. මෙහිදී දරුවා ආහාර ගන්නා සාමාන්‍ය ආකාරයට වඩා වැඩියෙන් ලබා දුන්නාද නැත්නම් ඊට අඩුවෙන් ආහාර දුන්නා ද කියා විමසා දැන ගත යුතුය. අඩුවෙන් ලබා දුනි නම් එය ඉතා අඩුවෙන්ද නැත්නම් තරමක් අඩුවෙන් ද කියා විමසා සටහන් කල යුතුය. දැනට ආහාර ලබා නොදෙන වයසේ දරුවෙක් නම් කේත අංක 1 කව විය යුතුය. මෙම කාලය තුල ආහාර දීම නවතා ඇත්නම් 2 කව විය යුතුය. එසේ නොමැතිව ඉහත ආකාරයේ තරමක් හෝ වැඩියෙන්ද විමසා අදාල කේතය කව කර 522 ට යන්න.

**ප්‍රශ්න අංක 522 - වෛද්‍ය උපදෙස් ගත්තාද?**

මෙම කාලය තුල දරුවාට වෛද්‍ය උපදෙස් හෝ ප්‍රතිකාර ලබා ගත්තේද කියා විමසා දැන ගත යුතුයි. ඔව් නම් 1කව කර 523 ට යන්න. නැත්නම් 2 කව කර ප්‍රශ්න අංක 527 ට යා යුතුය.

**ප්‍රශ්න අංක 523 - උපදෙස් ගත්තේ කොහෙන්ද?**

එසේ උපදෙස් හෝ ප්‍රතිකාර ලබා ගත් ස්ථානය විමසා දැන ගත යුතුය. ඇය ලබා දෙන පිළිතුරු වලට අනුව නිවැරදිව කේත අංක කව කල යුතුය. දී ඇති ස්ථාන පිළිබඳ ප්‍රකාශ කරමින් නිවැරදි කේත අංක කව කල

යුතුය. මෙහිදී ස්ථාන කීපයකින් ප්‍රතිකාර ලබා ගෙන තිබිය හැක. ඒ සියල්ලම අදාල කේතයන් කව කරන්න. 524 ට යන්න.

**ප්‍රශ්න අංක 524 - ෆිල්ටර්**

මෙහිදී ප්‍රශ්න අංක 523ට අනුව පරීක්ෂා කර නිවැරදි කොටුවට "✓" ලකුණ යොදන්න. කේත එකක් පමණක් කව වී ඇති විට අදාල කොටුවට "✓" ලකුණ යොදා ප්‍රශ්න අංක 526 ට යන්න. නැත්නම් ඊලග ප්‍රශ්නයට යන්න.

**ප්‍රශ්න අංක 525 - ප්‍රථම ප්‍රතිකාරය**

පාචනය වැළදුන විට මුලින්ම (ප්‍රථම වතාවට) උපදෙස් ලබා ගත්තේ හෝ ප්‍රතිකාර ලබා ගත්තේ කෙහෙන්ද? මෙහිදී ප්‍රශ්ණ අංක 523 හි කේත අංකම භාවිතා කර දී ඇති කොටුව තුළ සදහන් කරන්න.

**ප්‍රශ්න අංක 526 - කොපමණ දින ගණනකට පසුද?**

ඔබ මුලින්ම උපදෙස් හෝ ප්‍රතිකාර ලබා ගත්තේ දරුවාට පාචනය පටන් ගෙන කොපමණ දවස් ගණනකට පසුවද? එදිනම ප්‍රතිකාර ලබා ගත්තේ නම් "00"සටහන් කරන්න. අංක දෙකකින් සදහන් කල යුතුය. උදා :- දින 3ක් නම් 03 යනුවෙන් සදහන් කරන්න. 527 ට යන්න.

**ප්‍රශ්න අංක 527- තවමත් අසනීපයෙන්ද?**

දැනටත් (සමීක්ෂණයට යන කාලය තුලදී ) දරුවා පාචනය රෝගයෙන් පෙළෙමින් සිටී ද නැද්ද යන්න විමසා දැන ගත යුතුය. එවිට ලැබෙන පිළිතුර අනුව අදාල කේතය කව කර528 ට යන්න.

**ප්‍රශ්න අංක 528 - දියර වර්ග දුන්නාද?**

පාචනයෙන් පෙලුණු දා සිට කිසියම් වේලාවක පහත සදහන් දියර වර්ග ලබා දී තිබේද උදා: ජීවනී වැනි විශේෂිත දියර වර්ගයක් හෝ සෞඛ්‍ය නිළධාරීන්ගේ උපදෙස් මත නිවසෙහි සාදන ලද දියර වර්ගයක් දරුවාට බීමට දුන්නාද කියා ප්‍රතිචාරකගෙන් ඇසිය යුතුය. ප්‍රතිචාරක දෙන පිළිතුරු වලට අනුව නිවැරදි කේතයන් කව කරන්න. a හා b කොටස් වලට වෙන වෙනම පිළිතුරු සටහන් කල යුතුය.

**ප්‍රශ්න අංක 529 - බෙහෙත් වර්ගයක් දුන්නාද?**

ඉහත ප්‍රශ්න අංක 528 හි දී ඇති දියර වලට අමතරව වෙනත් බෙහෙත් වර්ගයක් හෝ ප්‍රතිකර්මයක් දෙනු ලැබුවාද කියා ඇසිය යුතුය. එවිට පිළිතුරු ලෙස ඔව් නම් 1 කව කරන්න. ප්‍රශ්න අංක 530 යන්න. නැත හෝ නොදනී නම් අදාල කේතය කව කර ප්‍රශ්න අංක 533 ට යන්න.

**ප්‍රශ්න අංක 530 - දුන්නේ මොනවාද?**

ඉහත ප්‍රශ්නය ඔව් යැයි පැවසුවේ නම් එම දෙනු ලැබූ ප්‍රතිකර්ම මොනවාද කියා ඇසිය යුතුය. මෙහි ඇතුලත් ලැයිස්තුවට අනුව දී ඇති ප්‍රතිකර්ම විමසා නිවැරදි කේතයන් සියල්ල කව කරන්න. මෙහිදී පෙති හෝ සිරප් වර්ගයක් දී තිබේ නම් කේතය A ද එන්නතක් දී තිබේ නම් B ද සේලයින් සමඟ එන්නතක් දී තිබේ නම් කේත අංක C ද නිවසේ සාදා ගන්නා යමක් දුන්නේ නම් D ද වෙනත් ප්‍රතිකාරයක් ලබා දී තිබේ නම් X ද කව විය යුතුය. වෙනත් නම් එහි නම සදහන් කරන්න. 533 ට යන්න.

**ප්‍රශ්න අංක 533 - උණ තිබුණාද?**

පසු ගිය සති දෙක ඇතුලත දරුවාට උණ සමග වූ අසනීපතත්වයක් තිබුණාද කියා ඇසිය යුතුය. මෙහිදී බලාපොරොත්තු වන්නේ දරුවාට මැලේරියා හෝ නියුමෝනියාව වැනි රෝග ලක්ෂණ තිබුනාද කියා දැන ගැනීමයි. (මෙවැනි රෝග දරුවන්ට මරණය පවා ගෙන දෙන අවස්ථා ඇති බැවිනි) ඒ අනුව අදාල කේතය කව කර 534 ට යන්න.

**ප්‍රශ්න අංක 534 - කැස්ස තිබුණාද?**

පසු ගිය සති දෙක ඇතුලත දරුවාට කැස්ස වැනි අසනීප තත්වයක් තිබුණා කියා විමසා දැන ගත යුතුය. පසු ගිය සති දෙක ඇතුලත යනු සමීක්ෂණයට භාජනය වන දින සිට පසු ගිය සති 2 ක බව ඔබ මතක තබා ගත යුතුය.

නැත හෝ නොදනී නම් ප්‍රශ්න අංක 537 ට යා යුතුයි. ඔව් නම් 1 කව කර 535 ට යන්න.

**ප්‍රශ්න අංක 535 - හුස්ම ගැනීම අපහසුවුවාද?**

ප්‍රශ්න අංක 534 ඔව් යැයි සදහන් කර ඇත්නම් එම කැස්ස පැවතිකාලය තුල හුස්ම ගැනීමට තිබූ අපහසුතාවය කුමන මට්ටමකින් තිබුනාද කියා දැන ගැනීමටයි. මෙහිදී දරුවා සාමාන්‍ය ආකාරයට වඩා වැඩි වේගයකින් හුස්ම ගත්තාද කියා විමසිය යුතුය. එසේම පෙනහැලි වලට ඉතා තදින් බලපාන ලෙස හුස්ම ගැනීම අපහසු වුනිද යන්න දැන ගැනීම වැදගත් වේ. මේ අනුව සාමාන්‍ය අකාරයට වඩා වැඩි වේගයකින්ද නැත්නම් ඉතා අපහසුවෙන් හුස්ම ගත්තාද යන්න විමසා දැන ගත යුතුය. එසේ තිබුනා නම් 1 කව කර 536 ට ද නැත හෝ' නොදනී නම් 537 ට ද යන්න.

**ප්‍රශ්න අංක 536 - පපුවේ / නාසයේ හිර වීමක්ද?**

දරුවාට හුස්ම ගැනීමේ අපහසුතාවය ඇති වුයේ නාසයේ සිරවීමක්ද එසේ නැත්නම් පපුවේ අපහසුතාවයක් නිසාද කියා විමසා බැලිය යුතුය. එවිට පපුවේ සිරවීමක් පමණක් නම් කේත අංක 1 ද, නාසයේ සිරවීමක් නම් 2 ද පපුවේ සහ නාසය යන දෙකම නිසා ඇතිවුවක් නම් 3 ද කව කරන්න. වෙනත් කරුණක් නිසා හුස්ම ගැනීම අපහසු වුයේ නම් කේත අංක 6 කව කර කුමක් නිසාද කියා සදහන් කරන්න. නොදනීනම් අංක 8 කව කරන්න. අදාල කේතය කව කර 537 ට යන්න.

**ප්‍රශ්න අංක 537 - ෆිල්ටර්**

ප්‍රශ්ණ අංක 533ට අනුව අදාල දරුවාට උණ තිබුනාද බලා එම් පස කොටුවට "✓" ලකුණ යොදා 537 A ට යන්න. 533 හි නැත හෝ නොදනී නම් දකුණු පස කොටුවලට "✓" ලකුණ යොදා ඊළඟ තීරුවේ 503 ට යන්න. තවත් උපත් නැත්නම් 549 ට යන්න.

**ප්‍රශ්න අංක 537A - මව් කිරි දුන්නාද?**

දරුවාට උණ තිබුනේ නම් ඒ කාලය තුල මව් කිරි දුන් ආකාරය ගැන මෙයින් අසනු ලැබේ.

කලින්ම මව් කිරි දීම නවතා ඇත්නම් කේත 1 කව විය යුතුය. එම කාලය තුල දුන්නේ නැති නම් 2 කව විය යුතුය. උණ පැවති කාලය තුල දරුවාට මව් කිරි ලබා දුන්නේ සාමාන්‍ය ප්‍රමානණයට වඩා වැඩි යෙන්ද එසේ නැත්නම් අඩුවෙන්ද කියා විමසිය යුතුය. අදාල කේතය කව කර 538 ට යන්න.

**ප්‍රශ්න අංක 538 - බීමට දුන්නාද?**

මෙම ප්‍රශ්නයේ දී බලාපොරොත්තු වන්නේ මෙම කාලය තුල දරුවාට **මව විසින් බීමට දී** ඇති දියර ප්‍රමාණය මැන බැලීමකි. මෙහිදී සාමාන්‍ය ආකාරයට වඩා වැඩිපුර ලබා දුන්නාද එසේ නැත්නම් අඩුවෙන් ලබා දුන්නාද බොහෝ අඩුවෙන් ලබා දුන්නාද විමසා අදාල නිවැරදි කේතය ලකුණු කර 539 ට යන්න.

**ප්‍රශ්න අංක 539 - ආහාර දුන්නාද?**

ඉහත ආකාරයටම මෙම කාලය තුල **දරුවාට කැමට දුන් ප්‍රමාණය** විමසා මැන බැලීමක් සිදු කෙරේ. මෙහිදී තවම දරුවා කැම කන වයසේ නොමැති දරුවෙක් නම් කේත අංක 1 කව කල යුතුය. මෙම කාලය තුල ආහාර නවත්වා ඇත්නම් 2 ද බොහෝ අඩුවෙන් නම් 3 ද ආදී ලෙස විමසා නිවැරදි කේතය කව කරන්න. 540 ට යන්න.

**ප්‍රශ්න අංක 540 - ප්‍රතිකාර හෝ උපදෙස් ගත්තාද**

මෙම උණ කැස්ස තිබූ අවස්ථාවේ දරුවාට ප්‍රතිකාර හෝ උපදෙස් ලබා ගත්තාද කියා විමසා දැන ගත යුතුය. නැත නම් 2 කව කර ප්‍රශ්ණ අංක 547A ට යන්න. ඔව් නම් 1 කව කර 541 ට යන්න.

**ප්‍රශ්න අංක 541- ප්‍රතිකාර ලබාගත් ස්ථාන**

එසේ ප්‍රතිකාර ලබා ගත් ස්ථාන විමසා දී ඇති ස්ථානයට අනුව නිවැරදි කේතය කව කරන්න. මෙහිදී ස්ථාන කිපයක් තිබිය හැක. ඒ සියල්ලම කව කර 542 ට යන්න.

**ප්‍රශ්න අංක 542 - ෆිල්ටර්**

ප්‍රශ්න අංක 541ට අනුව අදාල කොටුවට "✓" ලකුණ යොදන්න. මෙහිදී ස්ථාන 1ක් පමණක් කව වී ඇත්නම් නිවැරදි කොටුවට "✓" ලකුණ යොදා ප්‍රශ්න අංක 544 ට යන්න. කීපයක් කව කර ඇත්නම් 543 ට යන්න.

**ප්‍රශ්න අංක 543 - ප්‍රථම ප්‍රතිකාරය**

ප්‍රථමයෙන් ප්‍රතිකාර ලබා ගත් ස්ථානයේ කේත අංකය දී ඇති කොටුවේ සදහන් කරන්න. ප්‍රශ්න අංක 541 හි සදහන් කේත අංකයම භාවිතා කරන්න. 544 ට යන්න.

**ප්‍රශ්න අංක 544 - දින කීයකට පසුද?**

අසනීප වී කොපමන දින ගනණකට පසුද ප්‍රතිකාර ලබා ගත්තේ යන්න විමසා දැන ගත යුතුය. අසනීප වු දිනයේම ප්‍රතිකාර ලබා ගත්තේ නම් "00" සදහන් කරන්න. 545 ට යන්න.

**ප්‍රශ්න අංක 545 - රුධිර පටලයක් පරීක්ෂා කරාද?**

දරුවා අසනීපව සිටිය කාලයේ දී වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීමට ගිය විටදී මැලේරියා රෝගය සදහා රුධිර පටලයක් පරීක්ෂා කරනු ලැබුවාද කියා විමසා දැන ගත යුතුය. අදාල කේතය කව කර 546 ට යන්න.

**ප්‍රශ්න අංක 546 - ඖෂධයක් ගත්තාද?**

එසේ අසනීපව සිටි කාලය තුල කුමණ හෝ ඖෂධයක් ලබා ගත්තා ද කියා විමසා දැන ගත යුතුය. නැත හෝ නොදනී යැයි පැවසුව හොත් අදාල කේතය කව කර ප්‍රශ්න අංක 547A ට යන්න. තවත් උපත් නැත්නම් 549 ට යන්න. ඔව් නම් කේත අංක 1 කව කර ප්‍රශ්න අංක 547 ට යන්න.

**ප්‍රශ්න අංක 547 - ඖෂධය කුමක්ද?**

එසේ ලබා ගත් ඖෂධය කුමක් දැයි විමසා දී ඇති ලැයිස්තුවට අනුව අදාල කේත සියල්ල කව කරන්න.

**ප්‍රශ්න අංක 547A - තවමත් උණ/ කැස්ස තිබේද?**

සමීක්ෂණයට යන කාලය තුළදී ද අසනීප තත්වය තිබේ දැයි විමසා දැන ගත යුතුය. උණ පමනක්ද නැත්නම් කැස්ස පමණක් ද එසේ නොමැති නම් ඒ දෙකම තිබේ ද කියා විමසා නිවැරදි කේත අංකය කව කර 548 ට යන්න.

**ප්‍රශ්න අංක 548 - තවත් උපත් තිබේද කියා පරීක්ෂා කරන්න.**

503 හි ඊලග තීරුවට යන්න. තවත් උපත් නැත්නම් ප්‍රශ්න අංක 549 ට යන්න.

**ප්‍රශ්න අංක 549 - ෆිල්ටර්**

2001 හෝ ඊට පසු ඉපදුන දරුවන්ගෙන් ප්‍රතිචාරක සමග ජීවත් වන දරුවන් ඇති දැයි ප්‍රශ්න අංක 215 සිට 218 පරීක්ෂා කර අදාල කොටුවේ "✔" ලකුණ යොදන්න. දරුවන් ඇත් නම් 550 ට ද නැත්නම් 552 ට ද යන්න.

**ප්‍රශ්න අංක 550 - මළ පහ වලට කුමක් කරන්නේද?**

ඇය සමග ජීවත් වන දරුවන් සිටී නම් සාමාන්‍යයෙන් දරුවා මළ පහ කල විට එම මළ පහ ඉවත් කිරීම සිදු කලේ කුමණ ආකාරයෙන් ද කියා විමසා දැන ගත යුතුය. ප්‍රතිචාරකගේ පිළිතුරු අනුව නිවැරදි කේතය කව කල යුතුය. 551 ට යන්න.

**ප්‍රශ්න අංක 551- ෆිල්ටර්**

ප්‍රශ්න අංක 528 (a) පරීක්ෂා කරන්න. එක් 528a කව කර නැත්නම් හෝ 2 හෝ 8 කව කර ඇත්නම් වම් පස කොටුවට "✔" ලකුණ යොදා ප්‍රශ්න අංක 552 ට යන්න. 1 කේතය කව කර ඇත්නම් දකුණු පස කොටුවට "✔" ලකුණ යොදා ප්‍රශ්න අංක 553 ට යන්න.

**ප්‍රශ්න අංක 552 - ජීවනී ගැන අසා ඇද්ද?**

පාචනයට ප්‍රතිකාරයක් ලෙස ජීවනී නැමැති විශේෂ පානය ගැන ඔබ කවදා හෝ අසා තිබේද කියා විමසිය යුතුය. ඒ අනුව නිවැරදි කේතය කව කරන්න. 553 ට යන්න.

**ප්‍රශ්න අංක 553 - ෆිල්ටර්**

ප්‍රශ්න අංක 215 හා 218A හි පේළි පරීක්ෂා කරන්න. ඒ අනුව 2003 හෝ ඊට පසු ඉපදුන හා ඇය සමග ජීවත් වන දරුවන් සිටී දැයි පරීක්ෂා කර අදාල කොටුවට තුල "✔" ලකුණ යොදන්න. එසේ දරුවන් නැති නම් දකුණු පස කොටුවට "✔" ලකුණ යොදා ප්‍රශ්න අංක 611 ට යන්න. දරුවන් සිටී නම් ඇය සමග ජීවත් වන බාලම දරුවාගේ නම සඳහන් කල යුතුය.

**ප්‍රශ්න අංක 554 - පෙර දින දුන් අහාර / දියර වර්ග**

ප්‍රශ්න අංක 553 හි නම සඳහන් දරුවාට පෙර දිනයේ දවස තුල සහ රාත්‍රියේ ලබා දී ඇති දියර වර්ග හා ආහාර පිළිබඳ විමසා අදාල කේත කව කරන්න.

මෙහි සීරියල් වර්ග යනුවෙන් අදහස් වන්නේ වෙළඳපලෙහි විකිණීමට ඇති ධාන්‍ය වලින් පිළියෙල කරන ලද ආහාර වර්ග වේ.

උදා: නෙස්ටම්, ත්‍රිපෝෂ, සමපොෂ

තලප/කැද යනු කුඩා දරුවන්ට සකස් කරන එළවළු, ධාන්‍ය මිශ්‍ර කර සකස් කර ගන්නා තලප බත හෝ කැද

**ප්‍රශ්න අංක 555 - වෙනත් අහාර / දියර වර්ග**

මෙම ප්‍රශ්නය ඇසිය යුත්තේ ප්‍රශ්න අංක 533 හි නම සඳහන් දරුවා ගැන හා ප්‍රතිචාරක ගැනයි. මට හා දරුවා යන දෙදෙනාම පෙර දිනයේ දවස තුල හෝ රාත්‍රියේ ලබා ගත් ආහාර පිළිබඳව විමසා දැන ගත යුතුයි. මෙහි a සිට u දක්වා ආහාර වර්ග සඳහන් කර ඇත. එක් එක් ආහාර වර්ගයට අදාලව නිවැරදි කේතය මවට හා දරුවාට වෙන වෙනම සඳහන් කල යුතුය.

**ප්‍රශ්න අංක 556 - ෆිල්ටර්**

දරුවා සඳහා ප්‍රශ්න අංක 554 හා 555 ට අනුව අඩුම තරමේ එක් කේතයක්වත් කව වී ඇත්නම් කොටුව තුල "✓" ලකුණ යොදා ප්‍රශ්න අංක 557 ට යන්න. එකක්වත් කව වී නැත්නම් අදාල කොටුව තුල "✓" ලකුණ යොදා ප්‍රශ්න අංක 611 ට යන්න.

**ප්‍රශ්න අංක 557 - වාර ගණන**

(ප්‍රශ්න අංක 533 හි සඳහන් කර ඇති නම) දරුවා පෙර දින දවල් සහ රාත්‍රියේ ලබා ගත් ආහාර වේල් ගණන කොපමණද කියා ඇසිය යුතුය. වාර ගණන 7 ට වැඩි නම් හෝ 7 ක් නම් කොටුව තුල 7 ම යොදන්න. 7 ට අඩු නම් වාර ගණන සඳහන් කරන්න. ප්‍රශ්න අංක 555 හි සඳහා ලබා දී ඇති ඝණ හෝ අර්ධ ඝණ ආහාර, වේල් කීයක් ලබා දුන්නා ද කියා විමසා දැන ගත යුතුය.

## 6.6 කොටස

### හයවන කොටස - ලිංගික හැසිරීම් රටාව

ගැබ්ගැනීමකට හේතු වන්නේ ලිංගිකව එකතු වීමයි. එනම් සාපලයතා මට්ටම හෙවත් දරුඵල හට ගැනීමේ හැකියාව සෘජුවම සංසර්ගය හා සම්බන්ධ වේ. මෙහි ඇති ලිංගිකත්වය පිළිබඳ ප්‍රශ්න වල අරමුණ ලිංගිකව එකතු වීම නිසා ප්‍රතිචාරක ගර්භනී වීමට ඇති ඉඩ කඩ නිශ්චිත කර ගැනීමයි.

දෙදෙනෙක් ලිංගිකව එකතු වීමේදී කොන්ඩම්ස් (රබර් කොපු) භාවිතයට කැමැත්තක් ඇත. කොන්ඩම්ස් (රබර් කොපු) භාවිතය මගින් ඒඩ්ස් සහ අනෙකුත් ලිංගික ආසාදිත රෝග වලින් වැලකී සිටිය හැක. මෙහිදී ප්‍රතිචාරක කොන්ඩම්ස් (රබර් කොපු) සම්බන්ධයෙන් දැනුවත් වීමද සලකා බලනු ලැබේ.

මෙහි ඇති ප්‍රශ්න වලට පිළිතුරු දීමට කාන්තාවන්ට අපහසු විය හැක. එවැනි ප්‍රශ්න ඇසීමේදී ඔබ ප්‍රශ්න ඉදිරිපත් කරන විලාසය ගැන සැලකිලිමත් වන්න. අවස්ථාවට උචිතව ප්‍රශ්නය ඉදිරිපත් කරන්න. ප්‍රතිචාරක අපහසුතාවයට පත් නොකර පිළිතුරු ලබා ගැනීමට උත්සහ කරන්න. සාමාන්‍යයෙන් එසේ ඇය අපහසුතාවයට පත් වු විට ඇගේ ප්‍රතිචාරය සිනහා වීමක් විය හැක. එවැනි අවස්ථාවක ඔබද සිනහාසුනහොත් සහ අපහසුතාවයට පත් වු බවක් ඇයට දැනුනොත් මෙම ප්‍රශ්න එතරම් වැදගත් ප්‍රශ්න නොවන ලෙස ඇය සිතීමට ඉඩ ඇත. එම නිසා ප්‍රශ්න ඇය වෙත යොමු කිරීමේදී ඔබද එම ප්‍රශ්න වැදගත් ලෙස ඉදිරිපත් කිරීමට වග බලා ගන්න.

**ප්‍රශ්න අංක 611 පෞද්ගලිකත්වය රැක ගැනීම**

ප්‍රශ්නාවලිය ඉදිරියට කර ගෙන යැමේදී ප්‍රතිචාරකගේ පිළිතුරු වල ඇති පෞද්ගලිකතාවය ආරක්ෂා කර ගත යුතුය. ඇය ආසන්නයේ හෝ ඇය දෙන පිළිතුරු අසමින් පුද්ගලයින් ළඟ සිටිදැයි විමසිලිමත් වන්න. පිළිතුරු වල රහස්‍යතාව රැක ගැනීම ඉතා අවශ්‍ය බව මතක තබා ගන්න.

**ප්‍රශ්න අංක 612 ප්‍රථම වරට ලිංගිකව එකතු වන විට වයස**

මෙහිදී විමසිය යුත්තේ ප්‍රතිචාරක ප්‍රථමයෙන්ම පුරුෂයකු සමග ලිංගිකව එක් වන විට වයසයි.

ඇය ප්‍රථම වරට ලිංගිකව එකතු වීම ඇයගේ ප්‍රථම විවාහ වු දිනයේදී හෝ ප්‍රථම වරට පුරුෂයකු සමග ජීවත් වීමට පටන්ගන්නා දිනයේදී විය හැක. එහෙත් කිසිවිටකත් ඇයගේ ප්‍රථම විවාහයේදී හෝ දීර්ඝ කාලයක් ජීවත් වීමට සිතා ප්‍රථම වරට පුරුෂයකු සමග ස්ථිරවම එකට සිටීමට පටන්ගත් දිනයේ දී ඇය ප්‍රථමයෙන් ලිංගිකව එකතු වුවා යැයි අනුමාන නොකරන්න. ඇය ප්‍රථම වරට පුරුෂයකු සමග ලිංගිකව එකතු වීම ඇයගේ ප්‍රථම විවාහයට පෙර හෝ ප්‍රථමයෙන්ම පුරුෂයකු සමග ස්ථිරවම එකට ජීවත් වීමට පටන් ගැනීමට පෙර විය හැක. ඇයට එම දිනය මතක නැති බව පැවසුවහොත් විවාහයට ප්‍රථම එය සිදු වුනාද, පසු සිදුවුනාද, ප්‍රථම දරු උපත සිදුවුයේ කවදාද ලෙස විමසා අදාල පිළිතුර ලබා ගැනීමට උත්සහ කරන්න.

**ඇය ප්‍රථම වරට ලිංගිකව එකතු වුයේ ඇයගේ විවාහයේදී හෝ ප්‍රථම වරට පුරුෂයකු සමග ස්ථිරවම ජිවත් වීමට පටන් ගත් විටදී යැයි ඇය පැවසුවේ නම් "95" කේතය කව කරන්න.** මෙවිට ඇය විවාහ වු දිනය ඇය ප්‍රථම වරට ලිංගිකව එකතු වු දිනය විය යුතුය. ඇය දුන් පිළිතුරු නිවැරදි දැයි ඇයගේ ප්‍රථම දරු උපත සිදුවු වර්ෂය සමග සසදා බැලිය හැක. ඇයට ප්‍රථම දරු උපත සිදුවන විට ඇයගේ වයස ගණනය කර ප්‍රථම වරට ලිංගිකව එක්වන විට ඇය පැවසු වයස නිවැරදි දැයි බලන්න.

ඇයගේ ප්‍රථම දරුඋපත සිදුවන විට ඇයගේ වයස ඇය ප්‍රථම වරට ලිංගිකව එක්වන විට ඇගේ වයසට වැඩි විය යුතුයි. ඇය ප්‍රථම වරට ලිංගිකව එක්වන විට ඇගේ වයස ප්‍රථම දරුඋපත සිදු වු වයසට වඩා වැඩි වුව හොත්, ඇගේ ප්‍රථම දරු උපත සිදුවු අවුරුද්දේ හෝ එසේ නැතිනම් ඇය ප්‍රථම වරට ලිංගිකව එකතු වු අවුරුද්දේ/වයසේ හෝ සමහර විට ඇගේ උපන් අවුරුද්දේ හෝ වැරදි සටහන් කිරීමක් සිදුවී ඇත. මක් නිසාද යත් සමහර අවස්ථා වල ඔබ පිළිතුර තව දුරටත් විමසා සටහන් කිරීමේදී ඇයගේ පිළිතුරු වල හෝ ඔබ සටහන් කිරීමේදී නොගැලපීම් ඇතිවිය හැක. ඒ නිසා නැවත විමසා සටහන් කරන්න.

**ඇය ප්‍රථම වරට ලිංගිකව එකතු වුයේ ඇයගේ විවාහයේදී හෝ ප්‍රථම වරට ස්ථිරවම පුරුෂයකු සමග ජිවත් වීමට පටන් ගත් විටදී යැයි ඇය පැවසුවේ නම් හැර කෙසේ හෝ ප්‍රථම වරට ලිංගිකව එකතු වීමේ දී ඇගේ වයස ලබා ගැනීමට උත්සහ කරන්න.**

### ප්‍රශ්න අංක 615 රබර් කොපු (කොන්ඩම්) භාවිතය

ප්‍රතිචාරක ප්‍රථම වරට ලිංගිකව එකතු වීමේදී ඇය හෝ සැමියා/සහකරු හෝ ඇය සමග එකතු වු පුද්ගලයා රබර් කොපු (කොන්ඩම්) භාවිතා කලේ දැයි අසා දැන ගන්න. ඇය දෙන පිළිතුරු අනුව අදාල කේතය කව කරන්න.

### ප්‍රශ්න අංක 616/617/618 ප්‍රථමයෙන් එකතු වු පුද්ගලයාගේ වයස

### ප්‍රශ්න අංක 616

ප්‍රතිචාරක ප්‍රථම වරට ලිංගිකව එකතු වු පුද්ගලයාගේ වයස මෙහිදී විමසා බලනු ලැබේ. සම්මුඛ පරීක්ෂණ දිනයේ දී සිටින සැමියා/සහකරු ප්‍රථම වරට ඇය සමග එකතු වන විට ඔහුගේ වයස නොව ප්‍රතිචාරක ප්‍රථම වරට ලිංගිකව එක් වු පුද්ගලයාගේ (කිහිප වරක් විවාහ වී හෝ පුරුෂයින් සමඟ ජිවත් වී ඇත්නම්) වයස මෙහි සඳහන් කල යුතුය. ඔහු ඇයගේ ප්‍රථම/එකම ස්වාමිපුරුෂයා හෝ දීර්ඝ කාලයක් ප්‍රථම වරට ඇය සමග ජිවත් වු ප්‍රථම/එකම පුද්ගලයා හෝ වෙනත් පුද්ගලයෙක් විය හැක. ඇය වයස සඳහන් කලහොත් දී ඇති කොටුවේ සටහන් කර අදාල යොමු වීම අනුගමනය කරන්න. වයස සඳහන් කිරීමට අපහසු වුවහොත් ප්‍රශ්න අංක 617 වෙත යොමු කරන්න.

**ප්‍රශ්න අංක 617**

ඇය සමග ප්‍රථම වරට එක් වූ පුද්ගලයාගේ වයස නොදන්නේ නම් ඇයට වඩා වයසින් අඩුද වැඩිද සම වයසද යන්න මෙහිදී විමසයි. ඒ සඳහා කේත 2,3,8 කව වුව හොත් අදාල යොමු වීම අනුගමනය කරන්න. එම පුද්ගලයා වයසින් වැඩි යයි සඳහන් කල හොත් ප්‍රශ්න අංක 618 ඇයගෙන් විමසන්න.

**ප්‍රශ්න අංක 618**

ඇය සමග ප්‍රථම වරට එක් වූ පුද්ගලයා ඇයට වඩා වයසින් වැඩි නම් ඔහු ඇයට වඩා කොපමණ වැඩිමහල් දැයි මෙහිදී විමසයි. පිළිතුර අනුව අදාල කේතය කව කරන්න.

**ප්‍රශ්න අංක 619 අවසන් වරට ලිංගිකව එකතු වීම.**

මෙම ප්‍රශ්නය සමහර ප්‍රතිචාරක කාන්තාවන් අපහසුතාවයට පත් කිරීමට ඉඩ ඇති බැවින් ප්‍රශ්න ඇසීමේදී ඉතා සෙමින් ඇයව ලජ්ජාශීලීත්වයට පත් නොවන ලෙස ඇසීම ඔබගේ වගකීම වේ. ඇයගේ ප්‍රතිචාරය ඔබ ඇයගේ විශ්වාසය දිනාගෙන සිටීමේ ප්‍රමාණය මත රඳා පවතී. මේ ප්‍රශ්න ඇසීමේදී කිසි ලෙසක සිනහා නොවී ගැඹුරු ස්වරූපයකින් ඇසීම යහපත් ප්‍රතිචාරයක් ලබා ගැනීමට ප්‍රයෝජනවත් විය හැක. අවශ්‍ය වේ නම් මේ ප්‍රශ්න වල වැදගත්කම සහ ඇයගේ පිළිතුරු සමීක්ෂණයේ සාර්ථකත්වයට ඉවහල් වන බව නැවත පහදා දෙන්න.

ඇය අවසන් වරට ලිංගිකව එකතු වූයේ කවදා දැයි විමසන්න. ඇය දෙන පිළිතුර අනුව කේතය කව කර අදාල දින/සති/මාස/අවුරුදු ගණන කොටු තුල දක්වන්න.

අවසන් එකතුවීම සතිය අවසානයේ යැයි අවිනිශ්චිත ලෙස පැවසුවහොත් සති අන්තයට පෙරද, පසුද ලෙස විමසා පිළිතුරු ලබා ගන්න. අවසන් දරු උපතෙන් පසු එකතු වූයේ නැත යැයි පැවසුවහොත් දරුවා කුස තුළ සිටින කාලයේ එකතු වී ඇත්දැයි විමසා බාල දරුවාගේ උපත (ප්‍රශ්න අංක 215) පරීක්ෂා කර ඒ ගැන සඳහන් කරමින් දිනය විමසන්න.

අවසන්වරට ලිංගිකව එකතු වූයේ මාස 12 ට අඩු කාලයකදී නම් පිළිතුර දින, සති හෝ මාස යටතේ ද, මාස 12 ට වැඩි නම් පිළිතුර අවුරුදු යටතේ කව කරන්න.

<u>සටහන</u>

එකතු වූයේ අද යයි පැවසුවහොත් 1 කවකර කොටු තුල | 0 | 0 | ලෙස දක්වන්න.

අවුරුදු ගණනකට පෙර යන කේතය කව කිරීමට ඇයගේ එකතු වීම අවම වශයෙන් අවුරුද්දකට පෙර විය යුතුයි.

**දින 7 ට අඩු නම් 1 කව කර දින ගණනද,**

**දින 7 හෝ ඊට වැඩි නම් (දින 27 දක්වා) 2 කව කර සති ගණනද,**

**සති 4 හෝ ඊට වැඩි නම් 3 කව කර මාස ගණනද** කොටුතුල සඳහන් කරන්න.

**මාස 2 1/2 නම් මාස 2** ලෙස සඳහන් කරන්න.

අවශ්‍ය විටදී ඉදිරි කොටුව තුලට '0' සටහන් කර සම්පූර්ණ කරන්න.

| |
|---|
| **ප්‍රශ්න අංක 336 සමඟ ගැලපීම -** ප්‍රශ්න අංක 619 සඳහා දෙන ලද පිළිතුර අනුව කළ වූ කේතය 3 හෝ 4 නම් ප්‍රශ්න අංක 336A හා 336B සමඟ ගලපා නිවැරදි කිරීම් කළ යුතුය. |

**ප්‍රශ්න අංක 620 ලිංගික සබඳතා පැවැත්වූ පුද්ගලයින් ගණන**

තම ජීවිත කාලය තුල මේ දක්වා ප්‍රතිචාරක ලිංගික සබඳතා පැවැත්වූ පුද්ගලයින් ගණන මෙහිදී විමසිය යුතුයි. දැනට සිටින ස්වාමිපුරුෂයා හෝ දැනට ලිංගික සබඳතා පවත්වමින් එකට ජීවත් වන පුද්ගලයාද ඇතුළුව මෙය සටහන් කල යුතුය. ඇයටම පිළිතුරු දීමට ඉඩ හරින්න. ඇය සංඛ්‍යාමය ලෙස නොදනී නම් ඇස්තමේන්තු කර නිවැරදි පිළිතුර ලබා ගැනීමට උත්සහ ගන්න. අවශ්‍ය විටදී ඉදිරි කොටුව තුලට '0' සටහන් කර සම්පූර්ණ කරන්න. එසේත් නොදනී නම් 98 කළ කරන්න.

**ප්‍රශ්න අංක 621 රබර් කොපු ලබා ගත හැකි ස්ථානයක් ගැන දැනුවත් වීම.**

මෙම ප්‍රශ්නයේ අරමුණ ඇයට රබර් කොපු අවශ්‍ය වුවහොත් ගත හැකි ස්ථානයක් ගැන ඇය දැනුවත් වී ඇත්දැයි බැලීමයි. ප්‍රශ්නය පැහැදිලිව අසන්න. මෙහි අදහස ඇය රබර් කොපු ලබා ගැනීමට අදහස් කරනවාද යන්න දැනගැනීම නොවන අතර එහෙම අවශ්‍ය වුවහොත් ලබා ගැනීමට පුලුවන් තැනක් ඇය දන්නවාදැයි විමසීමයි.

**ප්‍රශ්න අංක 622 රබර්කොපු මිළට ගත හැකි ස්ථානය**

ප්‍රශ්න අංක 621 දී ප්‍රතිචාරක රබර් කොපු මිළට ගත හැකි ස්ථාන ගැන දැනුවත් වී ඇති බව පැවසුව හොත් එම ස්ථාන මොනවාදැයි අසන්න. විශේෂයෙන්ම එය රජයේ හෝ පෞද්ගලික ස්ථානයක්ද යන්න විමසා ඒ අනුව අදාල කේතය හෝ කේත සියල්ල සටහන් කරන්න.

උදාහරණයක් හැටියට රෝහල යයි පැවසුවහොත් එය රජයේ හෝ පෞද්ගලික දැයි විමසන්න. ඇය පැවසු ස්ථානය රජයේ හෝ පෞද්ගලික ස්ථානයක් ලෙස හඳුනාගත නොහැකි නම් දී ඇති ඉඩ ප්‍රමාණයෙහි ඇය පැවසු ස්ථානය ලියා තබන්න.

**ප්‍රශ්න අංක 623 කොන්ඩම් (රබර් කොපු) අවශ්‍ය නම් ලබා ගත හැකි බව**

මෙහිදී විමසිය යුත්තේ රබර් කොපු අවශ්‍ය වුවහොත් ප්‍රතිචාරකට ලබාගත හැකිද යන්නයි. ස්ථානයක් ගැන දැනුවත් වී ඇති ඇයට එය ලබා ගත හැකිද යන්න විමසීම මෙම ප්‍රශ්නයේ අරමුණ වේ.

## 6.7 කොටස

### හත්වන කොටස - දරුවිල ගැන කැමැත්ත

මෙම කොටසින් ප්‍රතිචාරක සහ ස්වාමිපුරුෂයා/සහකරු තවත් දරුවන් පිළිබඳ කැමැත්ත, දෙදෙනාගේ උපත් පාලන භාවිතය සම්බන්ධයෙන් ඇති ආකල්ප සහ ඒවා භාවිතය, දරුවන් අතර තබා ගැනීමට කැමති පරතරය සහ පවුලේ තරම, ගැන තොරතුරු එක් රැස් කරයි. සුදුසු කාන්තාවන්ට (ප්‍රතිචාරකට) දරුවන් සිටිය හැකි මෙන්ම දරුවන් නොමැති වීමටද හැකි බැවින්, ඔවුන් වෙත ප්‍රශ්න ඉදිරිපත් කිරීමේදී අවස්ථානෝචිතව ප්‍රශ්න ඉදිරිපත් කරන්න. මෙම කොටසෙහි ප්‍රශ්න බොහොමයක මගහැර යාමේ අවස්ථා ඇති බැවින් අදාල අවස්ථා වලදී විමසිලිමත්වන්න.

**ප්‍රශ්න අංක 701 ෆිල්ටර් ( ස්ත්‍රී හෝ පුරුෂ සැත්කම අනුව වෙන් කිරීම)**

මෙහිදී ප්‍රතිචාරක හෝ ස්වාමිපුරුෂයා/සහකරු වඳ සැත්කම් කර ඇතිදැයි විමසයි. ඒ සඳහා ප්‍රශ්න අංක 311/311A නැවත බලන්න. ඒ අනුව ඔහු හෝ ඇය වඳ සැත්කම කර ඇත්නම් අදාල කොටුව තුල " ✓ " දමා ප්‍රශ්න අංක 712 වෙතද, වඳ සැත්කම කර නැත්නම් අදාල කොටුව තුල " ✓ " දමා ප්‍රශ්න අංක 702 වෙතද ප්‍රතිචාරක යොමු කරන්න.

**ප්‍රශ්න අංක 702 තවත් දරුවන් ලබා ගැනීමට ඇති කැමැත්ත.**

මෙම ප්‍රශ්නය ෆිල්ටර් ප්‍රශ්නයක හා සාමාන්‍ය සංයෝජනයකි. ප්‍රථමයෙන් ප්‍රශ්න අංක 226 බලා දැනට ඇය ගැබ් ගෙන ඇතිද නැතිද යන්න නිශ්චය කර අදාල කොටුවේ " ✓ " ලකුණ යොදන්න. " ✓ " ලකුණ යෙදූ කොටුවට අනුව අදාල ප්‍රශ්නය අසන්න.

මෙහිදී ඉදිරියේදී අවශ්‍ය දරුවන් සම්බන්ධව ප්‍රතිචාරකගෙන් විමසයි.

- <u>දරුවන් නැති, සමීක්ෂණ දිනයේදී ගැබ් ගෙන නොමැති</u> කාන්තාවක් නම් පළමු කොටුවේ " ✓ " ලකුණ දමා ඉදිරියේදී ඇය දරුවන් ලැබීමට කැමතිද, දරුවන් අවශ්‍ය නැද්ද ලෙස අසන්න.
- <u>දරුවන් ඇති, සමීක්ෂණ දිනයේදී ගැබ්ගෙන නොමැති</u> කාන්තාවක් නම් පළමු කොටුවේ " ✓ " ලකුණ දමා <u>තවත්</u> දරුවන් අවශ්‍යද, අනවශ්‍යද ලෙස විමසන්න.
- <u>ප්‍රතිචාරක සමීක්ෂණ දිනයේදී ගැබ්ගෙන ඇත්නම්</u> දෙවන කොටුවේ " ✓ "ලකුණ දමා ඉදිරියේදී ඇය තවත් දරුවන් ලැබීමට කැමතිද, දරුවන් අවශ්‍ය නැද්ද ලෙස අසන්න.

<u>සටහන</u> : සමීක්ෂණ දිනයේදී ගැබ්ගෙන ඇති ප්‍රතිචාරකගෙන් අසන්නේ දැනට **ලැබෙන්නට සිටින දරුවාගෙන් පසු** තවත් දරුවන් ලබා ගැනීමට කැමතිද නැද්ද යනු මිස, දැනට ලැබෙන්නට ඉන්න දරුවා ලැබීමට කැමතිද නැද්ද යන්න නොවන බව පැහැදිලිව මතක තබා ගන්න.

ලැබෙන පිළිතුර අනුව අදාළ කේතය කව කර එම යොමුවීම අනුගමනය කරන්න.

**ප්‍රශ්න අංක 703 දරුවෙක් ලබා ගැනීමට කැමති කාලය**

ප්‍රශ්න අංක 702 දී

- දරුවෙක් අවශ්‍ය බව හෝ තවත් දරුවෙක් අවශ්‍ය බව පැවසූ
- සමීක්ෂණ දිනයේදී ගැබ් ගත් සහ ගැබ් නොගත්

කාන්තාවන්ගෙන් කොපමණ කාලයක් දරුවකු පිළිසිඳ ගැනීමෙන් තොරව සිටීමට කැමති දැයි විමසන්න. ඇසිය යුතු ප්‍රශ්නය තීරණය කිරීමේදී, ප්‍රශ්න අංක 226 පරීක්ෂා කර දැනට ඇය ගැබ් ගෙන ඇතිද නැතිද යන්න නිශ්චය කර අදාල කොටුවේ " ✓ " ලකුණ යොදා එයට අදාල ප්‍රශ්නය අසන්න.

පිළිතුර මාස ගණනක් යැයි පැවසුවහොත් කේත අංක "1" කවකර මාස ගණන ඉදිරියේ ඇති කොටු තුල ලියා දක්වන්න. පිළිතුර අවුරුදු ගණනක් යැයි පැවසුවහොත් කේත අංක "2" කව කර අවුරුදු ගණන ඉදිරියේ ඇති කොටු තුල ලියා දක්වන්න. ඇයට දරුවෙක් වහාම අවශ්‍ය නම් කේත අංක '993' කව කරන්න. මෙයට අමතරව වෙනත් අදහසක් පැවසුවේ නම් '996' කවකර අදහස දී ඇති ඉඩෙහි ලියා දක්වන්න. කාලය ගැන නොදනී නම් '999' කව කරන්න. අවසානයේ අදාල යොමුවීම් අනුගමනය කරන්න.

**ප්‍රශ්න අංක 704 ෆිල්ටර්**

**(සමීක්ෂණ දිනයේදී ගැබ් ගෙන නැති සහ ගැබ් ගෙන ඇති කාන්තාවන් වෙන් කිරීම)**

මෙම ප්‍රශ්නය සඳහා යොමුවන්නේ

- ප්‍රශ්න අංක 702 දී (තව) දරුවෙක් අවශ්‍ය බව (කේත අංක 1) පවසා, ප්‍රශ්න අංක 703 දී කේත අංක 1 හෝ 2 කව කල, සමීක්ෂණ දිනයේදී ගැබ්ගත් සහ ගැබ් නොගත් කාන්තාවන් සහ
- ප්‍රශ්න අංක 702 දී (තව) දරුවන් අවශ්‍ය නොවන බව (කේත අංක 2) පැවසූ, සමීක්ෂණ දිනයේදී ගැබ්ගත් සහ ගැබ් නොගත්, ප්‍රශ්න අංක 703 ට යොමු නොවූ කාන්තාවන්ය.

ප්‍රශ්න අංක 226 බලා ඒ අනුව නියමිත කොටුව තුල " ✓ " ලකුණ දමා අදාල යොමු වීම අනුගමනය කරන්න.

**ප්‍රශ්න අංක 705 ෆිල්ටර් (වර්තමාන පවුල් සැලසුම් ක්‍රම භාවිතය අනුව වෙන් කිරීම)**

මෙම ප්‍රශ්නය සඳහා යොමු වන්නේ

- දරුවෙක් අවශ්‍ය බව ප්‍රශ්න අංක 702 දී පවසා, ප්‍රශ්න අංක 703 දී කේත අංක 1 හා 2 කව කල, සමීක්ෂණ දිනයේදී ගැබ් නොගත් (ප්‍රශ්න අංක 704 අනුව) කාන්තාවන්ට සහ
- ප්‍රශ්න අංක 702 දී (තවත්) දරුවන් අවශ්‍ය නැති බව පැවසූ, එනම් කේත අංක 2 කව කල, සමීක්ෂණ දිනයේදී ගැබ් නොගත් (ප්‍රශ්න අංක 704 අනුව) කාන්තාවන්ටය.

ප්‍රශ්න අංක 310 බලා දැනට පවුල් සැලසුම් ක්‍රම භාවිතා කරන සහ නොකරන කාන්තාවන් මෙහිදී වෙන් කර ගත යුතුය. දක්වා ඇති පළමු කොටුව භාවිතා කළ යුත්තේ, ප්‍රශ්න අංක 310 වෙත යොමු නොවූ කාන්තාවන්ටය. එනම් කිසිම දිනක උපත් පාලන ක්‍රම භාවිතා නොකල (ප්‍රශ්න අංක 304 අනුව) සහ වැන්දඹු/දික්කසාද/වෙන්වූ (ප්‍රශ්න අංක 307 අනුව) කාන්තාවන්ගෙන් එම ප්‍රශ්නය අසා නැත. ප්‍රශ්න අංක 310 අනුව දැනට උපත් පාලන ක්‍රම භාවිතා නොකරන ලද කාන්තාවන් සඳහා දෙවන කොටුවේද, දැනට උපත් පාලන ක්‍රම භාවිතා කරන කාන්තාවන් සඳහා තුන්වන කොටුවේද " ✓ " ලකුණ දමා අදාල යොමු වීම අනුගමනය කරන්න.

**ප්‍රශ්න අංක 706 ෆිල්ටර් (තව) දරුවන් ලැබීමට කැමති කාලය**

- (තව) <u>දරුවන් අවශ්‍ය නොවන</u> (ප්‍රශ්න අංක 702 අනුව), සමීක්ෂණ දිනයේදී ගැබ් නොගත් (ප්‍රශ්න අංක 704 අනුව), නමුත් උපත් පාලන භාවිතා නොකරන (ප්‍රශ්න අංක 705 අනුව), කාන්තාවන් සඳහා පළමු කොටුවට " ✓ " ලකුණ දැමිය යුතුය. මක් නිසාද යත් ඔවුන් ප්‍රශ්න අංක 703 ට යොමු වී නැති බැවින් එම ප්‍රශ්නය අසා නැත.
- (තව) <u>දරුවන් අවශ්‍ය</u> (ප්‍රශ්න අංක 702 අනුව), සමීක්ෂණ දිනයේදී ගැබ් නොගත් (ප්‍රශ්න අංක 704 අනුව), උපත් පාලන භාවිතා නොකරන (ප්‍රශ්න අංක 705 අනුව), කාන්තාවන්, (තව) දරුවකු අපේක්ෂා කරන්නේ අවුරුදු 2 ට වැඩි කාලයක දී නම් දෙවන කොටුවෙහි " ✓ " ලකුණ දමා අදාල යොමු වීම අනුගමනය කරන්න.
- (තව) <u>දරුවන් අවශ්‍ය</u> (ප්‍රශ්න අංක 702 අනුව), සමීක්ෂණ දිනයේදී ගැබ් නොගත් (ප්‍රශ්න අංක 704 අනුව), උපත්පාලන භාවිතා නොකරන (ප්‍රශ්න අංක 705 අනුව), කාන්තාවන්, අවුරුදු 2 කට අඩු කාලයකදී (තව) දරුවන් බලාපොරොත්තු වේ නම් ඒ අය සඳහා තෙවන කොටුවේ " ✓ " ලකුණ දමා ඔවුන් ප්‍රශ්න අංක 709 වෙත යොමු කරන්න.

**ප්‍රශ්න අංක 707 උපත් පාලන ක්‍රමයක් භාවිතා නොකිරීමට හේතුව**

| |
|---|
| මෙම ප්‍රශ්නය සඳහා යොමු වන්නේ<br>(තව) දරුවන් අවශ්‍ය (ප්‍රශ්න අංක 702 අනුව), නමුත් ඉතා ඉක්මනින් අවශ්‍ය නොවන (ප්‍රශ්න අංක 706 අනුව), සහ (තව) දරුවන් අවශ්‍ය නොවන (ප්‍රශ්න අංක 702 අනුව), සමීක්ෂණ දිනයේදී ගැබ් නොගත් (ප්‍රශ්න අංක 704 අනුව), කිසිම දිනක හෝ දැනට උපත් පාලන ක්‍රම භාවිතා නොකරන (ප්‍රශ්න අංක 705 අනුව), කාන්තාවන්ය. |

ප්‍රශ්න අංක 702 නැවත බලන්න. එහිදී ඇය <u>(තව) දරුවකු අවශ්‍ය බැව්</u> පැවසීමෙන් කේත අංක 1 කව කර ඇත්නම්, වම් පැත්තේ ඇති කොටුව තුල " ✓ " ලකුණ දමා එයට අදාල ප්‍රශ්නය ප්‍රතිචාරකගෙන් අසන්න. ප්‍රශ්න අංක 702 දී ඇය <u>(තවත් ) දරුවන් අවශ්‍ය නැති බව</u> පවසා කේත අංක 2 කව කර ඇත්නම්, දකුණු අත පැත්තේ කොටුව තුල " ✓ " ලකුණ දමා එයට අදාල ප්‍රශ්නය ප්‍රතිචාරකගෙන් අසන්න.

උපත් පාලන භාවිතා නොකිරීමට විවිධ හේතු තිබිය හැක. ඒවා ලැයිස්තුවේ ප්‍රධාන මාතෘකා කිහිපයක් යටතේ වර්ග කර ඇත. එම නිසා ප්‍රතිචාරකට ඉතා හොඳින් සවන් දෙන්න. ඇය සඳහන් කරන සියල්ල ලැයිස්තුවේ කේත සමග සසඳා සටහන් කරන්න.

පහත දැක්වෙන උපදෙස් කියවා බැලීමෙන් ඔබට කේත හඳුනා ගැනීමට පහසු වනු ඇත.

**සරුභාවය පිළිබඳ හේතූන්**

ලිංගිකව හැසිර නැත (කේත අංක A)

ඇය කොහෙත්ම ලිංගිකව ක්‍රියාකාර් නැති යැයි ඇය පැවසුවහොත් ලිංගිකව හැසිර නැත යන කේතය කව කරන්න.

කලාතුරකින් ලිංගිකව හැසිරීම (කේත අංක B)

උපත් පාලන ක්‍රමයක් භාවිතා කිරීමට තරම් ඇය ලිංගිකව ක්‍රියාකාර් නැති බව ඇය පැවසුවහොත් මෙම කේතය කව කරන්න.

ආර්තවය නැවතීම/ ගර්භාෂය ශල්‍ය කර්මයකින් ඉවත් කිරීම (කේත අංක C)

ඇයගේ ඔසප් වීම නැවති ඇති බව හෝ ගර්භාෂය සැත්කමකින් ඉවත් කල ඇතැයි ඇය පැවසුවහොත් කේත අංක 24 කව කරන්න.

දරුඵල නැති නිසා (කේත අංක D)

යම් කිසි වෙනත් හේතුවක් නිසා හෝ ඔසප්වීම අවසන් උපතේ සිට නැවත නොසැදුන නිසා ඇයට ගැබ් ගැනීමට නොහැකි බව පැවසුවහොත් කේත අංක D කව කරන්න.

පසු ප්‍රසව කාලය (කේත අංක E)

අවසන් උපතේ සිට නැවත ඔසප්වීම සිදු නොවන නිසා උපත් පාලන ක්‍රමයක් අවශ්‍ය නොවන බව ඇය පැවසුවේ නම් මෙම කේතය, කව කරන්න.

මව් කිරි දීම (කේත අංක F)

දරුවාට මව් කිරි දෙන නිසා උපත් පාලන ක්‍රමයක් භාවිතා නොකිරීම වේ.

මාරාන්තික රෝග (කේත අංක G)

නිදන්ගත හෝ මාරාන්තික රෝග වැළදී සිටීම නිසා උපත්පාලන භාවිතා නොකිරීම

**භාවිතයට විරුද්ධ වීම**

ප්‍රතිචාරක විරුද්ධ වීම (කේත අංක H)

ප්‍රතිචාරක උපත් පාලන ක්‍රම අනුගමනය කිරීමට විරුද්ධ නිසා උපත් පාලන ක්‍රම භාවිතා නොකරන බව පැවසුවහොත් කේත අංක H කව කරන්න.

සැමියා/සහකරු විරුද්ධ වීම (කේත අංක I)

ස්වාමියා හෝ සහකරු උපත් පාලන භාවිතයට විරුද්ධ ලෙස පැවසුව හොත් මෙම කේතය කව කරන්න.

වෙනත් අයගේ විරුද්ධවීම (කේත අංක J)

ස්වාමියා හෝ සහකරු නොවන වෙනත් කෙනෙකු ඇය උපත් පාලන ක්‍රම භාවිතයට විරුද්ධ යැයි පැවසුවහොත් මෙම කේතය කව කරන්න.

ආගමික ප්‍රශ්න (කේත අංක K)

ඇයගේ ආගම අනුව උපත් පාලන භාවිතා කිරීම තහනම් බව පැවසුවහොත් මෙම කේතය කව කරන්න.

**දැනුම නොමැති වීම**

සැලසුම් ක්‍රම පිළිබඳ දැනුමක් නොමැති වීම (කේත අංක L)

පවුල් සැලසුම් ක්‍රම ගැන ඇය දන්නේ නැති බව පැවසුවහොත් මෙම කේතය කව කරන්න.

තොරතුරු දැන ගැනීමට ක්‍රමයක් නොමැති වීම (කේත අංක M)

උපත් පාලන ක්‍රම ගැන තොරතුරු ලබා ගත හැකි ක්‍රමයක්/ස්ථානයක් ඇය නොදනී යයි පැවසුවහොත් මෙම කේතය කව කරන්න.

**පවුල් සැලසුම් ක්‍රම පිළිබඳ හේතූන්**

සෞඛ්‍ය හේතු (කේත අංක N)

උපත් පාලන භාවිතය සෞඛ්‍ය තත්වයට තර්ජනයක් නිසා භාවිතා නොකරයි නම් මෙම කේතය කව කරන්න.

උදාහරණ : උපත් පාලනය සඳහා පෙති භාවිතා කිරීම පියයුරු පිළිකා ඇති වීමට හේතුවක් ලෙස අසා ඇත.

අතුරු ආබාධ (කේත අංක O)

උපත් පාලන ක්‍රම භාවිතය නිසා වෙනත් අතුරු ආබාධ ඇති වේ යැයි සිතා උපත් පාලන ක්‍රම භාවිතා නොකරයි නම් මෙම කේතය කව කරන්න. මෙහිදී අතුරු ආබාධ යනු භාවිතා කරන්නාගේ සෞඛ්‍ය තත්වයට ඉතා දරුණු ලෙස බලනොපාන නමුත් භාවිතා කරන්නාට නුසුදුසු වීමට හේතුවකි.

උදාහරණ : පෙති ගැනීම නිසා රුධිර වහනය වීමක් සිදු වේ යැයි සිතීම.

ආසන්නයේ නැත/ලබාගැනීම අපහසුය (කේත අංක P)

ඇය උපත් පාලන ක්‍රමයක් ලබා ගැනීමේ ස්ථාන ආසන්නයේ නැති නිසා හෝ උපත් පාලන ක්‍රම ලබා ගැනීමේ අපහසුතා නිසා භාවිතා නොකරයි නම් මෙම කේතය කව කරන්න.

මිළ අධික බව (කේත අංක Q)

උපත් පාලන ක්‍රමයක් ලබා ගැනීම සඳහා දැරීමට වන වියදම අධික නිසා ඇය භාවිතා නොකරයි ලෙස පැවසුවහොත් මෙම කේතය කව කරන්න.

භාවිතයට අපහසු වීම (කේත අංක R)

උපත් පාලන ක්‍රම භාවිතය කරදර සහිත ලෙස ඇය සැලකීම

ශරීරයේ සාමාන්‍ය ක්‍රියා කාරීත්වයට බාධා වීම (කේත අංක S)

ප්‍රතිචාරක උපත් පාලන ක්‍රම භාවිතා නොකරන්නේ ශරීරයේ සාමාන්‍ය ක්‍රියාකාරීත්වයට බාධාවක් වේ යැයි සිතා නම් මෙම කේතය කව කරන්න.

වෙනත් (කේත අංක X)

ලැයිස්තුවේ නොමැති දෙයක් ප්‍රතිචාරක පැවසුවේ නම් X කේතය කව කර හේතුව සටහන් කරන්න.

උදාහරණ : ස්වාමියා මියගිය නිසා උපත් පාලන ක්‍රම භාවිතා නොකරයි ලෙස පැවසුවේ නම් එය වෙනත් යටතේ සටහන් කරන්න.

නොදනී නම් (කේත අංක Z)

ඇය මොනයම් හේතුවක් වත් නොදැන උපත් පාලන ක්‍රමයක් භාවිතා නොකරයි නම් මෙම කේතය කව කරන්න.

**ප්‍රශ්න අංක 708 ෆිල්ටර් ( පවුල් සැලසුම් ක්‍රම භාවිතා කිරීම/නොකිරීම)**

මෙම ප්‍රශ්නය සඳහා යොමු වන්නේ

1. දරුවන් අවශ්‍ය වන (ප්‍රශ්න අංක 702 අනුව), නමුත් ඉතා ඉක්මනින් අවශ්‍ය නොවන ( ප්‍රශ්න අංක 706 අනුව), සමීක්ෂණ දිනයේදී ගැබ් නොගත් (ප්‍රශ්න අංක 704 අනුව), කාන්තාවන්
2. තවත් දරුවන් කෙසේවත් අවශ්‍ය නොවන ( ප්‍රශ්න අංක 702 සහ 706 අනුව), සමීක්ෂණ දිනයේදී ගැබ් නොගත් (ප්‍රශ්න අංක 704 අනුව), කාන්තාවන්ය.

ඉහත අයුරු පිළිතුරු දුන් කාන්තාවන්ගේ උපත් පාලන සම්බන්ධව ප්‍රශ්න අංක 705 දීද විමසා ඇති බැවින් ඔවුන් සඳහා ප්‍රශ්න අංක 705 දී මෙන් මෙහිදීද අදාල කොටුතුල " ✓ " ලකුණ දමා යොමු වීම අනුගමනය කරන්න.

| |
|---|
| 3. ප්‍රශ්න අංක 702 දී, කේත අංක 5 කව කළ (සමීක්ෂණ දිනයේදී ගැබ් ගෙන නැති සහ අවිනිශ්චිත) කාන්තාවන්<br>4. ප්‍රශ්න අංක 703 දී කේත අංක 993, 996, 999 කව කළ කාන්තාවන් |

ඉහත අයුරු පිළිතුරු දුන් කාන්තාවන් සඳහා කේත කව කිරීමේදී, මෙහිදී දක්වා ඇති පළමු කොටුව භාවිතා කළ යුත්තේ, ප්‍රශ්න අංක 310 වෙත යොමු නොවු කාන්තාවන්ටය. එනම් කිසිම දිනක උපත් පාලන ක්‍රම භාවිතා නොකල (ප්‍රශ්න අංක 304 අනුව) සහ වැන්දඹු/දික්කසාද/වෙන්වූ (ප්‍රශ්න අංක 307 අනුව) කාන්තාවන් සඳහාය. ප්‍රශ්න අංක 310 අනුව දැනට උපත් පාලන ක්‍රම භාවිතා නොකරන ලද කාන්තාවන් සඳහා දෙවන කොටුවේද, දැනට උපත් පාලන ක්‍රම භාවිතා කරන කාන්තාවන් සඳහා තුන්වන කොටුවේද " ✓ " ලකුණ දමා අදාල යොමු වීම අනුගමනය කරන්න.

**ප්‍රශ්න අංක 709 ඉදිරියේදී උපත් පාලන ක්‍රම භාවිතයට ඇති බලාපොරොත්තුව**

| |
|---|
| මෙම ප්‍රශ්නය යොමුවන්නේ<br>1. (තව) දරුවන් අවශ්‍ය (ප්‍රශ්න අංක 702 අනුව), සමීක්ෂණ දිනයේදී ගැබ් නොගත් (ප්‍රශ්න අංක 704 අනුව), දරුවන් ඉතා ඉක්මනින් අවශ්‍ය මෙන්ම ඉතා ඉක්මනින් අවශ්‍ය නොවන (ප්‍රශ්න අංක 706 අනුව) සහ තවත් දරුවන් අවශ්‍යම නොවන (ප්‍රශ්න අංක 702 අනුව), සමීක්ෂණ දිනයේදී ගැබ් නොගත් (ප්‍රශ්න අංක 704 අනුව)<br>2. කිසිම දිනක උපත් පාලන ක්‍රම භාවිතා නොකළ (ප්‍රශ්න අංක 708) සහ වර්තමානයේ උපත් පාලන ක්‍රම භාවිතා නොකරන (ප්‍රශ්න අංක 708 අනුව)<br>3. දැනට උපත් පාලන භාවිතා කිරීම ගැන නොඅසන ලද, සම්මුඛ සමීක්ෂණ දිනයේදී ගැබ්ගෙන සිටි (ප්‍රශ්න අංක 702 අනුව)<br>කාන්තාවන් සඳහාය. |

ඉදිරියේදී ඕනෑම කාලයකදී උපත් පාලන ක්‍රමයක් භාවිතා කිරීමට බලාපොරොත්තු වන්නේදැයි දැන ගැනීම මෙහි අදහසයි. ඇය දෙන පිළිතුර අනුව අදාල කේතය කව කරන්න. අදාල යොමුවීම අනුගමනය කරන්න.

**ප්‍රශ්න අංක 710 ඉදිරි කාලයේ භාවිතා කරන ක්‍රමය**

ප්‍රශ්න අංක 709 දී කේත අංක 1 කව කළ කාන්තාවන් මෙම ප්‍රශ්නය සඳහා යොමුවේ.

ඇය දරු උපත් වැළැක්වීමට ඉදිරි කාලයේ දී ක්‍රමයක් යොදා ගැනීමට අදහස් කරන බව ප්‍රශ්න අංක 709 දී පැවසුවේ නම් එය කුමක් දැයි අසා දැනගැනීම මෙහිදී කල යුතුය. ඇය ඉදිරියේදී භාවිතා කිරීමට අදහස් කරන ක්‍රම කිහිපයක් පැවසුවේ නම් ඇය භාවිතා කිරීමට වැඩියෙන්ම කැමති ක්‍රමය විමසන්න. ඇයට එම අවස්ථාවේදී තෝරා ගැනීම අපහසු වන බව ඔබට තේරුම් ගියේ නම් ඇය සඳහන් කල ක්‍රම අනුව ලැයිස්තුවේ ඉහලින්ම ඇති ක්‍රමය කව කර අදාල යොමු වීම අනුගමනය කරන්න.

**ප්‍රශ්න අංක 711 ඉදිරි කාලයේදී උපත් පාලන ක්‍රම භාවිතා නොකිරීමට හේතු**

මේ සඳහා යොමු වන්නේ ප්‍රශ්න අංක 709 දී ඉදිරියේ දී දරු උපත් වැළැක්වීමට උපත් පාලන ක්‍රම භාවිතා නොකරන බව හෝ නොදන්නා (කේත අංක 2 හෝ 3 කව කළ) බව පැවසූ කාන්තාවන්ය.

ඉදිරියේදී උපත් පාලන ක්‍රම භාවිතා නොකිරීමට ඇය හේතු ගණනාවක් පැවසිය හැක. ප්‍රතිචාරකට සාවධානයෙන් ඇහුම් කන් දෙන්න. උපත් පාලන ක්‍රම භාවිතා නොකිරීමට ඇය සලකන ප්‍රධානතම හේතුව විමසා සටහන් කරන්න. ප්‍රතිචාරක සටහන් කරන හේතුව ලැයිස්තුවේ සටහන් කර නොමැති නම් වෙනත් යටතේ සටහන් කර එම කේතය කව කරන්න. ඇය ඉදිරියේ උපත් පාලන භාවිතා නොකිරීමට තීරණය කර ඇත්තේ ඇයි දැයි ඇයට පැවසීමට අපහසු නම් නොදනී කේතය කව කරන්න.

<u>සටහන</u>
මේ සඳහා දක්වා ඇති කේත තේරුම් ගැනීමට අපහසු නම් ප්‍රශ්න අංක 707 දී, කේත සඳහා දී ඇති උපදෙස් නැවත කියවන්න.

**ප්‍රශ්න අංක 712 අවශ්‍ය දරුවන් ගණන**

සෑම සුදුසු කාන්තාවක්ම මෙම ප්‍රශ්නය සඳහා යොමුවේ.

ප්‍රශ්න අංක 216 නැවත බලන්න. ප්‍රතිචාරකට ජීවත් වන දරුවන් ඇත්දැයි එමගින් දැන ගන්න. ඇයට ජීවත් වන දරුවන් නොමැති නම් දකුණු පැත්තේ ඇති කොටුවේ " ✓ " ලකුණ දමා එම ප්‍රශ්නය කාන්තාවගෙන් විමසන්න. දැනට ජීවත් වන එක් දරුවෙක් හෝ ප්‍රතිචාරකට සිටියි නම් වම් අත පැත්තේ ඇති කොටුවේ " ✓ " ලකුණ දමා එයට අදාල ප්‍රශ්නය කාන්තාවගෙන් විමසන්න.

ඇයට දැනටමත් ජීවත් වන දරුවන් සිටියත් කිසිම දරුවෙක් දැනට නොමැති ලෙස සිතන මෙන් ඇයට පවසන්න. අවශ්‍ය දරුවන් ගණන හරියටම තෝරා ගත හැකි නම්, ඇය දරුවන් කී දෙනෙක් බලාපොරොත්තු වනවාදැයි අසන්න. <u>ඔබ අසන්නේ තව කොපමණ දරුවන් අවශ්‍ය ද යන්න නොවන බව ඇයට පැහැදිලිව පවසන්න.</u> ඇයගේ මුළු ජීවිත කාලය තුලම (ඉදිරියද ඇතුළත්ව) ඇය බලාපොරොත්තු වන දරුවන් ගණන අසා දැන ගන්න. ඇය සංඛ්‍යාමය ලෙස පැවසුවහොත් අදාල ගණන කොටු තුල

සදහන් කරන්න. උදාහරණයක් ලෙස ඇය එය දන්නේ දෙවියන් තමයි ලෙස පැවසිය හැක. එමනිසා සැමවිටම සංඛ්‍යාමය වශයෙන් පිළිතුර ලබා ගැනීමට උත්සහ ගන්න.

ප්‍රතිචාරක වෙනත් දෙයක් සදහන් කළහොත් වෙනත් යටතේ ලියා එම කේතය කව කරන්න. ඇය දෙන පිළිතුර අනුව අදාල ප්‍රශ්න වෙත යොමු වන්න.

**ප්‍රශ්න අංක 713 දරුවන් අවශ්‍ය අකාරය**

ප්‍රශ්න අංක 712 සදහා සංඛ්‍යාත්මක අගයක් පැවසු කාන්තාවන්ගෙන් ඇය බලාපොරොත්තු වන ගැහැණු දරුවන් හා පිරිමි දරුවන් ගණන විමසන්න. ඇය බලාපොරොත්තු වන ගැහැණු දරුවන් හා පිරිමි දරුවන් ගණන වෙන් වෙන් වශයෙන් කොටුතුල සටහන් කරන්න. බලාපොරොත්තු වන ගැහැණු දරුවන් හා පිරිමි දරුවන් ගණන තීරණය කර නැති බවත්, ලැබෙන දරුවන්ගේ භේදයක් නැති බවත් පැවසුවහොත් දක්වා ඇති අවසන් කොටුවේ සටහන් කරන්න. ඇය වෙනත් පිළිතුරක් සදහන් කලහොත් '96' කව කර දක්වා ඇති ඉඩෙහි එය සටහන් කරන්න.

උදා :

- ප්‍රශ්න අංක 712 දී ප්‍රතිචාරක අවශ්‍ය දරුවන් ගණන 6 ක් යැයි පැවසුවේ යැයි සිතන්න. ඇයට ගැහැණු දරුවන් දෙදෙනෙක්ද, පිරිමි දරුවන් දෙදෙනෙක් ද, භේදයක් නැතිව දරුවන් දෙදෙනෙක්ද අවශ්‍ය නම් සටහන් කල යුත්තේ | 0 | 2 | 0 | 2 | 0 | 2 | ලෙසය.
- ප්‍රශ්න අංක 712 දී ඇය අවශ්‍ය දරුවන් ගණන දෙදෙනෙක් යැයි පවසා ඇයට අවශ්‍ය පිරිමි දරුවන් දෙදෙනෙක් යැයි මෙහිදී පැවසුවහොත් සටහන් විය යුත්තේ | 0 | 2 | 0 | 0 | 0 | 0 | ලෙසය.
- ප්‍රශ්න අංක 712 දී ඇය දරුවන් තුන්දෙනෙකු අවශ්‍ය බව පවසා පිරිමි දරුවෙක් අත්‍යවශ්‍ය සහ අනෙක් දෙදෙනා තීරණයක් නැත ලෙස පැවසුවහොත් සටහන් කල යුත්තේ | 0 | 1 | 0 | 0 | 0 | 2 | ලෙසය.

මෙහිදී ඇය පවසන පිළිතුරෙහි එකතුව එනම් කොටු තුනෙහි එකතුව ප්‍රශ්න අංක 712 සදහා දුන් පිළිතුරට සමාන විය යුතුය. පිළිතුර ගැලපුනේ නැති නම් නැවත විමසා නිවැරදි කරන්න.

**ප්‍රශ්න අංක 714 ජනමාධ්‍ය මගින් ලබා දෙන උපත් පාලන ක්‍රම ගැන දැනුවත් වීම**

මෙහිදී ප්‍රතිචාරක පසු ගිය මාස කිහිපය තුල මාධ්‍ය මගින් පවුල් සැලසුම් ක්‍රම ගැන දැනුවත් වී ඇති දැයි විමසා බලයි. ප්‍රශ්නය ඇය වෙත යොමු කර ගුවන් විදුලියෙන්, රූපවාහිනියෙන්, පුවත්පත් හෝ සගරා මගින් අසා තිබෙනවාදැයි විමසන්න. මාධ්‍ය තුන සදහාම '1' හෝ '2' අනිවාර්‍යයෙන්ම කව විය යුතුය.

**ප්‍රශ්න අංක 715 විවාහකත්වය අනුව වර්ගීකරණය**

ප්‍රශ්න අංක 114 නැවත බලන්න. ඒ අනුව දැනට විවාහක හෝ පුරුෂයකු සමග ජීවත්වන හෝ විවාහක සම්බන්ධයක් නොමැති/තනිව ජීවත්වන ලෙස වෙන් කරන්න. අදාල කොටුව තුල " ✓ " ලකුණ දමා ඒවාට අදාල යොමුවීම් අනුගමනය කරන්න.

**ප්‍රශ්න අංක 716 භාවිතා කරන පවුල් සැලසුම් ක්‍රමය අනුව වර්ගීකරණය**

ප්‍රශ්න ප්‍රශ්න අංක 311 හා 311(A) නැවත බලන්න. විවාහක හෝ පුරුෂයකු සමග ජීවත් වන කාන්තාවන් පුරුෂ සැත්කම, රබර් කොපු හෝ ධාතු බැහැරලීම පවුල් සැලසුම් ක්‍රම ලෙස වර්තමානයේ භාවිතා නොකරයි නම් පමනක් (එනම් 311 හා 311(A) හි B, G හෝ K කව වී නොමැති අතර වෙනත් කේත කව වී ඇත.) පළමු කොටුවේ " ✓ " ලකුණ දමා ප්‍රශ්න අංක 717 වෙත යොමු කරන්න.

ප්‍රශ්න අංක 311 හා 311(A) හි B හෝ G හෝ K කව වී ඇත්නම් එනම් වර්තමානයේදී භාවිතා කරන උපත් පාලන ක්‍රම වන්නේ , පුරුෂ සැත්කම, රබර් කොපු සහ ධාතු බැහැරලීම නම් ප්‍රශ්න අංක 718 වෙතද, ප්‍රශ්න අංක 311හා 311A හි කේත කිසිවක් කව කර නොමැති නම් එනම් දැනට උපත් පාලන ක්‍රම භාවිතා නොකරයි නම් ප්‍රශ්න අංක 719 වෙතද යොමු කරන්න.

**ප්‍රශ්න අංක 717 කාන්තාව උපත් පාලන ක්‍රම භාවිතා කිරම ගැන ස්වාමිපුරුෂයා/සහකරු දැනුවත් වීම**

සමහර කාන්තාවන් තම ස්වාමිපුරුෂයා සහකරුගේ අනුදැනුමෙන් තොරව උපත් පාලන ක්‍රම භාවිතා කරයි. ඇය දෙන ප්‍රතිචාර වලට ඇහුම්කන් දෙන කිසිවෙක් ලග සිටී නම් මෙම ප්‍රශ්නය විමසීම ගැන කල්පනාකාරවන්න. කෙසේ වෙතත් මෙම ප්‍රශ්නය ඇසීමේදී අසා සිටින පුද්ගලයින් ඉවත් කර හෝ ප්‍රතිචාරක වෙනත් ස්ථානයකට ගෙන හෝ ප්‍රශ්නය විමසා පෞද්ගලිකතාව රැක ගැනීම ඉතා වැදගත්ය. ඇය දෙන පිළිතුර අනුව අදාල කේතය කව කරන්න.

**ප්‍රශ්න අංක 718 ස්ත්‍රී/පුරුෂ සැත්කම අනුව වෙන් කිරීම**

ප්‍රශ්න අංක 311 හා 311(A) නැවත බලන්න. ඇය හෝ ඔහු ස්ත්‍රී හෝ පුරුෂ සැත්කම කර නැත්නම් පළමු කොටුවේ " ✓ " ලකුණ දමා ප්‍රශ්න අංක 719 වෙතද, ස්ත්‍රී හෝ පුරුෂ සැත්කම කර ඇත්නම් දෙවන කොටුවේ " ✓ " ලකුණ දමා 8 කොටසේ ප්‍රශ්න අංක 1 වෙත යොමු කරන්න.

**ප්‍රශ්න අංක 719 ස්වාමිපුරුෂයා/ සහකරු සහ බිරිද (ප්‍රතිචාරක) ගේ දරුවන් සදහා වන කැමැත්ත**

මෙහිදී ප්‍රතිචාරකගේ ස්වාමිපුරුෂයා හො සහකරු/එකට ජීවත් වන පුද්ගලයා ගේ දරුවන් පිළිබද කැමැත්ත, ප්‍රතිචාරකගේ කැමැත්ත සමහ ගැලපේ ද (සමානද) යන්න විමසා බලයි. ප්‍රතිචාර ලබා ගැනීමට පෙර ප්‍රශ්නය සම්පූර්ණයෙන් ඇයට පවසන්න.

## 6.8 කොටස

### අටවන කොටස - සැමියාගේ පසුබිම, රැකියාව හා ප්‍රතිචාරකගේ රැකියාව පිළිබඳ තොරතුරු

මෙම කොටසින් සැමියාගේ පසුබිම හා රැකියාව ගැනත් ප්‍රතිචාරකගේ රැකියාව ගැනත් තොරතුරු එකතු කරනු ලැබේ. ඇතැම් විට විවාහ කීපයක් හෝ ස්වාමි පුරුෂයන් කිපදෙනෙක් සිටියේ නම් වර්තමාන ස්වාමිපුරුෂයාගේ හෝ අවසාන සහකරුගේ තොරතුරු මෙහි ඇතුලත් කල යුතුය. තවද ඇය දික්කසාද හෝ වෙන්ව සිටී නම් හෝ සැමියා මිය ගොස් නම් එම අවසන් වරට සිටි හෝ සැමියා ගැන තොරතුරු ලබා ගන්න. එවැනි කාන්තාවන් සඳහා 803 ට යන්න.

**ප්‍රශ්න අංක 801 ෆිල්ටර්**

ප්‍රතිචාරක සමග සාකච්ඡාවෙන් පසු ඇය දැනට සැමියෙක් හෝ වෙනත් පුරුෂයකු සමග එකට ජීවත් වේ නම් අදාල කොටුවෙහි (වම් පස) " ✓ " ලකුණ යොදා 802 ට යන්න. තොරතුරු ගන්න. කලින් විවාහ වී සිට හෝ කවදා හෝ පුරුෂයකු සමග එකට ජීවත් වුවත් දැන් වැන්දඹු හෝ දික්කසාද හෝ වෙන්ව ජීවත් වන කාන්තාවක් නම් අදාල කොටුවේ " ✓ " ලකුණ යොදා 803 ට යොමුවන්න.

**ප්‍රශ්න අංක 802 ස්වාමිපුරුෂයා / සහකරුගේ වයස**

අවසාන උපන් දිනට ඇගේ ස්වාමිපුරුෂයාගේ හෝ සහකරුගේ වයස, සම්පූර්ණ වූ අවුරුදු ගණන සඳහන් කරන්න.

**ප්‍රශ්න අංක 803 ස්වාමිපුරුෂයා / සහකරු පාසැල් ගොස් තිබේද?**

ස්වාමිපුරුෂයා / සහකරු පාසැල් ගොස් තිබේද කියා විමසා අදාල කේතය කව කරන්න. නැත නම් කේත 2 කව කර ප්‍රශ්න අංක 806 ට යන්න. ඔව් නම් 1 කව කර 804 ට යන්න.

**ප්‍රශ්න අංක 804 ස්වාමිපුරුෂයා / සහකරුගේ අධ්‍යාපන තත්වය**

ස්වාමිපුරුෂයා / සහකරු සමත් වූ ඉහලම අධ්‍යාපන තත්වය සඳහන් කල යුතුය. 1, 2, 3, 4, හා5 ශ්‍රේණි සමත් වුයේ නම් **ප්‍රාථමිකද** 6, 7, 8, 9 සහ 10 ශ්‍රේණි සමත් වුයේ නම් **ද්විතීයිකද** අ.පො.ස (සා.පෙ) හෝ උ.පෙළ සමත් නම් **උසස්** ලෙසද සලකනු ලැබේ. උපාධිය හෝ ඊට ඉහළ පශ්චාත් උපාධි ඩිප්ලෝමා වැනි විභාග සමත් වූ අයෙක් නම් 4 කව කර ප්‍රශ්න අංක 806 ට යන්න. ප්‍ර. 14 හි නොදනී (19) හෝ පෙර පාසල් (88) නම් 8 කව කර ප්‍ර. 806 ට යන්න. ප්‍ර. 804 සඳහා 1, 2, 3 කව කර ඇත්නම් ප්‍ර. 805 ට යන්න.

**ප්‍රශ්න අංක 805 ස්වාමිපුරුෂයා / සහකරු සමත් වූ ඉහලම ශ්‍රේණිය**

ප්‍රශ්න අංක 804 හි කේත 1, 2 හෝ 3 කව කර ඇත්නම් සමත් වූ ඉහලම ශ්‍රේණිය සඳහන් කල යුතුය. මෙහිදී ගෘහ කාණ්ඩ තොරතුරු වල A කොටසේ 14 තීරුව සඳහා දක්වා ඇති කේත අංකම භාවිතා කරන්න.

**ප්‍රශ්න අංක 806 ෆිල්ටර්**

ප්‍රශ්න අංක 801 බලන්න. ඒ අනුව අදාල කොටුව තුල " ✓ " ලකුණ යොදන්න. ඉන් පසු ස්වාමිපුරුෂයා / සහකරු ( වර්තමාන) රැකියාව කුමක්දැයි විමසා ඉදිරිපසින් ඇති ඉරමත එය සදහන් කරන්න. රැකියා කිහිපයක් කරයි නම් වැඩි කාලයක් නිරත වන රැකියාව සදහන් කරන්න. (මෙහිදී රැකියා ස්ථානය නොව ඔහු නිරත වන රැකියාව විස්තරාත්මකව සදහන් කල යුතුය.) දී ඇති කොටු 2 හිස්ව තබන්න. 807 ප්‍රශ්නයට යන්න.

**ප්‍රශ්න අංක 807 ප්‍රතිචාරකගේ රැකියා තත්වය**

**පසුගිය දින 7 තුල** ගෙදර දොර කටයුතුවලට අමතරව ප්‍රතිචාරක කාන්තාව වෙනත් රැකියාවක් හෝ ආර්ථික කටයුත්තක යෙදී සිටියාද කියා විමසිය යුතුය. එවිට ඔව් යැයි පැවසුව හොත් 1 කව කර ප්‍රශ්න අංක 811ට යන්න. නැත යැයි පැවසුව හොත් 2 කව කර ප්‍රශ්න අංක 808 ට යන්න. මීට මාස කිහිපයකට පෙර රැකියාවක් කර තිබුණත් දැනට ඇය රැකියාවක් නොකරයි නම් 2 කව කරන්න.

**ප්‍රශ්න අංක 808 ද්‍රව්‍යමය හෝ මුදලින් අදායමක් ඉපයීම**

පැහැදිලිව වැටුප් ලැබෙන රැකියාවක නිරත නොවුවත් බොහෝ කාන්තාවන් ද්‍රව්‍යමය හෝ මුදලින් කිසියම් අදායමක් ඉපයීම කරනු ලබයි ඇතැම් විට සුළු ව්‍යාපාරයක නිරත වීම හෝ පවුලේ කෘෂිකාර්මික කටයුත්තක නිරත වීම හෝ වැටුප් නොලබා පවුලේ ආර්ථික කටයුතු වල නිරත වන අවස්ථා ඇත. **පසුගිය දින 7** තුල ඇය එවැනි කටයුත්තක නිරත වුනිද කියා විමසා දැන ගත යුතුය. එසේ ඔව් යැයි පැවසුව හොත් 1 කව කර ප්‍රශ්න අංක 811 ට යන්න. නැත නම් 2 කව කර ප්‍රශ්න අංක 809 ට යන්න.

**ප්‍රශ්න අංක 809 පසු ගිය දින 7 තුල නිරත නොවුවත් යෙදීමට රැකියාවක් තිබුනාද / ආර්ථික කටයුත්තක් තිබුණේද?**

807 හෝ 808 න් කාන්තාව රැකියාවක් හෝ ආර්ථික කටයුත්තක යෙදෙනු බව හදුනා ගැනීමට නොහැකි වු නිසා මෙම ප්‍රශ්නයෙන් ඇසීමට බලාපොරොත්තු වන්නේ පසු ගිය දින 7 තුල ඇය තාවකාලිකව නිවාඩු ලබා සිටියත් සාමාන්‍යයෙන් රැකියාවක නිරත වන අයෙක් දැයි දැන ගැනීමයි. එසේ යෙදෙන අයෙක් නම් 1 කව කර 811 ට ද නැත නම් 810 ට ද යන්න.

**ප්‍රශ්න අංක 810 පසු ගිය මාස 12 තුල රැකියාවක යෙදුනාද?**

ඉහත ප්‍රශ්නාවලිය දැනට රැකියාවක් නොකරන කාන්තාවන් බව හදුනා ගැනේ. නමුත් **පසුගිය මාස 12 තුල** ඇය කුමන හෝ රැකියාවක යෙදී සිටියාද කියා විමසා ඔව් නම් 1 කව කර 811 ට යන්න. නැත්නම් 2 කව කර ප්‍රශ්න අංක 818 ට යා යුතුයි.

**ප්‍රශ්න අංක 811 ප්‍රධාන රැකියාව**

ප්‍රධාන වශයෙන් යෙදී සිටින රැකියාව යනුවෙන් අදහස් කරන්නේ වැඩි කාලයක් නිරත වන රැකියාවයි. ඔබ ප්‍රධාන වශයෙන් යෙදී සිටින ආර්ථික කටයුත්ත / රැකියාව විමසා ඉදිරියෙන් දී ඇති ඉරමත සඳහන් කරන්න. දී ඇති කොටු හිස්ව තබන්න. 812 ට යන්න. ප්‍රතිචාරක වැටුප් ලබන සේවකයෙක්, ස්වයංරැකියාවක් හෝ සේවායෝජකයෙක් ලෙස හෝ වැටුප් නොලබා පවුලේ වැඩ කරන්නෙක් යන කුමන අයුරින් හෝ වැඩෙහි යෙදී ඇත්නම් එම කටයුක්ත පැහැදිලිව විස්තර කරන්න.

**ප්‍රශ්න අංක 812 ෆිල්ටර්**

ප්‍රශ්න අංක 811 බලන්න. යෙදී සිටින ආර්ථික කටයුත්ත කෘෂිකාර්මික කටයුත්තක්ද ? නැද්ද ? හොඳින් විමසා අදාල කොටුව තුල " ✓ " ලකුණ යොදන්න. කෘෂිකර්මික රැකියාවක යෙදේ නම් එම " ✓ " ලකුණ යොදා 813 ට යන්න. එසේ නොවන්නේ නම් අදාල කොටුවට " ✓ " ලකුණ යොදා 814 ට යන්න.

**ප්‍රශ්න අංක 813 ආර්ථික කටයුක්ත පිහිටි ස්ථානය අයත් ඉඩම**

ප්‍රශ්න අංක 811 හි සඳහන් ඕනෑ ආකාරයකින් ප්‍රතිචාරක කෘෂිකාර්මික කටයුක්තක නිරත වේ නම් ඇය ප්‍රධාන වශයෙන් වැඩ කරන්නේ ඇයට අයත් , ඇයගේ ස්වාමිපුරුෂයාට අයත් හෝ ඇයගේ දරුවන්ට අයත් ඉඩමක නම් තමාගේ ඉඩම යයි සලකා 1 කව කල යුතුය.

ප්‍රතිචාරකගේ ඥාතීන්ට අයත් හෝ ඇයගේ ස්වාමියාගේ ඥාතීන්ට අයත් ඉඩමක් නම් පවුලේ ඉඩම ලෙස සලකා 2 කව කරන්න. කුලියට ගත් ගොවිපලක් හෝ කුලියට ගත් කෘෂිකාර්මික ඉඩමක ආර්ථික කටයුක්ත සිදු කරයි නම් කේත අංක 3 කව කරන්න. කම්කරුවෙකු ලෙසින් හෝ වෙනත් කෙනෙකුට අයත් ඉඩමක කෘෂිකාර්මික කටයුතු සිදු කරයි නම් කේත අංක 4 කව කරන්න. ප්‍රශ්න අංක 815 ට යන්න.

**ප්‍රශ්න අංක 814 අයිතිය**

මෙහිදී කෘෂිකාර්මික නොවන රැකියාවක යෙදෙන ප්‍රතිචාරකගේ ප්‍රධාන ආර්ථික කටයුත්ත / රැකියාව කරන ස්ථානය පිළිබඳ අයිතිය විමසා දැන ගත යුතුය. මෙහිදී ස්වාමියාට හෝ පියාට හෝ පවුලේ සාමාජිකයකුට අයත් ආර්ථික කටයුත්තේ ප්‍රතිචාරක රැකියාවේ මුදලින් හෝ ද්‍රව්‍යමය ආදායමක් ලබා හෝ නොලබා යෙදී සිටී නම් එම ස්ථානය පවුලේ සාමාජිකයෙකුට අයත් යනුවෙන් 1 කේතය කව කරන්න.

ප්‍රතිචාරක වෙනත් කෙනෙකු යටතේ රැකියාවක නිරත වේ නම් හෝ රජයට අයත් ස්ථානයක් නම් එම ස්ථානය 2 කේතය කව කරන්න. ඇතැම් විට ඇයගේ ආර්ථික කටයුත්තට වැටුප් නොලබා ස්වාමියා උදව් කරන අවස්ථා ඇත. එසේත් නැති නම් ප්‍රතිචාරක තමාගේ වැඩ කටයුතු වල තනියම නිරත වේ නම්, එනම් තමන්ගේ කටයුත්තක යෙදී සිටින්නේ නම් ඒ අය සඳහා කේත අංක 3 කව කරන්න. ප්‍ර. අ. 815 ට යන්න.

**ප්‍රශ්න අංක 815 වැඩෙහි යෙදෙන්නේ නිවසේද?**

ප්‍රතිචාරක සාමාන්‍යයෙන් වැඩෙහි යෙදෙන්නේ නිවසේ නැත්නම් වෙනත් ස්ථානයක දැයි විමසා අදාල කේතය කව කරන්න. කෘෂිකාර්මික කටයුතු සිදු කරන අවස්ථා වල ගෙවත්තෙන් පිටත කුඹුරක හෝ ගොවිපලක වැඩ කරන අය සඳහා වෙනත් ස්ථානයක යැයි සැලකිය යුතුය. නිවස ආසන්නයේම හෝ ගෙවත්ත තුල කෘෂිකාර්මික කටයුතු හෝ වෙනත් කටයුත්තක නිරත වේ නම් නිවසේ යැයි සැලකිය යුතුය. ප්‍ර. අ. 816 ට යන්න.

**ප්‍රශ්න අංක 816 වැඩ කරන කාලය**

ඇය සාමාන්‍යයෙන් වැඩ කරන්නේ මුළු අවුරුද්දේමද නැත්නම් කිසියම් විශේෂ වූ කාල පරාසයක ද අවුරුද්දේ මාස කිහිපයක් පමණක්ද කියා විමසා දැන ගත යුතුය. ඒ අනුව අදාල කේතය කව කල යුතුය. ඉඳ හිට වැටුප් නොලබා පවුලේ වැඩ කිරීම හෝ වෙනත් ආර්ථික කටයුත්තක යෙදෙන්නේ නම් කේත අංක 3 කව කරන්න. ප්‍ර.අ. 817 ට යන්න.

**ප්‍රශ්න අංක 817 ආදායම ලැබෙන ආකාරය**

ඇයගේ ආර්ථික කටයුත්ත / රැකියාව සඳහා ගෙවීම් කරනු ලබන්නේ මුදලින්ද නැත්නම් ද්‍රව්‍ය වලින්ද එසේත් නැතිනම් වැටුප් නොලබා වැඩ කරන්නේ ද යන්න විමසා අදාල කේතය කව කරන්න.ප්‍ර. අ. 818 ට යන්න.

**ප්‍රශ්න අංක 818 ෆිල්ටර්**

ප්‍රශ්න අංක 114 බලන්න. දැනට විවාහක/පුරුෂයෙක් සමග ජීවත් වේ නම් අදාල කෙටුවට " ✓ " ලකුණ යොදා 819 ට යන්න. එසේ නැති නම් " ✓ " ලකුණ යොදා 827 ට යන්න.

**ප්‍රශ්න අංක 819 ෆිල්ටර්**

ප්‍රශ්න අංක 817 බලන්න. එහි කේත අංක 1 හෝ 2 කව කර ඇත්නම් අදාල කොටුවේ " ✓ " ලකුණ යොදා ප්‍රශ්න අංක 820 ට යන්න. ප්‍රශ්න අංක 817 හි කේත අංක 3 හෝ 4 කවකර ඇත්නම් හෝ ප්‍රශ්න අංක 810 හි 2 කව වී ඇත්නම් " ✓ " ලකුණ යොදා ප්‍රශ්න අංක 822 ට යන්න.

**ප්‍රශ්න අංක 820 මුදල් පරිහරණය**

ප්‍රතිචාරක උපයාගත් මුදල් පරිහරණය කිරීම සිදුකරනුයේ කාගේ අදහස අනුවද කියා විමසා දැන ගත යුතුයි. පිළිතුරු අනුව පිළිතුර නිවැරදිව කේතය කව කල යුතුය. 821 ට යන්න.

**ප්‍රශ්න අංක 821 උපයන මුදල සැසඳීම**

ප්‍රතිචාරක උපයා ගන්නා මුදල ඇයගේ ස්වාමියා / සහකරු උපයන මුදලට වඩා වැඩිද නැත්නම් අඩු ද සමානද යන්න විමසා අදාල කේතය කව කරන්න. ප්‍ර.අ. 822 ට යන්න.

**ප්‍රශ්න අංක 822 මුදල් පරිහරණය පිළිබඳ තීරණ ගන්නේ කවුද?**

ඔබගේ ස්වාමියා / සහකරු උපයාගත් මුදල පරිහරණය කිරීම පිළිබඳ තීරණ ගත්තේ කවුරුන් දැයි විමසිය යුතුය. ඇතැම් විට නැන්දම්මා හෝ වෙනත් කෙනෙකු එම මුදල් පිළිබඳ තීරන ගන්නා තැනැත්තා විය හැක. එබැවින් අවස්ථාවක වෙනත් යැයි කේත අංක 6 කව කරන්න. නිවැරදි කේතය කව කල පසු ප්‍ර.අ. 823 ට යන්න.

**ප්‍රශ්න අංක 823 සිට 826 අසා ඇති කරුනු පිළිබඳ තීරණ ගන්නා තැනැත්තා කවුරුද?**

මෙහි අසා ඇති ප්‍රශ්න සඳහා පිළිතුරු වලට අදාල කේත අංක ඉහලින් පෙන්වා ඇත. ගෘහ ඒකකයේ විවිධ කරුණු සඳහා තීරණ ගැනීමේ අයිතිය කාටද යන්න විමසා බැලීමක් මෙහිදදී සිදු කෙරේ. ඒ අනුව එකින් එක මෙම ප්‍රශ්න කියවා එයට අදාල පිළිතුරු වලට අනුව කේත අංකය කව කරන්න. ඇය තනියම එම තීරණ ගනිනම් 1 ස්වාමිපුරුෂයා / සහකරු එම තීරණ ගනී නම් 2 ද, ප්‍රතිචාරක හා ස්වාමිපුරුෂයා යන දෙදෙනා නම් 3 ද නැන්දම්මා හෝ පවුලේ වැඩිහිටියකු හෝ වෙනත් කෙනෙකු නම් 4 ද කව කරන්න. ප්‍රශ්න අංක 827 ට යන්න.

**ප්‍රශ්න අංක 827 ප්‍රතිචාරක ලග සිටින අය**

මෙම ප්‍රශ්නා වලිය අසන අවස්ථාවේ ප්‍රතිචාරක ලග සිටි අය කවුරුන් දැයි ඔබ සටහන් කල යුතුය. මෙහිදී ඇහුම් කන් දී හෝ නොදී සිටි අය සඳහන් කල යුතුය. කිසිවෙක් නොසිටියේ නම් කේත 8 කව කරන්න. ඉන් පසු ප්‍රශ්න අංක 828 ට යන්න.

**ප්‍රශ්න අංක 828 ස්වාමිපුරුෂයාකෝපයට පත් වීම සාධාරණද?**

ඇතැම් විට බිරිද කරන කියන දේ ගැන ස්වාමිපුරුෂයාට තරහා යන අවස්ථා ඔබ දැක ඇති යැයි පවසා නමුත් කෝප වන අවස්ථාවලදී සමහර ස්වාමිපුරුෂයන් බිරිදට ශාරීරික හිංසා සිදු කිරීම් කරනු ඇත. එවැනි අවස්ථා පිළිබඳ අදහස් විමසීමක් මෙමගින් සිදු කෙරේ. මෙහි පහත සඳහන් කර ඇති එක් එක් අවස්ථා වලදී බිරිදට තම ස්වාමියා/සහකරු විසින් ශාරීරික හිංසා කිරීම සාධාරණද නැද්ද එසේ නැති නම් නොදනිද කියා විමසිය යුතුය. මෙහිදී එක් ප්‍රශ්නයක් අසා එයට ඇයගෙන් පිළිතුරක් ලැබෙන තුරු අනෙක් ප්‍රශ්න ඉදිරිපත් නොකරන්න. එම ප්‍රශ්නය ඇයට අපැහැදිලි නම් නැවත වරක් කියවන්න. එක් එක් ප්‍රශ්නය වෙන වෙනම අසා ඇයගේ පිළිතුරට අනුව කේතය කව කරන්න.

## 6.9 කොටස

### නවවන කොටස - ඒඩ්ස් රෝගය සහ වෙනත් ලිංගික රෝග පිළිබඳ දැනුම

HIV වෛරසය මගින් වැළදෙන ඒඩ්ස් රෝගය පුද්ගලයාගේ ප්‍රතිශක්තිය දුර්වල කර මරණය ළඟා කරවීමට හේතුවන්නකි. මෙය ලිංගික ඇසුර මගින්ද ආසාධිතයන්ගේ රුධිරය මගින්ද වැළදිය හැකි රෝගයකි. මෙම කොටසින් අසන ප්‍රශ්න මගින් මෙම රෝගය හා රෝගය වැලැක්වීම පිළිබඳ ප්‍රතිචාරක කාන්තාව සතු දැනුම පරීක්ෂාවට ලක් කෙරේ.

**ප්‍රශ්න අංක 901** **ඒඩ්ස් ගැන අසා තිබේද ?**

අසා තිබේදැයි දැනගෙන අදාල කේතය කව කරන්න. ඒ පිළිබඳ අසා නැත්නම් 942 ට යන්න.

**ප්‍රශ්න අංක 902 සිට ප්‍රශ්න අංක 907 දක්වා අසා ඇති ප්‍රශ්න ආකාර 2 කට වර්ග කළ හැක.**

902/903/904 ප්‍රශ්න අසනු ලබන්නේ ඒඩ්ස් රෝගය බෝවීමෙන් වැලැක්වීමට හැසිරිය යුතු ආකාරය පිළිබඳ දැනුමක් තිබේදැයි දැන ගැනීමයි. මහජනයා දැනුවත් කිරීමේ වැඩ සටහන් මගින් එක් සහකරුවකු/සහකාරියක් පමණක් ඇසුරු කිරීම, කොන්ඩම් භාවිතය, ලිංගික හැසිරීමෙන් වැළකීසිටීම වැනි ඒඩ්ස් සෑදීම වලක්වන ක්‍රම පිළිබඳ දැනුවත් වී තිබේදැයි ඉහත ප්‍රශ්න 3 න් විමසා බලනු ලැබේ.

ප්‍රශ්න අංක 905, 906, 907 මගින් ඒඩ්ස් රෝගය බෝවීම පිළිබඳ ඇති මිථ්‍යා විශ්වාසය විමසු ලැබේ.

**ප්‍රශ්න අංක 908, 909** රුධිරය මගින් බෝවිය හැකිදැයි විමසනු ලැබේ. අදාල කේත කව කරන්න.

**ප්‍රශ්න අංක 910** **සෞඛ්‍ය සම්පන්න පෙනුමැති පුද්ගලයකුට ඒඩ්ස් තිබිය හැකිද ?**

අදාල කේත කව කරන්න.

**ප්‍රශ්න අංක 911** **මවගෙන් දරුවාට ඒඩ්ස් බෝවිය හැකිද ?**

ගර්භනී අවස්ථාවේදී හෝ දරු ප්‍රසූතියේදී හෝ මව් කිරි දෙන අවස්ථාව යන අවස්ථා 3දී ඒඩ්ස් රෝගය සැදුණු මවකගෙන් දරුවාට බෝවිය හැකිද යන්න මෙයින් අසනු ලැබේ. අවස්ථා 3 වෙන වෙනම අසා අදාල කේතයක් කව කරන්න.

**ප්‍රශ්න අංක 912** **ෆිල්ටර්**

911 ප්‍රශ්නයේදී එක් අවස්ථාවකට හෝ ඔව් කී ප්‍රතිචාරකයන්ගෙන් 913 ප්‍රශ්නය අසනු ලැබේ. අනෙකුත් අය 914 ට යොමු වේ.

**ප්‍රශ්න අංක 913 මවගෙන් දරුවාට බෝවීම වලක්වන බෙහෙත් දන්නවාද ?**

මවගෙන් දරුවාට ඒඩ්ස් බෝවීමේ අවදානම අඩුකරන බෙහෙත් වර්ගයක් ගැන අසා තිබේද යන්න මෙයින් විමසනු ලැබේ.

**ප්‍රශ්න අංක 914 ඒඩ්ස් රෝගය සඳහා බෙහෙතක්**

911 දී ඔව් හෝ නැත කී සියලු පුද්ගලයිනගෙන් මෙම ප්‍රශ්නය අසනු ලැබේ. එවැනි බෙහෙතක් ගැන දන්නවාදැයි අසා අදාල කේතය කව කරන්න.

**ප්‍රශ්න අංක 929/ 929A**

රුධිර පරීක්ෂණයක් පිළිබඳව හා ප්‍රශ්න අංක 929A මගින් රුධිර පරීක්ෂාව කර ගත හැකි ස්ථානයක් ගැන විමසනු ලැබේ.

**ප්‍රශ්න අංක 930**

එම පරීක්ෂණ කර ගත හැකි ස්ථානයට අදාල කේත සියල්ල කව කරන්න.

**ප්‍රශ්න අංක 931 සිට ප්‍රශ්න අංක 934 ඒඩ්ස් රෝගය වැලදුණු පුද්ගලයින් ගැන පුද්ගලික අදහස්**

මෙම ප්‍රශ්න 4 න් විමසනු ලබන්නේ ඒඩ්ස් වැලදුනු මනඃකල්පිත පුද්ගලයින් ගැන ප්‍රතිචාරක දරන අදහස් දැන ගැනීමටයි. එක් එක් ප්‍රශ්නය සඳහා අදාල කේතයන් කව කරන්න.

**ප්‍රශ්න අංක 942 ෆිල්ටර්**

ප්‍රශ්න අංක 901 අනුව ඒඩ්ස් රෝගය ගැන අසා ඇති හා අසා නැති පුද්ගලයින් වෙන් කර ගන්නා අතර ඒ සියලු දෙනා වෙනත් ලිංගික ඇසුරින් බෝවන රෝග ගැන දැනුම විමසීමට යොමු කරනු ලැබේ.

**ප්‍රශ්න අංක 944 එවැනි රෝග ගැන අසා ඇත්නම් 945 - 947 දක්වා අසන්න. අසා නැති නම් 946 ට යන්න.**

**ප්‍රශ්න අංක 945 - 947 ලිංගික ඇසුරින් බෝවන රෝග තිබුණාද ?**

මෙම ප්‍රශ්න වලින් පසුගිය මාස 12 තුල ප්‍රතිචාරකට ලිංගික ඇසුරින් බෝවිය හැකි රෝග තිබුණාදැයි යන්න දැන ගැනීමට උත්සාහ කරනු ලැබේ. පිළිතුරට අදාල කේතය කව කරන්න.

**ප්‍රශ්න අංක 948 ෆිල්ටර්**

ප්‍රශ්න අංක 945 - 947 දක්වා ප්‍රශ්නවලින් එවැනි රෝගයක් සෑදී තිබුණ අයෙක් බව හඳුන් ගත්තේ නම් "✓" ලකුණ යොදා වැඩි දුර විස්තර සඳහා ප්‍රශ්න අංක 949 හා ප්‍රශ්න අංක 950 ට යොමු කරන්න. නැති අයෙක් නම් 948 හි "✓" ලකුණු කර 951 ට යන්න.

ප්‍රශ්න අංක 949/ප්‍රශ්න අංක 950 උපදෙස් හෝ ප්‍රතිකාර ගත්තේද ?

එවැනි රෝගයක් වැළදී සිටි බවට හඳුනා ගත්තේ නම් ඒ සඳහා උපදෙස් හෝ ප්‍රතිකාර ගත්තේදැයි විමසන්න. ඔව් නම් ප්‍රශ්න අංක 949 හි 1 කව කර ප්‍රශ්න අංක 950 න් අසනු ලබන එසේ ප්‍රතිකාර ලබාගත් ස්ථානය හෝ පුද්ගලයා සඳහා අදාල කේත සියල්ල කව කරන්න. එසේ නැති බව කිවහොත් 2 කව කර 951 ප්‍රශ්නයට යන්න.

## 6. 10 කොටස

### දහවන කොටස - වෙනත් සෞඛ්‍ය විස්තර

**ප්‍රශ්න අංක 1001 ගෘහ සාමාජිකයන්ගේ දුම්පානය, මත්ද්‍රව්‍යය හා මත් පැන් භාවිතය.**

ගෘහ ඒකකයේ සාමාජිකයෙකු දුම් පානය, මත්ද්‍රව්‍ය හෝ මත් පැන් භාවිතයේ යෙදෙන්නේද ? යන්න ප්‍රතිචාරකගෙන් ඇසිය යුතුය. ඔව් නම් 1 කව කර ප්‍රශ්නයට අදාල කොටස් සම්පූර්ණ කරන්න. නැත නම් 2 කව කර ප්‍ර. 1002 ට යන්න. අදාල පුද්ගලයා සඳහා A කොටසේ ඇති අනුක්‍රමික අංකය සඳහන් කරන්න. අදාල සාමාජිකයා එම අවස්ථාවේ නිවසේ සිටි නම් එම පුද්ගලයාගෙන් විස්තර ඇසිය හැක. එසේ නම් 3 තීරයේ 1 කේතය යොදන්න. අනතුරුව C, D, E තීර අදාල පරිදි සම්පූර්ණ කරන්න.

**ප්‍රශ්න අංක 1002 සෞඛ්‍ය පිළිබඳ උපදෙස් ගැනීමට කැමති ස්ථානය**

මෙයින් අසනු ලබන්නේ ප්‍රතිචාරක හෝ පවුලේ අයගේ සෞඛ්‍ය තත්වය පිළිබඳ ගැටළුවලදී වැඩියෙන්ම හමුවීමට කැමැත්තක් දක්වන්නේ කුමන නිලධාරියෙක්ද ? කුමන ස්ථානයේද ? එමෙන්ම කුමන ජනමාධ්‍යය මගින් ඒ පිළිබඳ දැනුවත් වූවේද යන්නය. අදාල කේත කොටු තුල ලියන්න.

**ප්‍රශ්න අංක 1003 එන්නත් කළාද ?**

පසුගිය මාස 12 තුල කුමන හෝ හේතුවක් සඳහා ප්‍රතිචාරක යම් කිසි එන්නත් වර්ග ලබා ගත්තාද යන්න අසා ලබා ගත්තා නම් එන්නත් ප්‍රමාණය කොටු 2 තුල ලියන්න. (90 ට වැඩි නම් 90 ලියන්න) ලබා නොගත්තේ නම් 00 කව කර 1007 ප්‍රශ්නයට යන්න.

**ප්‍රශ්න අංක 1004 සෞඛ්‍ය නිලධාරියෙකු විසින් ලබා දුන් එන්නත් ගණන**

එන්නත් ලබා ගත්තේ නම් වෛද්‍යවරයෙක්, හෙදියක්, දන්ත වෛද්‍යවරයෙක්, ඖෂධවේදියෙක් වැනි සෞඛ්‍ය නිලධාරියෙක් මගින් ලබා ගත් එන්නත් ගණන විමසා කොටු තුල සඳහන් කරන්න. කිසිවක් නැත්නම් 1007 ට යන්න.

**ප්‍රශ්න අංක 1005 එන්නත් ලබ ගත් ස්ථානය**

සෞඛ්‍ය නිලධාරියෙකු විසින් එන්නත් ලබා දුන්නේ නම් එම අවසාන එන්නත් ලබා ගත් ස්ථානය මෙම ප්‍රශ්නය මගින් අසනු ලැබේ. දී ඇති පිළිතුරු වලින් අදාල කේතය කව කරන්න. එය රජයේ හෝ පෞද්ගලික ලෙස හඳුනා ගැනීමට නොහැකි නම් ස්ථානයේ නම ලියන්න.

**ප්‍රශ්න අංක 1006 අලුත් එන්නත් කටුවක් හා සිරිංජරයක් පාවිච්චි කළාද ?**

එන්නත් ලබා ගත්තේ නම් අදාල නිලධාරියා අලුත් සිරිංජරයක් හා එන්නත් කටුවක් පාවිච්චි කලේද යන්න ප්‍රතිචාරකගෙන් අසා අදාල කේතය කව කරන්න.

**ප්‍රශ්න අංක 1007 - ප්‍රශ්න අංක 1010 ක්ෂය රෝගය පිළිබඳ දැනුම**

මෙම ප්‍රශ්න 4 න් ක්ෂය රෝගය ගැන ප්‍රතිචාරකගේ දැනුම පරීක්ෂා කෙරේ. 1008 දී රෝගය බෝවිය හැකි ක්‍රම කීපයක් දන්නේ නම් කේත සියල්ල කව කරන්න. අනිකුත් ප්‍රශ්න සඳහා අදාල කේතයන් කව කරන්න.

**ප්‍රශ්න අංක 1011 - 1015 පිළිකා රෝග**

මෙම ප්‍රශ්න වලින් බලාපොරොත්තු වන්නේ ස්ත්‍රීන්ට බහුල වශයෙන් වැළදෙන සමහර පිළිකා රෝග ගැන ප්‍රතිචාරකගේ දැනුවත් භාවය පරීක්ෂා කිරීමය. එමෙන්ම ඒවා පිළිබඳ පරීක්ෂා කිරීමට ඇති පරීක්ෂණ පිළිබඳ දැනුම හා එම පරීක්ෂණ කවදා හෝ සිදුකර තිබේද යන්නත් විමසා බැලේ. අදාල ප්‍රශ්න සඳහා සුදුසු කේතයන් කව කරන්න.

**ප්‍රශ්න අංක 1016 අසනීප වූ විට ප්‍රතිකාර ගැනීමට යාම ප්‍රශ්නයක්ද ?**

මෙයින් අදහස් කරනු ලබන්නේ සමහර කාන්තාවන්ට මුහුණ පෑමට සිදුවන අවස්ථාවකි. එනම් කාන්තාවක් අසනීප වූ විට ප්‍රතිකාර ගැනීමට යාමේදී මුහුණ පාන ගැටළු සහගත අවස්ථා කීපයක් මෙහි සටහන් කර ඇත. එක් එක් අවස්ථාව ප්‍රතිචාරකට ගැටළුවක්ද ගැටළුවක් නොවේද යන්න පැහැදිලිව අසා දැනගෙන 1 හෝ 2 කේත හැම අවස්ථාවක් සඳහාම කව කරන්න.

**ප්‍රශ්න අංක 1017/ප්‍රශ්න අංක 1018 සෞඛ්‍ය රක්ෂණයක් තිබේද ?**

සෞඛ්‍ය රක්ෂණයකින් ප්‍රතිචාරක ආවරණය වී ඇත්දැයි අසා තිබේනම් 1018 සඳහා එම රක්ෂණය කුමන ආකාරයකට ලබා ගත්තේදැයි අදාල කේත කව කරන්න. (මෙය ස්වාමි පුරුෂයා ලබාගත් රක්ෂණයකින් ආවරණයවීමක්ද විය හැක)

**ප්‍රශ්න අංක 1019 වේලාව සටහන් කරන්න.**

| |
|---|
| ගෘහ කාණ්ඩයේ අදාල වයස් කාණ්ඩවල දරුවන් හා කාන්තාවන් සිටී නම් BI, BII කොටස් සම්පූර්ණ කළ යුතුවේ. |

ප්‍රතිචාරකට ස්තුතිකර සම්මුඛ සාකච්ඡාව අවසන් කරන්න.